258 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 258 - இல. 5
Volume 258- No. 5

2018 පෙබරවාරි 19 වන සඳුදා
2018 பெப்ருவரி 19, திங்கட்கிழமை
Monday, 19th February, 2018

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන**

කථානායකතුමාගේ සහතිකය

ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කෙටුම්පත

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදි

**කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදි

**ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව:**

විවාදය කල් තබන ලදි

**පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය:**

විවාදය කල් තබන ලදි

**කල් තැබීමේ යෝජනාව:**

ශ්‍රී ලංකාව තුළ උද්ගත වී ඇති දේශපාලන අර්බුදය

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

சபாநாயகரது சான்றுரை

உத்தேச நிலையியற் கட்டளைகள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களின் நடத்தைக் கோவையினது வரைவுகள்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**கணக்காய்வுச் சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை**

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**தீவிரப் பொறுப்பு முகாமைச் சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது

**கொழும்பு பங்குத்தொகுதிப் பரிவர்த்தனையை பரஸ்பரமற்றமயமாக்கல் சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது

**நிலையியற் கட்டளைகள் பற்றிய குழுவின் அறிக்கை:**

விவாதம் ஒத்திவைக்கப்பட்டது

**பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவை:**

விவாதம் ஒத்திவைக்கப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**

இலங்கையில் எழுந்துள்ள அரசியல் நெருக்கடி

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Speaker's Certificate

Revised Draft Standing Orders and Code of Conduct for Members of Parliament

AUDITOR-GENERAL'S REPORT

PERFORMANCE REPORT OF FINANCE COMMISSION

PERFORMANCE REPORT OF AUDIT SERVICE COMMISSION

PUBLIC FINANCE COMMITTEE REPORT

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ACTIVE LIABILITY MANAGEMENT BILL:

Read the First time

DEMUTUALIZATION OF THE COLOMBO STOCK EXCHANGE BILL:

Read the First time

REPORT OF THE COMMITTEE ON STANDING ORDERS:

Debate Adjourned

CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT:

Debate Adjourned

ADJOURNMENT MOTION:

Political Crisis Arisen in Sri Lanka

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2018 පෙබරවාරි 19 වන සඳුදා***
*2018 பெப்ருவரி 19, திங்கட்கிழமை*
*Monday, 19th February, 2018*

**පූ. භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m., MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 පෙබරවාරි මස 08වැනි දින මා විසින් පහත සඳහන් පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැන්වීමට කැමැත්තෙමි.

ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන)

### II

## ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කෙටුම්පත
## உத்தேச நிலையியற் கட்டளைகள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களின் நடத்தைக் கோவையினது வரைவுகள்
## REVISED DRAFT STANDING ORDERS AND CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, අපගේ ව්‍යවස්ථාදායකයේ දැනට අප විසින් භාවිත කරනු ලබන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 1993 අවසන් වරට සංශෝධනය වීමෙන් පුරා වසර 25කට පසුව, අද තත්ත්වයට ගැළපෙන පරිදි වසර 2ක පමණ කාලයක් අවශ්‍ය සංශෝධන සිදු කරමින්, සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ අදහස් ද විමසා ඒකඡන්දවයෙන්, පාර්ලිමේන්තුවේ ප්‍රතිශෝධිත ස්ථාවර නියෝගත්, ඒ සමඟම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම සංග්‍රහයත් අද දිනම සම්මත කර ගැනීමට ඔබ සියලු දෙනාගේම කාරුණික සහයෝගය අපේක්ෂා කරන බව මෙම ගරු සභාවට දැන්වීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XI කොටස සහ අටවැනි කාණ්ඩයේ II කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එම වාර්තා මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT OF FINANCE COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2017.10.01 දින සිට 2017.12.31 දින දක්වා මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## கணக்காய்வுச் சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT OF AUDIT SERVICE COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ(6) සහ 153ඌ ව්‍යවස්ථා ප්‍රකාරව 2017.07.01 දින සිට 2017.09.30 දින දක්වා විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

එම නියෝග ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 සහ 2015 වර්ෂ සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife and Minister of Buddhasasana)

ගරු කථානායකතුමනි, 2016 වර්ෂය සඳහා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා ලෝහෝර් ආර්යා ණය අරමුදලේ වාර්ෂික වාර්තාව;

(ii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iii) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 2, 12, 22 සහ 25 වගන්ති යටතේ පානීය නොවන ස්ප්‍රීතු ආනයනය සඳහා වූ සුරාබද්ද සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 19 දිනැති අංක 2050/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය (අංක 1005 දරන සුරාබදු නිවේදනය); සහ

(iv) 2017 අංක 30 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2018.01.01 සිට 2018.01.22 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන් කිරීම් පිළිබඳ සටහන.

එම වාර්තා, නිවේදනය සහ පරිපූරක වෙන් කිරීම් පිළිබඳ සටහන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella )

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව යාපනය විශ්වවිද්‍යාලයේ වව්නියා මණ්ඩපයේ ව්‍යාපාර අධ්‍යයන පීඨයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 18 දිනැති අංක 2050/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2050/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ජාතික මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2008, 2009, 2010 සහ 2011 වර්ෂ සඳහා සීමාසහිත ලංකා සතොස හි වාර්ෂික වාර්තා; සහ

(ii) 2016 වර්ෂය සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා ලංකා ධීවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නවීන් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் )
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, 2015 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ
(ii) 2015 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on,

(i) Excise (Amendment) Bill;
(ii) Notes on the Supplementary Allocations given from the Budgetary Support Services and Contingent Liabilities provision made under the Department of National Budget as per the Introduction Note of the Annual Estimates;
(iii) Financial Performance of the Third Quarter of 2017;
(iv) Regulations under the Finance Act;
(v) Resolution for Revision of Remuneration of the Chairman & the Vice Chairman and the Allowances of the Members of the National Education Commission; and
(vi) Resolution for Determination of Salaries and allowances to Mr. H.M. GaminiWijesinghe, the Auditor General

which were referred to the said Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාව යටතේ වන මාධ්‍ය උපමාන" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු එස්.බී. දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් හය මම පිළිගන්වමි.

(1) බණ්ඩාරගම, වීදාගම, රේරුකාන පාර, නිවිසිටි, අංක 34/ඩී දරන ස්ථානයෙහි පදිංචි ඩී.ජේ.එම්. කුසුමාවති මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) බෙන්තොට, හබුරුගල, මහගොඩ, රසගවත්ත, අංක 43 ඒ දරන ස්ථානයෙහි පදිංචි ගල්ඔලුව ආරච්චිගේ සෝමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) වාද්දුව, මොල්ලිගොඩ, ගාලුපාර, අංක 768 දරන ස්ථානයෙහි පදිංචි එච්.සී.එම්.අමරතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) නවදගල, අටකොහොට, සපුමල් උයන යන ලිපිනයෙහි පදිංචි එම්. ප්‍රේමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) පානදුර, දිබ්බැද්ද, අංක 24 සී දරන ස්ථානයෙහි පදිංචි එම්.අයි.එස්. ප්‍රනාන්දු මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(6) පානදුර කළුඳැවල, මොරවින්න පාර, අංක 3 ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්.කේ. ප්‍රනාන්දු මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා (අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித தெவரப்பெரும - உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Palitha Tewarapperuma - Deputy Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs)

ගරු කථානායකතුමනි, ගෝවින්න, පහළ නාරගල යන ලිපිනයෙහි පදිංචි චාන්දනී වෙත්තසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, මීරිගම, පල්මඩ, අංක 55 දරන ස්ථානයෙහි පදිංචි අයි.කේ. සිසිර විජේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) මොරටුව, කොරළවැල්ල, දෙවන පටුමග, අංක 49/2බී දරන ස්ථානයෙහි පදිංචි නිමල් වීරක්කොඩි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අඹකොටේ, දැදුරුනදීගම, අංක 4/10 දරන ස්ථානයෙහි පදිංචි ටී.ජී.ජී. තංගල්ල මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) උකුවෙල, රයිතලාවල, කහටගහකුඹුර, අංක 01 දරන ස්ථානයෙහි පදිංචි මල්ලිකා ප්‍රනාන්දු මෙනවියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාතලේ, ලැලිඅඹේ, උඩංගමුව, අංක 101 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ජී.ජී. ඉන්ද්‍රා කුමාරිහාමි මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු කථානායකතුමනි, අරණායක, කෑගල්ල, මාවනැල්ල, මානදී ප්‍රාථමික විද්‍යාලයේ ගුරු නිවාසයේ පදිංචි ජී.කේ. සුනීතා නාලනී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ඉම්රාන් මහරුෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

Hon. Speaker, I present a petition from Mr. S.M. Moujood of Nadutheevu, Mutur 07.

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

ගරු කථානායකතුමනි, අවිස්සාවේල්ල, තල්දුව, අංක 345/3 දරන ස්ථානයෙහි පදිංචි එම්.එම්.එම්. ජෙමාල් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත
### தீவிரப் பொறுப்பு முகாமைச் சட்டமூலம்
### ACTIVE LIABILITY MANAGEMENT BILL

"ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ණය කළමනාකරණය කරනු පිණිස සක්‍රිය බැරකම් කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ ණය එකතුකර ගැනීමට බලය ලබා දීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.***

***2018 මාර්තු 06 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2018 மார்ச் 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon.Gayantha Karunatileka on behalf of the Prime Minister, Minister of National Policies and Economic Affairs; to be read a Second time upon Tuesday, 06th March, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

### කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත
### கொழும்பு பங்குத்தொகுதிப் பரிவர்த்தனையை பரஸ்பரமற்றமயமாக்கல் சட்டமூலம்
### DEMUTUALIZATION OF THE COLOMBO STOCK EXCHANGE BILL

"ඇපයෙන් සීමිත සමාගමක් වන කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය කොටස්වලින් සීමිත සමාගමක් බවට පරිවර්තනය කිරීමෙන් කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීම සඳහා ද; ඊ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.***

***2018 මාර්තු මස 06වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவர் சார்பில் மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2018 மார்ச் 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs; to be read a Second time upon Tuesday, 06th March, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අද ශ්‍රී ලංකාවේ උද්ගතවී ඇති දැවැන්ත දේශපාලන අර්බුදය නිසාවෙන් රට අරාජික තත්ත්වයකට පත්ව ඇති බැවින්, එය ජාතික වැදගත්කමකින් යුතු කරුණක් වශයෙන් ඒ සම්බන්ධව කරුණු සාකච්ඡා කිරීම සඳහා අද දින මෙම ගරු සභාවේ විවාදයක් ලබා දෙමින් ඒ ගැන සුවිශේෂ අවධානය යොමු කරලීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ස්ථාවර නියෝග 17 යටතේ ඉල්ලා සිටිනවා. මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට මන්ත්‍රීවරුන් 20 දෙනෙකුගේ සහයෝගය තිබෙන බවත් මා සඳහන් කරනවා.

***[මේ අවස්ථාවේදී ඒකාබද්ධ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සිය අසුන්වලින් නැඟී සිටියහ.]***

*[இச்சந்தர்ப்பத்தில் கூட்டு எதிரணியைச் சேர்ந்த உறுப்பினர்கள் எழுந்து நின்றனர்.]*

*[At this stage, the Members of the Joint Opposition rose from their seats.]*

මොකද, මෙය මුළු රටේම අවධානය යොමුවී තිබෙන ප්‍රශ්නයක්. එම නිසා අපට එම අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මේ ගැන අපට විතරක් නොවෙයි, ආණ්ඩුවටත් එම විවාදයේ දී කථා කරන්න පුළුවන්. මේ බරපතළ අර්බුදකාරී තත්ත්වය යටතේ මේ පිළිබඳව විවාදයක් ඉල්ලා ඔබතුමා වෙත නිවේදනයක් භාරදී තිබෙනවා. අද උදේ පැවති පක්ෂ නායක රැස්වීමේදීත් මම මේ ගැන සාකච්ඡා කරන්න අවස්ථාව ලබා දෙන ලෙසට ඉල්ලා සිටියා. මෙම යෝජනාවට පක්ෂව අපේ මන්ත්‍රී කණ්ඩායම සහයෝගය දක්වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි ගරු මන්ත්‍රීතුමා, මේ කරුණ ගැන සාකච්ඡා කරන්න අවශ්‍ය බවට ඔබතුමා අද උදේ ඉල්ලීමක් කළා. අපි ඒ ගැන සාකච්ඡා කරලා, අද දින විවාදයට නියමිතව තිබෙන මෙම කාරණයත් වැදගත් කරුණක් නිසා මෙම විවාදය කරගෙන යන්න අපි කල්පනා කළා. ඒ නිසා මට මේ අවස්ථාවේදී තීරණයක් දෙන්න අමාරුයි. අපි අද දින පස්වරු 3.00ට පැවැත්වෙන පක්ෂ නායක රැස්වීමේ දී මේ ගැන සාකච්ඡා කරමු. අද දින අවස්ථාව ලබා දීමට හැකි වන්නේ නම් අද දින අවස්ථාව ලබා දෙන්නම්. එහෙම නම් සභාවේ කටයුතු තාවකාලිකව අත්හිටුවා - [බාධා කිරීම්]

නැහැ. කරුණාකරලා පොඩ්ඩක් ඉන්න. වාද කරන්න අවශ්‍ය වන්නේ නැහැ, පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමන්ලා. පොඩ්ඩක් කථා කරන්න ඉඩ දෙන්න. මෙතැන රණ්ඩු කරන්න අවශ්‍ය නැහැ. අපි මේ ගැන උදේ සාකච්ඡා කළා. පාර්ලිමේන්තුව අත්හිටුවලා, නැවත පක්ෂ නායක රැස්වීමක් පවත්වා අපට මේ ගැන තීරණයක් ගන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, 17. (2)(අ) ස්ථාවර නියෝග යටතේ එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමට අදහස් කර ඇති දිනයේ රැස්වීම පටන් ගැනීමට පෙර එම යෝජනාව පිළිබඳව කථානායකවරයාට ලිඛිතව දැනුම් දී, ඔහුගේ එකඟත්වය ලබා ගැනීම අවශ්‍ය වන බව සඳහන් වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි පක්ෂ නායක රැස්වීම අවසන් වෙලා, කථානායක නිල ඇඳුම ඇඳගෙන සභාවට එන්න හදනකොටම එම ලිපිය මට භාර දුන්නා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා එකඟත්වයක් පළ කරලා නැහැ නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දැනට එකඟත්වය පළ කරලා නැහැ. එහෙම නම් අපි තාවකාලිකව සභාව අත්හිටුවා, මේ ගැන සාකච්ඡා කරමු.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා එයට එකඟ වෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ අවස්ථාවේ දී එකඟ වුණේ නැහැ. සාකච්ඡා කරලා අවස්ථාව දෙන්නම් කියලා මම කිව්වා. ඕනෑ නම් නැවත පක්ෂ නායක රැස්වීමක් කැඳවා අපට තීරණය කරන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
අද දින පැවැති පක්ෂ නායක රැස්වීමේදී මේ ගැන සඳහනක් කළේ නැහැ, මෙවැනි ඉල්ලීමක් ලිඛිතව ඉදිරිපත් කර තිබෙනවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ වෙලාවේ ලිඛිතව ලැබිලා තිබුණේ නැහැ. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
පක්ෂ නායක රැස්වීමේදී එවැනි යෝජනාවක් ඉදිරිපත් කරලා තිබුණා නම් අපි ඒ ගැන සාකච්ඡා කරනවා. පක්ෂ නායක රැස්වීමේදී එවැනි යෝජනාවක් ඉදිරිපත් කරලා තිබුණේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඒ ගැන ඉල්ලීමක් කළා. අපට අවශ්‍ය නම් නැවත පක්ෂ නායක රැස්වීමක් කැඳවන්න පුළුවන්. අපි පක්ෂ නායක රැස්වීමක් පවත්වා ඒ ගැන තීරණය කරමු. [බාධා කිරීම්] එහෙම නම් පාර්ලිමේන්තු රැස්වීම තාවකාලිකව අත්හිටුවා, පක්ෂ නායක රැස්වීමේදී මේ ගැන සාකච්ඡා කරලා තීරණයක් ගනිමු. [බාධා කිරීම්] හැබැයි, හොඳම ක්‍රමය තමයි මේ විවාදය අවසාන කරලා, ඊළඟට මේ ගැන සාකච්ඡා කරන්න පුළුවන්. [බාධා කිරීම්] ඔබතුමන්ලාට එහෙම කරන්න බැරි නම් මෙතැන වාදයක් ඕනෑ නැහැ, අපි පක්ෂ නායක රැස්වීමක් කැඳවා ඒ ගැන සාකච්ඡා කරමු. [බාධා කිරීම්] හොඳයි, පක්ෂ නායක රැස්වීම සඳහා සභාවේ කටයුතු අපි විනාඩි 15කට අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, පූ.භා. 10.45ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, மு.ப. 10.45 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 10.45 a.m. and then resumed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී තීරණය කළ පරිදි ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 17 යටතේ ජාතික වැදගත්කමකින් යුතුව අසන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් අද දින පැය තුනක සභාව කල් තබන අවස්ථාවේ විවාදයක් ලබා දීමට එකඟ වූ බව දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව, අද දින පාර්ලිමේන්තුවේ කටයුතු පස් වරු 7.00 දක්වා දීර්ඝ කිරීමටද, අදාළ යෝජනාව පිළිබඳ විවාදය අපර භාග 4.00ට ආරම්භ කිරීමටද පක්ෂ නායකයන් එකඟත්වය පළ කරන ලදී.

ගරු සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු. විෂය අංක 1, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සලකා බැලීම. විෂය අංක 2, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය අවසාන කෙටුම්පත අනුමත කිරීම.

කෙටුම්පත ඉදිරිපත් කිරීම, ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා.

## ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## நிலையியற் கட்டளைகள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF THE COMMITTEE ON STANDING ORDERS

[පූ.භා. 10.46]

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07වැනි අඟහරුවාදා පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, මෙම පාර්ලිමේන්තුවට අද විශේෂ දවසක්. මෙම පාර්ලිමේන්තුවේ කාර්ය පටිපාටිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මත පදනම්ව සකස් වී ඇති පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මත රඳා පවතිනවා. ඒ වාගේම වර්තමාන යහ පාලන රජය බලයට පත් වීමේදී පොරොන්දුවක් වුණා, පාර්ලිමේන්තුවේ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍ය වන ඉදිරි පියවරක් ලෙස ආචාර්ය ධර්ම සංග්‍රහයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හඳුන්වා දෙනවා කියලා. ඒ අනුව පාර්ලිමේන්තුවේ සංශෝධිත ස්ථාවර නියෝග හඳුන්වා දීම, ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම සංග්‍රහය අනුමත කරවා ගැනීම කියන කාරණා අද දින විවාදයට නියමිතව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙම ක්‍රියාවලිය පිළිබඳ ඉතිහාසය විශේෂයෙන්ම සඳහන් කිරීම අවශ්‍යයි. 1992න් පසු ස්ථාවර නියෝග සංශෝධනය වී තිබුණේ නැහැ. ඒ නිසාම ඇතැම් විට පාර්ලිමේන්තුවේ කටයුතු කරගෙන යෑමේදී ප්‍රශ්න ගණනාවක් මතු වුණා. ඒ අනුව 2015 දෙසැම්බර් මස 16වැනි දින ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සඳහා වූ ක්‍රියාවලිය මෙම පාර්ලිමේන්තුව විසින් ආරම්භ කළා. එහිදී ඔබතුමාගේ සභාපතිත්වයෙන් යුතුව, ගරු තිලංග සුමතිපාල මැතිතුමා, ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මැතිතුමා, ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා, අජිත් පී. පෙරේරා, ගරු විජිත හේරත් මැතිතුමා, ජේ.එම්. ආනන්ද කුමාරසිරි මැතිතුමා, ගරු එම්.ඒ. සුමන්තිරන් මැතිතුමා සහ ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මැතිතුමාගෙන් යුතු කාරක සභාවක් පත් කළා. ඉන් අනතුරුව මෙම කාරණයට අදාළව විශේෂ කරුණු සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා ගරු කථානායකතුමා විසින් පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් සිව්දෙනෙකුත් මෙම කමිටුවට පත් කළා. ඒ අනුව ගරු රවුෆ් හකීම් මැතිතුමා, ගරු ආර්. සම්පන්දන් මැතිතුමා, ගරු චමල් රාජපක්ෂ මැතිතුමා සහ ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමාද මෙම කමිටුවට සම්බන්ධ වුණා. මෙම කමිටුවට සම්බන්ධ වුණ එම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙත අපේ කෘතඥතාව පළ කළ යුතුයි. මොකද, ඉතාම සංකීර්ණ සංශෝධන ගණනාවකින් සමන්විත වුණු, වසර තුනක පමණ කාලයක් තිස්සේ ක්‍රියාත්මක වුණු මෙම ක්‍රියාවලිය සඳහා එතුමන්ලා විසින් විශාල කාලයක් කැප කරමින් තමන්ගේ දැනුම සහ අවබෝධය අනුව දායක වුණා. ඒ වාගේම මෙම කමිටුවෙන් පරිබාහිරව වෙනත් ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ පක්ෂවල නායකයන් මාර්ගයෙන් මෙම කමිටුවට අදහස් ඉදිරිපත් කළා. මෙම ක්‍රියාවලිය සඳහා සම්බන්ධ වීම පිළිබඳව එම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙත අපේ ස්තුතිය පළ කළ යුතුයි.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග යාවත්කාලීන කිරීම පිළිබඳ අවශ්‍යතාව දිගින් දිගටම ඇති වුණා. දිගින් දිගටම ඇති වුණු ඒ අවශ්‍යතාව පිළිබඳ ක්‍රියාදාමයේදී විවිධ අදහස් ඉදිරිපත් වුණා; ඒ වාගේම විවිධ මත ගැටුම් ඇති වුණා. හැබැයි, අවසානයේදී අපට මෙම කාරණා පිළිබඳව එකඟතාවලට පැමිණීමට හැකියාව ලැබුණා. එම නිසා රටේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කටයුතු ගෙන යාම සඳහා අවශ්‍ය කරන මෙම ක්‍රියාදාමය නිසි ලෙස පවත්වාගෙන යාමට ඉඟල්වන පරිදි පුළුල් වූ, ඉතා වැදගත් වූ, ඒ වාගේම නවීන කාලයට අනුකූල වූ, මේ සංශෝධන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, මේ සංශෝධන සියල්ලම සහිත අදාළ කෙටුම්පත සෑම ගරු මන්ත්‍රීවරයෙකුටම ලබා දී තිබෙනවා. එම කෙටුම්පතේ රතු පාටින් තිබෙන්නේ, අප විසින් යෝජනා කරනු ලබන නව සංශෝධන. ඒ අනුව ඒ පිළිබඳව කරුණු දැක්වීමට ගරු මන්ත්‍රීතුමන්ලාට හැකියාව තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙම සෑම සංශෝධනයක් පිළිබඳවම කරුණු දැක්වීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් රජය වෙනුවෙන්, මෙම වාර්තාවේ ඇති ඇතැම් වැදගත් කරුණු පිළිබඳව විශේෂයෙන් සඳහන් කිරීමට මා බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ අංක 7 යටතේ සඳහන්ව තිබෙනවා, ජනාධිපතිවරයෙකු තෝරා පත් කර ගැනීම පිළිබඳ කාරණය. මෙය වැදගත් වන්නේ, අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙකු පත් කර ගැනීම පිළිබඳවයි. මේ පිළිබඳව මීට කලින් අපට අත් දැකීමක් තිබෙනවා. මෙම පාර්ලිමේන්තුව මීට කලින් අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙකු පත් කර ගෙන තිබෙනවා. නමුත් ඒ පිළිබඳව විශේෂිතව ස්ථාවර නියෝගවල සඳහන්ව නොතිබීම නිසා අප අංක 7 යටතේ එය ඇතුළත් කළා. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40. (1) (ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙකු තෝරා පත් කර ගැනීමේදී රහස් ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපාදන 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ අනුගමනය කළ යුතු බව සඳහන් කර තිබෙනවා. මම හිතන විධියට කවුරුවත් එයට විරුද්ධ වන එකක් නැහැ.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන වෙලාව පිළිබඳව සඳහන් වෙලා තිබුණේ, කලින් තිබුණු තත්ත්වය අනුවයි. නමුත් අපි දැන් දීර්ඝ කාලයක් තිස්සේ ඒ වෙලාව වෙනස් කරලා පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වූවා. ඒ අනුව අලුත් තත්ත්වයට ගැළපෙන පරිදි අදාළ ස්ථාවර නියෝගය වෙනස් කිරීමට අපි කටයුතු කළා. ඒ අනුවයි 7 වන ස්ථාවර නියෝගය සංශෝධනය වන්නේ.

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නායකත්වය ඇතුව අපි මේ පාර්ලිමේන්තුව ඉදිරි පියවරකට ගෙන ගියා. ඒ තමයි, පාර්ලිමේන්තු රැස්වීම් කටයුතු රූපවාහිනියෙන් සජීවී පෙන්වීමට

අපි කටයුතු කිරීම. ඒ වාගේම ගුවන් විදුලිය සහ වෙනත් විද්‍යුත් මාධ්‍ය මඟින් මෙම පාර්ලිමේන්තු රැස්වීම් විකාශය කිරීමට අපි දැන් කටයුතු කරලා තිබෙනවා. නමුත් ඒ සඳහා වූ අවකාශය හෝ අවසරය ස්ථාවර නියෝගවල සඳහන් කර තිබුණේ නැහැ. ඒ නිසා ඊට අදාළව අපි 14වන ස්ථාවර නියෝගය විධියට අලුත් ස්ථාවර නියෝගයක් හඳුන්වා දී තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙය ඉතා වැදගත් දෙයක්. පාර්ලිමේන්තු රැස්වීම්වලදී සිදු වන කටයුතු සංස්කරණය කරලා තමයි රූපවාහිනියේ, ගුවන් විදුලියේ ප්‍රවෘත්තිවල විකාශය වන්නේ. ඒ වාගේම පුවත් පත් ආයතන තමන්ගේ මතය සහ අදහස අනුව, තමන් දෙන ප්‍රමුඛත්වය අනුව, පාර්ලිමේන්තු රැස්වීම් කටයුතු අතරින් තෝරා ගත් කටයුතු තමයි වාර්තා කරන්නේ. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ පසු පෙළ මන්ත්‍රීවරුන්ට ප්‍රධාන මාධ්‍යවල ඉඩකඩක් ලැබුණේ නැහැ. ඒ වාගේම දවස අවසානයේදී පාර්ලිමේන්තුවේ කථා කරන මන්ත්‍රීවරුන්ට ප්‍රධාන මාධ්‍යවල ඉඩකඩක් ලැබුණේ නැහැ. හැබැයි ඒ තත්ත්වය වෙනස් කරලා, ඔබතුමා මේ පාර්ලිමේන්තු රැස්වීම් කටයුතු අඛණ්ඩව, ඉහළ ප්‍රමිතියකින් යුක්තව, බාධා කිරීම්වලින් තොරව මේ රටේ පුරවැසියන්ට දැන ගැනීමට අවකාශය සලසා දීම නිසා පාර්ලිමේන්තු රැස්වීම්වල සිදු වන කාරණා පිළිබඳව දැන් සවිස්තරව දැන ගැනීමට අවකාශයක් ගොඩ නැඟී තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ පිළිබඳව අපි ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම මේ සඳහා දායක වුණු සියලුම ගරු මන්ත්‍රීවරුන්ට අපි ස්තුතිවන්ත වෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමාට විශේෂයෙන්ම අපි ස්තුතිවන්ත වෙනවා, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීලා, ඒ සඳහා අවකාශය සලසා දීම ගැන. ඒ සඳහා නීතිමය අවසරය ලබා දීමයි 14වන ස්ථාවර නියෝගය සංශෝධනය හරහා සිදු කෙරෙන්නේ. මෙය ඉතාම ප්‍රගතිශීලී සංශෝධනයක්; ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමක් මෙය රටේ අනාගතය වෙනුවෙන් නිවැරදි තීරණ ගැනීමට දැනුවත් පුරවැසියන් පිරිසක් බිහිවීමට හේතුවක් වෙනවා.

ඊළඟට, මම විශේෂයෙන්ම සඳහන් කරන්න අවශ්‍යයි, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ අංක 20 පිළිබඳව. සභාව කල් තබන අවස්ථාවේ යෝජනා හා ප්‍රශ්න පිළිබඳව ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබුණේ නැහැ. අපි ඒ පිළිබඳව අලුත් ප්‍රතිපාදන ඇතුළත් කර තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ වාගේම ශෝක ප්‍රකාශ යෝජනාවල අනුපිළිවෙළ කුමක්ද යන්න පිළිබඳව සඳහන් වෙලා තිබුණේ නැහැ. අපි ඒ පිළිබඳවත් ඇතුළත් කරලා තිබෙනවා. ඒ වාගේම ඔබතුමාගේ කාලයේදී ශෝක ප්‍රකාශ යෝජනා පිළිබඳව අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඉක්මනින් කටයුතු කිරීමට ඉඩකඩ සලසා තිබුණා. අපි ඒ පිළිබඳව අගය කරනවා.

ගරු කථානායකතුමනි, අපි මේ පාර්ලිමේන්තුවට නව සම්ප්‍රදායයක් හඳුන්වා දුන්නා. ඒ තමයි, අග්‍රාමාත්‍යවරයාගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාව. අපි ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවක් ඇති කර ගත්තා, විධායක ජනාධිපති ධුරය අහෝසි කරමින්, පාර්ලිමේන්තුවට වග කියන පාලන ක්‍රමයක් ඇති කිරීමට. අපට එක වරම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර ගන්න නොහැකි වුණත්, විධායක ජනාධිපති ක්‍රමය සතු ඇතැම් බලතල ඉවත් කිරීමටත්, ඒ වාගේම ඇතැම් සංවරණයන් සහ තුලනයන් ඇතුළත් කර ගැනීමටත්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා හැකියාව ලැබුණා. ගරු කථානායකතුමනි, ඒ වාගේම පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමට අපට අවස්ථාව ලැබුණා. පාර්ලිමේන්තුවට වටිනාකමක් ලැබුණා. පාර්ලිමේන්තුවේ පසු පෙළ මන්ත්‍රීවරුන්ට වටිනාකමක් ලැබුණා. ඒ හරහා සමාජය තුළ පාර්ලිමේන්තුවේ වටිනාකම ඉහළ ගියා. ඒ තුළ අග්‍රාමාත්‍ය ධුරය, වග කිව යුතු, වග විය යුතු, ඒ වාගේම නිතිපතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පිළිතුරු දිය යුතු ධුරයක් බවට පත් වුණා.

ඒ අනුව අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්න පිළිබඳව අලුත්ම ප්‍රතිපාදන අපි ඇතුළත් කළා, ගරු කථානායකතුමනි. ඒ අනුව ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ අංක 38 ප්‍රකාරව සෑම මාසයකම පළමුවැනි රැස්වීම් සතියේ බදාදා දින වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා වෙන් කර ඇති කාලයෙන් මිනිත්තු 30ක කාලයක් අපි අග්‍රාමාත්‍යතුමා වෙනුවෙන් වෙන් කරනවා. ඒ හරහා කෙළින්ම අග්‍රාමාත්‍යවරයාගෙන්ම පිළිතුරු ලබා ගැනීමේ හැකියාව ලැබෙනවා. මෙහි වැදගත්කම වන්නේ අග්‍රාමාත්‍යවරයාව සෘජුව ප්‍රශ්න කිරීමටත්, ඒ වාගේම අග්‍රාමාත්‍යවරයාට මේ ප්‍රශ්නවලින් මඟ හැර සිටීමට ඇති අවකාශය ඉවත් කිරීමටත් අපි කටයුතු කර තිබීමයි. ඒ අනුව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ඇති ඒ ශ්‍රේෂ්ඨ සම්ප්‍රදාය අපේ පාර්ලිමේන්තුවට අපි අනුයුක්ත කර ගෙන තිබෙනවා. ඒ හරහා අග්‍රාමාත්‍ය ධුරය දරන්නාගේ වටිනාකම ශක්තිමත් කර තිබෙනවා; අග්‍රාමාත්‍ය ධුරයට වටිනාකමක් ලබා දී තිබෙනවා; ඒ වාගේම මේ පාර්ලිමේන්තුවත් ඒ තුළින් ශක්තිමත් කර තිබෙනවා; පුරවැසියාත් එයින් ශක්තිමත් වනවා. ගරු කථානායකතුමනි, ඒ අනුව ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ අංක 38 ඉතා විප්ලවීය ස්ථාවර නියෝගයක්. එම සම්ප්‍රදාය ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ආරම්භ කළා. අනාගතයේ කවුරුන් මේ ධුරයට පත් වුණත්, මේ සම්ප්‍රදාය ආරක්ෂා කර ඉදිරියට ගෙන යෑමට එම පුද්ගලයාට බල කෙරෙනවා. ගරු කථානායකතුමනි, ඒ අනුව ඉතා වැදගත් සම්ප්‍රදායක් ඇති කිරීමේ ගෞරවය ගරු අග්‍රාමාත්‍යතුමාට හිමිවන අතර, එය නීතියට එකතු කරලා ආපසු හැරවිය නොහැකි තත්ත්වයකට පත් කිරීම පිළිබඳව ඔබතුමාටත්, මහන්සි වෙලා මේ යෝජනා සකස් කරපු සියලු දෙනාටත් අපි ස්තුතිය පිරිනමන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ඡන්දය දීමේ ක්‍රමවේදය පිළිබඳව අපි අලුත් නීති සකස් කළ යුතුව තිබුණා. පාර්ලිමේන්තුවේ ඉලෙක්ට්‍රොනිකව ඡන්දය දීමේ ක්‍රමය බොහෝ කාලයකට කලින් හඳුන්වා දුන්නත්, එය ක්‍රියාත්මක වුණේ නැහැ. එක් වරක් ක්‍රියාත්මක කොට අසාර්ථක වූ තැන එම ක්‍රමය අත්හැර දැම්මා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ ධුර කාලය තුළ ප්‍රායෝගිකව ඉලෙක්ට්‍රොනිකව ඡන්දය පාවිච්චි කිරීමේ හැකියාව අපට දැන් ලැබී තිබීම පිළිබඳව අපි ඔබතුමාට ස්තුතිවන්ත වනවා. අප එය විශ්වාසවන්තව වැදගත් ඡන්ද විමසීම්වලදී භාවිත කර තිබෙනවා. ඒ වාගේම විනිවිදභාවයෙන් යුතුව ඡන්දය පාවිච්චි කිරීමටත්, ඡන්දය පාවිච්චි කිරීමේදී ඇති වන්නා වූ අවිනිශ්චිතතා ඉවත් කිරීමටත්, ඒ වාගේම මොන බාධා සිදු වුණත් ප්‍රායෝගිකව ඡන්දය ලබා ගැනීමේ හැකියාව ඇති කිරීමත් ඒකෙන් සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව එක පැත්තකින් ඉලෙක්ට්‍රොනිකව පාර්ලිමේන්තුව තුළ ඡන්දය භාවිත කිරීමට අවකාශය සලසා දෙන අතර, ඒ සඳහා වූ නීතිමය ප්‍රතිපාදන ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ අංක 47 මඟින් ඇති කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ සංශෝධිත ස්ථාවර නියෝග තුළ තවත් බොහෝ කාරණා ඇතුළත් කර තිබෙනවා. නමුත්, ඉතාම වැදගත් දේ තමයි, ආංශික අධීක්ෂණ කාරක සභා හා සම්බන්ධ ස්ථාවර නියෝගය. මේ ආංශික අධීක්ෂණ කාරක සභා පිළිබඳව බොහෝ අය අතර වැරදි අවබෝධයක් තිබෙනවා. මම නියෝජ්‍ය ඇමතිවරයෙකු හැටියට ආංශික අධීක්ෂණ කාරක සභා කීපයක සාමාජිකයෙකු හැටියට කටයුතු කරනවා. මේ පාර්ලිමේන්තුව තුළ ආණ්ඩු පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරුන්ටත්, විපක්ෂ මන්ත්‍රීවරුන්ටත් වටිනාකමක් තිබුණේ නැහැ.

විශේෂයෙන්ම විධායක ජනාධිපති ක්‍රමයක් තුළ පාර්ලිමේන්තුවේ කැබිනට් ඇමති ධුර නොදරන මන්ත්‍රීවරුන්ට හඬක් තිබුණේ නැහැ. ඔවුන්ට ප්‍රතිපත්තිමය කරුණුවලට මැදිහත් වන්න හැකියාවක් තිබුණේ නැහැ. ඒ නිසා ඉතාම වැදගත් කරුණ තමයි, ආංශික අධීක්ෂණ කාරක සභා හරහා පාර්ලිමේන්තුවේ පසු පෙළ මන්ත්‍රීවරුන්ට වටිනාකමක් ලබා දීලා, ප්‍රතිපත්ති සම්පාදනය තුළ ඔවුන්ට ශක්තියක් ලබා දීලා තිබීම. එම නිසා ඇතැම් ආංශික අධීක්ෂණ කාරක සභා ඉතා ඉහළින් කටයුතු කරලා තිබෙනවා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

නමුත්, සමහර ආංශික අධීක්ෂණ කාරක සභා පිළිබඳව අපට විවේචන තිබෙනවා. හැබැයි, ඒ කාරක සභාවේ නායකත්වය නිසි ලෙස ලැබෙනවා නම්, සාමාජිකයින්ගේ ශක්තිය ලැබෙනවා නම්, ඒ හරහා ඒ අවශ්‍ය කටයුතු කිරීමේ හැකියාව ලැබෙනවා. ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රියාත්මක කිරීම තුළ විෂය භාර අමාත්‍යවරයා සහ ආංශික අධීක්ෂණ කාරක සභාව අතර ගැටීමක් ඇති නොවන ආකාරයට අපි යම් සංස්කෘතියක් ඇති කර ගත යුතු වනවා. කාලය ගත වීමත් සමඟ ඒ අවබෝධය ගොඩ නැඟෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම සංශෝධිත ස්ථාවර නියෝග මඟින් සකස් කර තිබෙනවා. එය ඉතාම වැදගත් තීරණයක්.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව තුළ උපදේශක කාරක සභා ඉවත් කිරීම පිළිබඳව ලොකු විවේචනයක් තිබුණා. ආණ්ඩු පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරුන්ගෙන් වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් නිරතුරුව විවේචන ආවා. මේ කාරණය සම්බන්ධව අපි අද දින එකඟතාවක් ඇති කර ගත්තා. ඒ සංශෝධනයේ පිටපත් ඔබතුමන්ලාට ලැබේවි. ඒ අනුව ආංශික අධීක්ෂණ කාරක සභාවලට අමතරව අපි අද එකඟතාවක් ඇති කර ගෙන තිබෙනවා, උපදේශක කාරක සභා නැවත හඳුන්වා දෙන්න. ඒ අනුව එය ක්‍රියාත්මක වනවා. ඒ පිළිබඳව වූ සංශෝධනය අද ඉදිරිපත් කරනවා. ඒ පිළිබඳවත් මා කියන්නට අවශ්‍යයි. ඒ පිළිබඳව වෙනස් අදහස් පළ කර ඒ වෙනුවෙන් පෙනී සිටි ගරු ඇමතිවරුන්ට, ගරු මන්ත්‍රීවරුන්ට අපි ස්තුතිවන්ත වනවා. අපි ඔවුන්ගේ අදහස් පිළිගන්නවා. ඒ අනුව උපදේශක කාරක සභා නැවත හඳුන්වා දීමට අපි කටයුතු කරනවා. ඒ පිළිබඳ සංශෝධනය අද දින ඔබතුමන්ලාට ලැබෙයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම වැදගත් කාරණාවක් තමයි ඉහළ අධිකරණ විනිශ්චයකාරවරයකු ධුරයෙන් ඉවත් කිරීම පිළිබඳ කාරණය. මේ පිළිබඳව සඳහන් කරලා තිබෙන්නේ යෝජිත 84වන ස්ථාවර නියෝගයේ.

ගරු කථානායකතුමනි, උපරිමාධිකරණ විනිශ්චයකාරවරු, ඒ කියන්නේ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරු, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු, අග්‍රවිනිශ්චයකාරතුමා, අභියාචනාධිකරණයේ සභාපතිතුමා ඇතුළු ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව කලින් තිබුණු ප්‍රතිපාදන ඉතා බරපතළ විවේචනයට ලක් වෙලා තිබුණා. මේක අලුත් තත්ත්වයක් නොවෙයි. පසුගිය අවුරුදු තිහක් තිස්සේම මේ විවේචන තිබුණා. එක්සත් ජාතික පක්ෂ රජයන් තිබෙන විටත්, සන්ධාන රජයන් තිබෙන විටත් මේ තත්ත්වය ඇති වුණා. ඒ වාගේම, මෙහිදී ලොකුම විවේචනය ඇති වුණේ අධිකරණයට ඇඟිලි ගැසීම සඳහා පාර්ලිමේන්තුව මෙම ක්‍රියාවලිය භාවිත කරනවා කියන කාරණය සම්බන්ධවයි. ඒ විවේචනවල සත්‍ය අසත්‍යතාව කෙසේ වෙතත්, මෙතැන ගැටලුවක් තිබුණා, ඉහළ අධිකරණ විනිශ්චයකාරවරයෙකු ධුරයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය තුළ ඔහු වරදක් කළාද කියන කාරණය විමර්ශනය කිරීමට බලය ඇත්තේ කාටද කියන කරුණ ගැන. ශිරානි බණ්ඩාරනායක හිටපු අග්‍රවිනිශ්චයකාරතුමිය ඉවත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව තිබුණු නඩුවලදී, ඒ පිළිබඳව සිවිල් සමාජය තුළ ඇති වුණු කතිකාවලදී වාගේම, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැටියට ලැබූ අත් දැකීම් තුළදී අප දුටුවා, යම් විනිශ්චයකාරවරයෙකු යම් වරදක් කර තිබේද යන කාරණය විනිශ්චය කිරීම සඳහා වඩාත් සුදුසු වන්නේ යම් ආකාරයක ස්වාධීන මණ්ඩලයක් විසින් නඩු විභාගයක ආකාරයෙන් කටයුතු කළ යුතු බව.

මේ කරුණ අප තේරුම් ගත යුතුයි. ජනාධිපතිවරයාට එරෙහි දෝෂාභියෝගයක් විමර්ශනය කිරීමේදී එහි බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ජනාධිපතිවරයා ඉවත් කිරීමේ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ඉහළ අධිකරණ විනිශ්චයකාරවරයෙක් ඉවත් කිරීමේ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ගරු කථානායකතුමනි, කිසිම ලෙසකින් මේ ඉවත් කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවට තිබෙන බලය අයින් කරලා නැහැ. නමුත් ජනාධිපතිවරයා ඉවත් කිරීමේ දෝෂාභියෝග ක්‍රියාදාමයේදී ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38වන ව්‍යවස්ථාව ප්‍රකාරව වැරදි කර තිබේද යන්න පිළිබඳව, අපරාධ වරදක් කරලා තිබෙනවාද, රාජද්‍රෝහී වීමේ වරද කරලා තිබෙනවාද, චේතනාන්විතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙනවාද යනාදී වශයෙන් නිශ්චිතව සඳහන් කර ඇති ඒ වරදක් කර තිබේද යන්න හෝ එහෙම නැත්නම් ජනාධිපතිවරයාගේ මානසික හෝ ශාරීරික අබලතාව හේතුවෙන් ධුරයේ කාර්ය ඉටු කිරීමට නියත වශයෙන් නොහැකි බවට පත් වෙලා තිබෙනවාද යන්න පරීක්ෂා කරන්නේ පාර්ලිමේන්තුව විසින් නොවෙයි, ශ්‍රේෂ්ඨාධිකරණය විසින්. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් පස් දෙනෙකුගෙන් යුක්ත මණ්ඩලයක් විසින්. ඒක තමයි සුදුසුම ක්‍රමය. සීමිත කාලයකදී ඒ පරීක්ෂණය අවසන් වෙන්නට ඕනෑ. ඒ පරීක්ෂණය අවසානයේදී ඔවුන්ගේ නිගමනය කියන්නට ඕනෑ; ඒ නිගමනයට හේතු දක්වන්නට ඕනෑ; නිගමනය සහ නිගමනයට හේතු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට ඕනෑ. ඒ හරහා පාර්ලිමේන්තුවට පුළුවන්කම තිබෙනවා ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කිරීමේ කටයුතු කරගෙන යන්නට. ඒක තමයි හරි ක්‍රමය; නිවැරදි ක්‍රමය. එවිට යම් ආකාරයක විධිමත් විනිශ්චයක් කිරීමට අවකාශය ලැබෙනවා.

විශේෂයෙන්ම ශිරානි බණ්ඩාරනායක මැතිනිය හා සම්බන්ධ කාරණයේදී විශේෂයෙන් මේ ප්‍රශ්නය මතු වුණා. මේ ප්‍රශ්නය මතු වුණු වෙලාවේ ආපු හඬ තමයි, පාර්ලිමේන්තුවට මේ බලය තිබිය යුතුයි, මේ බලය පාර්ලිමේන්තුවෙන් ඉවත් විය යුතු නැහැයි කියන එක. නමුත්, යම් වරදක් සිදු කර තිබේද යන කාරණය සාක්ෂි මත තමයි තීරණය වෙන්නේ. අදාළ විනිශ්චයකාරවරයා වරදක් කර තිබේද කියන කාරණය හෝ එම විනිශ්චයකාරවරයා ධුරය දැරීමට නොහැකි තරම් බරපතළ රෝගී තත්ත්වයට පත් වී තිබේද යන කාරණා විනිශ්චය කිරීමට හැක්කේ, අදාළ වෛද්‍ය වාර්තා, අදාළ සාක්ෂිකරුවන්, අදාළ ලේඛන සහ අදාළ නීතිය පිළිබඳව විධිමත් ලෙස විමර්ශනය කිරීමෙන් පසුවයි. මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන්ට ඉමහත් ගෞරවය සහිතවයි මම කියන්නේ, ඇතැම් කාරණා පිළිබඳව විනිශ්චය කිරීමට -යම් කෙනෙක් වරදකරුද කියන කාරණය විනිශ්චය කිරීමට- අප තුළ ඇති පක්ෂකම් සහ බලය පිළිබඳව අප තුළ ඇති ආකල්ප නිසා අප සුදුසු නැති බව. ඒ නිසා වඩාත් සුදුසු වන්නේ ස්වාධීන මණ්ඩලයක් විසින් ඒ පරීක්ෂණ කිරීමයි.

ජනාධිපතිවරයා සම්බන්ධ දෝෂාභියෝගයකදී පරීක්ෂා කිරීමේ බලය අපි දැනටමත් ශ්‍රේෂ්ඨාධිකරණයට දීලා තිබෙනවා. එහෙම නම්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙක් හෝ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙක් ඉවත් කිරීමේ ක්‍රියාවලියේදී ඒ බලය ස්වාධීන මණ්ඩලයකට ලබා දීම තර්කානුකූලයි.

ගරු කථානායකතුමනි, අපි අනුගමනය කරන්නේ පොදු රාජ්‍ය මණ්ඩලයේ සම්ප්‍රදායයි. පාර්ලිමේන්තු ක්‍රමය අපට ලැබිලා තිබෙන්නේ බ්‍රිතාන්‍ය අත් දැකීම් හරහායි. පොදු රාජ්‍ය මණ්ඩලයේ ලැටිමර් මූලධර්ම - Latimer Principles - අනුව සඳහන් කරලා තිබෙනවා මෙවැනි අවස්ථාවකදී ස්වාධීන මණ්ඩලයක් විසින් මේ පරීක්ෂණ කළ යුතුයි කියන කාරණය. ගරු කථානායකතුමනි, ඒ අනුව, ඉතාම දීර්ඝව, දින ගණනාවක වාද විවාදවලින් පසුව, මේ පිළිබඳව විශේෂඥයන්ගේ අදහස් සලකා බැලීමෙන් පසුවයි අපි මේ 84වන ස්ථාවර නියෝගය එකතු කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් වෙන්නේ මේ ආකාරයටයි:

"84. (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, විෂම පැවැත්ම හෝ අබලතාව -විෂම පැවැත්ම කියන්නේ, යම් වරදක් කර තිබෙනවාද කියන එක. අබලතාව කියන්නේ රෝගී තත්ත්වයක්- යන හේතු මත අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර වරයකු, අභියාචනාධිකරණයේ සභාපතිවරයා, සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු එම ධූරයෙන් ඉවත් කරනු ලැබීම සඳහා ජනාධිපතිවරයා අමතා යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම සඳහා දැනුම් දීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව කථානායකවරයාට භාර දී ඇති අවස්ථාවක දී, කථානායකවරයා විසින් එම යෝජනා සම්මතය පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය.

(2)(අ) ඉහත (1) වැනි ඡේදයේ දක්වා ඇති යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබ තිබෙන අවස්ථාවක දී, කථානායකවරයා විසින් අග්‍රාමාත්‍යවරයා සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා විමසා-

මෙහි වැදගත් කාරණයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයෙනුත්, විපක්ෂයෙනුත්, දෙපැත්තෙන්ම මේ පිළිබඳව විමසනවා. කථානායකතුමා හිතුවක්කාර විධියට මේ කටයුතු කරන්නේ නැහැ.

-එම යෝජනා සම්මතයේ දක්වා ඇති විනිශ්චයකාරවරයාගේ විෂම පැවැත්ම හෝ අබලතාව සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර වරයන් තිදෙනෙකුගෙන් සමන්විත විමර්ශන මණ්ඩලයක් පත් කරනු ලැබිය යුත්තේ ය."

රටේ ඉහළම මට්ටම ඒකයි.

අපි විවිධාකාර කොමිෂන් සභා පත් කරනවා. අපට පත් කරන්න පුළුවන් ඉහළම මට්ටම වන ශ්‍රේෂ්ඨාධිකරණ මට්ටමෙන් ඒවා පත් කරනවා. එතැනදීත් හිතුවක්කාර ලෙස ඒවා පත් කරන්න බැහැ. විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත්, දෙපැත්තේම මත -විපක්ෂ නායකතුමාගේත්, අගමැතිතුමාගේත් මත- විමසා තමයි ගරු කථානායකතුමා විසින් ඒ සභාවලට නම් කිරීම කරන්නේ. ඒ නිසා සාධාරණ සහ ස්වාධීන පත් කිරීමක් සිදුවෙයි කියලා අපට බලාපොරොත්තු වෙන්න පුළුවන්.

ගරු කථානායකතුමා විසින් එම මණ්ඩලයේ එක් සාමාජිකයකු සභාපති වශයෙන් පත් කරනවා. ඊට පස්සේ අපි මේ කටයුතු අනවශ්‍ය ලෙස ඇදගෙන යෑම වැළැක්විය යුතුයි. අපි දන්නවා, මීට කලින් එක් අවස්ථාවක හිටපු අග්‍ර විනිශ්චයකාරවරයෙකු ඉවත් කිරීම සඳහා වූ ක්‍රියාවලිය දීර්ඝ ලෙස ඇදගෙන යෑමක් සිද්ධ වුණා. එසේ නොවීම සඳහාත් මෙහි කියනවා;

"(3) එසේ පත් කරන ලද විමර්ශන මණ්ඩලය විසින් මාස දෙකක කාල සීමාවක් ඇතුළත දී විමර්ශනය අවසන් කරනු ලැබිය යුතු" යි. යනුවෙන්.

ඒකත් වැදගත් දෙයක් ගරු මන්ත්‍රීවරුනි. මාස දෙකක් ඇතුළත මේ පරීක්ෂණය අවසන් කරන්න ඕනෑ. එම නිසා අනවශ්‍ය ලෙස ඇදගෙන යෑමක් කරලා, ඒ හරහා රට තුළ හෝ නීති ක්ෂේත්‍රය තුළට බලපෑමක් ඇති කරන්නට හැකියාවක් ඇතිවෙන්නේ නැහැ. "මාස දෙකක නිශ්චිත කාල සීමාවක්" කියලා මෙහි සඳහන්ව තිබෙනවා.

ඒ සඳහා අවශ්‍ය කාර්ය පටිපාටිය සහ නීතිපති ප්‍රතිපාදන පිළිබඳවත් සඳහන් කරලා තිබෙනවා:

"කෙසේ වුවද, කථානායකවරයා විසින් විමර්ශන මණ්ඩලයේ ඉල්ලීම මත එම කාල සීමාව එක් වරකට මාසයක් නොඉක්මවන්නා වූ වැඩිදුර කාල සීමාවකට දීර්ඝ කරනු ලැබිය හැකි ය."

ඒ කියන්නේ, තව මාසයක් කල් ගන්න අවශ්‍ය විශේෂ තත්ත්වයක් තිබෙනවා නම්, එම කාලය දීර්ඝ කිරීමත් කථානායකතුමාගේ අවසර ඇතිවයි කළ යුතු වෙන්නේ.

ඒ වාගේම,

"විමර්ශනයේ වැඩකටයුතු අවසන් කරනු ලැබීමෙන් අනතුරුව, එසේ පත් කරන ලද විමර්ශන මණ්ඩලය විසින්, එකී මණ්ඩලය ඉදිරියේ සටහන් කර ගන්නා ලද සාක්ෂි සම්බන්ධ කාර්යසටහන් ද සමඟ එහි තීරණය කථානායකවරයාට වාර්තා කරනු ලැබිය යුතු අතර, එම විමර්ශන මණ්ඩලය විසින් අදාළ චෝදනා ලත් විනිශ්චයකාරවරයා විෂම පැවැත්ම හෝ අබලතාවට වරදකරු බව තීරණය කරනු ලැබ තිබේ නම් පමණක් කථානායකවරයා විසින් විමර්ශන මණ්ඩලය විසින් වාර්තා කරන ලද කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. අදාළ විනිශ්චයකාරවරයා වරදකරු නොවන බව විමර්ශන මණ්ඩලය විසින් සොයාගනු ලැබ ඇත්නම්, කථානායකවරයා විසින් ඒ බව පාර්ලිමේන්තුවට දැනුම් දෙනු ලැබිය යුතු අතර, එම යෝජනා සම්මතය සම්බන්ධ සියලු වැඩකටයුතු අවසන් කරනු ලැබිය යුත්තේ ය."

ගරු කථානායකතුමනි, දැනටමත් අපි පිළිගෙන තිබෙන, ජනාධිපතිවරයකු දෝෂාභියෝග ක්‍රියාදාමයකින් ඉවත් කිරීමේ ක්‍රියාදාමයමයි මේ. ජනාධිපතිවරයා සම්බන්ධයෙන් කටයුතු කරන කොට, ධූර දරන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු 5දෙනෙක් සම්බන්ධ වෙනවා. උපරිමාධිකරණ විනිශ්චයකාරවරයෙක් සම්බන්ධයෙන් වුණාම, විශ්‍රාම ලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු තුන්දෙනෙක් සම්බන්ධ වෙනවා. ඒ හැර ඉතුරු ක්‍රියාදාමයම එක හා සමානයි; අපි දැනටමත් පිළිඅරගෙන තිබෙන ක්‍රියාදාමයමයි. එනම්;

"(5) විමර්ශන මණ්ඩලය විසින් අදාළ විනිශ්චයකාරවරයාට එරෙහිව ඇති විෂම පැවැත්මට හෝ අබලතාවට වරදකරු බවට තීරණය කරනු ලැබ තිබේ නම්, කථානායකවරයා විසින් එය පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. එම යෝජනාව (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන්ගේ බහුතරයකින් සම්මත වුවහොත්, -ගරු කථානායකතුමනි, ඒ කියන්නේ 113දෙනෙක් අවශ්‍යයි; 113ක බහුතරයක් අවශ්‍යයි- කථානායකවරයා විසින්, එසේ ඔප්පු කරන ලද විෂම පැවැත්ම හෝ අබලතාව මත අදාළ විනිශ්චයකාරවරයා ධූරයෙන් ඉවත් කරනු ලැබීම සඳහා එය ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය."

ඒ වාගේම තවත් වැදගත් කරුණක් තිබෙනවා:

"(6) පාර්ලිමේන්තුව වාරාවසාන කිරීම හෝ විසුරුවා හැරීම නොසලකා විමර්ශන මණ්ඩලය විසින් සිය වැඩකටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබිය හැකිය."

ඒකත් වැදගත් දෙයක්. මොකද, මෙවැනි ක්‍රියාදාමයක් තුළින් මෙම පරීක්ෂණ ක්‍රියාදාමය අඩාල කිරීම සඳහා පාර්ලිමේන්තුව කල් තැබීම වැනි උපක්‍රම භාවිත කිරීමට ඇති ඉඩකඩ මෙයින් බැහැරකොට තිබෙන නිසා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගරු කථානායකතුමනි, ඒ අනුව ඉතාම විස්තරාත්මක, ඉතාම සාධාරණ ක්‍රියාදාමයක් අපි හඳුන්වා දී තිබෙනවා වාගේම, මෙමඟින් අපේ රටේ නීති ක්ෂේත්‍රය පිළිබඳව විශ්වාසයත් ඇති වෙනවා.

මේ රටේ නීති ක්ෂේත්‍රයට, අධිකරණයේ ස්වාධීනත්වයට, ව්‍යවස්ථාදායකය සහ විධායකය විසින් අනවශ්‍ය ලෙස ඇඟිලි ගසනවාය කියන චෝදනාවක් තිබුණා. ඇතැම් අවස්ථාවල ඒක සත්‍ය බව අපි ඇඟින් දැක්කා. ඇතැම් අවස්ථාවල ඒ කරුණු අපට පිළිගන්න බැරි වුණා. නමුත් දැන් අපි මෙවැනි නිශ්චිත ක්‍රියාදාමයක් ස්ථාවර නියෝග මඟින් හඳුන්වා දීලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් සමඟ එය ගැළපීම තුළින් පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය ආරක්ෂා වනවා. මොකද, ශිරානි බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රශ්නය ඇති වුණු වෙලාවේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය ගැන අපි කථා කථා. එම උත්තරීතරභාවය තවමත් අපි රැකිමින් තිබෙනවා. හැබැයි ඒ උත්තරීතරභාවය රැකෙන්නේ පාර්ලිමේන්තුව විනිවිදභාවයෙන් යුතුව සහ නිසි කාර්ය පටිපාටියකින් කටයුතු කළොත් පමණයි, ගරු කථානායකතුමනි. ඒ අනුව මෙම ප්‍රතිපාදන මඟින් ස්ථාවර නියෝගවල කලින් තිබුණු බරපතළ අඩුපාඩුවක් සම්පූර්ණ වෙනවා. විටින් විට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු විභාගවලදීත්, ඒ වාගේම සිවිල් සමාජය තුළදීත්, දේශපාලන වේදිකාවන් තුළදීත් දිගින් දිගටම සාකච්ඡා වුණු අවිනිශ්චිතතාවක් මේ තුළින් අපි ඉවත් කර තිබෙනවා. මීට වඩා හොඳ විකල්පයක් නැති බවයි, මා ඉතාම ගෞරවයෙන් ඔබතුමාට සඳහන් කර සිටින්නේ. මේ පිළිබඳව අපේ විවිධ පක්ෂවල සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවකින් තමයි මේ පිළිබඳව සලකා බැලුවේ. අවසානයේ සියලුදෙනාගේම එකඟතාව වුණේ, මෙය තමයි අපට යා හැකි උපරිම දුර කියලායි.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ප්‍රශ්න ඇසීම පිළිබඳව අපි සංශෝධන කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. ප්‍රශ්න ඇසීමේදී කලින් අතුරු ප්‍රශ්න තුනක් අසන්න හැකියාව තිබුණා. එය අතුරු ප්‍රශ්න දෙකකට සීමා කර තිබෙනවා. ඒ පිළිබඳව අපට අත් දැකීමක් තිබෙනවා. අතුරු ප්‍රශ්න තුනක් ඇසීම නිසා මුලින් ප්‍රශ්න අසන ලද ගරු මන්ත්‍රීතුමන්ලා විශාල කාලයක් වැය කරනවා. සමහර විට ඇමතිවරුන් විශාල කාලයක් වැය කරනවා. ඒ නිසා අවසානයේ අසන ප්‍රශ්නවලට ඇති ප්‍රමුඛතාව නැති වනවා. ඒ වාගේම වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු දීමේ අවස්ථාව නැති වනවා. ඒ නිසා අතුරු ප්‍රශ්න ප්‍රමාණය දෙකක් බවට පත් කර තිබෙනවා.

විශාලතම අවකාශය ඉදිරිපත් වන්නේ ආංශික අධීක්ෂණ කාරක සභා පිළිබඳවයි. ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභා වාර්තාවේ 111 වන වන්තියේ එය දීර්ඝ ලෙස සඳහන් කර තිබෙනවා. ඒ වාගේම ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හරහා අලුත් සම්ප්‍රදායක් හඳුන්වා දීලා තිබෙනවා, නීති සම්පාදනය පිළිබඳව. මේ කාරණා ඉතාම වැදගත්. මේ කාරණා පිළිබඳව ලොකු විවාදයක් තිබෙනවාය කියලා මා හිතනවා.

ගරු කථානායකතුමනි, විශේෂ කාර්යයන් සඳහා අලුතින් කාරක සභා කිහිපයක් නම් කර තිබෙනවා. විශේෂ කාර්යයන් සඳහා අලුතින් කාරක සභා කිහිපයක් එකතු කර තිබෙනවා. විශේෂ කාර්යයන් සඳහා කාරක සභා හැටියට ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, උසස් නිලතල පිළිබඳ කාරක සභාව අපි අලුතින් එකතු කරලා තිබෙනවා. උසස් නිලතල පිළිබඳ කාරක සභාව කලින් තිබුණත්, අපි එය විශේෂ කාර්යයන් සඳහා කාරක සභා ගොනුවට එකතු කිරීමෙන් එහි තත්ත්වය වෙනස් කරලා තිබෙනවා. ඒ වාගේම ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව අපි ශක්තිමත් කරනවා. ගරු කථානායකතුමනි, අද අපි ඉදිරිපත් කර තිබෙන ආචාර ධර්ම පද්ධතිය පිළිබඳව මේ රටේ සමාජයේ විශාල අවධානයක් යොමු විය යුතුව තිබෙනවා. මේ ආචාර ධර්ම පද්ධතිය හරහා මන්ත්‍රීවරුන් සාමාන්‍ය පුරවැසියන්ටත් වඩා ආදර්ශවත්ව කටයුතු කළ යුතු බව අපි පෙන්වා දී තිබෙනවා. යම් මන්ත්‍රීවරයකු මහජන නියෝජිතයකු විධියට ජන වරමක් ලබා ගෙන මේ පාර්ලිමේන්තුවට එනවා නම්, ඒ මන්ත්‍රීවරයාට වග කීමක් තිබෙනවා; ජනතාව කෙරෙහි වග වීමක් තිබෙනවා. ජනතාවට අයිතියක් තිබෙනවා, ඒ මන්ත්‍රීවරයා පිළිබඳව දැන ගන්න; ඒ මන්ත්‍රීවරයාගේ හැසිරීම පිළිබඳව ප්‍රශ්න කරන්න. තමන් පෞද්ගලික පුරවැසියකුගේ තත්ත්වයෙන් මහජන නියෝජිතයකු බවට පත් වනවා නම්, එය තමන් ස්වේච්ඡාවෙන් කරන දෙයක්. ඒ නිසා මන්ත්‍රීවරුන්ට හැකියාවක් නැහැ, "අපේ පෞද්ගලිකත්වය ගැන සොයන්නේ ඇයි? අපේ වත්කම් ගැන සොයන්නේ ඇයි? අපේ ආදායම් ගැන සොයන්නේ ඇයි? අපේ පවුලේ සාමාජිකයන්ගේ වත්කම් ගැන සොයන්නේ ඇයි?" කියලා ප්‍රශ්න කරන්න. අපි ඒවා අත් හැරලායි මේ ධුර භාර ගන්නේ.

ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරු හැටියට අපි අද සමාජය තුළ බරපතළ ලෙස විවේචනයට ලක් වනවා. දේශපාලනඥයන් හැටියට අද සමාජයේ පිළිකුලට ලක් වනවා. අද පාර්ලිමේන්තුව සමාජයේ වෛරයට, ක්‍රෝධයට ලක්වෙලා තිබෙනවා. අද පුරවැසියා අපේ මුළු රාජ්‍ය ව්‍යුහයම පිළිකුල් කරන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. එහෙම සිද්ධ වෙලා තිබෙන්නේ, පුරවැසියා සහ මහජන නියෝජිතයා අතර ඇති සම්බන්ධය දුරස්වීමත්, මහජන නියෝජිතයාගේ කාර්යය පිළිබඳව සමාජය දැනුවත් නොවීමත්, මහජන නියෝජිතයන් ආදර්ශවත් ලෙස කටයුතු නොකිරීමත් නිසායි. ඒ නිසා අද අපි ඉදිරිපත් කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය ඉතාම වැදගත් එකක්. එහි තිබෙන කරුණු එකින් එක කියන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ පිළිබඳව යම් ආකාරයක විවේචනයක්, අදහසක් ඉදිරිපත් කළොත් ඒ සම්බන්ධයෙන් පිළිතුරු දීමට හැකියාව තිබෙනවා. අපි ඉතාම සතුටු වනවා, චර්යා ධර්ම සංග්‍රහය ඉදිරිපත් කරන්නට ලැබීම පිළිබඳව. මේ ගැන ඉතාම දීර්ඝ කාලයක් සමාජයේ කථා වුණා; මැතිවරණ වේදිකාවල කථා වුණා. අපේ යහ පාලන රජය ප්‍රතිපත්තියක් වශයෙන් මෙය හඳුන්වා දුන්නා. නමුත් අපටත් මෙය ඉදිරිපත් කරන්න වසර තුනක් ගත වුණා. ප්‍රමාද වෙලා හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය සම්මත කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ලැබීම ලොකු සතුටක්, ගරු කථානායකතුමනි. එය ඔබතුමාගේත් ජයග්‍රහණයක් බව මා කියන්න අවශ්‍යයි. විශේෂයෙන්ම ඔබතුමා මේ කාරණා පිළිබඳව උනන්දු වුණා.

ගරු කථානායකතුමනි, මා අනෙකුත් කාරණා පිළිබඳව විශේෂයෙන් සඳහන් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන්ම මෙම රාජ්‍ය මූල්‍ය පිළිබඳ වගකීම පැවරී තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවටයි. එම රාජ්‍ය මූල්‍ය පිළිබඳ වගකීම සැබෑ ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ ශක්තිය පාර්ලිමේන්තුවට ලබා දීම සඳහා වූ ප්‍රතිපාදන අපි මීට ඇතුළත් කළා. වර්තමාන රජය බලයට පත් වුණාට පස්සේ ප්‍රතිපාදන ඇතුළත් කළා; ක්‍රියාත්මක කළා. දැනටමත් ක්‍රියාත්මක වන ඒ රාජ්‍ය මූල්‍ය පිළිබඳ වගකීම, පරීක්ෂාව, අය වැය පිළිබඳ පරීක්ෂාව, පාර්ලිමේන්තුවට ලබා දෙන්නා වූ ක්‍රියාවලියක් තමයි අපි අද ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මේ රටේ පුරවැසියන්ගේ අයිතිය නියෝජනය කරන උත්තරීතර ආයතනය මේ පාර්ලිමේන්තුවයි. ඒ උත්තරීතර ආයතනය තුළ අපි වග වීමෙන් යුතුව කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ වාගේම ඒ උත්තරීතර ආයතනය තුළ අපි දැනුවත්ව කටයුතු කළ යුතුව තිබෙනවා. උත්තරීතර ආයතනය තුළ මේ රටේ පුරවැසියන් වෙනුවෙන් වූ ඒ යුතුකම ඉටු කිරීම සඳහා වූ යම් ක්‍රියා පිළිවෙතකට අපි බැඳී සිටිනවා. ඒ අනුව මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ චර්යා ධර්ම සංග්‍රහය සහ කාලයට

ගැළපෙන ලෙස නවීකරණය කරන ලද -යාවත් කාලීන කරන ලද- අපේ ස්ථාවර නියෝගත් සමඟ අපේ පාර්ලිමේන්තුවේ ශක්තිය තවත් වැඩි වන බව කියමින්, මේ සඳහා දායක වෙච්ච සියලු දෙනාට මගේ ස්තුතියත් පිරිනමමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු අජිත් පී. පෙරේරා මැතිතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, I would like to quote from today's "Daily Mirror." In the front page it states, I quote:

> "UPFA quits National Government - UPFA General Secretary Mahinda Amaraweera sent a letter in this regard to the President."

Last night we had a statement from the Deputy Speaker also on behalf of the UPFA that they have quit the Government. Now there is no National Government. I had raised this matter a couple of times and Hon. Speaker gave a reply. Hon. Leader of the House also said nothing like that has happened. But, now it has happened. So there is no Government. ඒ නිසා ජාතික ආණ්ඩුව කියන එක හමාර බව ප්‍රකාශයට පත් වී තිබෙනවා. ගරු කථානායකතුමා හැටියට ඔබතුමා සහ අපි මොන පක්ෂවල හිටියත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ දැන් ජාතික ආණ්ඩුව කියන දේ නැහැ. ඒ කාරණයට සභානායකතුමාත් එකඟ වෙයි. අපි ප්‍රශ්න අහනකොට එතුමා කිව්වා, "එහෙම එකක් වෙලා නැහැ" කියලා. දැන් එහෙම එකක් වෙලා තිබෙනවා. ඒ නිසා මම ගරු කථානායකතුමාගෙන් මේ අවස්ථාවේ දී ඉල්ලීමක් කරනවා. අනෙක් කාරණය, මෙහි කියලා තිබෙනවා, "ගරු කථානායකතුමාට දැනුම් දීලා තිබෙනවා"යි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I have no official intimation.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම අහන්නේ මේකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කිසිම ලියුමක් ලැබිලා නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
"තවදුරටත් මේ සභාගය නැත" කියලා දැන් රටටම ප්‍රකාශ කරලා තිබෙනවා. "සභාගය නැත" කියලා රටටම ප්‍රකාශ කරලා තිබියදී ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුවේ,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, පොඩ්ඩක් මට ඉඩ දෙන්න. ඔබතුමා ඊට පස්සේ කියන්න. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුව කටයුතු කිරීමේදී බොහොම ප්‍රවේශමෙන් අපේ ගෞරවය ආරක්ෂා කරගෙන කටයුතු කළ යුතුයි. ඒකයි මේ කියන්නේ. එහෙම දෙයක් සිදුවෙලා තිබෙන බව ප්‍රකාශයට පත් වී තිබෙන නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ආණ්ඩුවට කියන්න, ඒගොල්ලන් වෙනම දිවුරුම් දෙනවා නම් දිවුරුම් දීලා එන්න කියලා. එහෙම නැත්නම් මෙතැන ආණ්ඩුවක් නැති බව තමයි අපට හැඟෙන්නේ. අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු ගැන අපිට කනගාටුයි. මොකද, හරි නම් ඇමති ධුර සංඛ්‍යාව 50 ඉඳලා 30 දක්වා අඩු වෙන්න ඕනෑ. එහෙම තත්ත්වයක් යටතේ මේ අයට ඉඳගෙන ඉන්න බැහැ. මම ඔබතුමාගෙන් ගෞරවයෙන් මේ ඉල්ලීම කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන හොයලා බලන්නම්. මට නිල වශයෙන් - officially - දැනුම් දීමක් කරලා තිබුණේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා කථා කරන්න.

ඊළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පත්තරේ තිබෙන දේකට ඔබතුමාට උත්තර දෙන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අනෙක් කාරණය මෙයයි. යහ පාලන ආණ්ඩුවට -ජාතික ආණ්ඩුවට- දෙපැත්තක් තිබෙනවා. අපි තවම එම යහ පාලන ආණ්ඩුවේ ඉන්නවා. [බාධා කිරීම්] අපි තවම ඒකේ ඉන්නවා. දෙපැත්තක් තිබෙනවා නේ. [බාධා කිරීම්] අපි තවම යහ පාලන ආණ්ඩුව ඇතුළේ ඉන්නවා. පුවත් පත් ලිපියක් අල්ලාගෙන මෙතැන ප්‍රශ්න කරන්න බැහැ. Sir, there are two parties in the agreement.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අනෙක් පාර්ශ්වය කෝ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
One party cannot depute it unilaterally. There are two parties. But this is only a newspaper article.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Anyway, I will also seek some clarification on this. Thank you very much. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා. ඊට පසුව, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, -

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පොඩ්ඩක් ඉන්න. ගරු කථානායකතුමාගෙන් මම අවස්ථාව ලබාගෙන තිබෙන්නේ, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා. ගරු කථානායකතුමනි, මේ අවස්ථාව වනවිට අපේ රට තුළ එක්තරා දේශපාලන අර්බුදයක් උද්ගත වෙලා තිබෙන බව ලංකාවේ ඉන්න මිනිසුන් හැටියට අපි කවුරුත් දන්නවා. ඒ වාගේම ලෝකයත් දන්නවා.

මේ දේශපාලන අර්බුදය ආණ්ඩුව ඇතුළේ අර්බුදයක් වී තිබෙනවා. ආණ්ඩුව තවමත් පවතිනවාය කියලා කියනවා නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් නැත්නම් එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් ආණ්ඩුවට ඇතුළත්ව ඉන්නා වූ පාර්ශ්වයේ ප්‍රධානියෙක් නැඟිටලා කියන්නට ඕනෑ, "අපි තවමත් ආණ්ඩුව තියාගෙන ඉන්නවා" කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දැන් ඉල්ලීමක් කරන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම අහන ප්‍රශ්නය මේකයි. පාර්ශ්ව දෙකක් එකතු වී හදා ගත්තු ආණ්ඩුවක තනි පාර්ශ්වයකට වෙන් වෙන්න බැහැ කියන නීතිය, කැලේ නීතියක් විනා රටේවත්, ලෝකයේවත් නීතියක් නොවෙයි. පාර්ශ්ව දෙකක් එකතු වුණාම, එක පාර්ශ්වයකට ඉවත් වෙන්න පුළුවන් කියන එක ස්වභාව ධර්මයේ නීතියක්. මොනවාද මේ කියන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා. - [*Interruption.*] Hon. Wimal Weerawansa, I will give you the Floor later.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඒකාබද්ධ විපක්ෂයේ නායක වශයෙන් ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මේ ප්‍රශ්නය මේ ගරු සභාවේදී අග්‍රාමාත්‍යතුමාගේ අවධානයට යොමු කරලා, මේ ගරු සභාවේ අවධානයට කිහිප විටක්ම -දෙවරක්ම- යොමු කළා. එයට උත්තරයක් නොදී ඉන්නවා. ඉතා පැහැදිලි ලෙස එවැනි සන්ධානයක් නැති බව ලෝකයටම ප්‍රකාශ කර තිබෙද්දී, එවැනි නැති ආණ්ඩුවක් පවතින වෙලාවක විවාද කිරීමෙන් අපි දැන් කරන්නේ විහිළු සහගත වැඩක්. මේ කැබිනට් මණ්ඩලය නීති විරෝධී වෙනවා නම්, කැබිනට් මණ්ඩලයක් නැත්නම්, එය ව්‍යවස්ථාවට පටහැනි නම් ඇයි අපි මේ විධියට හැසිරෙන්නේ? මේ පිළිබඳව මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් රජයේ අනෙක් පාර්ශ්වයේ කවුරු හරි කෙනෙක්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මම ඒ ගැන ඉල්ලීමක් කරන්නම්, ගරු මන්ත්‍රීතුමා.
ඊළඟට, ගරු විමල් වීරවංශ මැතිතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, රටේ මූලික නීතිය ආරක්ෂා කරන්න මේ ගරු සභාව බැඳිලා ඉන්නවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් කර ගත්තේ, ඔය ජාතික ආණ්ඩුවක් කියලා ප්‍රධාන යැයි කියන පක්ෂ දෙක එකට එකතු වුණාට පස්සේ විශාල කැබිනට් මණ්ඩලයක් හදා ගන්න අනුමැතිය ගත්ත එකයි. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්වරයා -මහින්ද අමරවීර මහතා- නිල වශයෙන් රටට නිවේදනය කරලා තිබෙනවා, "තවදුරටත් ඒ ජාතික ආණ්ඩුව තුළ එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය වෙන්නේ නැහැ කියලා. මේ රටේ මුද්‍රිත මාධ්‍යවල, විද්‍යුත් මාධ්‍යවල මේක ප්‍රචාරයට පත් වුණා. එහෙම කියලා තිබෙන තත්ත්වයක් යටතේ, මොකක්ද තිබෙන නීතිමය බලය, නොතිබෙන ජාතික ආණ්ඩුවක ඇමතිකම් ටිකක් තියාගෙන ඉන්න? දැන් ජාතික ආණ්ඩුවක් කියලා එකක් යථාර්ථයේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒක හොයලා බලන්නම්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ -

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න. ගරු කථානායකතුමනි, මේ රටේ ජනතා ප්‍රතිචාරයක් ඇවිල්ලා තිබෙනවා. සදාචාරාත්මක අයිතියක් නැහැ, අගමැතිතුමාට අගමැති පුටුවේ ඉන්න. සදාචාරාත්මක අයිතියක් නැහැ, ජනාධිපතිතුමාට ජනාධිපති පුටුවේ ඉන්න. [බාධා කිරීම්] සදාචාරාත්මක අයිතියක් නැහැ, විපක්ෂ නායක සම්පන්දන් මහත්තයාට තවදුරටත් ඔය පුටුවේ වාඩි වෙලා ඉන්න. ලජ්ජාවක් තිබෙනවා නම්, විපක්ෂ නායකකම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට දෙන්න. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඊළඟට, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා කිව්වේ, ජන මාධ්‍යයක තිබෙන ප්‍රවෘත්තියක් පිළිබඳව අපේ අවධානය යොමු කරන්න ඕනෑ නැහැය කියලා. ගරු කථානායකතුමනි, සභානායකතුමනි, සන්ධානයේ මහ ලේකම්වරයාගේ නිවේදනයට අමතරව මේ ප්‍රවෘත්තිය ඉදිරිපත් කරලා තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායකතුමා. එය, හුදු ජනමාධ්‍ය ප්‍රවෘත්තියක්ම පමණක් නොවෙයි. ඒ පිළිබඳව නියෝජ්‍ය කථානායකතුමා තමන්ගේ නමින් නිකුත් කරපු නිවේදනයක් අපට බැහැර කරන්න බැහැ. ඒක පළමුවැනි කාරණාව.

ගරු කථානායකතුමනි, දෙවැනි කාරණාව මෙයයි. ඔබතුමා දන්නවා, අගෝස්තු මාසයේ 21වැනි දා ජාතික ආණ්ඩුවකට අවුරුදු දෙකකට ගිවිසුමක් අත්සන් කරපු බව. අගෝස්තු මාසයේ කිව්වා, 2017 දෙසැම්බර් 31වැනි දා දක්වා මේක වලංගුය කියලා. දෙසැම්බර් මාසයේ 31වැනි දා කල් ඉකුත් වෙලා අද පෙබරවාරි 19වැනි දා, ගරු කථානායකතුමනි. මෙතැන ගැටලුව තිබෙන්නේ, ජාතික ආණ්ඩුව පවත්වාගෙන යනවාද, නැද්ද කියන කාරණාවට වඩා වැඩි දෙයක්. අපි අත ඔසවලා අනුමත කරපු දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 46.(1) (අ) ව්‍යවස්ථාව අනුව කැබිනට් මණ්ඩලය 30කට සීමා වුණා. 46.(1) (ආ) ව්‍යවස්ථාව අනුව රාජ්‍ය හා නියෝජ්‍ය ඇමතිවරුන්ගේ සංඛ්‍යාව 40කට සීමා වුණා, ගරු කථානායකතුමනි. දෙකේ එකතුව 70යි. දැන් ජාතික ආණ්ඩුව නිසා කැබිනට් අමාත්‍ය ධුර සංඛ්‍යාව 30 සිට 45 දක්වාත්, රාජ්‍ය හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව 40 සිට 55 දක්වාත් වැඩි වුණා. 70ට තිබුණු එක 100 වුණා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

වැරැදියි.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

වැරැදි නැහැ. මම වග කීමෙනුයි කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක විවාදයකට ගන්න අවශ්‍ය නැහැ.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

විවාදයක් නොවෙයි, ගරු කථානායකතුමනි. මට මගේ කථාව අවසන් කරන්න දෙන්න. මැතිවරණය අවසන් වෙලා මේ මොහොත වෙන කොට දවස් හතක් ගත වෙලා තිබෙනවා. ඔබතුමා දන්නවා, දේශපාලන අර්බුදයක් තිබෙනවා කියලා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට මැතිවරණය ඉවර වෙලා දවස් හතක් ගත වෙන කල් මැතිවරණ ප්‍රතිඵල නිකුත් කරන්න බැරි වෙලා තිබෙනවා. කොටස් වෙළෙඳ පොළ ගිලා බසිමින් පවතිනවා. රුපියල අවප්‍රමාණය වෙමින් පවතිනවා. ඒ නිසා විශාල අර්බුදකාරී තත්ත්වයක් රටේ ඇති වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ කොමිසම - [බාධා කිරීම්] හම්බවෙන්න ඕනෑ.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

අපි හදන්නේ මේකට මැදිහත් වෙන්නයි; උදව් කරන්නයි. කරුණාකර, මේක තේරුම් ගන්න ගරු කථානායකතුමනි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46.(2) ව්‍යවස්ථාව අනුව අගමැති ධුරය පුරප්පාඩු වන එක් කාරණයක් තමයි ඇමති මණ්ඩලය විසුරුවා හැරීම. ජාතික ආණ්ඩුවෙන් එක් පාර්ශ්වයක් ඉවත් වුණා නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46.(1)(අ) ව්‍යවස්ථාව යටතේ ඇමති මණ්ඩලය 30 දක්වා අඩු විය යුතුයි. එහෙම වුණා නම් ගරු කථානායකතුමනි, මේ ඇමති මණ්ඩලය පවතින්න බැහැ. අගමැති ධුරය නැති වුණායි පස්සේ ආණ්ඩුවක් පවතින්නට -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ ගැන අපි සවසට විවාද කරමු. [බාධා කිරීම්]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ඔබතුමාට ස්තුතියි, ගරු කථානායකතුමනි. කාරණා කිහිපයක් කියන්න තිබෙනවා. විශේෂයෙන් ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා කියාපු කාරණාව වැරදියි. ජාතික ආණ්ඩුවක ඉන්න පුළුවන් 93දෙනාටයි. අනෙක, මේ පැවැත් වූයේ පළාත් පාලන මැතිවරණයක්. පළාත් පාලන මැතිවරණයක ප්‍රතිඵලවලින් ජාතික ආණ්ඩුව වෙනස් වෙන්නවත්, පාර්ලිමේන්තුව වෙනස් වෙන්නවත් ඕනෑ නැහැ. එහෙම නම් 2015 මහ මැතිවරණයෙන් අපි දිනුවාට පස්සේ මේගොල්ලන් ප්‍රාදේශීය සභාවලින් ඉල්ලා අස්විය යුතුව තිබුණා. ගරු කථානායකතුමනි, අද මේගොල්ලන් ජාතික දේශපාලනය ගැන කථා කරන්න පළාත් පාලන මැතිවරණය යොදා ගෙන තිබෙනවා. අද මේගොල්ලන්ට ප්‍රශ්නයක් නැහැ, ජාතික ආණ්ඩුව හදන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි, එක්සත් ජාතික පක්ෂයයි. එක්සත් ජාතික පක්ෂයයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි ජාතික ආණ්ඩුව හදන්න සූදානම් නම් මේගොල්ලන් කරදර වෙන්න ඕනෑ නැහැ. මේගොල්ලන් අද ආවේ 113 පෙන්වන්නයි. අද 113 පෙන්වන්න ආපු අයට 13 පෙන්වා ගන්න බැරිවයි ඉන්නේ. ඒ නිසා 113 පෙන්වන්න ඇවිල්ලා අද නෝන්ඩි වෙලායි ඉන්නේ. [බාධා කිරීම්] පුළුවන් නම් ඔබතුමන්ලා 113 පෙන්වන්න. ආණ්ඩුවක් හදනවා කිව්වා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා, පැය 48න් ආණ්ඩුවක් හදනවා කියලා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා ඒක කරන්න. එහෙම නැතිව ජාතික ආණ්ඩුව ගැන ප්‍රශ්න කරන්න එන්න එපා. ඔබතුමන්ලා 113 පෙන්වන්න. 113 තියා තුන හොයා ගන්නවත් බැරිවයි ඔබතුමන්ලා ඉන්නේ. ඒකයි ඇත්ත තත්ත්වය. ඔබතුමන්ලා 113 පෙන්වන්න යාම තුළ අද රට විහිළුවක් බවට පත් වෙලායි තිබෙන්නේ . [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා. [බාධා කිරීම්] අපි දැන් ප්‍රධාන කටයුතුවලට යන්න අවශ්‍යයි. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් පස් වරු 4.00ට විවාද කරන්න පුළුවන්. මා ඔක්කෝටම අවස්ථාව දෙන්නම්. ඉතා වැදගත් කරුණක් දැන් සාකච්ඡා කරන්න තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, පස් වරු 4.00ට මේ ගැන සාකච්ඡා කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, පස් වරු 4.00ට සාකච්ඡා කරමු. දැන් සභාවේ වැඩකටයුතු කරගෙන යන්න තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් මතු කරන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

You will be given a three-hour Debate. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, මොකක්ද රීති ප්‍රශ්නය? [බාධා කිරීම්] I cannot give you the Floor now. We have to continue with this Debate. රීති ප්‍රශ්නයක් නම් අවස්ථාව දෙන්නම්. ඊට පස්සේ සභාවේ වැඩ කටයුතු කරගෙන යන්න ඕනෑ. [බාධා කිරීම්] මොකක්ද, රීති ප්‍රශ්නය?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, microphone එක දෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Microphone එක දීලා තිබෙන්නේ. ඔබතුමා රීති ප්‍රශ්නය මතු කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව පළාත් පාලන මැතිවරණයකින් ආණ්ඩුවට මෙහෙම බඩ ගියා නම් මහ ඡන්දයක් ආවොත් කොහොම - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. [බාධා කිරීම්] The Hon. Leader of the Opposition, this is your turn to speak on the Debate on the Standing Orders.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
( மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා point of Order එකක් raise කර තිබෙනවා. ඒකට පිළිතුර දීලා අවසානයි ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අවසානයි. දැන් අපි ප්‍රධාන කටයුතුවලට යනවා. මේ කරුණ සම්බන්ධයෙන් විවාදය තිබෙනවා, පස් වරු 4.00 සිට පස් වරු 7.00 දක්වා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

දැන් භය වෙලාද ඉන්නේ?

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
( மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

නැහැ, නැහැ. අපට කිසි භයක් නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පස් වරු 4.00ට මේ සම්බන්ධයෙන් පැය තුනක විවාදයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. පැය තුනක විවාදයක් තිබෙනවා.[බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
There is an Adjournment Debate at 4.00 p.m. So, we can debate at that time.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු කථානායකතුමනි, රටේ තිබෙන වාතාවරණය ගැනයි මෙතැනදී කථා කරන්නේ. දැන් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා point of Order එකක් raise කළා. ඔබතුමාගෙන් ඒකට පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට මොනවත් ලිඛිතව දැනුම් දීලා නැහැ.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, මොකක්ද රීති ප්‍රශ්නය?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා රීති ප්‍රශ්නයක් නැඟුවා. ඒ පිළිබඳව මාධ්‍යයට දැනුම් දීලා තිබෙන්නේ නියෝජ්‍ය කථානායක ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමායි. ඔබතුමා එතුමාගෙන් ඇසුවා නම් උත්තරයක් දේවි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි මා ගන්න හදන්නේ. මම දැනටමත් කියා තිබෙනවා, හොයා බලා වාර්තා කරන්නම් කියලා. Okay.

The next speaker is the Hon. M.A. Sumanthiran. - [*Interruption.*]

මොකක්ද? [බාධා කිරීමක්] කරුණාකරලා නැවත වරක් කියන්න, ගරු මන්ත්‍රීතුමා. මොකක් හෝ පැහැදිලි කිරීමක් කර ගන්න ඕනෑ මොන පාර්ලිමේන්තුවෙන්ද? [බාධා කිරීම්] මේක ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව. නැඟිටලා කථා කරන්න. [බාධා කිරීමක්] මොකක්ද? [බාධා කිරීමක්] නැඟිටලා කථා කරන්න. [බාධා කිරීම්] මොනවා හෝ දෙයක් කියන්න තිබෙනවා නම් අවස්ථාව දෙන්නම්. මොකක්ද?

**ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த பெரேரா)
(The Hon. Sanath Nishantha Perera)
ඔබතුමා අගමැති වෙනවාය කියලාත් දැනගන්න ලැබුණා. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. මම ඉල්ලුම් කරලා නැහැ. [බාධා කිරීම්] අගමැති කෙනෙක් ඉන්නවා. [බාධා කිරීම්] The Hon. M.A. Sumanthiran, please.

[11.31a.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Hon. Speaker.

As we consider the new Standing Orders and the Code of Conduct for Members of Parliament, it seems ironic that we are discussing these two documents which are important for the conduct of Business of Parliament on a day when there seems to be so much uncertainty in the country with regard to the Prime Minister, the Cabinet and the Government et cetera. But, for the orderly conduct of Business in this House, when the Hon. Dinesh Gunawardena rose on a point of Order this morning, consequent to a letter given to the Hon. Speaker, the Committee on Parliamentary Business in a very orderly manner took the decision to debate that issue from 4.00 p.m. today for three hours. That is a testimony to the fact that amidst even such a situation, where there is so much uncertainty, the Business of Parliament is being conducted in an orderly manner according to the prevailing Standing Orders and so in some sense this is an opportune moment to debate this document that has been prepared with a lot of care, as the Hon. Ajith P. Perera said, when he introduced the documents.

The Committee on Standing Orders has done a tremendous job. As I joined the previous Parliament - the Seventh Parliament - I was on the Committee on Standing Orders even during that time and under the Chairmanship of the then Speaker, the Hon. Chamal Rajapaksa, we met many times to review and to redraft anew Standing Orders of Parliament. Unfortunately, that effort was not concluded during that Parliament's tenure, but I am glad that within two-and-a-half years of the Eighth Parliament, it has been possible to present this set of Standing Orders and also the Code of Conduct for Members of Parliament.

It is often when there is uncertainty and weakness in government that good legislative measures are taken. As I

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

said when I started, it is ironic that we debate this today, that is yet another irony that it is only when the Government seems weak, that progressive and legislative measures become possible. There are many examples in this country itself. The Seventeenth Amendment to the Constitution is one example, but I think the supreme example is the Nineteenth Amendment to the Constitution. Then it was a minority government and the number of Hon. Members of that government was so low and yet it was possible to enact the Nineteenth Amendment to the Constitution with only one Member voting against it. When the government seems weak, that is when it seems that consensus is possible.

That is why I say today may be an opportune day to actually adopt these new Standing Orders that have been presented to the House on a day when the country and even this Parliament seems unsure as to what governance will look like tomorrow in this country. These Standing Orders have been prepared by this Committee as I said across party divides and has brought in a number of progressive measures.

Firstly, it was necessary to have a new set of Standing Orders because the one that we are working with even today is so old that most of those provisions had even become obsolete and unworkable. A Parliament which functions on the British Parliamentary traditions could always rely on tradition and we have been able to go on whenever there was a *casus omissus* to rely on the practice of the British Parliament and successive Speakers have been able to give rulings that have generally been accepted by the country and elsewhere as correct rulings and the dignity of this House had been maintained up to now. Yet, it has become necessary to review, to reform and renew the Standing Orders by which Parliament must work.

More importantly, a Code of Conduct for Members of Parliament has also been placed before the House. This was a promise given by the National Unity Government. It was an electoral pledge by the new dispensation that was brought in from January, 2015 to August 2015. It may be important today to just look back on that two-and-a-half or three-year period and even pat ourselves on our backs for the number of progressive legislative measures that this Parliament was able to enact.

After the Nineteenth Amendment, the Right to Information Act - Mr. Speaker, you were the force behind it even when you were in the Opposition- was brought into operation. That has revolutionized transparency in governance in this country. That is a fact. Today, as I speak, it may seem that what was achieved or what has been going on for the last two-and-a-half to three years may have come to an end or is a failure. But the fact is that many of the legislative measures that were adopted have gone forward, have been very progressive. The democratic reforms must be acknowledged.

One important democratic reform is strengthening of Parliament and it is to that end that the new Sectoral Oversight Committees have been brought in. I agree with the Hon. Ajith P. Perera that this whole concept of a Sectoral Oversight Committee system, which seems even today alien to us, is an important measure in strengthening Parliament - Parliament's oversight. Therefore, although many Ministers and other Members seemed dissatisfied with this and the committee system that prevailed before this, which was Consultative Committees, is what they want, I would urge the House to look at this slightly differently. You can have Consultative Committees, I am not opposed to that. But, that is a very different issue to the setting up of Sectoral Oversight Committees. It is through the Oversight Committees that Parliament actually, in effect, exercises even legislative control, where it is possible for Members in Committees to consider legislative measures that are brought in, various other matters that are referred to those Committees and unless there is a committee system through which this oversight is exercised, merely debating it in the House, in public, when Members are grouped in sharply divided compartments of their respective political parties, will not bring about much good. So, as we all know, it is in the Committees that a lot of constructive work is done and therefore, the introduction of Oversight Committees is a very, very important step - a progressive step - that was taken by this Parliament. Even without amending the Standing Orders, by Resolution of this House, those were set up and now, today, it is being brought in into the Standing Orders and that is to be welcomed. I know there is an amendment that may be moved to retain the functioning of the Consultative Committees as well. That can happen and that is a totally different issue altogether. But, I want to impress on the Members not to compare the two, even in this Debate today, because we hear this all the time. Those who want the Consultative Committees revived keep attacking the Sectoral Oversight Committees, particularly the Ministers.

Actually, Sectoral Oversight Committees, as the name itself suggests, is an oversight function and understandably Ministers are not too much in favour of that. But, if we are serious about strengthening the institution of Parliament, then Oversight Committees are an essential feature of that. As the Hon. Ajith Perera also mentioned, a new Committee, the Pubic Finance Committee, which I have the honour of chairing for the present, has been entrusted with Parliament's special function of exercising total control over public finance. That is there in the Constitution, but we saw how ineffective that was in actual practice. But, here is an opportunity now, through the working of that important Committee, that Parliament's important role of being the sole authority, one who exercises the sole control over public finance, to exercise it in a meaningful way.

There are many more measures that need to be taken, particularly the Parliamentary Budget Office which is essential for the functioning of that Committee and also for various other reasons of advising the Members of Parliament with regard to Budgetary procedures and generally with regard to public finance. Unfortunately, the legislation in that regard has also got delayed. But, I hope, very soon, in the next few months, we would be

able to set that up as an independent office that is not attached to the Ministry of Finance but something that comes within the control of Parliament, something that functions independently to be able to advise this House, not the Government, on very acutely technical matters with regard to finance so that the Members of this House can involve themselves in intelligent debate.

I want to also refer to the other important matter that the Hon. Ajith Perera referred to, and that is the removal of judges. This actually came to a head as he said with the removal or the purported removal of the Chief Justice of that time, Dr. Shirani Bandaranayake. But, it did not begin at that time. The very first impeachment of a judge -which was also of a Chief Justic - was Neville Samarakoon and Parliament did it through a Committee appointed for that purpose. Then itself this issue arose. Unfortunately, the Hon. Dinesh Gunawardena is not in the House at the moment. The Hon. Anura Bandaranaike and the Hon. Dinesh Gunawardena gave a dissent stating that the inquiry procedure by Members of Parliament, particularly over those who exercise judicial function was not desirable. Unfortunately, that was not rectified. It had to be rectified. Even now, I wish to state that brining in the new Standing Order provisions in that regard are not sufficient, because in Article 107 of the Constitution, as interpreted by the Supreme Court as well, there are certain segments of that procedure that must be prescribed by law and not by Standing Orders. Standing Orders recognize that. It says that law in that regard must be enacted, and I hope that that is enacted.

Again, the crucial factor to be considered in this is the independence of that inquiry panel much more than anything else. I would say even more than what is invariably referred to as the "supremacy of Parliament", it is the independence of that inquiry panel that needs to be considered. It is a mistaken notion to say that Parliament is supreme. Perhaps under the First Republican Constitution that was true. But under the present Constitution it is the Constitution that is supreme; the Constitution says so. Parliament is supreme in the functions that have been delegated to Parliament - in the legislative functions. Of course, Article 4 (c) of the Constitution states that the judicial power of the people is also exercised by Parliament through courts, except when it is in connection with the powers and privileges of Parliament or Members of Parliament.

The removal of a judge or inquiry into allegations of misconduct or incapacity of a superior court judge is not a matter that comes within the purview of powers and privileges of Parliament or its Members. That is, yes, a judicial power exercised by Parliament, but through courts. That is where a mechanism that is consonant with that principle where the inquiry procedure is a fair procedure and is in accordance with laws of natural justice, laws of procedural fairness et cetera must be strictly complied with. It is for that reason that retired Judges of the Supreme Court have been suggested or prescribed in the Standing Orders, that three of those persons must be appointed by the Speaker in consultation with the Prime Minister and the Leader of the Opposition, so that there is a bipartisan view as to who constitutes that panel.

But, I would urge that in regard to this matter, the House actually considers employing judges from other countries. When I say this, there will be reaction automatically in the House saying that we are allowing foreign interference and so on. This seems an unnecessary fear that many Hon. Members have. After all, our judges function in many foreign jurisdictions. Even while they are judges here, they have been given leave and they function in courts elsewhere. Our Supreme Court Judges have conducted inquiries into the conduct of other judges in other jurisdictions. In Malaysia, for instance, Justice Mark Fernando and Justice Parinda Ranasinghe have, with distinction and acceptance, played that role. No doubt we are an island and perhaps that island mentality sometimes overcomes us. But, we are a country which is a part of a community of nations - a civilized group of countries. If we are so paranoid all the time to the extent that we cannot accept independent advice and assistance from others around us, then we will not make much progress. So, I urge the House to keep aside this unnecessary paranoia and look to what is good, what is ideal and what is sought to be achieved - which is independence. There is a criticism on what has been formulated here, saying even if you say “retired judges”, it may be judges who retired recently, so it may be judges who have actually worked with the accused judge and there can be lack of independence et cetera. But, if you actually take it away from the country, you can achieve the objective of an independent inquiry.

That is the most important thing because we are talking about judges of the superior courts: the Chief Justice and other Judges of the Supreme Court, the President and the other Judges of the Court of Appeal. The Supreme Court is the apex court and the Court of Appeal exercises the other superior court’s functions. If we are to strengthen the independence of the Judiciary, the judges of the superior courts must be able to function without fear of interference into their activity, not only by the Executive, but also by the Legislature, because that is the institution which is at the vanguard, that is the institution which actually protects, that is beyond the political vicissitudes and that is the one that people can repose their confidence in. So, so much more for persons who occupy positions in those courts, that they should know when their matter comes up or there is an allegation against them, that the procedure that is in place to inquire into that is no second to the judicial system that we have for any other citizens.

That is where we failed with regard to the inquiry into the alleged misconduct on Dr. Shirani Bandaranayake - the hasty way in which the Select Committee of Parliament functioned; the manner in which 16 witnesses were examined in one night and the fact that by 8.00 a.m. the next morning a Report was ready and tabled in this House. An almost humanly impossible task had been performed. That mighty rush showed up the flaws in that procedure and that too, in respect of the Chief Justice of the country. So, that is why this was brought into sharp focus. At that time, I remember, as an Opposition Member, the Hon. (Dr.) Wijeyadasa Rajapakshe introduced a Private Members’ Bill on the removal of judges. There, he proposed, where it is the Chief Justice,

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

to invite sitting judges from other jurisdictions to constitute that panel of inquiry. So, this is something that many countries, particularly in the Commonwealth - we say the Commonwealth because at least within the Commonwealth, judicial systems are comparable - practise and in most instances, we function with the same principles. Therefore, it becomes easier for judges from other jurisdictions to perform that function.

Now, we already have this in our system. Where commercial disputes or even other disputes are concerned, the Arbitration Act, in Section 5, permits that. We participate in international arbitrations. International arbitrations take place in this country, where panels of arbitrators from other countries come and sit and they make awards. Those have to be implemented through the court system in this country even today. You cannot set aside an arbitral award on the basis that there is a foreigner who is an arbitrator. You can set it aside only on three very narrow grounds that go to the root or the jurisdiction of that arbitral panel. So, when it is possible, when it is all right to have commercial disputes settled by persons who are not citizens of this country, foreigners who form arbitral tribunals, why is it anathema to have judges from other jurisdictions to ensure independence? So, this is a matter that I would urge the House to consider as a very important aspect.

The other issues are with regard to the Code of Conduct for Members of Parliament. I want to highlight one or two matters particularly with regard to the duty of disclosure by Hon. Members of Parliament. When that disclosure is done, the country will know when an Hon. Member of Parliament speaks or acts in this House, what conflict he or she suffers from. That disclosure is made well in time. So, Hon. Members' interests in contracts, companies and in various other activity must be disclosed beforehand, so that whenever some issue arises in connection with something that the Hon. Member is otherwise connected to, the disclosure is already made. As it is, the duty is cast on us to make that disclosure. It is not that we cannot participate, but we must make the disclosure. But, if there is a conflict, then we must desist from functioning.

It is not only that, it is also with regard to order being maintained in Parliament that the new Code of Conduct together with the Standing Orders now provide for stricter punishment. It is unfortunate that those provisions had to be made in order to enforce discipline. But, as we all know, even in this Parliament, there have been incidents which we all are ashamed of, which ought not to have happened, but still happens and even very recently it happened. So, it has become necessary, I think, in order to enforce a certain measure of discipline without actually violating the freedom that Hon. Members have to express themselves, not only in speeches, but in various other ways. But yet, for the orderly conduct of Business of the House, these measures are important.

Sir, I commend the Report of the Committee on Standing Orders and the Code of Conduct for Members of Parliament and I hope this House will adopt it today with necessary adjustments and amendments that the Hon. Members propose. It is important that we send a message to the country today, Sir, that amidst this speculation, amidst this uncertainty that this House is still able to function and has, in fact, conducted a business which is very important for democracy, transparency and a strong legislature.

Thank you.

[අ.භා. 12.02]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife and Minister of Buddhasasana)

ගරු කථානායකතුමනි, අද දවස මගේ ජීවිතයේ බොහොම සතුටු වෙන දවසක්. මොකද, මම "අ" යන්නේ සිට දේශපාලනයට ආපු කෙනෙකු නිසා. මගේ දේශපාලන ජීවිතය ආරම්භ කළේ ගම් සභාවෙන්, 1968දී. මේ උත්තරීතර සභාවේ කිසිවෙකුට මට ඇඟිල්ලක් දිගු කර චෝදනාවක් කරන්න බැරි ආකාරයට ප්‍රජාතන්ත්‍රවාදීව මේ පාර්ලිමේන්තුවෙන් මම දෙවරක් අයින් වුණා.

1977දී ජේ.ආර්. ජයවර්ධන රජයේ මන්ත්‍රීවරයකු විධියට මම පාර්ලිමේන්තුවට පැමිණියා. එදා මේ රටේ ආර්ථිකය වහලා දමලායි තිබුණේ. 1977 යුගයට කලින් හාල් පොලු දමා තිබුණා. එදා කෙනෙකුට හාල් සේරු දෙකයි ගෙනියන්න පුළුවන් වුණේ. ඒ නිසා නිදහස් ආර්ථිකයෙන් මේ රට දියුණු කරනවාය කියලා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ලෝකයට අපේ රට විවෘත කළා. ඒ නිසා මේ රටේ විශාල සංවර්ධනයක් ඇති වුණා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට පිංසිදු වෙන්න වික්ටෝරියා, රන්දෙනිගල, කොත්මලේ වැනි ජලාශ ඒ යුගයේ හැදුණා. ඒ යුගය නොවෙන්න ඒවා හැදෙන්නේ නැති වෙන්න තිබුණා. ඒ වාර්තාවේ තිබුණේත් ඒ ව්‍යාපෘති අවුරුදු තිස්දෙකකින් කරන්න කියලායි. ඒ වෙලාවේ එතුමා, මගේ ජීවිත කාලය තුළදී, අවුරුදු අටකින් ඒ ව්‍යාපෘති අවසන් කරන්න කියලා තමයි ගාමිණී දිසානායක මැතිතුමාට ඒ වගකීම භාර දුන්නේ. අන්න! නායකත්වය. එතුමා ඒ විධියට තීරණ අරගෙන ක්‍රියා කළා. එතුමා පුළුවන් තරම් බලය විමධ්‍යගත කරන්න තීරණය කළ කෙනෙක්. විනය ආරක්ෂා කරන්න බොහොම තදින් ක්‍රියා කරපු කෙනෙක්. එතුමාගේ ඒ යුගයේදී මමත් දිසා ඇමති කෙනකු විධියට කටයුතු කළා. අපේ රටේ දිස්ත්‍රික්ක 24ට දිසා ඇමතිවරු හිටියා. එදා යූ.බී. විජේකෝන් මැතිතුමා වැනි බොහොම වැදගත්, තැන්පත් කෙනෙක් යාපනය දිසාවට පත් කළා. මම කුරුණෑගල දිසා ඇමතිවරයා විධියටයි හිටියේ.

1988 දකුණේ භීෂණය පැවැති කාලයේ මම පාර්ලිමේන්තුවෙන් අස් වුණේ ඇයි? මගේ සහෝදර මන්ත්‍රීවරු, ඇමතිවරු කිව්වා, "උඹ පිස්සෙක්. අයින් වෙන්න එපා" කියලා. ජීවිතය කියන්නේ අභියෝගයක්. ගරු කථානායකතුමනි, අනුන් කියන දෙයක් කරන්න නොවෙයි මහ ජනතාව අප පත් කරන්නේ. මහ ජනතාව තමන්ගේ ඥානයට අනුව ජනතා නායකයකු විධියට, සේවකයකු විධියට අප පත් කළා නම්, අලුත් දර්ශනයක්, සිතිවිල්ලක් ක්‍රියාත්මක කරලා මේ රටට, පොළොවට, ගහකොළට, සතා සීපාවාට, ජාතියට, ජනතාවට ලාංකිකයකු විධියට සේවය කරන්න ඕනෑ. ඒ සඳහායි ඔවුන් අප පත් කරන්නේ.

ගරු කථානායකතුමනි, 1988දී මම මන්ත්‍රීකමින් අස් වුණේ අභියෝග දෙකකට මුහුණ දෙන්නයි. එක අභියෝගයක් තමයි, එදා තිබුණු භීෂණය. අද ඔවුන් ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන සමාජ ක්‍රමයට පැමිණ තිබෙනවා. ඒ එක්කම මට තිබුණු අනෙක් අභියෝගය තමයි, මේ පළාත් සභා ක්‍රමය හරි කියලා වයඹ පළාත දියුණු කර පෙන්වීම.

උතුරු පළාතේ අපේ සහෝදර මන්ත්‍රීවරු මේ ගරු සභාවේ ඉන්නවා. පළාත් සභාවලට අසීමිත බලයක් තිබෙනවා. ඒවාට බලය නැතිවා නොවෙයි. "නටන්න බැරි මිනිහාට පොළොව ඇදයි" වාගේ කථාවක් තමයි පළාත් සභා ගැන මේ කියන්නේ. මගේ පළාත් සභාවට වෙනම සල්ලි දුන්නේ නැහැ. එදා හිටපු නිලධාරින්ගේ ශරීරය විතරයි එහේ තිබුණේ. ඔවුන්ගේ මනස තිබුණේ කොළඹ, අමාත්‍යාංශයේ. නමුත් ඒ පළාතට ඒ සේවාව කරන්න මට පුළුවන් වුණේ අභියෝගයක් අරගෙන වයඹ පළාත දියුණු කරන්න මා ගෙන ගිය වැඩ පිළිවෙළ නිසායි.

මම විනය කියන එක විශ්වාස කරන කෙනෙක්. මම අවංකත්වය කියන එක විශ්වාස කරන කෙනෙක්. ගරු කථානායකතුමනි, කවුරු හරි මගෙන් ඇහුවොත් මේ රටේ තිබෙන්නේ මොනවාද කියලා මම කියනවා, "සෑම සම්පතක්ම, සෑම දෙයක්ම තිබෙන ලෝකයේ වාසනාවන්තම භූමිය ශ්‍රී ලංකාද්වීපයයි." කියලා. ගරු කථානායකතුමනි, අපේ රටේ නැත්තේ මොනවාද කියලා කවුරු හරි මගෙන් ඇහුවොත් මම කියනවා, "අපේ රටේ නැත්තේ අවංකකමයි, කැපවීමයි" කියලා. අවංකකමයි, කැපවීමයි හදාගෙන අප තුළ විනයක් ඇති කරගන්න පුළුවන් නම් සුළු කාලයකින් මේ රට හදනවාය කියන එක එච්චර දෙයක් නොවෙයි. ඒ සඳහා විනයයි, කැපවීමයි, අවංකකමයි තිබෙන්න ඕනෑ. අපි පාලකයන් විධියට ඒවා දියුණු කරගන්න ඕනෑ. ඒ කරුණ මම දැඩි ලෙස විශ්වාස කරනවා. මගේ නිලධාරිනුත් රාත්‍රී 10.00 පමණ වන තුරු වැඩ කරනවා. ඒ ගැන මට ආඩම්බරයෙන් කියන්න පුළුවන්. ඇයි ඒ විධියට ඔවුන් වැඩ කරන්නේ? අපි ඒ තැනට ඒ අයගේ මනස වෙනස් කරන්න ඕනෑ. අපට හදන්න තිබෙන්නේ ඔවුන්ගේ මනසයි. මිනිසාගේ මනස හදන්නේ නැතිව අපට කවදාවත් සමාජයක් හදන්න බැහැ.

ගරු කථානායකතුමනි, ඔබතුමා කොළඹ පුරපතිවරයා වෙලා හිටියා. මම වයඹ පළාතේ ප්‍රධාන ඇමතිවරයා විධියට වැඩ කළා. අපේ පක්ෂයත් භේද වෙලා කැඩිලා ගිහිල්ලා රාජාලියා ලකුණින් පක්ෂයක් ආරම්භ කළ යුගයක් තිබුණා. ඒ නිසා අපි කාලයක් දුක් වින්දා. ගරු කථානායකතුමනි ඔබතුමාට මතක ඇති, 1988දී පක්ෂයේ නාමයෙන් මට පාර්ලිමේන්තුවෙන් අස් වෙලා පළාත් සභාවේ මහ ඇමති තනතුරට තරග කරන්න කියපු බව. එදා මගේ මුළු අනාගතය සම්පූර්ණයෙන්ම පරදුවට තියලා කිව්වා, "හොඳයි, පක්ෂය වෙනුවෙන් මම ඒ තීරණය ගන්නම්." කියලා. මට නොයෙක් තර්ජන එයි. නමුත්, වයඹ පළාත ජයග්‍රහණය කරලා එක්සත් ජාතික පක්ෂය බලයට ගේන්න පුළුවන් වෙයි කියලා මම කිව්වා. ඒ අවස්ථාවේ මහා භයානක භීෂණයක් තිබුණා. එදා ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට කළු ලපයක් දුන්නා. ඒ මැතිවරණයේදී ඡන්ද පෙට්ටි පිරෙව්වා. ගරු කථානායකතුමනි, ඒ පළාත් සභාවේ ඒ නින්දිත, ජරා විපක්ෂ නායක පුටුවට අවුරුදු එකහමාරක් මම ගියේ නැති බව ඔබතුමා දන්නවා. මම ගෙදර හිටියේ. මම පාර්ලිමේන්තුවට ආවෙත් නැහැ. මම එහෙම කළේ මොකද? මම ජනතාව -ඡන්දදායකයා- උතුම් කොට සලකන නිසා. මම කිව්වා, "ඡන්දදායකයාගේ ඡන්දය උදුරා ගත්ත නිසා මම පළාත් සභාවට යන්නේ නැහැ." කියලා. අපේ නායකතුමා මට ඒ අවස්ථාවේදී බල කළා. ඒ වෙලාවේ මම කිව්වා, "එහෙම නම් මම පක්ෂයෙනුත් අයින් වෙනවා. මගේ වැඩ කරගෙන ගෙදර ඉන්නම්. මට බල කරන්න එපා." කියලා. මොකද, ඒක මගේ ප්‍රතිපත්තිය නිසා.

ගරු කථානායකතුමනි, අද දිනයේ අපි ඓතිහාසික යෝජනා දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. මේ උත්තරීතර සභාවේ යම් යම් අභ්‍යන්තර ඇති කළාට, මම පැහැදිලිව කියනවා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිවරයා ලෙස බහුතරයක් එක්ක මේ පාර්ලිමේන්තුව තුළ හිඳිමින් ඉතා වැදගත් යෝජනා දෙකක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන බව. ඒ නිසා අද ඓතිහාසික දිනයක්. අපි 2020 දක්වා මේ පාර්ලිමේන්තුව ගෙනිහිල්ලා මේ රටේ ප්‍රශ්න විසඳන්න කටයුතු කරන්න ඕනෑ.

මොනවාද මෙතැන තිබෙන ආචාර ධර්ම පද්ධතිය? ගරු කථානායකතුමනි, ඔබතුමා තොරතුරු දැනගැනීමේ පනත ගෙනාපු වෙලාවේත් ඔබතුමාට සැලකුවේ කොහොමද කියලා ඔබතුමාට මතක ඇති. එදා ඔබතුමාට ඒක ගෙනෙන්න දුන්නෙත් නැහැ. අද මේ ආචාර ධර්ම පද්ධතියත් එක්ක අපේ ස්ථාවර නියෝගත් සංශෝධනය කරලා ඉදිරිපත් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ජීවිතයේ ලද සතුටු දිනයක් විධියටයි මම අද කථා කරන්නේ. ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් භේදයකින් තොරව මේ මහත්මාකම, මේ වැදගත්කම තේරුම් ගෙන මේ උත්තරීතර සභාවේ කටයුතු කළ යුතුයි. අපි මහජනතාවගේ සේවකයෝ. අපි පාලකයෝ නොවෙයි. අපි කවුරුත් අන්න ඒ බව මතක තියා ගන්න ඕනෑ. අප මේ තැන්වලට පත් කළ මහජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු වගකීම් හා යුතුකම් බොහොමයක් අපට තිබෙනවා.

ආණ්ඩු පක්ෂය යුතුකම් හා වගකීම් ඉටු කරන අතරම, විපක්ෂය මෙතැනට ඇවිත් නොයෙකුත් හිරිහැර කරලා මේ රට, මේ පාර්ලිමේන්තුව නින්දිත තත්ත්වයට පත් කරන එක නොවෙයි තිබෙන යුතුකම. අපට සංවරයක් ඇතිව උද්ඝෝෂණය කළ හැකියි. පාර්ලිමේන්තුවට ඇවිත් කථා කළ හැකියි; වාද විවාද කළ හැකියි. නමුත් ඊට එහා ගිහින් යම් යම් සිදුවීම් ඇති වෙනවා දකිද්දී රට විතරක් නොවෙයි, ලෝකයේම ජනතාවගෙන් සමච්චලයට පත් වන්නේ අපේ මේ උත්තරීතර සභාවයි. මේ සිදුවීම් අපි නවත්වන්නට ඕනෑ. අපි මේ පාර්ලිමේන්තුව, මේ රට ඉදිරියට ගෙනයන්න ඕනෑ. එසේ ඉදිරියට ගෙන යන්න නම්, අපි නිවැරදි පිළිවෙතකට යන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, මට අද උදේ තමයි කිව්වේ, මේ විවාදයේ දී කථාවක් කරන්න කියලා. මම කිව්වා," හොඳයි, මම කැමැතියි" කියලා. මම අද කථා කරන්නේ එදා යුගයේ සිට මා දකින විධියට අද මේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පතත් සමඟ ගෙනැවිත් තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහය තුළින් ඔබතුමා කථානායකතුමා ලෙස මුලසුනේ ඉඳගෙන හදවතේ සන්තෝෂයෙන් හොඳ ක්‍රමයක්, හොඳ වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවා. මේ අනුව මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් ඔබතුමා තදින් නීතිය ක්‍රියාත්මක කරන්න. ආණ්ඩු පක්ෂයේ වෙන්නට පුළුවන්; විරුද්ධ පක්ෂයේ වෙන්නට පුළුවන්. ඔබතුමා ඔය පුටුවේ ගරුත්වය ආරක්ෂා කරන්න ඕනෑ. එසේ නැත්නම් මේ කටයුත්ත කරන්න බැහැ. ප්‍රජාතන්ත්‍රවාදයේ ශක්තිය තිබෙන්නේ එතැනයි. ප්‍රජාතන්ත්‍රවාදයේ ශක්තිය ඇති කරන්න නම් අලුතෙන් දේශපාලනයට එන්න ඕනෑ කුඩුකාරයෝ නොවෙයි. එවැනි දේවලට ඇබ්බැහි වෙච්ච අය නොවෙයි. ගම් සභාවෙන් ආපු මම පළාත් පාලන ආයතනවල ඡන්දය ගැන කථා කරලා වැඩක් නැහැ. ඒ වාගේත් උත්තරීතර අනාගතයක් හදන්න පුළුවන් අය ඉන්නවා. පළාත් සභාවලටත් එහෙම අය එන්න ඕනෑ. විනයගරුක පාලකයෝ, ජනතා සේවකයෝ විධියට රටේ අනාගතය හදන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මම පැහැදිලිව කියනවා, මේ පාර්ලිමේන්තුව තුළ අපට ඕනෑ, පිරිසිදු දේශපාලනයක්. පසුගිය කාලය තුළ මෙම පළාත් පාලන මැතිවරණයේදී මගේ කටුගම්පල

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

ඡන්දදායකයින්ට මා කිව්වා, "මම දේශපාලනයෙන් අයින් වෙන්නේ, මේ පාර්ලිමේන්තුව ශුද්ධ භූමියක් කරලා" යි කියා. මම ඒක පැහැදිලිව කිව්වා. මෙතැන ශුද්ධ භූමියක් කරන්න යද්දී එක්සත් ජාතික පක්ෂය ගැන චෝදනා එන්න පුළුවන්. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ පක්ෂයේ ඉන්න අය ගැන චෝදනා එන්න පුළුවන්. අනෙක් පක්ෂවල අය ගැන චෝදනා එන්න පුළුවන්. මම තරාතිරමක්, නම් ගම් කිසිවක් කියනවා නොවෙයි. චෝදනා තිබෙනවා නම්, නීතියෙන් අධිකරණයට ගෙනෙන්නට ඕනෑ, අනාගතයේදී මේ රටේ එවැනි දේ නොවෙන්න. ඒවා ශුද්ධ කරන්නට ඕනෑ. එසේ ශුද්ධ නොකර වහන්න හදනවා නම්, මම ඒවා ගැන කෙළින්ම ප්‍රකාශ කරන කෙනෙක් විතරක් නොවෙයි, මම කෙළින්ම එළියට බහින කෙනෙක්. ඒ විධියට ඒ අංශය ක්‍රියාත්මක වෙනවාය කියන එක මම කියනවා.

ගරු කථානායකතුමනි, මම දේශපාලන ජීවිතයට ආවේ නාලන්දයේ ඉඳලා, සර්වෝදයේත් කටයුතු කරලාය කියන එක ඔබතුමා දන්නවා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත් එදා රෝයල් කොලේජ් එකේ ඉඳලා සර්වෝදයේත් කටයුතු කර ඉදිරියට ආව කෙනෙක්. එහෙම නේද ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි? ඔබතුමාගේ පියා උත්තම පියෙක්. මම බොහොම ගරු කරනවා. අපේ අරමුණ වෙන්න ඕනෑ, කොළ, කහ, නිල් වශයෙන් පාට අනුව වැඩ කිරීම නොවෙයි. අපි මෙතැනට ආව අරමුණ ඉෂ්ට වෙන්නට ඕනෑ. අපි මේ ගරු සභාව උත්තරීතර කර ගනිමු. ආගම් වාද, ජාති වාද, කුල වාද මතු කරලා ආයෙත් මේ රට විනාශ කරන්න ඉඩ දෙන්න එපා. අපේ ජනතාව කාලයක් ඒකෙන් බැට කාලා, සිංහල අය අනාථ කඳවුරුවල හිටියා. දෙමළ අයත් අනාථ කඳවුරුවල හිටියා; මුස්ලිම් අයත් අනාථ කඳවුරුවල හිටියා. රටක දියුණුවක් ඇති කර ගන්න එහෙම බැහැ. විපක්ෂ නායකතුමාට මම ගරු කරනවා. අරලිය ගහ මන්දිරයට ඇවිත් සාකච්ඡා කරද්දී එතුමා සියලු දෙනාම ඉදිරියේ කෙළින්ම කිව්වේ, "අපේ ජීවිත කාලය තුළ ජාතික සමගිය ඇති කරන්න, නැත්නම් විනාශයක් වෙනවා" කියලායි. මම එතුමාට බොහොම ගරු කරනවා. ගරු එම්. ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමාත් එදා පැමිණියා. අන්න එහෙම සිතන්න. ඡන්දය දිහා බලා පටු අරමුණු ඇතිව අපි මේවා කරන්න ගියොත් රටක දියුණුව නොවෙයි ඇති වෙන්නේ. "මමයි බලයට එන්න ඕනෑ" කියලා සිතාගෙන කටයුතු කරන එක නොවෙයි විය යුත්තේ. පසුගිය කාලයේ අපි විපක්ෂයේ ඉන්නකොට අපේ පැත්තෙන් එහා පැත්තට කඩා ගෙන ගියා. එදා අපේ පැත්තේ අසූ ගණනක් හිටියා. ඔබතුමා, එදා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක. කෝටි ගණන් දීලා අපේ අයව ගත්තා. එහෙම අරගෙනත් මොකද වුණේ? හයෙන් පහක් තිබිලාත්, මාස තුනෙන් කෙසේ හෝ ඡන්දයකට ගිය බව මම දන්නවා. අදත් කථාවක් යනවා, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තව විනාඩි පහක් තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හොඳමයි ගරු කථානායකතුමනි, මා මේවා ගැන කථා කරන්නේ මේ සභාවේ තිබෙන උත්තරීතර බව ආරක්ෂා කරන්න ඕනෑ නිසායි. අදත් කථාවක් යනවා, අපේ අයට කෝටි ගණන් දෙන්න හදනවා කියලා. අර පැත්තටත් දෙන්න හදනවා ලු. මම කියනවා, රෙද්දක් ඇඳගෙන නම් ආයෙත් කිසිම කෙනෙක් කෝටි ගණන් අරගෙන යන්න එපා කියලා. හදවතට අවංකව එනවා නම් එන්න, යනවා නම් යන්න. ඊට පස්සේ ජනතාව තීන්දුව දෙයි. ජනතාවයි තීන්දුව දෙන්නේ. මම පැහැදිලිව කියනවා ගරු කථානායකතුමනි. මට මේක වහන්න දෙයක් නැහැ. රජයක් විධියට අපි ජනතාවට දුන් ප්‍රතිපත්ති මාලාවක් තිබෙනවා. අපි ඒවා ක්‍රියාත්මක කරනවා. රටේ සුබසාධන වැඩ කටයුතු දියුණු කරලා, අපි දුගීභාවය නැති කරන්න ඕනෑ. තරුණ අසහනයත් නැති කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, අපි අද කථා කරන මේ කාලය තුළ කිව යුතු දේ කියන්න ඕනෑ. මට මේ දේවල් කියන්න තව විනාඩි පහක කාලයක් පමණයි තිබෙන්නේ.

මෙම නීති මාලාව හා චර්යා ධර්ම සංග්‍රහය අපි වහාම ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපි මේ කටයුත්ත නොකළොත්, අපට සිදුවන විපත තමයි, අනාගතයේදී මේ පාර්ලිමේන්තුවට හොඳ අය එන්නේ නැති වෙන එක. ඇයි? පාර්ලිමේන්තුවේ කියන එක අපිට ලජ්ජාවක් වෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට කිසිම බයක් නැතිව පාරේ යන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. මට නම් තනියම යන්න පුළුවන්. මට හිතෙන වෙලාවක පාරේ යන්න පුළුවන්. ඒ මොකද? මම ආණ්ඩු පක්ෂයේ හිටියත්, විපක්ෂයේ හිටියත් මට කවදාවත් කවුරුවත් බාධා කරන්නේ නැහැ. ඇයි ඒ? මම ප්‍රතිපත්ති තුළ ඉඳගෙන සාධාරණව වැඩ කරන නිසා. මගේ අමාත්‍යාංශයේ අය වැය යෝජනාවලට කවදාවත් කවුරුවත් බාධා කරන්නේ නැහැ. මට අදහස් දෙනවා. මම ඒවාට ගරු කරනවා. මේ ගරු සභාව තුළදී මෙම චර්යා ධර්ම අනුව ක්‍රියා කිරීම ඉතාම අවශ්‍යයි, ගරු කථානායකතුමනි. එහෙම නම් අද අපි ඒවා ගැන කථා කරමු.

මේ නීති රීති අපි වහාම ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඔබතුමා පුටුවේ ඉන්න තුරු බය නැතිව ක්‍රියා කරන්න. ඒ වාගේම මහ ලේකම්තුමා ඇතුළු නිලධාරි මණ්ඩලයත් නීතිය තදින් ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ රටේ නීතිය හරියට ක්‍රියාත්මක කළොත්, රටේ ජනතාව තරම් නීතියට ගරු කරන තවත් පිරිසකුත් නැති වෙයි. පාලකයා විධියට කොන්ද පණ ඇතිව ඒ කාර්යය කරන්න ඕනෑ. මමත් කියනවා අපිත් ඒ විධියට කොන්ද පණ ඇතිව වැඩ කරන්න ඕනෑය කියලා. එහෙම නැතිව බැහැ. මේ රටේ රාජ යුගයේ සිට ආපු නීතියක් තිබෙනවා. විනයක් තිබුණා. අපි ඒ නීතිය අනුව තදින් ක්‍රියා කළා. බලන්න, පසුගිය ඡන්දය දිහා? මැතිවරණ කොමසාරිස්තුමාට මම ස්තුතිවන්ත වෙනවා. එතුමා තදින් හිටියා. කෝ, කොළ පාට කොඩි ආදී මොනවත් තිබුණේ නැහැ. ඒ කිසිම දෙයක් නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමාත් ඒ කාලයේ ඡන්දයට ඉල්ලද්දී කොඩි දැම්මේ නැහැ. ඒක ඔබතුමාගේ ප්‍රතිපත්තිය වුණා. ඔබතුමා පෝස්ටර් ගැහුවේ නැහැ. අන්න, ලංකාව ලෝකයටම හොඳ ආදර්ශයක් දුන්නා.

මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අද මම බොහොම සතුටු වන දවසක්. මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව අපේ ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට මම ස්තුතිවන්ත වෙනවා. අද මෙම ගරු සභාවට ඓතිහාසික දිනයක්. අද අපේ "සභාග" කියන එක නැති වුණාට, එක්සත් ජාතික පක්ෂය හා අපේ සුළු පක්ෂ රාශියකින් සමන්විත ආණ්ඩුවක් ගෙන යන්නේ කියන එක ඔබතුමන්ලා මතක තියාගන්න. අපි දන්නවා, දෙමළ පක්ෂත් ඒ ආකාරයෙන් කටයුතු කරන බව. අපේ ජාතිවාදයක් නැහැ. අපිට ආගම් භේදයක්, කුලවාදයක් නැහැ. ලාංකිකයෝ විධියට ඔබතුමන්ලා රට හදන්න සහයෝගය දෙන බවත් අපි දන්නවා. ගරු කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

මීළඟට, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා. දිවා ආහාර විවේකයට ප්‍රථම ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා. නමුත් ඔබතුමා මේ ගැන හුඟක් ක්‍රියාකාරී වූ මන්ත්‍රීවරයෙක්. එම නිසා ඔබතුමාට තව වේලාව අවශ්‍ය නම් දිවා ආහාර විවේකයෙන් පසුව වේලාව ගන්න පුළුවන්. ඔබතුමාට තව කොපමණ වේලාවක් අවශ්‍යද?

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මට හරියටම කියන්න බැහැ, ගරු කථානායකතුමනි. මම කථා කරලා බලලා කියන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, එහෙම නම් ඔබතුමා කථා කරන්න.

[අ.භා. 12.17]

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ මෙම ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත පිළිබඳව කථා කරන්න, ඒ වෙනුවෙන් මගේ අදහස් ඉදිරිපත් කරන්න මට විනාඩි 13ක කාලයක් ලබාදීම පිළිබඳව ප්‍රථමයෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත් අද වාගේ දවසක මෙම ස්ථාවර නියෝග සාකච්ඡාවට; විවාදයකට ගත්ත එක ගැන මම කනගාටු වෙනවා. ස්ථාවර නියෝග පිළිබඳව තිබුණු කමිටු කිහිපයකටම මමත් සහභාගි වුණා. ඒ වෙනුවෙන් තිබුණු පුහුණු වැඩසටහන්වලටත් මම සහභාගි වුණා. එකකට විතරයි අපිට සහභාගි වෙන්න බැරි වුණේ. ඒකාබද්ධ විපක්ෂය වශයෙන් අපි මේ සඳහා යෝජනා 31ක් ඉදිරිපත් කර තිබුණා. මේ සමහර යෝජනා ගැන අපිට යම්කිසි විධියකට හිතන්න වෙනවා. නමුත් සමහර ඒවා ඉතාම සරල යෝජනායි. අපේ යෝජනා තිස්එක වෙනුවෙන් අපි කොයි තරම් කාලය කැප කළත්, අපි ඉදිරිපත් කළ එක යෝජනාවක්වත් පිළිගෙන නැහැ. ගරු කථානායකතුමනි, මේ යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණාට පසුව තරු පහේ ප්‍රජාතන්ත්‍රවාදය දෙනවාය කිව්වාට, ඇත්ත වශයෙන්ම යහ පාලන ආණ්ඩුව මොකක්ද කර තිබෙන්නේ? අද යම්කිසි විධියකට එම ප්‍රජාතන්ත්‍රවාදය සීමා කරන්නත්, ප්‍රජාතන්ත්‍රවාදී මර්දනයක් ගෙනෙන්නත් තමයි උත්සාහ දරා තිබෙන්නේ.

2015දී පටන් ගත් දවසේ සිට සිදු වුණු දේවල් ගැන අපි විමසා බලමු, ගරු කථානායකතුමනි. ඉස්සර වෙලාම කිසිම වරමක් නැතිව අගමැති කෙනෙක් පත් කළා. දැන් අගමැතිතුමා කියනවා, "අයින් වෙන්න බැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කරනවා" කියලා. ඉස්සර හිටපු අගමැතිතුමාට මොකද වුණේ කියන එකත් අපි මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි, ගරු කථානායකතුමනි. මීට කලින් කථා කළ කරීකයෝ ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය පිළිබඳව දුන් තීන්දුව ගැන කථා කළා. ඒ තීන්දුව හරි හෝ වැරදි වුණත් අපි පාර්ලිමේන්තුවේ තිබුණු නීතියත්, ස්ථාවර නියෝගත් අනුව තමයි ඒ කටයුතු කළේ. නමුත් ඒ නියෝගය දුන්නාට පසුව මොකද වුණේ? මන්ත්‍රීවරුන් තුනෙන් දෙකක පිරිසක් ඡන්දය දුන්න යෝජනාවක් සම්බන්ධයෙන් වර්තමාන ජනාධිපතිතුමා බලයට ආවාට පසුව කියනවා, "ඒක බල ශූන්‍යයි" කියලා.

ඉතින්, මේ වාගේ දේවල් අපි දිගටම දකිනවා, ගරු කථානායකතුමනි. මේක යහ පාලන ආණ්ඩුවක් කිව්වාට ප්‍රජාතන්ත්‍රවාදය යම්කිසි ආකාරයකට මර්දනය කිරීමක් තමයි මෙතැනදී බැලුවේ.

ගරු කථානායකතුමනි, අපේ විපක්ෂ නායකතුමා - Leader of the Opposition - පත් කළ ආකාරය බලන්න. දින සියයේ පාර්ලිමේන්තුවේදී එක පක්ෂයක් එවැනි සම්ප්‍රදායයක් ඇති කර තිබුණා. ඊට පස්සේ මේ පාර්ලිමේන්තුවේ 55 දෙනෙක් මන්ත්‍රීවරු ඉන්න කණ්ඩායමට විපක්ෂ නායකකම ගන්න බැහැයි කියලා කියනවා. ඒ අනුව තිබෙන සම්ප්‍රදාය ඉදිරියට ගෙන යනවා කියලා මම නම් දකින්නේ නැහැ. අවස්ථාවට ගැලපෙන ආකාරයට තමයි සම්ප්‍රදායන් ඇති කරන්නේ, ගරු කථානායකතුමනි. ඒ නිසා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැටියට ස්ථාවර නියෝග සංශෝධනය කරනවාට වඩා, පුළුවන් තරම් සම්ප්‍රදායන් රැක ගන්න එකයි අපි කරන්න ඕනෑ. මොකද, අපි පුළුවන් තරම් නීති ගෙනාවොත්, මේ පාර්ලිමේන්තුවේ නීතිඥවරු ගොඩක් ඉන්න නිසාද කොහේද, ඒ එක එක්කෙනා, ඒ අයට වාසි වන විධියට ඒවා අර්ථකථනය කරන්න හදනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, අපි සම්ප්‍රදායන් ඇති කර ගත්තොත් මීට වඩා හොඳයි.

අපි එංගලන්ත පාර්ලිමේන්තුව දිහා බැලුවොත්, මම හිතන විධියට ගරු කථානායකතුමා දන්නවා කොහොමද එහි සම්ප්‍රදායන් තිබෙන්නේ කියලා. ගරු කථානායකතුමනි මම මෑතකදී YouTube එකේ දැක්කා, එහි ඇමති කෙනකුගෙන් ප්‍රශ්නයක් ඇහුවාම, ඒ ප්‍රශ්නයට පිළිතුරු දීලා ඇමතිතුමා යන්න හැදුවාම එහි කථානායකතුමා ජෝන් බර්කෝ මහතා ඒ ඇමතිතුමාට ආපසු කථා කරලා "එහෙම යන්න බැහැ, අනෙක් අයගේ මතයත් අහන්න ඕනෑ" කියලා දැඩි ලෙස අවවාද කරනවා. අන්න ඒකයි, ඒ පාර්ලිමේන්තුවේත්, මේ පාර්ලිමේන්තුවේත් තිබෙන වෙනස. ඉතින් මේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග හදලා ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්න අපට ඇත්ත වුවමනාවක්; අවංක වුවමනාවක් තිබෙනවාද කියන එක මට සැකයි, ගරු කථානායකතුමනි. මම විශ්වාස කරනවා, මේ රජයට තිබුණු මූලික අවශ්‍යතාව වුණේ යම් කිසි විධියකට මේ ස්ථාවර නියෝගත්, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදත් ඔක්කොම manipulate කරලා, එහෙම නැත්නම් විකෘති කරලා ඒ අයගේ පැවැත්ම සඳහා ඒ වුවමනාව ඉදිරියට ගෙන යාමයි. ඒ වාගේම විපක්ෂ නායකතුමා පත් කළ ආකාරය දිහා බැලුවොත් ව්‍යවස්ථා සභාවේ - Constitutional Council එකේ - විකෘතියක් වෙලා තිබෙනවා. ඒ පත් කරන කට්ටිය කවුද? ආණ්ඩුවට සහයෝගය දෙන කණ්ඩායමක් තමයි විපක්ෂයේ සිටින්නේ. මන්ත්‍රීවරු 55 දෙනෙක් සිටින කණ්ඩායමට අද නියෝජනයක් නැතිවෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ආණ්ඩුවේ ඉන්න කට්ටිය කොච්චර තරු පහේ ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන කථා කළත්, ඇත්ත වශයෙන්ම පසු ගිය පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල දිහා බැලුවාම මේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී විකෘතිය අද මේ රටේ ජනතාවට තේරිලා තිබෙන බව පෙනෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, මේ ව්‍යවස්ථාදායක සභාව -Constitutional Council- විසින් කරන පත්වීම්. සම්පූර්ණයෙන්ම ස්වාධීන පත්වීම් කියලා රජයට කියනවා. ගරු කථානායකතුමනි, බලන්න, පොලිස්පතිතුමා ස්වාධීන ද කියලා. පොලිස්පතිතුමා කියනවා "නීතිය නවන්න ඕනෑ" කියලා. එදා ව්‍යවස්ථා සභාවෙන් මොකක්ද කළේ කියලා අපි දන්නවා. ඒ ආණ්ඩුවට ඕනෑ කරන පොලිස්පති කෙනෙක් තමයි පත් කළේ. ඒ විධියට බැලුවොත් මෙතැන විශාල විකෘතියක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි දුන්න යෝජනා ගැනත් මම මෙතැනදී පොඩ්ඩක් කථා කරන්න කැමැතියි. අපි යෝජනා 31ක් දුන්නා. පළමුවැනි යෝජනාව 1 සිට 6 දක්වා ස්ථාවර නියෝග අනුව විපක්ෂ නායක කෙනෙක් පත් කරන්නේ කොහොමද කියන

[ගරු තාරක බාලසූරිය මහතා]

එක ගැනයි. මේ රටේ වර්තමාන තත්ත්වය බැලුවොත්; පසු ගිය අවුරුදු තුන දිහා බැලුවොත් මූලිකව ප්‍රශ්න තුනක් උද්ගත වෙලා තිබෙනවා. එයින් පළමුවැනි කාරණය තමයි තමන් ඉන්නේ ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේද කියන එක පිළිබඳව මන්ත්‍රීවරයකුට තිබෙන අයිතිය. ගරු කථානායකතුමනි, ඔබතුමා ඉන්දියාවේ පුහුණු වැඩසටහනකට මාවත් යැව්වා මතකයි. ඒ පුහුණු වැඩසටහනට යන කොට මට කාඩ් එකක් දුන්නා. එහිදී මම කිව්වා, "මම විපක්ෂයේ මන්ත්‍රී කෙනෙක්" කියලා. එතකොට මේ පාර්ලිමේන්තුවේ ඉන්න නිලධාරින් කියනවා "නැහැ, නැහැ, ඔබතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී කෙනෙක්" කියලා. ඒ නිසා තමන් විපක්ෂයේද, ආණ්ඩු පක්ෂයේද කියලා හැඳින්වීම සඳහා මන්ත්‍රීවරයකුට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය නැත්නම් මොකක්ද මේ සභාවේ තේරුම කියන එක මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ගරු කථානායකතුමනි. අපට විපක්ෂයේ මන්ත්‍රී කෙනෙක් කියලා, ඒ අයිතිය තිබෙන්න ඕනෑ. අපේ පක්ෂය කැමැති නැත්නම් ඒ කට්ටියට පුළුවන්, අපට නඩු දමන්න. ඒක වෙනම කථාවක්. නමුත් ඒ මන්ත්‍රීවරයා විපක්ෂයේද, ආණ්ඩු පක්ෂයේද කියලා කියන්න මේ පාර්ලිමේන්තුවෙන් ඉඩ දෙන්නේ නැත්නම්, ඒ අයට ස්වාධීන වෙන්න ඉඩ දෙන්නේ නැත්නම් ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක වැරදියි. මම ඒ ගැන සොයලා බලන්නම්.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ගරු කථානායකතුමනි, එක සිද්ධියක් නොවෙයි. අපේ විමල් වීරවංශ මැතිතුමාගේ පක්ෂය එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් වෙන් වෙන්න ඕනෑ කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. ගරු කථානායකතුමනි, ඒ වෙලාවේ ඔබතුමා කිව්වේ මොකක්ද, එහෙම නම් ඒක ලිඛිතව දෙන්න කියලායි. ඊට පස්සේ ලිඛිතව දුන්නා. ලිඛිතව දුන්නාට පස්සේ ඔබතුමා කියනවා ඉවත් වෙන්න නම් ඒ පක්ෂයෙන් ලියුමක් දෙන්න ඕනෑ කියලා.

ඉතින්, මේකද ප්‍රජාතන්ත්‍රවාදය කියන එක -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකයි නීතිමය තත්ත්වය. ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ගරු කථානායකතුමනි, මීට වඩා සම්ප්‍රදායන් තිබිලා තිබෙනවා. මම ඔබතුමා එක්ක තර්ක කරනවා නොවෙයි, ගරු කථානායකතුමනි. මම ඔබතුමාට හුඟක් ගරු කරන පුද්ගලයෙක්. රටට අවශ්‍යම මොහොතේ ඔබතුමා පක්ෂ, පාට බලන්නේ නැතිව යුද්ධය අවසන් කරන්න උදව් කළ පුද්ගලයෙක්. මම ඔබතුමාට කියන්න කැමැතියි, මෙවැනි සම්ප්‍රදායන් මීට පෙරත් තිබුණු බව. මන්ත්‍රීවරයෙකුට විපක්ෂයේ සිටීමට ඇති අයිතිය ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා මෙය කනගාටුදායක තත්ත්වයක් කියලා මම විශ්වාස කරනවා.

ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභා වාර්තාවේ අංක 1 සිට 6 දක්වා වගන්ති බැලුවාම, විපක්ෂ නායකවරයෙක් පත් කරන්න කියන ඉල්ලීම තමයි අපි මූලිකව කරලා තිබෙන්නේ. නමුත්, මේ ගැන කිසිම සැලකිල්ලක් දක්වා නොතිබීම පිළිබඳව මම බොහොම කනගාටු වෙනවා. ඒ වාගේම වගන්ති අට තුළින් අපි බොහොම සරල ඉල්ලීමක් කරලා තිබෙන්නේ. 8වැනි වගන්තියෙන් මොකක්ද කියලා තිබෙන්නේ? පාර්ලිමේන්තු රැස්වීම් අඟහරුවාදා පෙර වරු 10.30ට ආරම්භ කරමු කියලායි. මම හිතන විධියට ඒක ඉතාම සාධාරණ ඉල්ලීමක්. අපට හුඟක් දේවල් පිළිබඳ විවාද කරන්න තිබෙනවා. සමහර මන්ත්‍රීවරුන්ට තම අදහස් ඉදිරිපත් කිරීමට කාලය ලැබෙන්නේත් නැහැ. එම නිසා පස් වරු. 1.00ට නැතිව, පෙර .වරු. 10.30ට පාර්ලිමේන්තු රැස්වීම් ආරම්භ කරමු කියලා යෝජනා කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒකත් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා.

ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභා වාර්තාවේ අංක 8 (7) යටතේ සඳහන් කර තිබෙන්නේ, "පාර්ලිමේන්තු රැස්වීම් පවත්වන කාල වේලාව දීර්ඝ කිරීමට අමාත්‍යවරයෙකුට ඉල්ලීමක් කළ හැකියි" කියලා. අපි ඒ ඉල්ලීම කිරීම කැබිනට් ඇමැතිවරයෙකුට පමණක් සීමා කරන්න කියලායි ඉල්ලුවේ. ගරු කථානායකතුමනි, ඒකත් සාධාරණ ඉල්ලීමක්. මේවා ඉතාම සරල දේවල්. සාකච්ඡා කරලා ඉතා ලෙහෙසියෙන් විසඳාගත හැකි දේවල්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද point of Order එක?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ක්‍රියාවලියේදී අපට දක්වපු සහයෝගය මම විශේෂයෙන් අගය කරනවා. නමුත්, ඔබතුමා චෝදනා මුඛයෙන් සඳහන් කළා, ඔබතුමන්ලා විසින් ඉදිරිපත් කරපු යෝජනා ගණනාවක් තිබුණා. ඒ එකක්වත් සලකා බැලුවේ නැහැ කියලා. 2017 ජූලි මාසයේ 18වැනි දින පෙර වරු 11.30ට ගරු කථානායකතුමාගේ නිල මැදිරියේදී පවත්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ දසවැනි රැස්වීමේදී මෙම යෝජනා, අදහස් එකින් එක පිළිබඳ සලකා බලා සමහර යෝජනා පිළිගත්තා, සමහර යෝජනා ප්‍රතික්ෂේප කළා කියලා මම ඔබතුමාට ඉතාම කාරුණිකව කියා සිටිනවා. ඒවාට ගොඩක් හේතු තිබුණා. මම ඔබතුමාට කියන්නේ "කිසිසේත්ම සලකා බැලුවේ නැහැ" කියන එක වැරැදියි කියලායි.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ඔබතුමා අපේ යෝජනා 31න් මොකක්ද සලකා බැලුවේ කියලා මට කියන්නකෝ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම ඔබතුමාට ඒ පිළිබඳ විස්තර කියන්නම්. මෙම වාර්තාවේ 19වැනි පිටුවේ සිට 27වැනි පිටුව දක්වා දීර්ඝ සටහනක් යොදා තිබෙනවා. එක් එක් යෝජනා සලකා බැලීම පිළිබඳව තමයි එහි සඳහන් වෙන්නේ. සමහර යෝජනා ප්‍රතික්ෂේප කරලා තිබෙනවා;

සමහර යෝජනා පිළිගෙන තිබෙනවා. අපි යෝජනාවක් ඉදිරිපත් කළාම එයට එකඟවීමම අපේක්ෂා කරන්න අමාරුයි. ඒ පිළිබඳව වෙනස් අදහස් තිබුණා. සමහර යෝජනාවලට එකඟ වුණා; සමහර යෝජනා පිළිගත්තේ නැහැ. එයයි මට කියන්න ඕනෑ. ඔබතුමන්ලාගේ යෝජනා අහක දැම්මේ නැහැ.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ගරු කථානායකතුමනි, මට එකක් පැහැදිලියි. අපි ඉදිරිපත් කළ යෝජනා 31 ගරු කථානායකතුමාටත් ලබා දුන්නා. මේ යෝජනා 31න් මොනවාද ඇතුළත් කරලා තිබෙන්නේ කියලා කියන්න පුළුවන් නම්, මගේ කාලය ඉතිරි කර ගන්න පුළුවන් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් ඉතිරි වෙලා තිබෙනවා. ඔබතුමාට අවශ්‍ය නම් දිවා විවේකයෙන් පසුව කථා කරන්න පුළුවන්.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

දැන් කථා කරන්නද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දිවා විවේකය සඳහා තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ගරු කථානායකතුමනි, මෙහි ඇතුළත් කර තිබෙන සමහර යෝජනා විහිළු සහගතයි. ගරු කථානායකතුමා සභා ගර්භයට ඇතුළු වෙනකොට ඔක්කොම අය හිටගෙන ආචාර කරන්න කියලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි කවදාද ඔබතුමාට ආචාර කළේ නැත්තේ? ඔබතුමාට ආචාර නොකළ එක මන්ත්‍රීවරයෙක් මේ ගරු සභාවේ ඉන්නවාද? එහෙම සිදු වීමක් වෙලා නැත්නම් ඇයි මෙහෙම දෙයක් ඇතුළත් කරන්නේ? සම්ප්‍රදායන් රකින්න ඕනෑ කියලා මේවා දමලා විකෘති කරන එක නොවෙයි කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, අද මේ රටේ ජනතාව පළමුවැනි වතාවට, මැතිවරණයකදී අලුතෙන් හඳුන්වා දුන් විපක්ෂයේ පක්ෂයක් ජයග්‍රහණය කරවලා තිබෙනවා. ජනතාව සියයට 45ක ඡන්ද ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. ඇයි, සියයට 45ක ඡන්ද ප්‍රමාණයක් ලබා දීලා තිබෙන්නේ? මේ පාර්ලිමේන්තුවේ සියලු දේ විකෘති වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද රට කොයි පැත්තටද යන්නේ කියන එක සැලකිල්ලට අරගෙන මේ විකෘතිය නවත්වන්න කියලායි මම පළමුවෙන්ම ඉල්ලා සිටින්නේ. අපි සම්ප්‍රදායන් පිළිබඳ කොයි තරම් කථා කළත්, නීති ගැන කොපමණ කථා කළත් නායකයන්ට ඇත්ත වශයෙන්ම වුවමනාවක් නැත්නම් මේ නීති-රීති වෙනස් කරන්න, ගරු කථානායකතුමනි. අපි මේවා ගැන කථා කරන එක බොරු වැඩක්. අද ජනතාව හිනා වෙනවා. ජනතාව හිනා වෙන්නේ මොකද? මැතිවරණයක් අවසන් වෙලා පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන පළමුවැනි දවසේම අපි ස්ථාවර නියෝග - Standing Orders - ගැන කථා කරනවා. හැබැයි, මේ රටේ සිටින ජනතාව දන්නවා පාර්ලිමේන්තුවේ තිබෙන විකෘතිය මොකක්ද කියලා.

අඩුම ගණනේ අද රටේ ජනතාවට හරිහමන් විපක්ෂ නායකයෙක් නැහැ, ගරු කථානායකතුමනි. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකකමක් දීලා තිබෙනවා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරය දීපු ජනතා විමුක්ති පෙරමුණ නම් අඩුම ගණනේ විපක්ෂය වෙනුවෙන් කථා කරනවා කියලා කියන්න පුළුවන්. නමුත් -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දැන් වේලාව පස් වරු 12.30යි. අපි දිවා ආහාරය සඳහා සභාවේ කටයුතු අත් හිටුවනවා. දිවා ආහාරයෙන් පසුව කථා කිරීමට ඔබතුමාට වේලාව අවශ්‍යද?

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ගරු කථානායකතුමනි, මට විනාඩි 2ක් වාගේ දුන්නොත් හොඳයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එහෙම නම් දිවා ආහාරයෙන් පසුව ඔබතුමාට විනාඩි 2ක හෝ විනාඩි 5ක කාලයක් ලබා දෙන්නම්.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දිවා ආහාරය සඳහා පස් වරු 1.30 දක්වා සභාවේ කටයුතු අත් හිටුවනවා.

(5th Start)

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා (ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා) ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப.1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Tharaka Balasuriya, you may continue your speech and conclude in four minutes.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඉස්සෙල්ලා මගේ කථාවේදී පැහැදිලි කරමින් ආවේ, මේ අලුත් පාර්ලිමේන්තුවේදී අපි දැකපු විකෘති කිහිපයක් පිළිබඳවයි. තරු පහේ ප්‍රජාතන්ත්‍රවාදය දෙනවා කියලා කිව්වාට, ඇත්ත වශයෙන්ම විපක්ෂ නායකකමවත් අඩුම ගණනේ සැබෑ විපක්ෂයකට දීලා නැහැ කියන එක අපි දැක්කා. එතැනදී එක එක ස්ථාවර නියෝග ගෙනැත් තමයි ඒවා යම් කිසි විධියකට මර්දනය කළේ. ගරු නියෝජ්‍ය කාරක

[ගරු තාරක බාලසූරිය මහතා]

සභාපතිතුමනි, මම ඉල්ලා සිටින්නේ මේ විකෘතිය නවත්වන්න කියලායි. මම හිතන විධියට පසුගිය පළාත් පාලන මැතිවරණයේදී ඓතිහාසික ජයග්‍රහණයක් විපක්ෂයට ලබා දීමට එම විකෘතිය එක හේතුවක් වුණා. ලංකාවේ මැතිවරණවලදී පළමුවැනි වතාවට තමයි විපක්ෂයේ පක්ෂයක් පළාත් පාලන මැතිවරණයක් ජයග්‍රහණය කරලා තිබෙන්නේ කියන එක අපි දන්නවා. මම හිතන විධියට මේ පාර්ලිමේන්තුවේදී සැබෑ විපක්ෂයකට විපක්ෂ නායකකම දෙන්නේ නැතිකමත් මෙම විකෘතියට කාරණාවක් වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුන් හැසිරිය යුත්තේ කොහොමද කියලා අපි මෙතැනදී සාකච්ඡා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, COPE එකේ මන්ත්‍රීවරුන් එම කාරක සභාවේ ඉන්නා ගමන්, අර්ජුන ඇලෝසියස් මහතාට දුරකථන මාර්ගයෙන් කථා කරලා තිබුණු බව වාර්තා වෙලා තිබුණු ආකාරය අපි දැක්කා. මේවා ගැන කිසිම නීතියක් නැද්ද; පාර්ලිමේන්තුවේදී කථානායකතුමා හෝ මේවාට කිසිම ක්‍රියා මාර්ගයක් ගන්නේ නැද්ද; මේ මන්ත්‍රීවරුන් ඉදිරියේදීත් COPE එකේම ඉන්නවාද; එතකොට පාර්ලිමේන්තුවේ COPE එක කෙරෙහි ජනතාවට තිබෙන විශ්වාසය මොකක්ද, කියන එක මම මෙතැනදී අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි තවත් දෙයක් දැක්කා. පසුගිය කාලයේදී පාර්ලිමේන්තුවට යම්කිසි විධියකට පනත් කෙටුම්පතක් ගෙනැල්ලා එම පනත් කෙටුම්පතට Committee Stageවලදී අලුත් දේවල් ඇතුළත් කිරීම නිසා ඇත්ත වශයෙන්ම තිබුණු පනත විකෘතිවීමක් වුණා. පළාත් පාලන මැතිවරණයේදී එම මැතිවරණය එක දවසක තබන්න ඕනෑය කියලා ඉස්සෙල්ලාම මේ ආණ්ඩුව සංශෝධනයක් ගෙනාවා. "මේවා ඔක්කෝම කල් දමන්න බැහැ." කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කිව්වාට පසුව, කළේ මොකක්ද? පරණ පනතට සංශෝධන ගෙනැල්ලා, එහි කාරක සභා අවස්ථාවේදී එයට එක එක යෝජනා ගෙනැල්ලා සම්පූර්ණයෙන්ම ඒක විකෘති කළා. අන්තිමට මොකක්ද, වුණේ? අන්තිමට ජනතාවගේ පරමාධිපත්‍ය උදුරා ගත්ත එක විතරයි කළේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඇත්ත වශයෙන්ම ස්ථාවර නියෝගවලින් - Standing Ordersවලින්- මේවා කරන්න බැහැ. මම හිතන විධියට අපි සම්ප්‍රදායක් ඇති කර ගන්න ඕනෑ. පසුගිය අවුරුදු තුන දිහා බැලුවාම, මේ පාර්ලිමේන්තුව මේ සම්ප්‍රදායන් ඔක්කෝම කඩ කරපු පාර්ලිමේන්තුවක් හැටියට තමයි මම නම් දකින්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක්කෝ ජනාධිපතිවරයෙක් ඝාතනය කළාම එහෙම නැත්නම් අසනීප වීමෙන් එම තනතුරේ කටයුතු කරන්න බැරි නම් ජනාධිපතිවරයෙක් තෝරා ගන්නේ කොහොමද කියලා ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ අංක 7හි ඇතුළත් කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම ජනාධිපති කෙනෙක් තෝරා පත් කිරීම පිළිබඳව තිබෙන්නේ ස්ථාවර නියෝගවල නොවෙයි. ඇත්තටම එය සඳහන් කර තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ. ජනාධිපති කෙනෙක් තෝරා ගන්නකොට, ඒක විය යුත්තේ රහස් ඡන්දයෙන් නොවෙයි කියා මම විශ්වාස කරනවා. ජනාධිපති කෙනෙක් තෝරා ගන්නවා නම්, මන්ත්‍රීවරු තමන්ගේ ඡන්දය දුන්නේ කාටද කියන එක ජනතාව පැහැදිලිව දැන ගන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම ජනාධිපති කෙනෙක් රහස් ඡන්දයෙන් තෝරා ගන්නවා කියන එක ලජ්ජා වෙන්න ඕනෑ කාරණාවක් කියන එකයි මම විශ්වාස කරන්නේ. මෙම Standing Orders දිහා බැලුවාම පාර්ලිමේන්තුවේ ඉන්නා මන්ත්‍රීවරුන් kindergarten එකක ඉන්නා ළමයින් වාගේ තමයි සලකන්න හදන්නේ කියා අපට පෙනෙනවා. මේ තුළින් එක නීතියක් ගෙනැල්ලා තිබෙනවා, කථානායකතුමා කරන නියෝගයක් Serjeant-at-Arms අනිවාර්යයෙන්ම ඉදිරියට ගෙන යන්න ඕනෑය කියලා. කවුරුන් හෝ මන්ත්‍රීවරයකු සම්බන්ධයෙන් ගරු කථානායකතුමා කිව්වොත්, "මෙයාට කනට එකක් දීලා එළියට දමන්න." කියලා, කනට එකක් දීලා එළියට දමන්න වෙනවා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒක නොවෙයි මා කියන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)
එහෙම බලාපොරොත්තු වන්නේ නැහැ නේ.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
එය නොවෙයි මා මෙතැනදි කියන්නේ. එහෙම නම්, මෙය වෙනස් කරන්න වුවමනාවක් නැහැ නේ. නමුත් මෙය වෙනස් කර තිබෙනවා, කථානායකතුමා දෙන නියෝගයක් Serjeant-at-Arms අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරන්න ඕනෑ කියා. එහෙම නම් මන්ත්‍රීවරුන් එළියට දමන්න තමයි මෙයින් උත්සාහ දරන්නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன இராஜாங்க அமைச்சர்)
The Hon. Palitha Range Bandara - State Minister of Irrigation)
සභාවේ හරියාකාරව හැසිරෙන්න ඕනෑ.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
සභාවේ හැසිරීම කියන එක වෙනම කතාවක්. යම්කිසි සාධාරණයක් වන්නේ නැත්නම් මන්ත්‍රීවරුන්ට අයිතියක් තිබෙනවා කොහොම හරි හඬක් නඟලා ඒ අයගේ හඬ ඉදිරිපත් කරන්න. මේ පාර්ලිමේන්තුවේ දේවල් දිගින් දිගටම විකෘති කළාට පසුව අපට නිහඬව ඉන්න කියලාද කියන්නේ? [බාධා කිරීමක්] තමුන්නාන්සේලා හොඳින් තේරුම් ගන්න. අප විතරක් නොවෙයි විපක්ෂයේ ඉන්නේ. තමුන්නාන්සේලාත් කවදා හෝ විපක්ෂයේ ඉන්නවා. එතකොට මේ නීති රීතිම තමුන්නාන්සේලාට එරෙහිව පාවිච්චි කරන්න පුළුවන්. මේක නොවෙයි අපේ රටට වෙන්න ඕනෑ, ගරු රාජ්‍ය අමාත්‍යතුමා. අප ඔක්කෝම එක්කාසු වෙලා, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්නේ කොහොමද කියා කල්පනා කරන්න ඕනෑ. එයයි අපේ රටට වෙන්න ඕනෑ. [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, විනාඩිය ඉවරයි.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මට තවත් විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. [බාධා කිරීමක්] මට මෙතුමන්ලා බාධා කරනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera )
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Deputy Minister, what is your point of Order?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා සඳහන් කළා එතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සලකා බැලීමක් සිද්ධ වුණේ නැහැ කියා. මම කලිනුත් සඳහන් කළා ඒ ගැන. එතුමා මට කිව්වා, එවැනි සලකා බැලීමක් කර තිබෙනවා නම් එය සොයා දෙන්න කියා. අද අපට ලබා දී තිබෙන ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභා වාර්තාවේ 19වන පිටුවේ සිට 27වන පිටුව දක්වා ඒ පිළිබඳව සඳහන් කර තිබෙනවා. ඒ යෝජනා එකින් එකට වෙන වෙනම සලකා බලා, පිළිගන්නවා නම් පිළිගන්න හේතුවත් ප්‍රතික්ෂේප කරනවා නම් ප්‍රතික්ෂේප කරන්න හේතුවත් එහි දක්වා තිබෙනවා. ඒ කමිටුවට පක්ෂ කිපයක සාමාජිකයන් සහභාගි වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා, "ඔබතුමන්ලාගේ යෝජනා එකක්වත් පිළිගෙන නැහැ." කියා. එම වාර්තාවේ අංක 8(2) බලන්න. ඔබතුමාගේ යෝජනාව අනුව "අමාත්‍ය මණ්ඩලයේ" යන වචන උක්ත සඳහනට ඇතුළත් කිරීමට කාරක සභාව නිර්දේශ කළා. එය ඔබතුමාගේ ඉල්ලීමක්. ඒ වාගේම අංක 82(2) සම්බන්ධයෙන් ඔබතුමා කළ අවධානය යොමු කරවීම -concern එක- සලකා බලා, එයට ගරු කරලා මෙම ස්ථාවර නියෝගවලින් පසුව විනිශ්චයකරුවන් ඉවත් කිරීමේ පනත් කෙටුම්පත සම්මත කරන්න -ඒ කියන්නේ මීට සමාන්තරව වෙනම නීතියක් සම්මත කිරීමට- අපි එකඟතාවක් ඇති කර ගත්තා. ඒ වාගේම, අංක 111 බලන්න. ආංශික අධීක්ෂණ කාරක සභා පිළිබඳ සලකා බැලීමේදී උපදේශක කාරක සභා ඇතුළත් කිරීම පිළිබඳව ඔබතුමා ඉල්ලීමක් කළා. අපි ඒකට එකඟ වුණා. අද දින උපදේශක කාරක සභා පිළිබඳ සංශෝධනය ඇතුළත් කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා අවසන් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණය පැහැදිලි කරන්න අවශ්‍ය වන නිසා මට අවස්ථාව දෙන්න.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා දැන් මගේ වෙලාව අරගෙන-

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඔබතුමා වෙලාව ගන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ආණ්ඩුවට වෙන් කළ කාලයෙන් කොටසක් එතුමාට දෙන්න. මා මෙය කියන්න අවශ්‍යයි. අංක 132වන -

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු කතා කරන වෙලාවේ මට මයික්‍රෝෆෝනයවත් දෙන්නේ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් මේක අහන්න කෝ. [බාධා කිරීමක්] මට විනාඩියක් දෙන්න, මේ කාරණය සම්පූර්ණ කරන්න. අංක 132 සඳහා "අමාත්‍ය මණ්ඩල ලේකම් විසින්" යන වචන එකතු නොකර "අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු" යන වචන- [බාධා කිරීමක්] ඒ සම්බන්ධවත් ඔබතුමා ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒ විධියට ගත්තාම අපි ඔබතුමාගේ යෝජනා සලකා බලා තිබෙනවා.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය point of Order එකක් නොවෙයි. මෙතුමාගේ තර්කය මට තේරුණා. මා මෙහිදී කිව්වේ, Standing Ordersවලට දාපු points 31ක් ප්‍රතික්ෂේප කර තිබෙනවා කියන එකයි. වැදගත්ම දේවල් ප්‍රතික්ෂේප කර තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ හරියාකාර සම්ප්‍රදායයක් ගෙන යන්නේ නැති නිසා තමයි මේ වාගේ ගැටලුවකට අද මුහුණ පාන්න සිදු වෙලා තිබෙන්නේ. මා මෙහිදී නියෝජ්‍ය අමාත්‍යතුමාට පැහැදිලි කළේ එයයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,"මෙය යහ පාලන ආණ්ඩුවක්." කියා කියනවා. "මෙය සම්මුතිවාදී ආණ්ඩුවක්." කියා කියනවා. ඉන් පසුව කිව්වා, "අවුරුදු දෙකකට ගිවිසුමක් අත්සන් කළා." කියා. අද පාර්ලිමේන්තුවේදී ගරු දිනේෂ් ගුණවර්ධන හිටපු අමාත්‍යතුමා මේ ගැන කතා කළා. හැබැයි, දැන් ඒ අවුරුදු දෙක ඉවරයි. ගරු කථානායකතුමා අද පාර්ලිමේන්තුවේදී කිව්වා, "කිසිම දැනුම් දීමක් කර නැහැ." කියලා. එහෙම නම් ගරු කථානායකතුමා දැනුම් දීමක් කරන තුරු තවදුරටත් බලාගෙන ඉන්නේ නැතිව කුමක් හෝ තීන්දුවක් ගන්න ඕනෑ. දැනුම් දීම තවත් අවුරුදු 3ක් පරක්කු වුණොත්, මේ විශාල ඇමති මණ්ඩලයත් එක්ක මෙය මෙහෙම ඉදිරියට ගෙන යනවාද කියන එක ගැන අප ප්‍රශ්න කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මෙහිදී අවසන් වශයෙන් කියන්නේ මෙයයි.

මේ Standing Orders නැත්නම් ස්ථාවර නියෝගවල එක එක දේවල් ලියන්න පුළුවන්. හැබැයි, අද රටේ ජනතාව ගොනාට අන්දවන්න බැහැ. ඇත්ත වශයෙන්ම මේ පාර්ලිමේන්තුවේ වෙලාව වෙන් කිරීමේ කාරණයේ සිටම බලා ගන්න පුළුවන්, ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙනවාද කියන කාරණය. යහ පාලන ආණ්ඩුව ආපු දවසේ සිට තරු පහේ ප්‍රජාතන්ත්‍රවාදය දෙනවා කියා ඒ හැම පැත්තෙන්ම බැලුවේ මොකක්ද? මේ කට්ටිය බැලුවේ මර්දනයක් ගෙනෙන්නයි. ඉතින් මම විශ්වාස කරනවා, ඉදිරි මැතිවරණවලදීත් මේ යහ පාලන ආණ්ඩුවට අනිවාර්යෙන්ම රටේ ජනතාව හොඳ උත්තරයක් දේවි කියා.

[අ.භා. 1.40]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය ගැන විවාද කෙරෙන අවස්ථාවේදී කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

මට ප්‍රථමයෙන් කථා කළ ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමාගේ සමහර කරුණුත් සමඟ මම එකඟ වෙනවා. නමුත් අපේ ආණ්ඩුව මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න සෑහෙන වැඩ පිළිවෙළක් කරලා තිබෙනවා කියන එකත් කියන්න ඕනෑ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ස්වාධීන කොමිෂන් සභා පිහිටෙව්වා. අද පොලිස්, රාජ්‍ය සේවා, මැතිවරණ කොමිෂන් සභාව යනාදිය පිහිටුවා ඒවා ශක්තිමත් කරලා තිබෙනවා; ඒවායේ ක්‍රියාවලීන් ශක්තිමත් කරලා තිබෙනවා. අපට ආඩම්බරයෙන් කියන්න පුළුවන්, අපි මැතිවරණයක් සම්පූර්ණ කළා; එය අවම දූෂණ තිබුණු, අවම ලෙස හිරිහැර වුණු මැතිවරණයක් කියලා. මම හිතන්නේ කවුරුත් පිළිගත යුතුයි, ඒක සිදුවුණේ මැතිවරණ කොමිෂන් සභාවේ ස්වාධීනත්වය නිසායි කියන එක.

ඒ විතරක් නොවෙයි, අපේ රජය මේ කෙටි කාලය තුළදී පුරවැසියාගේ අයිතීන් ශක්තිමත් කරලා තිබෙනවා. පුරවැසියාගේ අයිතීන් ශක්තිමත් කරලා, පුරවැසියාට තොරතුරු දැනගැනීමේ අයිතිය ලබා දුන්නා. මේ අයිතිය ඉන්දියාව, පාකිස්තානය, බංග්ලා දේශය වාගේ ආසියාවේ සෑම රටකම පාහේ කලක සිට තිබිලා තිබෙනවා. සමහර යුරෝපීය රටවල මේ අයිතිය පුරවැසියාට අවුරුදු දෙසීයකට පෙර සිට තිබිලා තිබෙනවා. නමුත් ලංකාවේ මේ තත්ත්වය ඇති වුණේ අපේ ආණ්ඩුව කාලයේ කියන එකත් අපි අමතක නොකළ යුතුයි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ඒ ගැන වාද විවාද කිරීම තවත් ජයග්‍රාහී පිම්මක් කියලා කියන්නට පුළුවන්. අපේ අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එතුමාගේ මැතිවරණ පොරොන්දුවේ ප්‍රකාශ කළා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම පද්ධතියක් ගෙනෙනවා කියලා. ඒක අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා, 2016 දෙසැම්බර් මාසයේ 10 වෙනිදා. ඉන්පස්සේ නැවතත් 2017 අගෝස්තු මාසයේ 08 වෙනි දා එය සංශෝධන සමඟ ඉදිරිපත් කළා. වග කිවයුතු රජයක් හැටියට දූෂණය අවම කරන්න, ඥාති සංග්‍රහය හා බලය අනිසි ලෙස භාවිත කිරීම වළක්වන්න, විනිවිදභාවය වැඩි කරන්න, ඒ වාගේම පාර්ලිමේන්තුවේ නිසි හැසිරීමක් ඇති කිරීම සඳහා තමයි මේ චර්යා ධර්ම පද්ධතිය ඉදිරිපත් කරලා තිබෙන්නේ. [බාධා කිරීමක්] ඔව්. මේ පාර්ලිමේන්තුවේ බොහෝ ගැටලු, ප්‍රශ්න තිබෙනවා. ඒ හැම එකක්ම නිරාකරණය කරලා නැහැ. නිරාකරණය කරන්නේ නැති දේවලුත් තිබෙනවා. නමුත් මම හිතන්නේ ඔබතුමාත් පිළිගන්න ඕනෑ, මේ සංස්කෘතිය වෙනස් කරන්න අද අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ බොහොම හොඳ දෙයක් බව. මේ අලුත් පාර්ලිමේන්තු සංස්කෘතිය ස්ථාපිත කිරීම සඳහා ඔබතුමාගේ දායකත්වය ලැබිලා තිබෙනවා. ඒ වාගේම මම හිතනවා, අනාගතයේදීත් ඒ දායකත්වය ලැබෙයි කියා. අපි බලන්න ඕනෑ, මේ ඉදිරිපත් කරලා තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම පද්ධතිය ජාත්‍යන්තර චර්යා ධර්ම පද්ධතීන් එක්ක සසඳනකොට එහි මොනවාද තිබෙන අඩුපාඩු කියලා. ඇත්තටම අපි කියන්නේ නැහැ, මේ චර්යා ධර්ම සංග්‍රහය අංග සම්පූර්ණයි කියලා. නමුත් කවදාවත් නොතිබුණු දෙයක් තමයි අපි කරලා තිබෙන්නේ, අලුත් දෙයක් කරලා තිබෙන්නේ. අපි දන්නවා, අවුරුදු විසිපහකට එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපතිවරයෙක් මේ රටේ ඉඳලා නැහැ කියන කාරණය. ඒ වාගේම ඒ අවුරුදු විසිපහෙන් විසිතුනකට පමණ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ රජයකුත් මේ රටේ තිබිලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අහන්න කැමැතියි පසුගිය දශක දෙක සම්බන්ධයෙන් වැඩියෙන් වගකීම ගත යුත්තේ කොයි පක්ෂද කියලා. අපි පසුගිය වසර දෙකේදී එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ රජයක් පිහිටුවලා තිබෙනවා. අපේ ඒ කාලය තුළදීම තමයි මේ චර්යා ධර්ම සංග්‍රහයත් ඉදිරිපත් කරගෙන යන්නේ. අපි මේ චර්යා ධර්ම පද්ධතිය සසඳලා තිබෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමය සකස් කරන ලද චර්යා ධර්ම පද්ධතියත් සමඟ. අපි ඒක මිනුම් දණ්ඩක් හැටියට භාවිත කරලා බැලුවොත්, මෙහි තිබෙන අඩු පාඩු සහ අප තවදුරටත් එහි සලකා බැලිය යුතු තැන් මොනවාද කියලා බලන්නට පුළුවන් වනවා. මම ඒවායේ කරුණු කිහිපයක් මෙතැනදීම පෙන්වලා දෙන්න කැමතියි. එකක් තමයි, අපි - පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් - උනන්දුව දක්වන දේවල් ගැන ලේඛන ඉදිරිපත් කර නොතිබීම. - Verité Research ආයතනයෙන් මේ ගැන කථා කරලා තිබුණා. මේ ගැන පත්තරවලත් පළ කරලා තිබුණා. - ඒක අපි සඳහන් කරලා නැහැ. අපට බොහෝ දේවල් ගැන උනන්දුව දක්වන්න පුළුවන්. සමහර අයට ඒ අයගේ දෙමව්පියන්ගෙන්, පවුලෙන් සමහර විට දේපළ ලැබෙනවා. අනෙක් අය වෘත්තියක් කරලා, හම්බ කරලා ඒ ගොල්ලන්ට නිවාස අරගෙන, ඒ අයගේ දරුවන්ට අධ්‍යාපනය දීලා අවසන් කර පාර්ලිමේන්තුවට එන අය ඉන්නවා. ඒ වාගේම ඒ අභියෝග තියා ගෙන පාර්ලිමේන්තුවට එන අයත් ඉන්නවා. එතකොට එක එක හේතූන් නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමහර දේවල් ලබා ගැනීමට පෙළඹෙනවා. එතකොට ඔවුන් අනෙක් දේවල් සඳහා දක්වන උනන්දුව ප්‍රසිද්ධ කළ යුතුයි. නමුත්, අපේ මේ දැනට ඉදිරිපත් කරලා තිබෙන චර්යා ධර්ම පද්ධතිය තුළ ඒක ප්‍රසිද්ධ කරන්න අවශ්‍යතාවක් නැහැ. ඒ නිසා සමහර විට මේ උනන්දුව ඉඩම්-දේපළ ගැන වෙන්නට පුළුවන්; කොටස් වෙළෙඳ පොළේ තිබෙන කොටස් ගැන වෙන්නට පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර අය විදේශ සංචාරවල යෙදෙනවා. ඒ විදේශ සංචාරවලට මුදල් ලැබෙන්නේ කොහෙන්ද, ඒ ටිකට් පත අරගෙන දෙන්නේ කවුද කියන එක සම්බන්ධව බොහෝ වෙලාවට සඳහන් වෙන්නේ නැහැ. එක එක පාර්ශ්වවලින් ආදායම් ලැබෙනවා. මේ ආදායම් ලැබෙන්නේ කොහෙන්ද කියන එක එළි දක්වන්න අවශ්‍යතාවක් නැහැ. ඊට අමතරව අනුබද්ධයන් තිබෙනවා. සමහර අය එක එක දේවල්වලට අනුබද්ධ වෙනවා. ඔහු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් හැටියට ක්‍රියා කරනකොට ඒවා අදාළ වෙන්නේ, අදාළ නොවෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් එක එක්කෙනාට සෝදිසි කරලා බලන්න පුළුවන්. මම හිතන්නේ මේ කාරණය අත්‍යවශ්‍යයි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිළිබඳ පැමිණිලි ලැබුණු විට යම් පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් එහි සත්‍ය විමර්ශනය කළ යුතුයි. අපේ පාර්ලිමේන්තුවේ චර්යා ධර්ම පද්ධතිය තුළ තිබෙන්නේ ඒකට කමිටුවක් පාර්ලිමේන්තුවෙන්ම පිහිටුවලා පාර්ලිමේන්තුවෙන්ම හොයලා බලන්න ඕනෑ කියලායි. නමුත් පොදු රාජ්‍ය මණ්ඩලයේ චර්යා ධර්ම පද්ධතිය තුළත්, සමහර අනෙක් රටවල තිබෙන චර්යා ධර්ම පද්ධති තුළත් ඒක පාර්ලිමේන්තුවට විතරක් සීමා කරලා නැහැ. ඒවා ගැන හොයා බලා මහජනයා වෙනුවෙන් පෙනී සිටින්න, මහජනයාට සාධාරණයක් වෙන විධියට ස්වාධීන පුද්ගලයන් පත් කරන්න පුළුවන්.

මන්ත්‍රීවරයකුට විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් වුණොත්, ඒ පැමිණිල්ල ඉදිරිපත් කරන ඒ පුද්ගලයාටයි එය ඔප්පු කිරීමේ වගකීම තිබෙන්නේ. The burden of proof lies with the complainant. සමහර චර්යා ධර්ම පද්ධතිවලට අනුව ඒ පුද්ගලයාම ඒක ඔප්පු කරන්න ඕනෑ නැහැ. පුද්ගලයාට ඒක ඉදිරිපත් කරන්න පුළුවන්. ඉදිරිපත් කළාට පසුව ඒක පාර්ලිමේන්තුව තුළින් සෝදිසි කර බලා ඒක ඔප්පු වෙනවාද, නැද්ද කියා හොයා බලන්න වෙනවා. මේක අපේ චර්යා ධර්ම

පද්ධතිය තුළත් නැහැයි කියන එක පෙන්වලා දෙන්න අවශ්‍යයි. ඒ වාගේම වරදක් වෙලා තිබෙනවා කියලා කවුරු හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කළොත්, ඒ පැමිණිල්ල ඉදිරිපත් කළ පුද්ගලයා ආරක්ෂා වෙන්න විධිවිධාන මේ තුළ නැහැ. මොකද, කවුරු හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කළොත් ඒ පුද්ගලයා ආරක්ෂා වෙන්න ඕනෑ. මොකද, ජනාධිපති කෙනකුට තිබෙන බලයට වැඩිය, ඇමති කෙනකුට තිබෙන බලයට වැඩිය, මන්ත්‍රී කෙනකුට තිබෙන බලයට වැඩිය සාමාන්‍ය පුරවැසියෙක්ට තිබෙන බලය අඩුයි.

මේ සියල්ලෙන්ම ශක්තිමත් වෙන්න ඕනෑ පුරවැසියායි. "ප්‍රජාතන්ත්‍රවාදය" කියමින් අපි පාර්ලිමේන්තුව ශක්තිමත් කරනවා කියලා කිව්වාම, අන්තිමට පුරවැසියා තමයි ශක්තිමත් වෙන්න ඕනෑ. හැබැයි, පුරවැසියාව ආරක්ෂා කරන්නත් මෙහි තිබෙන විධික්‍රම අඩුයි කියලා කියන්න පුළුවන්.

ලෝකයේ සමහර රටවල පාර්ලිමේන්තුවල චර්යා ධර්ම පිළිබඳව උපදේශකවරු පත් කරලා තිබෙනවා. ඒ කියන්නේ, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් තීරණ ගැනීමේදී ඒ ගන්න තීරණය සදාචාරාත්මක තීරණයක් ද කියලා ඔවුන්ට ගිහිල්ලා සාකච්ඡා කරලා මඟ පෙන්වීමක් ලබා ගන්න පුළුවන්. අපිත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම සංස්කෘතියක් ඇති කරනවා නම්, එවැනි සුදුසු පුද්ගලයෙකු පත් කරන්න පුළුවන්. පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබෙන චර්යා ධර්ම පද්ධතියේ ඒක සඳහන් වනවා. නමුත්, එහෙම එකක් අපේ පද්ධතියට ඇතුළු කරලා නැහැ. අපි මේ පාර්ලිමේන්තුව තුළ චර්යා ධර්ම සංස්කෘතියක් පෝෂණය කරන්න ඕනෑ. මොකද, සමහර වෙලාවට නීතියට අනුව අපි නිවැරදි වෙන්න පුළුවන්. එය technical කරුණක් වෙන්න පුළුවන්. අපි උසාවියකට ගිහිල්ලා කරුණු කියලා උසාවියෙන් බේරෙන්න පුළුවන්. නමුත් උසාවියෙන් බේරුණා කියලා, අපි වරදක් කළාද, නැද්ද කියන එක පැහැදිලි වෙන්නේ නැහැ. චර්යා ධර්ම කියන්නේ, උසාවියේ නීති රීතිවලට එහා ගිය හැසිරීම අගය කරන සංස්කෘතියක්. එවැනි පාර්ලිමේන්තු සංස්කෘතියක් ස්ථාපිත කිරීම අවශ්‍යයි කියන එක තමයි කියන්නේ. ශ්‍රී ලංකාවේ අපටත් එහෙම චර්යා ධර්ම සංස්කෘතියක් පෝෂණය කිරීමේ වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියලා සඳහන් කළ යුතුයි. ඡන්දදායකයා බලාගෙන ඉන්නේ ක්‍රියාවෙන් ගෞරවය දිනා ගන්න පුළුවන් අයව පත් කර ගැනීමටයි. ඒකයි ඡන්දදායකයාගේ කැමැත්ත. ඒ වාගේම මන්ත්‍රීවරුන් හැටියට පත් වුණු අපට තිබෙන වගකීම තමයි, ඡන්දදායකයා අප තුළ තැබූ විශ්වාසය කඩ නොකර චර්යා ධර්ම පද්ධතිය අනුව ක්‍රියා කිරීම. ඒකයි අපට තිබෙන වගකීම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ අද ඇති වෙලා තිබෙන අර්බුදය පිළිබඳව මම වචනයක් කියන්න කැමැතියි. අර්බුදයක් තිබෙන මේ වෙලාවේ තමයි චර්යා ධර්ම පද්ධතිය ගැනත් අප සාකච්ඡා කරන්නේ. රටේ අර්බුදයක් තිබෙන වෙලාවක මේ කරුණ සාකච්ඡාවට යෙදුණු එක මම හිතන හැටියට එක අතකින් හොඳයි. 2015 ජනවාරි මාසයේ මේ රටේ ජනාධිපති ලෙස මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ජන වරමක් ලැබුණ බව අපි දන්නවා. අවුරුදු පහක් ජනාධිපති හැටියට ක්‍රියා කරන්න එතුමාට වරම ලැබුණා. ඒ වාගේම 2015 අගෝස්තු මාසයේ අපේ රජයට විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයට -එක්සත් ජාතික පෙරමුණට- ආසන 106ක් එක්ක ජන වරමක් ලැබුණා, මේ රට පාලනය කරන්න. එම මැතිවරණයේදී වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගත්ත අනෙක් පක්ෂත් එක්ක හවුල් වෙලා තමයි අපි මේ රජය ගෙන යන්නේ. ඒ ජන වරමත් අපට ලැබිලා තිබෙන්නේ ව්‍යවස්ථානුකූලවයි. ව්‍යවස්ථාවේ සඳහන් වන කාල සීමාවට තමයි ඒ ජන වරම ලැබිලා තිබෙන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, a Question was raised by our Leader, the Hon. Dinesh Gunawardena, whether this Government which was formed two years ago still continues to be in power or is presently not in power. The Hon. State Minister is speaking about the Government which was formed unitedly. Whether it is still continuing is a question because of a news headline published today. So, the Hon. Speaker said that he will have it verified from the persons concerned.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා එතුමාගේ අදහස ප්‍රකාශ කළා. එතුමාට ස්තුතියි. එතුමාට පුළුවන් තමන්ගේ අදහස ප්‍රකාශ කරන්න.

ඒ ප්‍රශ්නය අහලා තිබෙන්නේ කථානායකතුමාගෙන්. කථානායකතුමා ඒ ගැන සෝදිසි කරලා, ඒ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙයි කියලා මමත් බලාපොරොත්තු වනවා. ඒ ප්‍රශ්නය තිබෙන අතරේදී මටත් මගේ මතය කියන්න පුළුවන්. පාර්ලිමේන්තුව තුළ මටත් මගේ මතය කියන්න පුළුවන්. ව්‍යවස්ථාව අනුව, අපේ රජයට යම් කාල සීමාවකට ජන වරමක් ලැබී තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Member?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, a point of Order was raised and the Hon. Speaker said -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

At 4.00 p.m., ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ යෝජනාවට අදාළ Debate එක පටන් ගන්න ඕනෑ නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Yes, the Debate will be held at 4.00 p.m.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

It is not a point of Order.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Sir, I am asking whether the Hon. Speaker has been able to get it verified.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. State Minister, you may continue with your speech.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ළඟදී ප්‍රාදේශීය සභා, නගර සභා ඡන්දයක් තිබුණා. ඒ ප්‍රාදේශීය සභා, නගර සභා ඡන්දයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණටත්, ඒ වාගේම අනෙක් පක්ෂවලටත් ජනතාව ජන වරමක් ලබා දුන්නා, එක එක පළාත්වල නගර සභාවල, ප්‍රාදේශීය සභාවල කටයුතු කරගෙන යන්න. ඒකට තමයි "ජන වරම" කියන්නේ. ඒ ජන වරම ලබා දීලා තිබෙන්නේ, ව්‍යවස්ථානුකූලව -ව්‍යවස්ථාවේ තිබෙන පරිදි- ඒ කටයුතු ක්‍රියාත්මක කරගෙන යන්නයි. ඒ නිසා ඒ මුළු කාල පරිච්ඡේදයේම අපේ ආණ්ඩුව පවත්වාගෙන යනවා කියන එක මං නැවතත් මතක් කරන්න කැමතියි. අද අපට තිබෙන ගැටලුව, මේ අවදානම ගැන සඳහන් කරලා මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද මේ තිබෙන අවදානම, අද පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට තිබෙන අවදානම, පක්ෂයකට තිබෙන අවදානමක් නොවෙයි. අද මේ ඇති කරන අවදානම, අර්බුදයක් -ඒකට කියන්න පුළුවන්, මවපු අර්බුදයක් කියලා- මඟින් ඇති කරන්න හදන මේ ගැටලුව, පක්ෂයකට තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. මේක පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට ඇති කරන අවදානමක් කියන එක සඳහන් කරන්න ඕනෑ. මොකද, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට මෙවැනි පහරක් ගැහුවාම, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට -විධායකයට නොවෙයි, පාර්ලිමේන්තුවට- තමයි ඒ පහර වදින්නේ. අනෙක් සමහර රටවල පාර්ලිමේන්තුවලට ඒ පහර වැදිලා තිබෙනවා. ඒකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනුත් වග කියන්න ඕනෑ. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා අපි බොහොම වග කීමෙන් ක්‍රියා කරන්න ඕනෑ. අපේ ලංකාවේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය අනුව පක්ෂ තුනකට වරම් තුනක් ලැබෙන්න පුළුවන්. ජනාධිපතිතුමා එක පක්ෂයකින් පත් වෙන්න පුළුවන්. ආණ්ඩුව තවත් පක්ෂයක ප්‍රමුඛත්වයෙන් පත් වෙන්න පුළුවන්. ඒ වාගේම පළාත් සභා, ප්‍රාදේශීය සභා තවත් පක්ෂයක ජන වරමකින් පත් වෙන්න පුළුවන්. නමුත් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වන විධියට තමයි සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ම ක්‍රියා කළ යුත්තේ කියන එකත් මතක් කරමින්, මා නිහඬ වෙනවා. මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you. Next, the Hon. Vijitha Herath.

[අ.භා. 1.57]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ දැනට තිබෙන්නේ යල් පැන ගිය ස්ථාවර නියෝග. ඒ නිසා ඒ ස්ථාවර නියෝග අලුත් කිරීම ඇත්තටම පාර්ලිමේන්තුවේ කාලීන අවශ්‍යතාවක් වෙලා තිබුණා. ඒ අනුව තමයි ස්ථාවර නියෝග නැවත සකස් කිරීම පිළිබඳ කමිටුව හරහා අද මේ වාර්තාව ඉදිරිපත් වෙලා තිබෙන්නේ. එහි බොහෝ සාධනීය කරුණු ගණනාවක් අඩංගු වෙලා තිබෙනවා. ඒ වාගේම මේ ස්ථාවර නියෝග වෙනස් කිරීමේදී අපි සාකච්ඡා කරලා එකඟ වුණු කරුණු කිහිපයක් අද දවස තුළ වෙනස් කරන්න සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. ඉන් ප්‍රධාන එකක් ගැන මම කියන්නම්. මන්ත්‍රීවරයෙක් තමන්ගේ ප්‍රශ්නය ඇහුවාට පස්සේ අතුරු ප්‍රශ්න තුනක් අහන්න අවස්ථාව තිබෙනවා. නමුත් සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා, ඒක අවස්ථා දෙකක් වෙන්න ඕනෑ කියලා. ඉතා පැහැදිලිව, එහෙම එකකට කමිටුව එකඟ වුණේ නැහැ. මම ඒ කමිටුව නියෝජනය කළා. එහිදී අපි මේ පිළිබඳව සාකච්ඡා කළා. අපි පැහැදිලිව කිව්වා, විශේෂයෙන්ම නවක මන්ත්‍රීවරුන්ට තිබෙන අවස්ථාවක් වන අතුරු ප්‍රශ්න ඇසීමේ අවස්ථාව අහිමි කරන්න එපා කියලා. තාවකාලික අත්හදා බැලීමකට තමයි පසුගිය කාලය තුළ එකඟතාවකට ආවේ, අතුරු ප්‍රශ්න දෙකක් විතරක් අහන්න අවස්ථාව දෙනවා කියලා. නමුත් අද සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා, එය මුළුමනින්ම මේ ස්ථාවර නියෝගවලට ඇතුළත් කිරීමට. ඒකට අපි එකඟ නැහැ. ඒ නිසා දැනට අපි එකඟ වුණු කාරණාව එහෙමම තිබිය යුතුයි කියන ස්ථාවරයේ අපි ඉන්නවා. මොකද, මන්ත්‍රීවරු අගමැතිවරයාගෙන් ප්‍රශ්න අසන අලුත් සම්ප්‍රදායයකුත් ඇති වුණා. එහෙම තැනකට ඇවිල්ලා තිබෙද්දී මන්ත්‍රීවරයාට ප්‍රශ්න අහන්න තිබෙන අවස්ථාව අහිමි කළොත්, ඒක වැරදියි. මොකද, මන්ත්‍රීවරයෙකුට තිබෙන එකම හා ප්‍රධානතම අවස්ථාවක් තමයි, ප්‍රශ්නයක් අහන එකත්, ඒ ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න කීපයක් අහන එකත්. ඒ නිසා අතුරු ප්‍රශ්න තුනක් ඇසීමේ අවස්ථාව ඒ විධියටම තිබිය යුතුයි කියන එක මා නැවත අවධාරණය කරනවා.

ආංශික අධීක්ෂණ කාරක සභා පිළිබඳව විවිධ අදහස් තිබුණා. එදා මේ ආංශික අධීක්ෂණ කාරක සභා පිහිටුවීමේදී අපි ඉතා පැහැදිලිව අවධාරණය කළා, යුරෝපයේ තිබෙන දේශපාලන සංස්කෘතියත් -විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයේ තිබෙන දේශපාලන සංස්කෘතිය-අපේ රටේ තිබෙන දේශපාලන සංස්කෘතියත් වෙනස්, එම නිසා මේ ක්‍රමය එක පාරටම අපේ රටට ආදේශ කරන්න ගියොත් ප්‍රායෝගිකව සාර්ථක වන්නේ නැහැයි කියන එක. නමුත්, එදා ආණ්ඩුව පැත්තෙන් කරුණු ඉදිරිපත් කළා, මේ ක්‍රමය අපි අත් හදා බලමු, ක්‍රියාවට නඟමු කියලා. කෙසේ වෙතත්, අවසානයේ ආපසු උපදේශක කාරක සභා පිහිටුවිය යුතුයි කියලා ඔබතුමන්ලා සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ යෝජනාව මොන පාර්ශ්වයෙන් ආවාද කියන එක මම දන්නේ නැහැ. නමුත්, ඒ පිළිබඳ විවිධ අදහස්, විවිධ සංවාද තිබෙන්න පුළුවන්. බ්‍රිතාන්‍යයේ තිබෙන ආංශික අධීක්ෂණ කාරක සභාවල

විපක්ෂයේ හෝ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු සභාපතිත්වය දරනවා; විවිධ පක්ෂවල සාමාජිකයෝ ඉන්නවා. ඒ කමිටුවට ඇමතිවරයා වුණත් ගෙනැල්ලා ප්‍රශ්න කරන්න පුළුවන්. එය සම්පූර්ණයෙන් මාධ්‍යයට විවෘතයි. ඒ නිසා අදාළ විෂය භාර ඇමතිවරයා ඒ ආංශික අධීක්ෂණ කමිටුව ඉදිරියට ඇවිල්ලා තමන්ගේ විෂය පිළිබඳව, ඒ විෂය හරහා ජනතාවට ලබා දෙන සේවාව පිළිබඳව ඒ කමිටුවේ මන්ත්‍රීවරු විසින් අසන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දිය යුතුයි. එය මුළු රටටම දැක ගන්නත් පුළුවන්; මාධ්‍යයට විවෘතයි. නමුත්, අපේ රටේ එහෙම සංස්කෘතියක් නැහැ. අපි ආංශික අධීක්ෂණ කමිටුවට අදාළ විෂය භාර ඇමතිවරයා ගෙනැල්ලා ප්‍රශ්න කළොත් ඇමතිවරයා අනෙක් අතට කුණුහරුපයෙන් බනියි, "තමුසෙලා කවුද මගෙන් ප්‍රශ්න අහන්න" කියලා. එවැනි සංස්කෘතියක් තමයි අපේ රටේ තිබෙන්නේ. ඒ නිසා මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම සංග්‍රහයක් තිබීම හොඳයි. හැබැයි, අපේ රටේ මේ විධියේ දේශපාලන සංස්කෘතියක් තියා ගෙන මොන චර්යා ධර්ම සංග්‍රහයක් හඳුන්වා දුන්නත්, අපි බලාපොරොත්තු වන සාධනීය ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් වෙයි කියලා මා හිතන්නේ නැහැ. කොහොම වුණත් එය නොකළ යුත්තක් කියලා අපි දකින්නේ නැහැ, එය කළ යුත්තක්. නමුත්, මේ ආංශික අධීක්ෂණ කාරක සභා සහ උපදේශක කාරක සභා පිළිබඳව තිබුණු සංවාදයේදී ආණ්ඩුවත් එකඟතාවකට ඇවිල්ලා නැහැයි කියලා මා හිතනවා. ආණ්ඩුවේ විවිධ පාර්ශ්ව අතර විවිධ මත තිබෙනවා. කෙසේ වෙතත්, ඒ පිළිබඳව අපේ ලොකු විරෝධයක් නැහැ. ඔබතුමන්ලා අවසානයේ එන එකඟතාව උපදේශක කාරක සභාවලට නම්, ඒ සම්බන්ධයෙන් අපට කිසි ප්‍රශ්නයක් නැහැ. මොකද, ඒ උපදේශක කාරක සභා ක්‍රමයටත් අපේ එකඟතාව තිබෙනවා. මම ඒ කරුණත් මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම දැනට සම්පාදනය කර තිබෙන මේ ස්ථාවර නියෝගවල විපක්ෂ නායක ධුරය පිළිබඳව එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. මැතිවරණයට ඉදිරිපත් වුණු දේශපාලන පක්ෂ කථානායකතුමා මඟින් පාර්ලිමේන්තුවේ පිළිගැනීමට ලක්වනවා. ඒ අනුව තමයි විපක්ෂයේ බහුතරය නියෝජනය වන විපක්ෂ නායකවරයා තේරීම කරන්නේ. ඊට වෙනස් ක්‍රමවේදයක් පාවිච්චි කරන්න ගියොත් ඇත්තටම විකෘති තත්ත්වයක් නිර්මාණය වන්න පුළුවන්. උදාහරණයක් විධියට කිව්වොත්, ආණ්ඩු පක්ෂයටම පුළුවන් ස්වාධීන කණ්ඩායමක් විපක්ෂයට එවා, ඒ ස්වාධීන කණ්ඩායමෙන් විපක්ෂ නායකවරයෙක් තෝරන්න. පසුගිය කාලයේ අපි ඒක දැක්කා. මේ ආණ්ඩුව බලයට පත් වූ මුල් අවස්ථාවේදී විපක්ෂ නායක ආණ්ඩු පක්ෂයත් නියෝජනය කළා, විපක්ෂයත් නියෝජනය කළා. විපක්ෂ නායකත් ආණ්ඩු පක්ෂයේ. මේක ක්‍රමයක් විධියට ගැළපෙන එකක් නොවෙයි. මොකද, තමන්ගේ පැත්තෙන් කණ්ඩායමක් විපක්ෂයට එවා විපක්ෂයේ වාඩි කරවා විපක්ෂ නායක ධුරයත් ආණ්ඩුවටම ගන්න ඕනෑම මොහොතකදී ආණ්ඩුවට පුළුවන්. එතැනදී විපක්ෂ නායක කියන තනතුරේ නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. ප්‍රශ්නය තිබෙන්නේ එවිට ඇතිවන විකෘති තත්ත්වයේයි. එතකොට, ආණ්ඩුවට ඕනෑ දේ විපක්ෂ නායකවරයා හරහා කරන්න පුළුවන්. එම නිසා ඒ ක්‍රමවේදය කොහෙත්ම ගැළපෙන්නේ නැහැයි කියලායි අපි හිතන්නේ. ඒ නිසා දැනට ස්ථාවර නියෝගවල තිබෙන ක්‍රමය ඒ සඳහා සුදුසුයි කියන එකයි මා අවධාරණය කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තටම ස්ථාවර නියෝග සියල්ලම සම්පූර්ණ නොවූ තත්ත්වයක් දැනට තිබෙනවා. උදාහරණයක් විධියට කිව්වොත්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව අවසාන තීන්දුවක් දුන්නාට පස්සේ ඒ කාරක සභාවේ තීන්දුව ක්‍රියාත්මක කිරීම අනිවාර්යය වනවා.

නමුත් අපි දන්න, හැම දාම සිද්ධ වෙන දේ තමයි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් තීන්දුවක් ලබා දුන්නාට පසුව, එය ඒ විධියටම ක්‍රියාත්මක නොවීම. කලින්, පාර්ලිමේන්තුවෙන් දෙන තීන්දුවක්, ගරු කථානායකතුමාගේ සභාපතිත්වයෙන් යුතු මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් දෙන තීන්දුවක් ක්‍රියාත්මක කරන්නට රාජ්‍ය සේවයේ සියලු නිලධාරීන් බැඳී සිටියා; ක්‍රියාත්මක කළා. නමුත් පසුගිය කාලයේ ඒක එහෙම වුණේ නැහැ. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් දෙන තීන්දු විවිධ අමාත්‍යාංශ ලේකම්වරුන් දිගින් දිගටම පැහැර හැරීමට ලක් කළා. සමහර වෙලාවට රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඒවා ක්‍රියාත්මක කරන්නේත් නැහැ. අන්න ඒකට උත්තරයක් තවම මේ ස්ථාවර නියෝගවලින් ලැබිලා නැහැ. අධිකරණමය බලයක් නැති වුණාට, පාර්ලිමේන්තුව උත්තරීතරයි කියන නාමකරණයට යටත් වෙලා තිබෙනවා නම්, පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් දෙන තීන්දුව ක්‍රියාත්මක කළ යුතුයි. එවැනි තීන්දුවක් ක්‍රියාත්මක නොකළොත් කළ හැක්කේ කුමක්ද, එතැනින් එහාට යන්නේ කොහේටද කියන ප්‍රශ්නයට උත්තරයක් මේ ස්ථාවර නියෝගවලින් අදත් ලැබිලා නැහැ. එම නිසා ඒ ප්‍රශ්නය තවමත් එහෙමම තිබෙනවා. යම්කිසි අසාධාරණයකට ලක් වුණු කෙනෙකුට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් තීන්දුවක් ලබා දුන් පසු එය ක්‍රියාත්මක නොවන්නේ නම්, එතැනින් එහාට ඔහුට පිළිසරණක් නැති වෙලා තිබෙනවා. ඒකට උත්තරයක් සපයා ගන්න තවම අසමත් වෙලා තිබෙනවාය කියන කාරණයත් මා අවධාරණය කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්ථාවර නියෝග වෙනස් කිරීම හරහාත්, ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම හරහාත් පාර්ලිමේන්තු ක්‍රියාවලිය යම් මට්ටමකට වෙනස් කිරීම තමයි අපේක්ෂා කරන්නේ. විශේෂයෙන් පසුගිය කාලයේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන වෙලාවේ යම් යම් සංශෝධන ඉදිරිපත් වෙලා තිබුණා. එහිදී විශේෂයෙන්ම අපේ පැත්තෙන් සංශෝධනයක් ඉදිරිපත් කළා, "යම්කිසි දේශපාලන පක්ෂයක් නියෝජනය කරලා මහ ජනතාවගේ ඡන්දයෙන් යම්කිසි මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවට තේරී පත් වුණාට පසුව ඔහුට පැති මාරු කරන්නට අයිතියක් නැහැ. පැති මාරු කළොත් ඔහුගේ මන්ත්‍රී ධුරය අහෝසි කළ යුතුයි" කියලා. ඒ යෝජනාව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඇතුළත් කරලා අවසන් කෙටුම්පතත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. එදා, අධිකරණ ඇමතිවරයා හැටියට සිටි ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා අන්තිම මොහොතේ, ඒ යෝජනාව කියවෙන අවස්ථාවේ තමයි වෙනස් කළේ. මට හිතෙන විධියට අද කාටත් පැහැදිලියි ඒ ව්‍යවස්ථාව තිබුණා නම් කොපමණ හොඳද කියලා.

අද මේ රටේ අස්ථාවරත්වයක්, අරාජිකත්වයක් ඇති වෙලා තිබෙනවා. කොයි වෙලාවේද මන්ත්‍රීවරුන් එහාට මෙහාට මාරු වෙන්නේ කියලා හිතා ගන්නට බැහැ. අද තිබෙන ප්‍රධාන ප්‍රශ්නය ඒක. හැම පැත්තෙන්ම ඇහෙන්නේ, මන්ත්‍රීවරුන් කියන්නේ, ඇමතිවරුන් කියන්නේ, "අච්චර දෙන්නම් කිව්වා, මෙච්චර දෙන්නම් කිව්වා, එන්න කිව්වා, ඇමතිකම් දෙන්නම් කිව්වා, සල්ලි දෙන්නම් කිව්වා, මේ පැත්තට එන්න කිව්වා, අර පැත්තට එන්න කිව්වා" කියලා. අද වෙන්දේසියක් ඇවිල්ලා තිබෙන්නේ. තවමත් ඒ අවිනිශ්චිතතාව තිබෙනවා. මල් වට්ටි වෙන්දේසිය වාගේ මන්ත්‍රීවරුන් වෙන්දේසියට ලක්වෙලා තිබෙන්නේ ඒ යෝජනාව එදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් නොකළ නිසායි. දැන් ඇවරයි, දැවරයි කියලා ඉවරයි. තවම තුන් ඇවරයි කියලා නැහැ. "තුන් ඇවරයි" කියනතෙක් බලාගෙන ඉන්නවා. මධ්‍යාහ්න 12.00ට රැස්වීම් තිබ්බා. ඒ රැස්වීම ඉවර වෙලා එන පණිවුඩය මොකක්ද කියලා බලාගෙන ඉන්නවා. ඒ වාගේම හවස 4.00න් පසුව මොකක්ද වෙන්නේ කියලා බලාගෙන ඉන්නවා. ඒ අස්ථාවරත්වය ඇති වෙලා තිබෙන්නේ එවැනි පැති මාරු කිරීමේ ඉඩක් ලබා දීම

[ගරු විජිත හේරත් මහතා]

හරහායි. එසේ පැති මාරු කිරීම ජනතාව ලබා දුන් ජන වරමටත් පටහැනියි. යම්කිසි ප්‍රතිපත්තියක් නියෝජනය කරන පක්ෂයක් හරහා ජන වරමක් මඟින් මන්ත්‍රීවරයෙක් පත් වුණොත්, ඔහුගේ පෞද්ගලික වුවමනා එපාකම් වෙනුවෙන් ඒ ප්‍රතිපත්තියට, පක්ෂයට, ජනතාවගේ ජන වරමට පයින් ගහලා යන්න අයිතියක් නැහැ. එම නිසා එදා ඒ යෝජනාව ව්‍යවස්ථාවට ඇතුළත් නොකිරීමේ අඩුව, එහි ඵල විපාකය අද මුළු රටම දකිනවා. එම නිසා නැවත අවධාරණය කරනවා එදා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඇතුළත් කිරීමට නොහැකි වූ ඒ යෝජනාව අනාගතයේදී හෝ ඇතුළත් කළ යුතුයි කියලා. මොකද, ඒකෙන් තමයි ලබා දුන් ජන වරම, ඒ ප්‍රතිපත්තිය ක්‍රියාවට නඟන්නට තමන්ගේ නියෝජිතයා ක්‍රියා කරනවාය කියන සහතිය ජනතාවට ලබා ගන්නට පුළුවන් වෙන්නේ. ඒ අඩු පාඩුව නැවත මතක් කරමින්, මේ ඉදිරිපත් කර තිබෙන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පතේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කෙටුම්පතේ සාධනීය ලක්ෂණවලට එකඟ වෙමින්, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලදී අතුරු ප්‍රශ්න තුනක් ඇසීමට තිබෙන අවස්ථාව අහෝසි නොකළ යුතුයි කියන කාරණය දැඩිව අවධාරණය කරමින්, - කලින් පැවති ආකාරයට අතුරු ප්‍රශ්න තුනක් ඇසීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ඇති අයිතිය පැවතිය යුතුයි කියන කාරණය අවධාරණය කරමින්- මාගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

[2.09 p.m.]

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

*Bismillahir Rahmanir Raheem.*

Mr. Deputy Chairman of Committees, I am pleased to be associated in adding my comments to the two documents that we placed for approval of the House today - one relating to a new set of Standing Orders for the conduct of Business in this House, as well as the Code of Conduct for Members of Parliament. In my opinion, this effort has gone through almost for the last three years. I have had the privilege of serving in that committee under the Chairmanship of the Hon. Speaker.

First of all, I must thank the Hon. Speaker for having taken his precious time to give leadership to this important effort in drafting amendments to the Standing Orders, which had not been attended to since 1980s. Therefore, very important groundbreaking changes have been incorporated and I would say that particularly, the concept of Sectoral Oversight Committees, which goes to empower the backbenchers in this House, to have an oversight role over the executive functions of the government is a very, very salutary feature. But then, we must understand that certain functions of the High Posts Committee as well as the other financial oversight committees such as the Committees on Public Enterprises and Committee on Public Accounts, may also get overlapped by provisions that we have included in the Sectoral Oversight Committees. Since even the suitability of candidates to institutions that are appointed under each Ministry can once again come under scrutiny by the Sectoral Oversight Committee, and also the accounts and financial matters concerning the enterprises coming under different Ministries could also be examined all over again by the Sectoral Oversight Committees in addition to the Committee on Public Enterprises and the Committee on Public Accounts. So while these overlapping oversight issues can become somewhat confusing I feel that continuous oversight of the executive by the legislative arm is a very welcome feature and we must all agree that these are important changes that have been made.

I would like to venture into another area which had somewhat been ignored and sometimes been purposely ignored by even the Presiding Members of this House. I beg your pardon for saying this. I have, in fact, taken very strong objection to the way in which the Bills are presented to the House. Quite recently we observed that conduct of entertaining Bills for approval in this House has happened in violation of constitutional provisions. Now, I speak in particular - we have had in the recent past two such instances. One particularly -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order please! Hon. Speaker will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එක් කාරණයක් කෙරෙහි ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය යොමු කරන්න කැමැතියි. අද අපට වැඩ කටයුතු රාශියක් තිබෙනවා. විශේෂයෙන්ම අද පස් වරු 3.00ට මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමාත්, නීතිපතිතුමාත්, ඒ වාගේම පළාත් පාලන ඇමතිතුමා ඇතුළු කණ්ඩායමක් පැමිණෙනවා. ඒ නිසා සභානායකතුමාත්, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත්, විශේෂයෙන්ම මෙයට සම්බන්ධ කමිටු සාමාජිකයිනුත් සමඟ සාකච්ඡා කරලා දැන් එකඟත්වයකට පැමිණියා, අපි මෙම විවාදය අද දින පස් වරු 4.00 දක්වා පවත්වාගෙන ගොස් අවසන් කරලා, Committee Stage එක සඳහා ඊළඟ සැසිවාරයේ දවසක් යොදා ගන්න. ඒ සඳහා සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
*Ayes.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අතරතුර සාකච්ඡා කිරීම සඳහා එක් අවස්ථාවක් ලබා දෙනවා. දැන් ගරු ඇමතිතුමා කථා කරන්න.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

Thank you, Mr. Speaker. I am glad that you have come to the Chair at a time when I am raising a very important issue.

We are dealing with the new Standing Orders and we have also made provision for the presentation of Bills. We have made a few changes but some of these changes do not go as far as desirable.

Mr. Speaker, I have in particular taken objection to the way in which certain Bills have been submitted to Parliament in a manner so as to deny the constitutional right of a citizen to petition the Supreme Court against such a Bill. What has happened is, very surreptitiously amendments have been introduced, which are totally different to the content of the Bill that has been presented. The Provincial Councils Elections (Amendment) Bill was presented in such a manner and I took very strong objections to that both in the Party Leaders meeting as well as in this House. There was a subterfuge that was used and this type of incident must be avoided. As a matter of fact, this issue is before the Supreme Court today. We are all awaiting a judgment of the Supreme Court on this issue so that there will be a closure and we will not resort to such ways in which we will deny the constitutional right of a citizen. - [*Interruption.*] Indeed it is! It is a shame.

Now it has come to a situation after the experience we had in the last Local Government elections that the electoral system that we introduced is full of so many lacunas and contradictions that it has finally resulted in total instability. Of course, all of us are responsible for having enacted this piece of legislation. I think, it is very prudent for us to now erase what we did in such a surreptitious manner and revert back to the old system of elections, so that we will be in a position to conduct the Provincial Council elections as soon as possible.

But my point here is in the presentation of Bills we have to be quite responsible. We should not simply rely on the certificate of the Attorney-General to say that the Bill is not inconsistent with the Constitution, but the primary right of every citizen to challenge a Bill should not be denied by very surreptitiously introducing a whole new piece of legislation as amendments. This is what happened. It was such an embarrassing situation. We took strong objection to it. Everything was ignored and it was pushed through. Such things should never be repeated and I hope the Supreme Court should pronounce on the objections that have been made. I know the former Chief Justice went before the Supreme Court and argued this matter since this is a matter of serious concern for legislating in this House.

In addition to that, I believe that our effort to introduce Sectoral Oversight Committees as well as the decision to refer to the Legislative Committees once Bills are presented is commendable. They must come before the Sectoral Oversight Committees as well be referred to the Standing Committees to be examined and then a report be obtained before they are passed in this House. That is a very welcome feature. Particularly, when it comes to Bills which contradict, which are not in consonant with the Devolution Chapter of the Constitution they are referred to the Provincial Councils. There again, I think some welcome features have been incorporated so that the concerns of the Provincial Councils could be also addressed by the relevant Ministries as well as legislative subcommittees in the House.

These are welcome features. Of course, we have also introduced some new Standing Orders to provide for situations such as an impeachment of the Chief Justice. In keeping with the Latimer House Principles, what happened in the recent past prompted all of us to include some important provisions to ensure that principles of fair play, particularly relating to due process, is afforded to any superior court judge who may face an issue of impeachment in the House. So, that will prevent the Hon. Members of the House sitting in judgment without affording sufficient opportunity for a superior court judge, not being able to have a fair trial. Therefore, the issue of incorporating the Latimer House Principles in keeping with the Commonwealth practice in providing for a three-member panel to examine and report to the House before the House takes a decision whether to impeach or not is a very welcome feature and I believe a lot of time has been taken to introduce such important amendments.

Similarly, we have also introduced other features like the Prime Minister's Question Time as well as the rules relating to broadcasting and telecasting of Parliamentary Proceedings. Of course, the issue relating to abuse of the Parliamentary Privileges by Members sometimes brings out allegations in contravention of the Standing Orders. While we have simultaneous broadcast or telecast, once something is said, it could not be expunged or taken away because whatever damage would have been done before the public. So, these issues need to be addressed properly. A responsible - [*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Minister, you have only four more minutes.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

Okay, Hon. Speaker. It was just a matter of concern that I thought should be added.

Coming back to the situation that we are currently faced within the country, a sense of instability has come about because of the disagreements between Parties in deciding on the issue of governance in the country. But I must say that there is a mandate and that mandate is for the National Government to continue and if the National Government cannot continue, I do not think, we should have a Government which is unstable and which is being run by a remote control by somebody else. I know, I have had this kind of an experience once in the past. When I was removed from the Cabinet all of a sudden in 2001, I believe, I crossed over to the Opposition. Then there was

[ගරු රවුෆ් හකීම් මහතා]

a brief period in which there was a "Probationary Government" - the "*Pariwasa Anduwa*" concept. A Similar "*Pariwasa Anduwa*" cannot continue in this country. I believe some steps are being taken; some are being spoken about. But, if all Parties who are supposed to be forming an administration, they must in the first place be prepared to take the Executive Office. If one Party is not taking the Executive Office and if we are going to run by proxy or by having a minority Government, we are violating our own mandate that we got.

So, I must say very categorically to those who have decided to form a Government that as far as the Sri Lanka Muslim Congress is concerned, we would only be part of a stable Government. If we are going to have a Government which is not going to have a substantial majority, it will be a total violation of the mandate that we got to serve the people. So, it is a very important thing. In fact, together with some of our minority Members who met with us, we very clear decided that we would insist on our national leaders to see that they respect the mandate that they have got in forming an administration and that decision should be taken in that spirit without resorting to unnecessary dilatory tactics and they must also see that the confidence that the people have reposed in our national leaders would be respected.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you. The next speaker is the Hon. Douglas Devananda.

[பி.ப. 2.24]

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே!

நாடாளுமன்ற உறுப்பினர்கள் தொடர்பான நடத்தைக் கோவையின் இறுதி வரைவு அங்கீகாரத்திற்கென முன்வைக்கப்பட்டுள்ள நிலையில், அதுதொடர்பில் எனது கருத்துக்களையும் இங்கு முன்வைக்க விரும்புகின்றேன். நாடாளுமன்ற உறுப்பினர்கள் தொடர்பான பொறுப்புகள், கடமைகள், நடத்தைகள் குறித்ததான, நாடாளுமன்றத்திற்குள்ளும் தேர்தல் தொகுதியிலும் பொதுமக்களிடத்திலுமான செயற்பாடுகள் பற்றிய கருத்துக்கள் கடந்த பல வருடங்களாக இந்தச் சபையிலே பல்வேறு சந்தர்ப்பங்களில் முன்வைக்கப்பட்டிருந்தும் இன்றைய நிலையில் அந்த விடயமானது ஓர் இறுதி வரைவாக இந்தச் சபையின் அங்கீகாரத்திற்கு வருவதையிட்டு, இதற்கென முன்முயற்சிகளுடன் வெகு அக்கறைகொண்டு உழைத்துள்ள கௌரவ சபாநாயகர் கரு ஜயசூரிய அவர்களுக்கு முதலில் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

நாடாளுமன்ற உறுப்பினர்களது பொறுப்புகள், கடமைகள், செயற்பாடுகள் தொடர்பிலான விளக்கமின்மை பொது மக்களிடையே பெருமளவில் காணப்படுகின்றது. நாடாளுமன்ற உறுப்பினர்கள் ஒருசிலரிடையேயும் அந்த நிலைமை காணப்படுவதை நாம் அறியக்கூடியதாக உள்ளது. இது அவர்களது தவறு என்று கூறமுடியாது. பொறுப்புகள், கடமைகள் மற்றும் நடத்தைகள் தொடர்பிலான ஒழுங்கமைந்த ஒரு கோவையின் தேவையிலேயே இது தங்கியிருக்கின்றது. நாட்டின் நிறைவேற்று அதிகாரமுடையவரை ஒரு பக்கத்திலும் பொதுமக்களை மறுபக்கத்திலும் வைத்துப் பார்க்கின்றபோது, இதன் மத்தியில் உள்ளவர்கள் யாப்பியலாளர்களாக இருக்கின்ற நாடாளுமன்ற உறுப்பினர்களே என்பதையும் நாம் அவதானத்திற்கொள்ள வேண்டும். சுதந்திரத்திற்குப் பின்னரான எமது நாட்டில் கொள்கைகள் வகுப்பதில் மற்றும் கொள்கை ரீதியிலான தீர்மானங்களை எடுப்பதில் துறைசார்ந்த சட்ட உருவாக்கத்தினது முக்கிய தீர்மான சக்தியாக இருப்பவர்கள் நாடாளுமன்ற உறுப்பினர்களேயாவர். பிரித்தானிய நாடாளுமன்ற சம்பிரதாயத்தின் தொடர் என்ற வகையில் ஆரம்பிக்கப்பட்டிருந்த எமது நாடாளுமன்ற உறுப்பினர்கள் தொடர்பிலான விடயங்களைப் பொறுத்த மட்டில், தேர்ந்தெடுக்கப்படுகின்ற நாடாளுமன்ற உறுப்பினர் யார்? என்பதற்கே எமது மக்கள் முக்கியத்துவம் வழங்குகின்றார்களேயன்றி, அவரது கடப்பாடுகள் யாவை? என்பது தொடர்பில் முக்கியத்துவம் வழங்குவதில்லை. யாப்பினை உருவாக்குகின்றவர் என்பதாலும் அந்த யாப்புக்கு உட்பட்ட வகையில் சட்ட உருவாக்கங்களின்போது மக்களின் பிரதிநிதியாக இருப்பவர் என்பதாலுமே நாடாளுமன்ற உறுப்பினர் யாப்பியலாளர் என இனங்காட்டப்படுகின்றார் என்பதனை பொதுமக்களில் பெரும்பாலானவர்களும் நாடாளுமன்ற உறுப்பினர்களில் ஒருசிலரும் அறிந்திராத நிலைமை இல்லாமலில்லை. குறிப்பாக, 1978ஆம் ஆண்டின் அரசியல் யாப்புக்கிணங்க விருப்புவாக்கு முறைமைக்கு அமைய தேர்ந்தெடுக்கப்படும் நாடாளுமன்ற உறுப்பினர்களது வருகையின் பின்பாக இத்தகையதொரு நிலைமை எழுந்துள்ளதென அரசியல் விமர்சகர்கள் கூறுகின்றதையும் இங்கு நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அதேநேரம், நாட்டில் நிறைவேற்று ஜனாதிபதி முறைமையை மாற்றியமைப்பது குறித்தும் பல்வேறுமட்ட கலந்துரையாடல்கள் இடம்பெறுவதை நாம் கண்டுவருகின்றோம். அவ்வாறு நிறைவேற்று ஜனாதிபதி முறைமையில் மாற்றங்கள் கொண்டுவரப்படுமானால், அதற்கேற்ற வகையில் மக்கள் நலனில் அக்கறையுள்ள, அறிவார்ந்த உறுப்பினர்களைக் கொண்டதாக நாடாளுமன்றத்தை மேலும் பலப்படுத்திக்கொள்வதற்கும் மேற்படி நடத்தைக் கோவையானது உறுதுணையாக அமையும் என எண்ணுகின்றேன். அத்துடன், நாட்டில் ஸ்திரமான ஓர் ஆட்சி அமைய வேண்டியது மிகவும் அவசியமாகும். அது பொருளாதாரம், சட்டம், ஒழுங்கு போன்ற அனைத்துத் துறைகள் சார்ந்து பலமிக்கதாகவும் நிலையானதாகவும் இருக்கும் பட்சத்திலே தமிழ்பேசும் மக்களது அன்றாட, அடிப்படை மற்றும் அரசியல் உரிமைப் பிரச்சினைகள் போன்றவற்றைத் தீர்த்துக்கொள்ள வழிவகுப்பதாக அமையும். எமது மக்கள் கடந்தகால யுத்த மற்றும் தொடர் காலநிலை மாற்றங்களினால் பாதிக்கப்பட்டிருக்கின்ற நிலையில் அம்மக்களது வாழ்க்கையின் மீள்எழுச்சிக்காக ஒரு நிலையான ஆட்சியின் தேவையை இங்கு வலியுறுத்த விரும்புகின்றேன்.

அரச நிர்வாகத்தின் உரிமையானது அந்த அரசினது மக்களுக்குரியதாகும் என்ற அடிப்படை எண்ணக்கருவானது, எமது நாடாளுமன்ற ஆரம்ப நிலையிலிருந்து அது ஒரு நிறுவனமயமாக்கல் என்ற பிரித்தானிய நாடாளுமன்ற வழிமுறைக்கேற்ப வகுக்கப்பட்டிருப்பதைக் காணலாம்.

அதாவது, மக்கள் தாங்கள் சார்ந்த தீர்மானங்களை எடுப்பதற்கான வாய்ப்பினை உருவாக்கிக்கொள்வதே இதன் நோக்கமாகின்றது. அதேநேரம், பிரித்தானியரின் பாராளுமன்றக் கொள்கைக்கிணங்க இந்தச் சபையானது 'பாராளுமன்றம்' எனத் தமிழில் குறிப்பிடப்பட்டாலும் இச்சபையானது தமிழ் மொழியில் 'நாடாளுமன்றம்' என்றே குறிப்பிடப்படல் வேண்டும் என்பதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். கௌரவ சபாநாயகர் அவர்கள் இதனைக் கருத்தில் எடுத்துக்கொள்வார் என நினைக்கின்றேன். பாராளுமன்றம் என்பது உலகத்தை ஆளுகின்ற மன்றம் எனும் கருத்துடைய பிரித்தானியருடைய சொல். நாடாளுமன்றம் என்பது நாட்டை ஆளுகின்ற மன்றம் எனும் கருத்துடையதால், அந்தப் பெயர் மாற்றத்தையும் கௌரவ சபாநாயகர் அவர்கள் கருத்திற்கொள்ள வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். மக்களால் தெரிவு செய்யப்பட்டு இங்கு அனுப்பி வைக்கப்படுகின்ற உறுப்பினர்களுக்கு வழங்கப்படுகின்ற விசேட பொறுப்புக்கள் உண்டு. இந்த விசேட பொறுப்பானது நாட்டினது அரசியல் யாப்பினூடாகச் சட்டமாக முன்வைக்கப்படுகின்றது. இத்தகைய நிலைமைகளைக் கருத்திற்கொண்டு பார்க்கின்றபோது, மக்களுக்கும் தமக்கும் இடையிலான சமூகப் பிணைப்பினை மதித்துச் செயலாற்ற வேண்டிய நிலையில், ஈழ மக்கள் ஜனநாயகக் கட்சியினராகிய நாம் ஆரம்பந்தொட்டு அதனைச் செவ்வனே நிறைவேற்றுவதில் உறுதியாகவே இருந்துவருகின்றோம் என்பதையும் இந்தச் சபையில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, 1994ஆம் ஆண்டில் நாம் இந்த உயரிய சபையிலே காலடி எடுத்து வைத்தோம். அக்காலம் தொடக்கம் இன்றுவரை தொடர்ந்தும் இந்தச் சபையினை எமது மக்கள் சார்பில் நான் பிரதிநிதித்துவப்படுத்தி வருகின்றேன். இந்தக் காலகட்டத்தில் அமைச்சராகவும் பொறுப்பு வகிக்கக்கூடிய சந்தர்ப்பங்கள் எனக்குக் கிடைத்திருந்தன. நாடாளுமன்ற உறுப்பினர் என்ற வகையிலும் அமைச்சர் என்ற வகையிலும் நான் எனது கடமைகளையும் பொறுப்புக்களையும் மிகவும் நியாயமான முறையில் இந்த நாட்டிலே வாழுகின்ற அனைத்து மக்கள் சார்பாகவும் என்னால் இயன்ற வரையில் நிறைவேற்றியுள்ளேன் என்றே கருதுகின்றேன். அந்த வகையில், நாடாளுமன்ற உறுப்பினர்கள் தத்தமது பொறுப்புக்களையும் கடமைகளையும் உணர்ந்துகொள்வது மிகவும் அவசியமாகும். எமது நாட்டில் தொடர்ந்தும் நிகழ்ந்து வருகின்ற பல்வேறு சம்பவங்கள் இதனை எடுத்துக்காட்டுகின்றன என்பதையும் இங்கு தெரிவித்தாக வேண்டும். குறிப்பாக, எமது நாட்டைப் பொறுத்தவரையில் அரச பாடசாலைகளில் பிள்ளைகளைச் சேர்த்துக் கொள்வதிலிருந்து அரச நிறுவனங்களுக்கு பணியாளர்களைச் சேர்த்துக்கொள்வது வரையில் அரசியல்வாதிகளின் தலையீடுகள் தொடர்வதாகவே நாளாந்த ஊடகங்களில் செய்திகள் வெளியாகிக் கொண்டிருக்கின்றன. இவ்வாறான அரசியல் கலாசாரங்கள் மாற்றப்பட வேண்டும். எங்களைத் தெரிவு செய்கின்றவர்களாக எமது மக்களே உள்ளனர். எனவே, நாங்கள் எமது மக்களின் நலன்களிலிருந்தே தீர்மானங்களை எடுத்துச் செயற்பட வேண்டுமேயன்றி, எமது மக்களை மறந்துவிட்டல்ல என்பதனை நாம் நினைவில் இருத்திக்கொள்ள வேண்டும்.

கடந்த காலங்களில் எமது மக்களால் தெரிவு செய்யப்பட்டதன் பின்னர் அம்மக்களை மறந்து செயற்பட்ட பலர் இன்று தமது எதிர்கால அரசியல் இருப்பு தொடர்பில் சிந்திக்கவே இயலாத நிலைக்குத் தள்ளப்பட்டுள்ளனர். இத்தகையவர்களால் எமது மக்களுக்கென ஏற்படுத்தப்பட்ட பயன்பாடுகள் எதுவுமற்ற நிலையில், வீணடிக்கப்பட்ட காலகட்டத்துக்குள் தள்ளப்பட்ட எமது மக்கள் வெறும் எதிர்பார்ப்புக்களை மட்டுமே சுமந்தவர்களாக இன்னமும் வாழ்ந்துவருகின்றனர். மக்களுக்கும் நாடாளுமன்ற உறுப்பினர்களுக்கும் இடையிலான சமூகக் கடப்பாட்டு இடைவெளியானது அதிகரித்துள்ள நிலையில், அம்மக்கள் சார்பில் தேர்ந்தெடுக்கப்பட்டு அனுப்பப்படுகின்ற பிரதிநிதிகள் என்ற வகையில் இந்தப் பிரதிநிதிகள் ஊடாக நிறைவேற்றப்பட வேண்டிய அம்மக்களின் தேவைகள், தீர்க்கப்பட வேண்டிய பிரச்சனைகள் என்பன தேங்கிக் கிடக்கின்ற நிலைமையினையும் அவதானத்திற்கொள்ள வேண்டும். இத்தகைய நிலைமைகள் எமது மக்கள் மத்தியில் ஏற்படக்கூடாது என்பதற்காகவே ஈழ மக்கள் ஜனநாயகக் கட்சியினராகிய நாங்கள் எமது மக்கள் மத்தியிலேயே வாழ்ந்துவருகின்ற கொள்கையைத் தொடர்ந்தும் கடைப்பிடித்து வருகின்றோம். இந்தக் கொள்கை வழியானது, எமது மக்களையும் எமது மக்களது தேவைகள் மற்றும் பிரச்சினைகளையும் தெளிவுறப் புரிந்துகொள்வதற்கும் அந்தப் பிரச்சினைகளைத் தீர்ப்பதற்கும் எமக்கு உறுதுணையாக இருக்கின்றது.

இத்தகையதொரு நிலையில்தான் மீண்டும் வரக்கூடிய தேர்தல்களில் எமது மக்களின் வாக்குகளைப் பெறுவதற்காக இனவாதக் கருத்துக்கள் சம்பந்தப்பட்டவர்களால் மிகவும் இலகுவாக முன்னெடுக்கப்படுகின்றன. ஆனால், அவற்றினது பாரதூரமான விளைவுகள் பற்றி அக்கறை கொள்ளப்படாத காரணத்தினால் எமது மக்களிடையே அவ்விதமான மனிதாபிமானமற்ற கருத்தியல்கள் பதியப்பட்டு விடுகின்றன. இவ்வாறான நிலையில், இனவாதம் கதைத்து மக்களது வாக்குகளை ஒரு தரப்பினர் பெற்றுக்கொள்கின்ற நிலையில், அத்தரப்பினரைத் தோற்கடித்து எமது மக்களின் வாக்குகளைப் பெற எண்ணுகின்ற மற்றைய தரப்பினர் முன்னைய தரப்பினரைவிட அதிகளவில் இனவாதம் கதைக்கவே முற்படுகின்றனர். இந்த நிலை வடக்கில் மட்டுமன்றி, நாட்டின் ஏனைய பகுதிகளிலும் தொடர்ச்சியாக இடம்பெற்று வருவதால் யுத்தத்திற்குப் பின்னரான எமது நாட்டில் தேசிய நல்லிணக்கம் என்பது எமது மக்கள் மத்தியில் இன்னமும் அடிப்படைச் சாத்தியமற்ற விடயமாகவே இருந்துவருகின்றது.

கௌரவ சபாநாயகர் அவர்களே, இலங்கைத் தீவில் பல தசாப்தங்களுக்கு மேலாகக் கூர்மையடைந்திருக்கும் பிரதான பிரச்சினையாக இந்த நாட்டின் தேசிய இனப்பிரச்சினையே இருந்துவருகின்றது. ஆனாலும், இந்த நாட்டின் தேசிய இனப்பிரச்சினையாகிய தமிழ் பேசும் மக்களின் அரசியலுரிமைப் பிரச்சினை என்பது இன்றுவரை தீராப் பிரச்சினையாகவே நீடித்துவருகின்றது. ஆட்சி அதிகாரங்களைக் கைப்பற்றுவதும் ஆட்சி மாற்றங்களை உருவாக்குவதும் தென்னிலங்கையின் பிரதான கட்சிகளின் அக்கறையாக இருந்துவருவதை நான் தவறென்று கூறவில்லை. எந்தவோர் அரசியல் தரப்புக்கும் இந்த விருப்பம் இருந்தேயாகும். அதேபோல், தமிழ் பேசும் மக்களின் அரசியலுரிமைப் பிரச்சினைக்குத் தீர்வு காணும் விடயத்திலும் அக்கறை காட்டப்பட வேண்டுமென்றே நான் விரும்புகின்றேன். தேசிய இனப்பிரச்சினைக்குத் தீர்வு காணும் விடயத்தில் இனிவரும் காலத்தில் தமிழர் தரப்பிலிருந்து தவறுகள் ஏதும் நடக்காது என்றே நான் நம்புகின்றேன். இது குறித்து, விரைவில் ஒன்றுபட்ட உடன்பாட்டுக்கு வருமாறு நான் தமிழர் தரப்பில் உள்ள அனைத்துக் கட்சிகளுக்கும் பகிரங்க அழைப்பு விடுக்கத் தீர்மானித்திருக்கின்றேன். அரசியல் முரண்பாடுகளுக்கப்பால் தமிழ் பேசும் மக்களின் அரசியல் உரிமையென்ற பொது உடன்பாட்டில் அனைத்துத் தமிழ்க் கட்சிகளின் தலைமைகளோடும் நான் பேசவும் தயாராக இருக்கின்றேன்.

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

இலங்கைத்தீவின் இறைமைக்கு எதிராக நான் எதையும் கேட்கவில்லை. ஆனாலும், அந்த இறைமைகள் தமிழ் பேசும் மக்களுக்கும் பகிரப்பட வேண்டும் என்பதையே நான் கேட்கின்றேன். பகிரப்படும் இறைமைகள் பறிக்கப்படக் கூடாது என்பதையும் அதில் மத்திய அரசின் தலையீடுகள் தவிர்க்கப்பட வேண்டும் என்பதையும் நான் வலியுறுத்த விரும்புகின்றேன். "மத்தியில் கூட்டாட்சி! மாநிலத்தில் சுயாட்சி!" இதுவே எங்கள் அரசியல் கோட்பாடு. அதை அடைவதற்கு நாம் தெரிவு செய்திருக்கும் வழிமுறை என்பது உங்கள் எல்லோராலும் ஏற்றுக்கொள்ளப்பட்டிருக்கும் ஒன்றாகும். 13வது திருத்தச் சட்டத்தை முழுமையாக அமுல்படுத்தி, அதை மேலும் பலப்படுத்தி, அதிலிருந்து முன்னோக்கிச் செல்வதே எமது விருப்பமாகும். இதுவே நடைமுறைச்சாத்தியமான அணுகுமுறையும் ஆகும். நான் கூறும் இந்த வழிமுறை ஊடாக இலங்கைத் தீவின் தேசிய இனப்பிரச்சினைக்குத் தீர்வு காணும் திசை நோக்கி நாம் செல்ல முடியும். தமிழர் தரப்பிலிருந்து இன்று உரிமைக்குக் குரல் கொடுக்கும் நாம், அரசின் உறவுக்கும் கரம் கொடுக்கத் தயாராகவே இருக்கின்றோம். இவை வரலாறு எமக்குக் கற்றுத்தந்த பாடங்கள். இந்த அணுகுமுறை அடுத்துவரும் சந்ததிக்குத் தெரியாமல் போகலாம். ஆகவே, வரலாற்று அனுபவங்களின் ஊடாக நாம் எடுத்திருக்கும் நிலைப்பாடு எமது காலத்திலேயே வெற்றியாக்கப்பட வேண்டும். இல்லையேல், இனிவரும் தமிழ் பேசும் சந்ததி போதிய அனுபவமின்றி வேறு விதமாகச் சிந்திக்கும். அது மறுபடியும் எமது மண்ணில் இனக்குரோதங்களுக்கும் இன முரண்பாடுகளுக்கும் வித்திட்டுவிடும். ஆகவே, நீண்ட- நெடிய அனுபவம்மிக்க எமது காலத்திலேயே இந்த நாட்டின் தேசிய இனப்பிரச்சினைக்குச் சுலபமாகத் தீர்வு காணும் வாய்ப்பை நாம் பயன்படுத்த வேண்டும். தென்னிலங்கை அரசியல் தலைமைகளோ அன்றித் தமிழ் பேசும் அரசியல் தலைமைகளோ இந்தத் தேசிய இனப்பிரச்சினைக்குத் தீர்வு காணும் பொறுப்பை அடுத்த சந்ததிக்குச் சுமத்திவிட்டுச் சென்றுவிடுவது மாபெரும் வரலாற்றுத் தவறாகும். இந்தத் தலைமுறையிலேயே நாம் அனைவரும் ஒன்றுபட்டுத் தீர்வு காணவேண்டும். சமாதானப் புறாக்களைக் கையிலேந்தி வந்தவர்கள் நாம்! எங்கள் கைகளில் உரிமைகளைத் தந்து கைகுலுக்கிக் கொள்ளுங்கள்!

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த அரசு ஆரம்பந்தொட்டு வலியுறுத்தி வருகின்ற தேசிய நல்லிணக்கம் குறித்த விடயத்தில் நாம் வெற்றிகாண வேண்டும். அதற்காக அரசியல் உரிமைப் பிரச்சினைக்கான தீர்வு உட்பட எமது மக்களின் உணர்வு ரீதியிலான பல பிரச்சினைகளுக்கான தீர்வுகள் காணப்பட வேண்டும். காணாமற்போனோரைக் கண்டறிவதற்கான உறவுகளின் போராட்டமானது கிளிநொச்சிக் கந்தசுவாமி கோவில் முன்றலில் ஆரம்பித்து, இற்றைக்குச் சரியாக ஒரு வருடம் பூர்த்தியாகின்றது. இந்த உறவுகளுடன் பேச்சுவார்த்தைகள் நடத்தப்படுகின்றனவே அன்றி, இதுவரையில் இவர்களது பிரச்சினைக்கு எந்தவொரு பதிலும் வழங்கப்படவில்லை. தங்களது சொந்தக் காணி - நிலங்களை விடுவிக்கக் கோரி, கேப்பாபுலவு மக்கள் இன்றுடன் 355 நாட்களாகப் போராடி வருகின்றார்கள். தமிழ் அரசியல் கைதிகளின் விடுதலை குறித்துச் சாத்தியமான ஏற்பாடுகள் இன்னமும் முன்னெடுக்கப்பட்டதாக இல்லை.

மீள்குடியேற்றப்பட்டுள்ள மக்கள் அடிப்படை வசதிகள்கூட இல்லாமை காரணமாகப் பல்வேறு பகுதிகளைவிட்டு வெளியேறுகின்ற நிலைமைகள் காணப்படுகின்றன. வலிகாமம் வடக்கு மக்களில் கணிசமான தொகையினர் இன்னமும் மீள்குடியேற்றப்படாத நிலையில், முகாம்களில் உள, உடல் ரீதியில் அனுபவித்து வருகின்ற துன்பதுயரங்கள் ஏராளமாகும். இந்த மக்கள் தங்களைப் பாதித்து வருகின்ற விடயங்களிலிருந்து மீள்வதற்காகவே தமது பிரதிநிதிகள் என்ற ரீதியில் வாக்களித்து, நாடாளுமன்றத்திற்கு உறுப்பினர்களை அனுப்பியுள்ளனர். அந்தவகையில், அந்த மக்களுக்கு உதவ முடியாதபோது நாடாளுமன்ற உறுப்பினர் பதவி என்பது தேவைதானா? என்கின்ற நிலையே எமது மக்கள் மத்தியில் உருவாகின்றது. இது நியாயமான நிலைப்பாடு என்பதில் சந்தேகமில்லை. மக்களிடம் பெறுகின்ற வாக்குகள் அந்த மக்களின் பணிகளுக்காக மாற்றீடு செய்யப்பட வேண்டும். அதனைச் சொந்த அரசியல் நலன்களுக்காக அல்லது கட்சி அரசியல் நலன்களுக்காக மாத்திரம் பயன்படுத்தப்படுகின்ற நிலைமைகள் எப்போது தவிர்க்கப்படுமோ, அப்போதுதான் எமது மக்களுக்கு விமோசனம் கிடைக்கும் என்பதை இங்கு வலியுறுத்திக் கூற விரும்புகின்றேன்.

இனவாதம் தூண்டப்பட்டு அதனால் பெறப்படுகின்ற மக்களது வாக்குகள் இன்னோர் இனத்தை அழிப்பதற்கே என அர்த்தப்படுத்திக்கொள்வது கொலைக்குச் சமமானது. வாக்குக் கேட்பவர்கள் எந்தளவுக்கு இனவாதத்தைக் கக்கி மக்களை உசுப்பேத்தினாலும் தூண்டினாலும் அம்மக்கள் திடீர் உணர்ச்சி மேலீட்டால் வழங்குகின்ற வாக்குகள் இன்னோர் இனத்தை அழிப்பதற்கானதாக இராது. தம் இனத்தைப் பாதுகாப்பதற்கான வாக்குகளாகவே அவை கருதப்படல் வேண்டும். அவ்வாறு ஓர் இனத்தைக் காப்பது என்பது அந்த இனத்தின் - மக்களின் அடிப்படை உரிமைகள் முதற்கொண்டு அரசியல் உரிமைகள் வரையிலான ஏற்பாடுகளைப் பெறுவதாகவும் பேணிப் பாதுகாப்பதாகவும் அமைதல் வேண்டும். இது இன்னோர் இனத்தின் மீதான இனவாதமாக இருக்க முடியாது. அந்த வகையில் இங்கு இனவாதமென்பது ஒருசிலரது சுயலாபம் கருதிய பேசுபொருளாக மாத்திரம் கொள்ளப்படுகின்றதே அன்றி, அது செயற்படுபொருளல்ல. இதனை நன்கு உணர்ந்துகொள்கின்ற நிலையில், எமது மக்களின் உணர்வுபூர்வமான பல்வேறு பிரச்சினைகளைத் தீர்த்துக்கொள்வதற்கு எந்தவொரு தரப்பினரும் தடையாக இருக்கப்போவதில்லை என்பதை இங்கு தெரிவித்துக் கொள்கின்றேன். அதேநேரம், இத்தகைய குறுகிய இனவாதம் பேசித்தான் எமது மக்களின் வாக்குகளைப் பெறவேண்டும் என்ற கொள்கை ஈழமக்கள் ஜனநாயகக் கட்சியினராகிய எம்மிடம் இல்லை. எனவே, எமது வெற்றியானது மனிதாபிமானத்தைக் கொண்டது என்பதையும் தோல்விகள் இனவாதத்தை நோக்கியது என்பதையும் தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்!

[අ.භා. 2.39]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කරලා, අලුත් ස්ථාවර නියෝග ඇති කිරීම පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ මෙම කාරණය පිළිබඳව තවදුරටත් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම පිළිබඳව පළමු කොටම අපි ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඉන් අනතුරුව කාරක සභා අවස්ථාවට පිවිසීම ඉතාම වැදගත්. එයට හේතුව අප විසින් ඉදිරිපත් කරන ලද කරුණු රාශියක් පිළිබඳව යළිත් සැලකිල්ලට ගැනීමට අපි බලාපොරොත්තු වන නිසායි.

පසුගිය කාල පරිච්ඡේදය තුළ -හැත්තෑ වසරක් තුළ- එනම් අපි බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවෙන් නිදහස් වුණු දවසේ සිට අපේ ස්ථාවර නියෝග සකස් කරලා තිබෙනවා. ඒ, සෝල්බරි ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාව, පළමුවැනි ජනරජ ව්‍යවස්ථාව හා දෙවැනි ජනරජ ව්‍යවස්ථාව යටතේ. ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රී සංඛ්‍යාව මුල් පාර්ලිමේන්තුවට වඩා දෙගුණයකට වඩා වැඩි සංඛ්‍යාවක් දක්වා අද වනකොට පරිවර්තනය වී තිබෙනවා. මේ නිසා ස්ථාවර නියෝග සකස් කිරීමේදී පාර්ලිමේන්තුව කටයුතු කරන ආකාරය පිළිබඳව අලුතින් සිතීමට අවතීර්ණ විය යුතුයි. එසේ නැතිව අපි අනුකරණවාදී පිළිවෙතක් අනුගමනය කළොත් අපට ගැටලුවලට මුහුණ දෙන්න සිදු වනවා. මම ඒ සම්බන්ධයෙන් උදාහරණයක් කියන්න කැමැතියි.

පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව ගැන මෙහි සඳහන් වනවා. මෙහි අටවැනි කාරණයේ සඳහන්ව තිබෙනවා, බ්‍රහස්පතින්දා හා සිකුරාදා දිනවල දී පූර්ව භාග 10.30ට පාර්ලිමේන්තුවේ රැස්වීම් පටන් ගන්නවා කියලා. අනික් දිනවල අපර භාග 1.00ට පාර්ලිමේන්තු රැස්වීම් පටන් ගන්නවා. මේ කාරණා දෙක අතර කිසිම සාධාරණත්වයක් නැහැ. ලංකාවේ සියලුම කාර්යාල උදේ පටන් ගන්නවා. මන්ත්‍රීවරු වැඩි වීම නිසා පාර්ලිමේන්තුවේ කටයුතු වැඩි වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවට පවරන කටයුතු පසුගිය ව්‍යවස්ථාවන් රාශිය තුළදී වැඩිවෙලා තිබෙනවා. රටට ආදර්ශයක් ලබා දෙමින් දැනට දවස් දෙකකට සීමා කර තිබෙන උදේ රැස් වී සවස විසිරී යෑම, සියලු දවස්වලට යොදා ගැනීම ඉතාම යෝග්‍ය යැයි කියා මා හිතනවා. ඒ තුළින් මහජන නියෝජිතයන් හැටියට වාගේම ව්‍යවස්ථාදායකයේ නියෝජිතයන් හැටියට අපට තිබෙන වගකීම් රාශිය ඉෂ්ට කරන්න පුළුවන් වනවා.

පාර්ලිමේන්තුව ඉෂ්ට කරන කාර්ය භාරයේදී රජය හා විපක්ෂය කියලා දෙකක් තිබෙනවා. එය ඉතිහාසගතව පාර්ලිමේන්තු සම්ප්‍රදායයේ තිබෙනවා. පාර්ලිමේන්තුවේ කථානායකතුමාට පිටුපස්සේ දොරටුවෙන් තට්ටු කළත් "මට ඇසෙන්නේ නැහැ" කියලා කියපු දවසේ ඉඳලා පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය ඇති වුණු බව ඔබතුමා දන්නවා. රජතුමාටවත් තට්ටු කළාට දොර ඇරියේ නැති පාර්ලිමේන්තුවේ ගැටුම තමයි අද දක්වා ශත වර්ෂ ගණනාවක් තිස්සේ වර්ධනය වෙමින් පවතින්නේ. අදත් දෝංකාර දෙමින් පවතින්නේ එවැනි ගැටලුවක්. ආණ්ඩුවත්, විපක්ෂයත් අතර යම්කිසි කාරණාවක් පිළිබඳ සාකච්ඡා කිරීමට මහජන මන්ත්‍රීවරුන්ට තිබෙන අවකාශය පිළිවෙතකට සකස් කර දීමට ස්ථාවර නියෝග අවශ්‍ය වනවා.

මම තව උදාහරණයක් කියන්න කැමැතියි. අපි බලමු, Committee on High Posts ගැන. ගරු කථානායකතුමනි, මා කලිනුත් මේ ගැන කිව්වා. අපි යළිත් ඒ පිළිබඳව කියනවා. High Posts Committee එක ඇති කිරීමෙන් පස්සේ මේ පත් වීම් ලබන රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් එන්නේ එම ආයතනය විනාශ වුණාට පසුවයි. අපි ඒ නිසා මේ ස්ථාවර නියෝගය වෙනසකට භාජන කරන්න ඕනෑ. මෙය United States Congress එකෙන් ගත් දෙයක්. ඔවුන් පත් වීම ලැබුවාට පස්සේ ඉක්මනට ඇවිල්ලා එම කාරක සභාව ඉදිරියේ පෙනී සිට, ඔහු එම පත්වීමට සුදුසුද නැද්ද, ඔහුට ඒ සඳහා හැකියාවක් තිබෙනවාද නැද්ද, ඔහු සම්බන්ධයෙන් මහජන පෙත්සම් තිබෙනවාද නැද්ද කියලා සොයා බලා ඉක්මනින් එය අනුමත කර දීම වඩා සුදුසුයි. පත්වීම් ලබා අවුරුද්දක් විතර ගත වී ඒ ආයතනය විනාශයට පත් වුණාට පස්සේ මේ අය ගෙන්වීමේ කාර්යයට තමයි අද අපි ගොදුරු වෙලා සිටින්නේ. එහි ඵල විපාක තමයි වෙනත් ආකාරයේ කොමිෂන් සභා, කමිටු, විගණකාධිපති වාර්තා හරහා එන්නේ. නමුත් මේ මහජන ආයතන, මහජන දේපළ, මහජන මුදල්.

මම මේ කාරණා ටික ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. මේ පිළිබඳ සාකච්ඡා කළ අවස්ථාවලදී අපි මෙවැනි කරුණු රාශියක් ඉදිරිපත් කළා. උදාහරණයක් වශයෙන් කිව්වොත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ විධියට තිබෙනවා. දැනුත් තිබෙන විවාදය ඒකයි. පළාත් පාලන මැතිවරණයක් පැවැත්තුවා. ගරු කථානායකතුමනි, ඔබතුමයි, මමයි මේ ඡන්ද ක්‍රමය වෙනස් කරන්න ඒ කාලයේ ඉඳලා දිගටම කරපු උත්සාහයේ ප්‍රතිඵලයක් හැටියට ඡන්ද ක්‍රමය වෙනස් කළා. රවුෆ් හකීම් ඇමතිතුමා සමඟ මම එකඟ වෙන්නේ නැහැ. ඡන්ද ප්‍රතිඵලයෙන් පස්සේ දැන් එතුමා කියනවා, නැවත පරණ ක්‍රමයට යන්න ඕනෑ කියලා. නැහැ, අපි ඇති කරපු ඡන්ද ක්‍රමය ඉතා හොඳට සකස් වෙලා, එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව තුළ ඒකඡන්දයෙන් සම්මත වුණා. ජය පරාජය කෙසේ වුණත්, ඒ සම්මත කරපු පනතට, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙත උල්ලංඝනය කරමින්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කියන ලද කරුණු උල්ලංඝනනය කරමින් පාර්ලිමේන්තුව හදිසියේ සම්මත කළ වගන්ති රාශියක් නිසා -විවිධ කෑලි හදිසියේ එකතු කිරීමේ ප්‍රතිඵලය නිසා- පළාත් පාලන ආයතනත් අද අර්බුදයකට මුහුණ දෙනවා. ඒ නිසා අපි පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අනුගමනය කරන්න ඕනෑ. පාර්ලිමේන්තු ස්ථාවර නියෝග එලෙස සකස් කරගන්නට ඕනෑ. ඒ වාගේම, දුර්වලතා තිබෙන තැන් ශක්තිමත් කරන්නට ඕනෑ. වැරදි ආකාරයේ කටයුතු කරන්න කුමන අවස්ථාවක හෝ ඉඩක් නොලැබෙන ආකාරයට ඒවා සකස් විය යුතුයි කියා සඳහන් කරන්න කැමැතියි.

අග්‍රාමාත්‍යවරයා පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන වගන්තිය තමයි, "පාර්ලිමේන්තුවේ බහුතරයක් දිනාගත හැකි පුද්ගලයා අග්‍රාමාත්‍යවරයා හැටියට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ" කියන වගන්තිය. විරුද්ධ පක්ෂයේ නායකයා පත් කරනකොට එහෙම වගන්තියක් නැහැ. දැන් ඒවා වෙනස් වෙන්න ඕනෑ. ඒකයි අපි සාධාරණව කියන්නේ. පුද්ගලයෙකුගේ ප්‍රශ්නයක් නොවෙයි මෙතැන තිබෙන්නේ. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු 55දෙනෙක් මෙතැන ඉන්නවා. ඊට වඩා ඉතාම අඩු සංඛ්‍යාවක් තමයි විපක්ෂයේ නායකතුමා සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා නියෝජනය කරන්නේ. කොහොමද, ඒක සාධාරණීකරණය කරන්නේ? දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ව්‍යවස්ථා මණ්ඩලයක් පත්වෙනවා. ඔබතුමා තමයි එහි සභාපති. ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතු කරන්නේ විපක්ෂය; විරුද්ධ පක්ෂයේ නායකයා. නමුත්, විරුද්ධ පක්ෂයේ නායකයාගෙන් විරුද්ධ පක්ෂය නියෝජනය වෙන්නේ නැහැ. ඒ නිසා සංඛ්‍යා ලේඛන බැලීම නොවෙයි වඩා හොඳ. "පාර්ලිමේන්තුවේ බහුතරයක් දිනාගත හැකි කෙනා අග්‍රාමාත්‍යවරයා විය යුතුයි" යන වගන්තිය වගේ වගන්තියක්, ඒ කියන්නේ, "විරුද්ධ පක්ෂයේ බහුතරය නියෝජනය කරන කෙනා විපක්ෂ නායක විය යුතුයි" කියන වගන්තිය ඇතුළත් කිරීම ඉතාම වැදගත්. අද මොන ප්‍රශ්න තිබුණත් අපි මේ යථාර්ථයට පැමිණිය යුතුයි. යථාර්ථයට පැමිණෙන්නේ නැත්නම් අපි මෙම ස්ථාවර නියෝග ඇති කළත්, මහ ජනයා එය සැලකිල්ලට භාජන කරන්නේ අපි මහ ජනතාවට නොසලකනවාය, ජනතා නියෝජිතයන්ට නොසලකනවාය යන හැඟීම ඇතිවයි. අපි හිතනවා නම්, ජනතාව තුළ එහෙම එකක් නැහැ කියලා, ඒක වැරදියි. මොකද, අවුරුදු කිහිපයක් රට පාලනය කරපු අයට දැන් ජනතාවගෙන් කෙළින් තීන්දුවක් ලැබුණා. ඒ ජනතා තීන්දුව පළාත් පාලන මැතිවරණයේදී ලැබුණත්, පළාත් පාලනයටත් වඩා ජාතික වූ මැතිවරණයක් හැටියට පරිවර්තනය වීමෙන් ඇති කළ ප්‍රතිඵලයයි එයින් කියාපාන්නේ. ජනතාව කියන දේට අපි සවන් දෙන්න ඕනෑ. අපි සවන් නොදී ඇති කරන,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මට තව සුළු කාලයයි වෙන්ව තිබෙන්නේ.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

මේ වාගේ කරුණු රාශියක් තිබෙනවා. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම සාකච්ඡා කරලා මේ විධියට සුළු වශයෙන් හෝ වෙනසකට භාජන විය යුතු කාරුණු රාශියක් ඉදිරි දවස් තුළදී ඔබතුමාට ලිඛිතව භාර දෙන්න බලාපොරොත්තු වෙනවා. එයින් පසු ඒ පිළිබඳව කාරක සභාවක් පවත්වලා, කාරක සභා අවස්ථාවට පිවිසීමේ කාර්ය සිදු කරන ලෙස අපි ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ආරම්භයේ සිට අපි ඉල්ලා සිටියා, මහජන මන්ත්‍රීවරුන්ට අවශ්‍ය උපදේශක කාරක සභාවන් දිගටම පවත්වාගෙන යන්න කියලා. අද වන විට ආණ්ඩුව එකඟවෙලා තිබෙනවා; -මෙතෙක් කල් එකඟ වුණේ නැහැ- අද දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී එකඟ වුණා, උපදේශක කාරක සභා යළි ඇති කරන්න. මේ සම්බන්ධව ඇති කරපු කාරක සභාවලට අතිරේකව මේ කාරක සභාවන් ඇති කිරීම සඳහා වූ කාර්යයේ වැදගත් වෙනස වන්නේ, උපදේශක කාරක සභාව සඳහා අමාත්‍යවරයා සිටිය යුතු වීමයි, ගරු කථානායකතුමනි. අමාත්‍යවරයා නොමැතිව නිලධාරින් හා ආයතන ගන්නා වූ තීරණ ක්‍රියාත්මකවෙලා නැති නිසාත්, මහජන මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම් ඉෂ්ට වෙලා නැති නිසාත් තමයි මේ ප්‍රශ්නය වඩාත් මතු වී තිබෙන්නේ. එම නිසා මේ ගැන සැලකිලිමත් විය යුතුයි.

අනික් කාරණය තමයි, මන්ත්‍රීවරුන් සභාවෙන් පිට කිරීම. මන්ත්‍රීවරුන් සභාවෙන් පිට කිරීමේ වගන්තිය සංශෝධනය වනවා. සාමාන්‍යයෙන් මන්ත්‍රීවරයකුගේ පාර්ලිමේන්තු සේවය තාවකාලිකව තහනම් කර සභාවෙන් පිට කරන්නේ එක් කෙනා, එක් කෙනා වශයෙනුයි. නමුත් මට පෙනෙන විධියට මේ ස්ථාවර නියෝගවලට ඇතුළත් කරලා තිබෙනවා, මන්ත්‍රීවරුන් තොග වශයෙන් පිට කිරීමේ වගන්තියක්. ඒක කාලෝචිත නැහැ. එයින් අදහස් කරන්නේ කුමක්ද? එක් මන්ත්‍රීවරයකු පිට කරන්න හැකියාව තිබෙනවා නම්, 10 වරකට 10 දෙනකු පිට කරන්න පුළුවන්. නමුත් 10 දෙනාම එකට පිට කරන්න එකම කාරණය නොවෙන්න පුළුවන්. මෙය බරපතළ කාරණයක්. මහ ජනයා වෙනුවෙන් කරුණු කියන්න, තර්ක කරන්න, වාද කරන්න මහජන මන්ත්‍රීවරයකුට තිබෙන අයිතිය -යම් යම් අවස්ථාවලදී ඒවා ගැටුම්කාරී වාද බවට පත් වන්න පුළුවන්. ඒ මන්ත්‍රීවරයාට කරුණක් පාර්ලිමේන්තුවට කියන්න තිබෙන අයිතිවාසිකම- මෙලෙස මන්ත්‍රී කණ්ඩායමකට යටපත් කිරීමේ ක්‍රියාවලියකට පත් කිරීම සඳහා ස්ථාවර නියෝග සකස් විය යුතු නැහැ.

ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධව ඇති කරන වෙනස්කම් ගැන අපේ අදහසුත් පළ කළා. තව අදහස් කිහිපයකුත් තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු අග්‍ර විනිශ්චයකාර නෙවිල් සමරකෝන් මහතා මේ පාර්ලිමේන්තුවට ගෙනැවිත් ඔහුව ඉවත් කිරීම සඳහා වූ කාරක සභාවේ මන්ත්‍රීවරුන් හැටියට සරත් මුත්තෙට්ටුවෙගම මැතිතුමාත්, මමත්, "අනුගමනය කළ යුතු පිළිවෙත" කියලා අදහස් මාලාවක් ඉදිරිපත් කළා. එය තවමත් පාර්ලිමේන්තු වාර්තාවේ තිබෙනවා. ඒ පිළිවෙත් අනුගමනය කරන්න, ඒ වෙනස්කම් කරන්න ඉඩ ලැබුණේ නැහැ. මේ තත්ත්වය ගැන දැන් ඇති වී තිබෙන සාකච්ඡාව පොදු එකඟතාවකට පරිවර්තනය වන සාකච්ඡාවක් බවට පත් කළොත්, මා හිතන හැටියට ඒ තුළින් පාර්ලිමේන්තුවට රටේ ජනතාවගේ තිබෙන ගෞරවය තහවුරු කර ගැනීමට හැකි වීම හා මන්ත්‍රීවරුන්ට කටයුතු කිරීම වඩාත් පහසු වනවා. ඒ පිළිබඳව ලිඛිතව අදහස් ඉදිරිපත් කරන්න ඔබතුමා අපට තවත් කාල වේලාව දී තිබෙනවා. ඒ පිළිබඳව අපි ඉදිරිපත් කරන කරුණු සැලකිල්ලට ගනියි කියලා අපි බලාපොරොත්තු වනවා. ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඊළඟට ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථමයෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත. අද මේ විවාදය සවස 4.00 දක්වා පැවැත්වීමට අපි බලාපොරොත්තු වනවා.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES took the Chair.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Ajith Mannapperuma, you may start your speech.

[අ.භා. 2.52]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, දැන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩිවෙලා තිබෙනවාය, පාර්ලිමේන්තු රැස්වීම් අඟහරුවාදා සහ බදාදා දිනවලදී සවස 1.00ටත්, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවලදී උදේ 10.30ටත් ආරම්භ වනවාය කියලා. නමුත් හැම දාම උදේ 10.30ට රැස්වෙන්න කියලායි එතුමා යෝජනා කළේ. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වැඩි වුණේ මේ ආණ්ඩුව තිබුණු කාලයේ නොවෙයි. එදා ඉඳලාම මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩිවෙලා තිබුණා. ඒ කාලය තුළ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට කර ගන්න බැරි වුණු දේ මේ රජය ලවා කර ගැනීම තුළත් සතුටු වන්න පුළුවන් කාරණයක් තිබෙනවා. මොකද, එතුමන්ලා කියන දේ එදා ජනාධිපතිවරයා ඇහුවේ නැහැ. අද අපට කියනවා, අවුරුදු 20ක් රට පාලනය කරලාත් කර ගන්න බැරි වුණු දේ කරලා දෙන්න කියලා.

ඒ විතරක් නොවෙයි. එතුමා හැම තිස්සේම උත්සාහ කරන්නේ පසුගිය පළාත් පාලන මැතිවරණය අගමැති තෝරන මැතිවරණයක් කර ගන්නයි. හැම දාම ජනතාව මුළාවට පත් කරන දේ තමයි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ඇතුළු කණ්ඩායම කළේ.

එදා විදුලි පුටුවක් පෙන්න-පෙන්නා ඡන්දය ඉල්ලුවා. එක පාරක් ජනතාව රැවටුණා. දෙවැනි වතාවට ජනතාව රැවටුණේ නැහැ. අද වෙන කල් අපට ඒ විදුලි පුටුව හොයා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම මෙතුමන්ලා, 'මහින්ද අගමැති කරමු' කියලා තමයි ඡන්ද ව්‍යාපාරය ගෙනිච්චේ. ගමේ ජනතාව මහින්දත් එක්ක සංසන්දනය කළේ, අපි දාපු ගුරුවරයායි; එහෙම නැත්නම් අපි දාපු වෘත්තිකයායි; එහෙම නැත්නම් අපි දාපු සමාජ සේවකයායි. එහෙම කරලා මහින්දව අගමැති කරන එක හොඳයි, මේ ඉන්න ගුරුවරයාව අගමැති කරනවාට වඩා; මේ ඉන්න සමාජ සේවකයාව අගමැති කරනවාට වඩා කියලා හිතාගෙන ජනතාව කතිරය ගැහුවා. බලපුවාම මහින්ද අගමැති වෙන්නේත් නැහැ. අන්තිමට

පිස්තෝල්කාරයෙක්, කිණිසිකාරයෙක්, කුඩුකාරයෙක් තමයි ගමේ දේශපාලනය කරන්න, ගමෙන් මතු වෙලා තිබෙන්නේ. ජනතාව ගොනාට අන්දපු දේ නැවත කරන්න එපා. දිගින් දිගටම කරන්නේ ලොකු බරපතළ වැරැද්දක්. එදා, 'විදුලි පුටුව' ගැන කිව්වා වාගේ ඔය කථාව ඔවුන්ට ආපහු කියන්න බැරි වෙයි. නමුත්, ඊළඟ මැතිවරණයේදීත් ජනතාව ගොනාට අන්දවන්න තවත් උප්පරවැට්ටියක් ලැහැස්ති කරගෙන එයි.

මහින්ද අගමැති කරනවාද, ගමේ වෘත්තිකයා අගමැති කරනවාද එහෙම නැත්නම් මහින්ද අගමැති කරනවාද, ගමේ ඉන්න සමාජ සේවකයා අගමැති කරනවාද කියලා තීරණය කරපු ගමේ ජනතාවට අන්තිමට වෙන්නේ මොකක්ද? මහින්ද අගමැති වෙන්නේ නැහැ. අර කොහේවත් ඉන්න කුඩුකාරයෙක්, මංකොල්ලකාරයෙක්, තක්කඩියෙක් තමයි ගමේ මන්ත්‍රීවරයා වෙලා තිබෙන්නේ කියන එක ජනතාව තේරුම් ගත්තාම ඔය ගෙනයන ජනතා ව්‍යාපාරයට මොකක්ද වෙන්නේ කියන එක අපට හිතාගන්න පුළුවන්. ඒ වාගේම එතුමා හැම දාම කියනවා, "ඒකාබද්ධ විපක්ෂයෙන් මන්ත්‍රීවරුන් 40 ගණනක් ඉන්නවා. ඒක තමයි ලොකුම විපක්ෂය. ඒක හින්දා ඒකට විපක්ෂ නායකකම දෙන්න ඕනෑ" කියලා. මම හිතනවා, ඒකෙනුත් කරන්නේ ජනතාව නොමඟ යැවීමක් කියලා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් ඒ තරම් අඥාන නැහැ. මොකද, 'ඒකාබද්ධ විපක්ෂය' කියලා කණ්ඩායමක් පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා නැහැ. මේක ඇතුළේ කල්ලියක් හදාගෙන, ඒ ගොල්ලන්ම 'ඒකාබද්ධ විපක්ෂය' කියලා නම් කරගෙන ඒකට විපක්ෂ නායකකම ඉල්ලනවාය කියන එකත් විහිළුවට කාරණාවක් වෙනවා. මොන චර්යා ධර්ම පද්ධතිය හැදුවත් මේ වාගේ විහිළුකාරයන්ව, මේ වාගේ ජනතාව රවට්ටන අයව කොහොමද හදන්නේ කියන එක විශේෂයෙන්ම හිතන්න වෙනවා.

ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මන්ත්‍රීවරුන් අතුරු ප්‍රශ්න තුනක් අහන එක ගැන. එතුමා ප්‍රශංසා කළා, "ස්ථාවර නියෝග වෙනවස් වීම හොඳයි. ඒ වාගේම යම් තරමින් හෝ මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම පද්ධතියක් ඇති කිරීම හොඳයි" කියලා. නමුත් එතුමාට ප්‍රශ්නයක් තිබුණා, ඇමතිවරයෙකුගෙන් තමුන් ඇසූ ප්‍රශ්නය පැහැදිලි කරගැනීම සඳහා මන්ත්‍රීවරයෙකුට අතුරු ප්‍රශ්න තුනක් ඇසීමට තිබූ අවස්ථාව අතුරු ප්‍රශ්න දෙකට අඩු කිරීම සම්බන්ධයෙන්. මේ පාර්ලිමේන්තුවේ අපට තිබුණු අත් දැකීම් අනුව දන්නා දෙයක් තමයි, ඇත්තටම තුන්වැනි අතුරු ප්‍රශ්නය බොහෝ විට අහන්නේ වැඩක් නැති දෙයක් ගැන කියන එක. ප්‍රශ්නයක් අහලා ඒක පැහැදිලි කර ගන්න බොහෝ විට අතුරු ප්‍රශ්න තුනක් මන්ත්‍රීවරුන්ට නැහැ. තුන්වැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ, කඩාකප්පල්කාරී නැත්නම් කාවහරි අපහසුතාවට පත් කරන ප්‍රශ්නයක්; එහෙම නැත්නම් 'කොහේද යන්නේ - මල්ලේ පොල්' වාගේ ප්‍රශ්නයක්. ගරු මන්ත්‍රීතුමන්ලාගේ, පාර්ලිමේන්තුවේ වටිනා කාලය තුන්වැනි අතුරු ප්‍රශ්නයක් වෙනුවෙන් වැය කරන එකත් සුදුසු වෙන්නේ නැහැ කියන එකයි මේ පාර්ලිමේන්තුවේ අවුරුදු තුනක, හතරක අපට තිබෙන අත් දැකීම් එක්ක බැලුවාම පේරෙන්නේ. ඒ ප්‍රශ්නය වැදගත් විධියට අහනවා නම් කමක් නැහැ. සමහර විට ඒක සුදුසු වෙන්න පුළුවන්. නමුත් අපි අත් දැකීම් තුළින් දැකපු දෙයක් තමයි, ප්‍රශ්නය ඇහුවාට පස්සේ ඒක පැහැදිලි කර ගැනීමට නොවෙයි අතුරු ප්‍රශ්න තුනම අහන්නේ කියන එක. ප්‍රශ්නයක් අහලා ඒ ප්‍රශ්නය පැහැදිලි කර ගැනීම සඳහා අතුරු ප්‍රශ්න දෙකකට සීමා වීම කාලෝචිතයි කියන එකයි මම කියන්නේ.

මේ රටේ ඉතිහාසයේ කවදාවත් නැති විධියට ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මන්ත්‍රීවරයෙකුට ප්‍රශ්න තුනක් ඇසීමේ අවස්ථාව මේ රජය යටතේ ලබා දීලා තිබෙනවා. මේ ප්‍රජාතන්ත්‍රවාදී ගමන් මඟම අපට පාරාවළල්ලක් වුණාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. අගමැතිතුමාගෙන් සෘජුව මන්ත්‍රීවරයෙකුට ප්‍රශ්න තුනක් ඇසීමේ කාලය මේ රටේ ඉතිහාසයේ කිසිම දවසක තිබුණේ නැහැ. ඒක අපි ඇති කළා. ආංශික අධීක්ෂණ කාරක සභා හරහා අමාත්‍යාංශය පිළිබඳව සොයා බලන්න මන්ත්‍රීවරුන්ට භාර දුන්නා; විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් භාර දුන්නා. "කෝප්" කමිටුව වාගේ එකක සභාපතිකම විපක්ෂයට භාර දුන්නා. ඒ භාර දීපු එකෙනුත් සමහර වෙලාවට අවශ්‍ය දේ වුණාද කියන එකත් ප්‍රශ්නයක්. අන්තිමට මඩ ගැහිල්ලකට ඒ කමිටුවේ සභාපතිකම පාවිච්චි කළාද කියන එක ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුව කොච්චර හොඳ ගමනක් යන්න උත්සාහ කළත්, ඒ හොඳකම අපට පාරාවළල්ලක් වෙලා තිබෙනවා.

ඒ නිසා මේ ගැන හිතන්න ඕනෑ; සැලකිල්ලට ගන්න ඕනෑ. මොකද, යහ පාලනයක් ඇති කරලා, චර්යා ධර්ම පද්ධතියක් ඇති කරලා, ස්ථාවර නියෝග නැවත සංශෝධනය කරලා අපි උත්සාහ කරන්නේ හොඳ රටක් හදන්නයි. නමුත්, බොහෝ අය මේ කරුණු පාවිච්චි කරන්නේ තමන්ගේ පක්ෂය ශක්තිමත් කර ගන්නයි; තමන්ගේ පක්ෂය ජනප්‍රිය කර ගන්නයි. ඒක යහ පාලනයට, යහ පාලනය අගය කරන අයට බේදනීය අවස්ථාවක්, පහරක් කියන එක මම විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම පද්ධතියක් ඇති කිරීම 2015 ජනවාරි 08වැනි දා අපි දීපු එක පොරොන්දුවක්. ඊට පස්සේ ඒ ගැන කෙමෙන් කෙමෙන් සාකච්ඡාවට බඳුන් වුණා. විශේෂයෙන් ගරු කථානායකතුමා විපක්ෂයේ ඉන්න කාලයේ පවා කථා කළා, මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම පද්ධතියක් සකස් කරන්න ඕනෑය කියලා. ගරු අගමැතිතුමාගේත්, ගරු ජනාධිපතිතුමාගේත් මඟ පෙන්වීම තුළ සහ අපේ ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමාගේ විශේෂ අවධානය තුළ අපට අද මේ වාර්තාව එළිදක්වන්න පුළුවන්කම ලැබුණා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ විවාද කරලා සැලකිල්ලට ගැනීම විශේෂයෙන් යහ පාලනය බලාපොරොත්තු වන මේ රටේ ජනතාවට, 2015 ජනවාරි 08වැනි දා විප්ලවයට එකතු වුණු ජනතාවට සුවිශේෂී අස්වැසිල්ලක් වෙනවා ඇතැයි කියා අපි හිතනවා.

2015 ජනවාරි 08වැනි දා මේ රජය පිහිටුවන කොට මේ රටේ ජනතාවට අපි පොරොන්දු දුන්නා. ඒ පොරොන්දු කිසිවක් අප අමතක කරන්නේ නැතිව කෙමෙන් කෙමෙන් ඉටු කරමින් යනවා. මොකද, ඒකාධිපති පාලනයක් යහ පාලනයට වෙනස් කරන්න එක ලෙහෙසි වැඩක් නොවෙයි. ඒකට ගල් මුල් ප්‍රහාර එනවා; විවිධ මැර ප්‍රහාර එනවා; විවිධ චෝදනා එල්ල වෙනවා. නමුත්, අපි ජනතාවට දුන් පොරොන්දු අමතක නොකර ක්‍රම ක්‍රමයෙන් ඒවා ඉටු කරන්න කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුව කියන්නේ රටේ තිබෙන උත්තරීතර ආයතනය. මේ ආයතනයට විවිධ පුද්ගලයන් එනවා මන්ත්‍රීවරුන් බවට පත් වෙලා. සමහර විට ඒ අය උගත් පිරිස නියෝජනය කරන අය වෙන්න පුළුවන්; නූගත් පිරිස නියෝජනය කරන අය වෙන්න පුළුවන්; කෘෂිකර්මයේ යෙදෙන අය නියෝජනය කරන අය වෙන්න පුළුවන්; කම්කරුවන් නියෝජනය කරන අය වෙන්න පුළුවන්; එහෙම නැත්නම් වෛද්‍යවරුන් නියෝජනය කරන අය වෙන්න පුළුවන්; විවිධ වෘත්තිකයන් නියෝජනය කරන අය වෙන්න පුළුවන්; විවිධ සමාජ ස්තර නියෝජනය කරන අය වෙන්න පුළුවන්. ඒ විවිධත්වය තුළ තමයි මේ පාර්ලිමේන්තුවේ වටිනාකම තිබෙන්නේ. නමුත්, කෙනකු කියනවා නම් ඉගෙන ගත්තු අයගෙන්ම මේ පාර්ලිමේන්තුව පිරිලා ඉන්න ඕනෑය කියලා, මේ පාර්ලිමේන්තුවේ

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

චරිතාකමක් නැහැ. මේ 225 දෙනා විවිධ අදහස් දක්වන, විවිධ සමාජ ස්ථර නියෝජනය කරන පුද්ගලයන්ගෙන් සමන්විත වන විටයි පාර්ලිමේන්තුවේ චරිතාකම තිබෙන්නේ. මේ මන්ත්‍රීවරුන්, විවිධ ඇදහිලිවල, විවිධ විශ්වාසවල, විවිධ සංස්කෘති තුළ විවිධ ප්‍රදේශවලට නායකත්වය දරන අය. මේ පාර්ලිමේන්තුව තුළ ඒ අයගේ හැසිරීම් රටාව දිහාව බලලා ඒ අයගේ ප්‍රදේශ ගැන රටේ මිනිස්සු තීරණය කරනවා. ඒ ප්‍රදේශය මෙවැනි ප්‍රදේශයක් කියන එක ඒ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයාගෙන් කැඩපතකින් වාගේ පෙනෙනවා.

ඒ විතරක් නොවෙයි. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225 දෙනාම එකතු වෙලා කරන කථා බහ අනුව, කරන වැඩ කටයුතු අනුව, හැසිරීම් රටාව අනුව තමයි ලෝකය ලංකාව මනින්නේ. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැසිරෙන ආකාරය අනුව තමයි ලෝකය මේ රට දිහා බලන්නේ. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම පද්ධතියක් ඇති කරන එක අපි විශේෂයෙන්ම අගය කළ යුතුයි.

සමහර අය රට හදන්න කියලා, ගම හදන්න කියලා පාර්ලිමේන්තුවට ආවාට, තමන්ගේ පක්ෂය තුළ ඉස්මතු වෙන්න දඟලන අවස්ථා අපි දැකලා තිබෙනවා. එහෙම නැත්නම්, එකම පක්ෂයේ හිටියත් මනාප ක්‍රමය තුළ වඩාත් ඉස්මතු වෙන්න චර්යා ධර්ම පද්ධති කඩාගෙන කටයුතු කළ අවස්ථා අප දැකලා තිබෙනවා. නමුත්, මේ දේවල්වලින් හෑල්ලුවට පත් වෙන්නේ රටයි. එහෙම නැත්නම් රටේ උත්තරීතර ආයතනය වන මෙම ආයතනයයි.

ගරු අග්‍රාමාත්‍යතුමාටත්, අතිගරු ජනාධිපතිතුමාටත් වාගේම මේ යෝජනා ගැන විශාල උනන්දුවක් දැක්වූ ගරු කථානායකතුමාටත් මම මේ අවස්ථාවේදී විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, මේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසය තුළට මේ චර්යා ධර්ම පද්ධතිය ඇතුළත් කරලා ශිෂ්ට සම්පන්න සමාජයක් නිර්මාණය කිරීමේ ඉහළම තලය නිර්මාණය කිරීමට, සකස් කිරීමට ගත්ත පියවර ගැන.

අද වන කොට මන්ත්‍රීවරයකු කිව්වාම සමහර වෙලාවට චාරයක් නැති පුද්ගලයකු, හොරෙකු, වංචාකාරයකුය කියන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එහෙමත් නැත්නම් පාර්ලිමේන්තුව කියන්නේ මොන්ටිසෝරියක්ය කියන තැනට පත් වෙලා තිබෙනවා. මේක එක දවසකින් වුණු දෙයක් නොවෙයි. කාලයක සිට ක්‍රම ක්‍රමයෙන් ඒ තැනට මේ පාර්ලිමේන්තුව පත් වුණා.

නමුත්, එහි හැරවුම් ලක්ෂ්‍යයක් වශයෙන් අද මේ ගන්නා තීන්දුව, අද මේ සාකච්ඡා කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය සම්මත කරලා මේ රටේ ගමන් මාර්ගය වෙනස් කිරීමට ගන්නා උත්සාහය විශේෂයෙන්ම අගය කරනවා.

යහ පාලනය කියන කොට චර්යා ධර්ම සංග්‍රහය විශේෂයෙන්ම සඳහන් වෙන්න ඕනෑ; අගය කරන්න ඕනෑ. හිටපු ජනාධිපතිවරයාට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහින් සාක්ෂියක් දෙන්න කිව්වාම, මේ පාර්ලිමේන්තුව ඇතුළේ මන්ත්‍රීවරු බුදියා ගත්ත හැටි අපි දැක්කා. ඒක ලෝකයම දැක්කා. ඒ නිසා අපේ පාර්ලිමේන්තුව කොච්චර හෑල්ලුවට ලක් වුණාද?

ඒ වාගේම, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා 1993දී ගොවිජන සේවා පනත ගැන මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරද්දී, එවකට ආණ්ඩු පක්ෂයේ හිටපු ඇමතිවරයෙක් එතුමාට පෙරළා ගෙන ගැහුවා. අද ඒ දෙගොල්ලෝම එක්කාසු වෙලා ඒකාබද්ධ විපක්ෂයේ ඉන්නවා. එවැනි ඉතිහාස අපට තිබෙනවා.

පසුගිය දවස්වල මන්ත්‍රීවරු හැසිරුණු විලාශය, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ක්‍රියා කලාපය අපි දැක්කා; ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට පහර දීපු හැටි දැක්කා. ඒ අය හැසිරුණු විලාශය මුළු රටම දැකගත්තා. මේවා පිළිකුලට ලක් වෙනවා. එහෙම පිළිකුලට ලක් වෙන්නේ එක මන්ත්‍රීවරයෙක් නොවෙයි, සමස්ත මන්ත්‍රීවරුන්ම පිළිකුලට ලක් වෙනවා. පාර්ලිමේන්තුව විතරක් නොවෙයි පිළිකුලට ලක් වෙන්නේ. ලෝකය ඉදිරියේ මුළු රටම පිළිකුලට ලක් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්තුමාට අපේ මන්ත්‍රීවරයෙක් ගිහිල්ලා පහර දීපු හැටි අපි දැක්කා. ඒ වාගේම, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු මහ ලේකම් බෑන් කී මූන් මහත්මයා මේ රටට ආවා. ආණ්ඩුව වීසා දෙනවා බෑන් කී මූන් මහත්මයාට මේ රටට එන්න කියලා. එතුමා ආපුවාම එතුමාට විරුද්ධව ඇමතිවරයෙක් ගිහිල්ලා පාරේ බුදියා ගන්නවා. ඒ නිසා අපි හෑල්ලු වෙලා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධානයේ මහ කොමසාරිස්තුමිය වන නවනීදන් පිල්ලේ මැතිනියට වීසා දීලායි මේ රටට ගෙන්වා ගත්තේ. එහෙම ආරාධනා කරලා ගෙන්වා ගත්තාම ඇමතිතුමෙක් ගිහිල්ලා, "මම කැමැතියි ඔයා කසාද බඳින්න" කියලා මඟුල් යෝජනා කරනවා. එවැනි දේ නිසා රට කොපමණ අපහසුතාවකට පත් වුණාද?

මේ රටේ බුද්ධිමතුන් මේ රට හැර ආලා ගියා. පාර්ලිමේන්තුවේ සංස්කෘතියක් නැත්නම්, රටේ ප්‍රධාන ස්ථානයේ සංස්කෘතියක් නැත්නම්, ඒක නියෝජනය කරන මන්ත්‍රීවරයාගේ සංස්කෘතියක් නැත්නම්, අපට කොහෙන්ද සංස්කෘතියක් තිබෙන්නේ, අපට කොහොමද රටේ සාධාරණයක් ඉෂ්ට වෙන්නේ කියලා මේ රටේ උගතුන්, බුද්ධිමතුන් රට හැර දමා ගිය කාලයක් තිබුණා. ලංකාව දිහා ලෝකය බලන කොට මිලේච්ඡ රටක්, ගෝත්‍රිකයන් ඉන්න රටක් කියන හැඟීම තුළ මේ රටට තිබුණු වාසි අහිමි වෙලා ගියා. GSP plus වාගේ සහන මේ රටට නැති වෙලා ගිහිල්ලා අපේ රටේ රැකී රක්ෂා ප්‍රශ්න ඇති වුණා. එදා ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා ඇඟලුම් කර්මාන්තශාලා 200ක් මේ රටේ හදලා ගමේ ඉන්න තරුණ තරුණියන්ට රැකී රක්ෂා හදලා දුන්නත්, මෙවැනි මන්ත්‍රීවරුන් තුළ තිබුණු සංස්කෘතිය නිසා ඒවායින් 180කට වැඩි ප්‍රමාණයක් වැහිලා ගියා.

ඒ විතරක් නොවෙයි, ධීවරයන්ට තිබුණු ලොකුම දෙයක් වූ, අපේ රටෙන් යුරෝපයට මත්ස්‍ය අපනයනය කිරීමට තිබුණු අවස්ථාව තහනම් වුණා. එමඟින් රටේ ආර්ථිකය කඩා වැටුණා. ඒ නිසා මන්ත්‍රීවරුන්ට චර්යා ධර්ම සංග්‍රහයක් ඇති කරලා, රටට කීර්තියක් වෙන විධියට හැසිරෙන විලාශය ගැන දැනුවත් කිරීම අද ආරම්භ කිරීම ගැන විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා.

මේ සියලු වැරදි කරපු මන්ත්‍රීවරු, වැරදි කරපු ඇමතිවරු වැරැද්ද කරලා උසාවියට යනවා. වැරැද්ද කරලා පොලීසියට යනවා. ගිහිල්ලා කටඋත්තර දෙනවා. පසුව, වීරයෝ වාගේයි, වීර කැප්පෙටිපොළලා වාගේයි එතැනින් එළියට එන්නේ. කට්ටිය මල් මාලා දමලා ඒ අය පිළිගන්නවා. නීතිය ක්‍රියාත්මක කරන පොලිස් නිලධාරියාට පහර දීපු කෙනාට මල් මාලා දමලා උස්සා ගෙනයි අරගෙන යන්නේ. අන්න ඒ සංස්කෘතිය මේ රටේ නැති කරන්න වෙනවා. මන්ත්‍රීවරුන්ට චර්යා ධර්ම සංග්‍රහයක් ඇති කළා වාගේ රටටත්, රටේ ජනතාවටත් කවුද ගැළපෙන කෙනා, කවුද අගය කරන්න ඕනෑ කෙනා, කවුද අපේ විශ්වාසවන්තයා වෙන්න ඕනෑ කෙනා කියන එකත් හඳුන්වා දීමේ වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ.

මේ රජය කොමිෂන් සභා ඇති කරලා රාජ්‍ය සේවකයා ශක්තිමත් කළා. දේශපාලකයන්ගේ අතකොළුවක් නොවී, තමන්ගේ බුද්ධිය මෙහෙයවා වැඩ කරන්න පුළුවන් රාජ්‍ය සේවයක් පසුගිය අවුරුදු දෙකක කාලය තුළ මේ රටේ ඇති කළා. ඒ විතරක් නොවෙයි, ඉතිහාසයේ වැඩිම පඩි වැඩි කිරීමක් රජයේ සේවකයන්ට ලබා දුන්නා. නමුත්, අන්තිමට රාජ්‍ය සේවකයා ඡන්දය දුන්නේ කාටද? යහ පාලනයටද මේ කැමැත්ත? රටේ ජනතාවට තවමත් අවශ්‍ය වෙන්නේ සපත්තුවට පෑගෙන පාලනයක්ද, ජනතාවට අවශ්‍ය වෙන්නේ ඒකාධිපති පාලනයක්ද කියන එක ගැන පසුගිය මැතිවරණයේ ප්‍රතිඵල දිහා බැලුවාම අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපි යහ පාලනයක් ඇති කරනවා, අපි සමාජය ශක්තිමත් කරනවා, අපි සාධාරණ සමාජයක් ඇති කරනවා, අපි ආචාර ධර්ම පද්ධතිය ඇති කරනවා කියනවා.

නමුත්, ඒවා අගය කරන ජනතාවක් නිර්මාණය කිරීම අපට වඩාත් වැදගත් වෙනවා. එහෙම නැතිව මේ දේවල් කරලා හරියන්නේ නැහැ. ඒ නිසා චර්යා ධර්ම සංග්‍රහය ගැන වගේම මේ ගැනත් හිතන්න ඕනෑ කියන එක මා විශේෂයෙන්ම කියන්න කැමැතියි. කවුරු හරි මන්ත්‍රී අපේක්ෂකයකු ගිහිල්ලා පොලිසියට ගහලා හිරේට ගියොත්, ඔහු අනිවාර්යෙන්ම ඡන්දයෙන් දිනලා මන්ත්‍රීවරයකු වෙනවා. එහෙම සංස්කෘතියක් මේ රටේ තිබෙන්නේ. එහෙම නම් අපි චර්යා ධර්ම සංග්‍රහය ගැන කථා කරන්න ඉස්සෙල්ලා මේ රටේ සංස්කෘතිය නිර්මාණය කරන්න ඕනෑ; සංස්කෘතිය හැඩගස්සන්න ඕනෑ. නැත්නම් අපි තව තවත් පස්සට යන එක තමයි සිද්ධ වෙන්නේ. අපි හරි දේ කරන්න ගිහිල්ලා, හරි දේ හඳුන්වා දෙන්න ගිහිල්ලා අපි අන්තිමට පිටුපස්සට විසි වෙන පක්ෂයක්, පිටුපස්සට විසි වන ආණ්ඩුවක් බවට පත් වෙනවා කියන එකත් විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ. එම නිසා මම කියනවා, මෙතැනින් නවතින්න එපා. අද රටේ හැමදේම පිරිහිලා තිබෙනවා. මන්ත්‍රීවරයා පිරිහිලා තිබෙනවා. වෛද්‍යවරයා වෘත්තියෙන් පිරිහිලා තිබෙනවා. එදා එහෙම පිරිහිලා තිබුණේ නැහැ. ගුරුවරයා අද වෘත්තියෙන් පිරිහිලා තිබෙනවා. සියලු වෘත්තිකයන්, ආගමික නායකයන් අද පිරිහිලා තිබෙනවා. එදා තත්ත්වයට වඩා සමාජ ගෞරවය අද අඩු වෙලා තිබෙනවා. ඒ නිසා මේ රට තුළ සංස්කෘතික විපර්යාසයක් කරන්න ඕනෑ. නැත්නම් අපි තනියම යහ පාලනයක් හදන්න ගිහිල්ලා, අපි තනියම සංස්කෘතියක් නිර්මාණය කරන්න ගිහිල්ලා, අපි තනියම මේ රට ලෝකයේ ඉහළ තලයට උස්සලා තියන්න ගිහිල්ලා අවසානයේදී අපි තනි වෙන එක මිසක් වෙනත් දෙයක් සිදු වන්නේ නැහැ කියන එක මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා නීති හදනවා වාගේම, ක්‍රමවේද සකස් කරනවා වාගේම, යහ පාලනය ගැනත් ජනතාවට අවබෝධ කරගැනීමේ වැඩ පිළිවෙළක් නිර්මාණය කරන එක අපේ වගකීමක් කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

පසුගිය කාලයේ මන්ත්‍රීවරු පළාත් පාලන ආයතනවලට ආවේ කොන්ත්‍රාත් කරන්නයි. ඒ බව අපි කවුරුත් දන්නවා. ඒ නිසා තමයි පසුගිය ඡන්දයේදී මන්ත්‍රීවරයා පෙන්වන්නේ නැතිව "මහින්ද අගමැති කරමු" කියලා පෝස්ටර් ගැහුවේ. පත් වෙන මන්ත්‍රීවරයා කවුද කියලාවත් මිනිස්සු දන්නේ නැහැ. පෝස්ටරයේ තිබෙන පත් වෙන මන්ත්‍රීවරයාගේ ෆොටෝ එක බොහොම පොඩියි. ඒ පෝස්ටරයේම මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ලොකු ෆොටෝ එකක් ගහලා තිබෙනවා. තව මාසයකින් තමයි ගමට පත් වෙච්ච මන්ත්‍රීවරයා කවුද කියලා ගමේ ජනතාව දැනගන්නේ; රටේ ජනතාව දැනගන්නේ. එතකොට පසුතැවිලි වුණාට වැඩක් නැහැ. එතකොට වෙන්න ඕනෑ දේ වෙලා ඉවරයි. ඒ සංස්කෘතිය නැති කරන්න ඕනෑ. ඒ නිසා පළාත් සභාවට, පළාත් පාලන ආයතනවලට, මාධ්‍ය ආයතනවලට මේ හැම තැනකටම මේ චර්යා ධර්ම සංග්‍රහයක් නිර්මාණය කිරීම සඳහා අපි කටයුතු කරන්නට ඕනෑ කියන එකත් මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි.

මේ ආකාරයෙන් කටයුතු කළාට විතරක් මදි. ජනතාවට මේ චර්යා ධර්ම සංග්‍රහය අගය කරන්න, ජනතාවට මේ චර්යා ධර්ම සංග්‍රහය ගැන පැහැදිලි කරලා දෙන්න, අපි ඉන්නේ කොතැනද කියලා පැහැදිලි කරන වැඩ පිළිවෙළකුත් මේ හා සමාන්තරව ඇති කරන්න ඕනෑ. මොකද, යහ පාලනයට වඩා අර යකඩ සපත්තුවට පෑගෙන සමාජය ජනතාව අගය කරන බව පසුගියදා සිදුවීම්වලින් අපි දැක්කා. රජයේ සේවකයාට ලැබුණු නිදහසට වඩා, රජයේ සේවකයාට නිදහසේ වැඩ කටයුතු කරන්න ලැබුණු අවස්ථාවට වඩා, රජයේ සේවකයා දේශපාලන අතකොළුවක්වීමට කැමැතියි කියන එක පසුගිය මැතිවරණ ප්‍රතිඵලවලින් අපි දැක්කා. ඒ නිසා අපි අපි මීට වඩා එහාට ගිය පුළුල් වැඩසටහනක් මේ සඳහා ඇති කළ යුතුයි කියන එකත් විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි.

පසුගිය ආණ්ඩුව කාලයේ රතුපස්වල මගේ ගමේ වතුර ඉල්ලපු ජනතාවට සිදු වූ දේ අපි දැක්කා. පසුගිය ආණ්ඩුවේ නරුමයෝ ගිහිල්ලා වතුර ඉල්ලපු ජනතාව වෙඩි තියලා මැරුවා. අමු අමුවේ ජනතාව මරා දැම්මා. පාසල් දරුවෝ මැරුවා. නමුත්, රතුපස්වල ජනතාවත් පසුගිය මැතිවරණයේ දී ඡන්දය දුන්නේ කාටද? ඒ මිනී මරුවන්ටමයි. කටුනායක රොෂේන් චානක වැනි තරුණයන් මරා දැමුවා. නමුත් ඒ, කම්කරුවන් ඡන්දය දුන්නේත් එම මිනී මරුවන්ටමයි. හලාවත ධීවරයෝ ඉන්ධන මිල අඩු කරන්න කියලා කෑ ගහලා උද්ඝෝෂණය කළා. ඒ අයව අමු අමුවේ ඝාතනය කළා. හැබැයි, ඒ ප්‍රදේශයේ මිනිස්සු ඡන්දය දුන්නේත් ඒ මිනී මරුවන්ටමයි. එහෙම නම් ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළකුත් මේ සමාන්තරව යන්න ඕනෑ. ජනතාවට මේ යහ පාලනය මොකක්ද කියන එක කියලා දෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
හොඳයි. ඒ නිසා මුලින්ම චර්යා ධර්ම සංග්‍රහයක් තුළ ශිෂ්ට සම්පන්නව වැඩ කරන, නීතියට අනුව වැඩ කරන මන්ත්‍රීවරුන් සහිත පාර්ලිමේන්තුවක් නිර්මාණය කළොත් තමයි රජයේ සේවකයාත්, අනෙකුත් ආයතනත් හරියට හැදෙන්නේ. එහෙම නම් මේ ගත්ත ක්‍රියා මාර්ගය අත් දෙකම උස්සලා අනුමත කරමින්, අප ගෙනයන මෙම වැඩ පිළිවෙළ ජනතාව හා එකතු වෙලා කරමු කියන එකත් යෝජනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 3.13]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින සාකච්ඡාවට ගැනෙන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධනය සහ චර්යා ධර්ම සංග්‍රහය පිළිබඳව කථා කරන්නට ලැබීම සතුටට කරුණක්.

විශේෂයෙන්ම මෙම ස්ථාවර නියෝග ප්‍රතිශෝධනය සහ චර්යා ධර්ම සංග්‍රහය පිළිබඳව ගරු කථානායකතුමා සුවිශේෂී උනන්දුවක්

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

දැක්වූ බව අපි දන්නවා. අපි එම කාරක සභාවේ සාමාජිකයන් නොවුණත්, අපේ අදහස් ප්‍රකාශ කරන්න සමහර අවස්ථාවලදී අපිත් එම කාරක සභාවට සහභාගි වුණා. අපේ තිබෙන සමහර ස්ථාවර නියෝග වෙනස් කරන්න, ඒවා ගැන අලුතින් සලකා බලන්න අවශ්‍ය කාරණා ගැන සාකච්ඡා කළා. ඒ වාගේම හොඳ චර්යා ධර්ම පද්ධතියක් මේ රටට අවශ්‍යයි; පාර්ලිමේන්තුවට අවශ්‍යයි; දේශපාලනයට අවශ්‍යයි කියන එක ගැන සමාජයේ කතිකාවතක් තිබුණා. මේ කාරණා දෙකම ඉතාම වැදගත්. රටේ අනාගතය ගැන කල්පනා කරන, රටේ උන්නතිය ගැන කල්පනා කරන දේශපාලනඥයන් පිරිසක් බිහි කරන්න දරන උත්සාහයක ප්‍රතිඵලයක් හැටියට තමයි අපි මෙය දකින්නේ. හැබැයි සමහර වෙලාවට මේ උත්සාහය ගඟට කැපූ ඉනි වාගේ වෙයිද කියන ප්‍රශ්නය අපිට මතු වෙනවා. මොකද, අපි කොයි වාගේ අපේක්ෂකයන්ටද ඡන්දය දෙන්නේ කියන එක ගැන මේ රටේ ප්‍රශ්නයක් තිබෙනවා. කොයි තරම් ආචාර ධර්ම සහිත දේශපාලනඥයන් හිටියත්, චර්යා ධර්ම පද්ධතියක් සහිත දේශපාලනඥයන් හිටියත්, දිනන පිරිස විවිධ මංකොල්ලකෑම් කළ හොරු, වංචාකාරයෝ පිරිසක් නම්, මෙවැනි චර්යා ධර්ම සහිත ජන සමාජයක් හදන්නේ කොහොමද කියන කාරණය ලොකු ප්‍රශ්නාර්ථයක් සමඟ මේ රටේ නැවත සාකච්ඡාවට බඳුන් විය යුතු වෙනවා. ඇත්තටම මෙය අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ යුතු කාරණයක්. රටේ අනාගතය ගැන, අපේ දූ දරුවන්ගේ අනාගතය ගැන කල්පනා කරන විට මෙවැනි චර්යා ධර්ම පද්ධතියක් රටකට අවශ්‍යයි කියා අපිට පෙනෙනවා. ඒක ඉතාම වැදගත්.

ඊළඟ කාරණය තමයි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග රැකිය යුතු, එහෙම නැත්නම් පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් රැකිය යුතු මේ කාරණා සියල්ල ගැන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වශයෙන් අපි වෙන දාට වඩා අවධානය යොමු කළ යුතු වෙනවා. මොකද මේ දෙස බලාගෙන සිටින රටේ සමස්ත ජනතාව, අනාගතයේ දී දේශපාලනඥයන් වෙන්න සිතාගෙන සිටින අය ආදර්ශයට ගන්නේ මෙතැනයි. ඒ නිසා තමයි අද මේ කථා කරන මාතෘකා දෙකම අපිට වැදගත් වන්නේ. මේ පාර්ලිමේන්තුව ලෝකයේ අනෙක් පාර්ලිමේන්තු එක්ක යන, සැබෑ දේශපාලනඥයන් බිහි කරන, රටට හිතකර දේශපාලනඥයන් බිහි කරන හිතකර පාර්ලිමේන්තුවක් බවට පත් කළයුතු වෙනවා. ඒ සඳහා තමයි අද අපි මේ කථා කරන කාරණා දෙක වැදගත් වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහිදී මම කාරණා කිහිපයක් ගැන කථා කරන්න කැමැතියි. ඉන් පළමුවැනි කාරණය තමයි දැනට ක්‍රියාත්මක වන ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය. මෙම ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය මේ 8වන පාර්ලිමේන්තුවේ ඉතාම වැදගත් ක්‍රියාවලියක්. 2015දී අපි මෙම පාර්ලිමේන්තුවට පත් වුණාට පසුව, සුවිශේෂී කාරක සභා ක්‍රමයක් හැටියට, නැත්නම් වෙන දා පාර්ලිමේන්තුවේ නොතිබුණු අලුත් අත්දැකීමක් විධියට තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපට මෙය දකින්නට ලැබුණේ. මෙම ක්‍රමය ලෝකය අත්හදා බැලූ දෙයක්. එය දැනටත් ක්‍රියාත්මක වෙනවා. ඇමෙරිකාව, එංගලන්තය වැනි රටවල මෙම ක්‍රමය ක්‍රියාත්මක වෙනවා. එංගලන්තය වැනි රටවල මේ කාරක සභා ක්‍රමය ක්‍රියාත්මක වන්නේ කොහොමද, තීරණ ගන්නේ කොහොමද, එම තීරණ රටට බලපාන්නේ කොහොමද, ඒවා රටට බලපෑම තුළ වෙනස්වීම් වන්නේ කොහොමද කියන කාරණය අපි දැක්කා. නමුත් මෙම ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය තුළ ඇති වැදගත්කම අපේ මන්ත්‍රීවරු සියලුදෙනාම අවබෝධ කරගත්තේ නැහැ කියන හැඟීම අපට තිබෙනවා. ඒකට හේතුව මෙකයි. මෙම ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වෙන කොට එම කාරක සභා රැස් කර ගන්න අවශ්‍ය අවම ගණ පූරණයවත් සම්පූර්ණ කරගන්න බැරි වන අවස්ථා තිබෙනවා. අනුකාරක සභාවක් නම් මන්ත්‍රීවරු දෙදෙනෙක්, කාරක සභාවක් නම් මන්ත්‍රීවරු තිදෙනෙක් වශයෙන් ඒ අවශ්‍ය ප්‍රමාණය සමහර වෙලාවට ලබාගන්න අමාරු තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒ නිසා පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරු මේ ගැන දැඩි අවධානය යොමු කළ යුතු වෙනවා. මේ ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය කියන්නේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ට ලැබුණු දුර්ලභ අවස්ථාවක්. විශේෂයෙන්ම අපි ගරු අගමැතිතුමාට මේ ගැන ස්තුතිවන්ත වෙනවා. එතුමා දැඩි උනන්දුවකින් යුතුව මේ කාරක සභා ක්‍රමය ඉදිරිපත් කරලා, අදහස් ඉදිරිපත් කළා. ඒ අනුව පාර්ලිමේන්තුවට මේ කාරක සභා ක්‍රමය හඳුන්වා දීලා, ඒ යටතේ අලුතින් කාරක සභා 15ක් පිහිටුවන්න අපිට හැකියාව ලැබුණා. මෙම කාරක සභා හරහා මන්ත්‍රීවරුන් වන අපට අත් දැකීම් රාශියක් ලබාගන්න පුළුවන්. අමාත්‍යාංශ සමඟ කටයුතු කිරීමේදී ඇති වන අවශ්‍යතාවන් අනුව එම ප්‍රතිපත්ති සකසා ගැනීමේ අත්දැකීම් මේ හරහා මන්ත්‍රීවරුන්ට ලබාගත හැකි වෙනවා. එය මීටත් වඩා උනන්දුවෙන් ලබාගත යුතුය කියා මා පාර්ලිමේන්තුවට යෝජනා කරනවා.

මෙම ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වෙන කොට අපි දැකපු තවත් කාරණයක් තිබෙනවා. මේ කාරක සභා ක්‍රමවේදය ඉතාම හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නමුත් දැනට ඉන්න ලේකම් මණ්ඩලයට - නිලධාරි මණ්ඩලයට - වැඩ රාජකාරි ඉතාමත් අධිකයි. ලෝකයේ අනෙක් රටවල් එක්ක ගත්තොත් මේ එක කාරක සභාවකට අවම වශයෙන් පස් දෙනකුගෙන් යුතු කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර වෙලාවට එක නිලධරයකු හෝ නිලධාරිනියක කාරක සභා පහක විතර වැඩ කටයුතු කරන අවස්ථා අපි දැක තිබෙනවා. මේක තමයි තත්ත්වය. ඒ නිසා මේ ගැන ගරු කථානායකතුමාගේත්, පාර්ලිමේන්තුවේත් දැඩි අවධානය යොමු කළ යුතුව තිබෙනවා. දැන් අපි මේ පාර්ලිමේන්තුවේ තුන්වැනි අවුරුද්ද යන්නේ. මේ කාරක සභා ක්‍රමය සාර්ථක වෙන්න නම් ඉතාමත් ඉක්මනට නිලධාරි මණ්ඩලය වැඩි කිරීමට අවශ්‍ය වෙනවා. ඒ නිලධාරි මණ්ඩලය හරහා කාර්යක්ෂමතාව වැඩි කර ගෙන මේ ආංශික අධීක්ෂණ කාරක සභාවලින් උපරිම සේවය ලබා ගත හැකි විධියේ පුහුණුවක් ලබා දිය යුතුයි. නිලධාරි මණ්ඩලය වැඩි කිරීම තුළින් විතරයි මේ කාරක සභාවල ප්‍රතිඵල ගන්න පුළුවන් වන්නේ. එහෙම නැත්නම්, අපි කාරක සභා රැස්වෙලා, මන්ත්‍රීවරු යම් යම් තීරණ අරගෙන අමාත්‍යාංශවලට, ලේකම්වරුන්ට යම් යම් directives දුන්නාට, ඒවා ක්‍රියාත්මක වීමේදී, ඒ ඒ අමාත්‍යාංශවලට යොමු කරවීමේදී ප්‍රමාද සිදු වන්නේ ලේකම් මණ්ඩලයේ නිලධාරිනියන්ගේ අඩු පාඩුවක් නිසා නොවෙයි, ඔවුන්ට තිබෙන වැඩ රාජකාරි ප්‍රමාණය ඉතාමත් ඉහළ නිසායි. එක නිලධාරි මහත්මයකුට හෝ මහත්මියකට සිදු වෙනවා, කාරක සභා තුන හතරක් අධීක්ෂණය කරන්න; කාරක සභා තුන හතරකට අවශ්‍ය කළමනාකරණ කටයුතු සියල්ලම කරන්න. මම හිතන විධියට කර ගන්න බැරි තරමට වැඩ වැඩිවෙලායි තිබෙන්නේ. සමහර වාර්තා ඉදිරිපත් කරන විට දිවා රාත්‍රී වෙහෙසිලා කොහොම හරි අපි ඒ වාර්තා එළිදක්වනවා. නමුත් ඒ වාර්තාවේ ප්‍රමිතිය - productivity එක - ගැන අපි නැවත නැවතත් සිතා බැලිය යුතු වෙනවා. නැත්නම් වැඩ රාජකාරි රාශියක් තිබෙන නිසා එවැනි දේවල් සිදු කිරීමේදී අතපසුවීම් සිදු විය හැකි වෙනවා. එවැනි අතපසුවීම් සිදු නොවන ආකාරයෙන් මේ ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය ගැන නැවත සිතා බලා ඒවා ක්‍රමානුකූල කර ගත්තේ නැත්නම්, ඉතාමත් වටිනා යෝජනාවක් හැටියට ආපු පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය ආරක්ෂා කරන්නට තිබෙන මේ කාරක සභා ක්‍රමය ටිකෙන් ටික අපෙන් ඈත් වීමට ඉඩකඩ තිබෙනවා. ඒ වාගේම නැවතත් උපදේශක කාරක සභා ඇති කිරීමත් හොඳයි.

නමුත් අපි යෝජනා කරනවා, උපදේශක කාරක සභාවත් යම්කිසි විධියකින් ආංශික අධීක්ෂණ කාරක සභා හා බද්ධ වන ක්‍රමයක් ඇති කර ගන්න පුළුවන් නම්; වෙනත් වචනවලින් කිව්වොත් ආංශික අධීක්ෂණ කාරක සභාවලින් ගන්නා තීරණ ඇමතිවරයා හරහා - උදාහරණයක් විධියට අපි ප්‍රතිපත්ති ඉදිරිපත් කරනවා නම් ඒ ප්‍රතිපත්ති පිළිබඳව- මීට වඩා සලකා බැලීමක් සිදු විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. මොකද, සමහර වෙලාවට අපි හිටපු ආංශික අධීක්ෂණ කාරක සභාවලදී කළ යෝජනා අමාත්‍ය මණ්ඩලයේ සමහර ඇමතිවරුන් තුළින් ඒ ආකාරයෙන්ම සලකා බැලීමක් සිදු වූයේ නැහැ. ඒ නිසා ඒ ඇමතිවරු මීට වඩා මේ ගැන සැලකිලිමත් වෙලා රටේ අනාගතය ගැන හිතලා නිර්මාණශීලීව අදහස් දක්වන මන්ත්‍රීවරුන්ගේ යෝජනා ටිකත් මේ ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය හරහා ලබා ගන්නවා නම් තමයි මේ කාරක සභාවල ඇත්ත වගකීම ජනතාව අතරට යන්නේ. ඒක ඉතාමත් වැදගත් කාරණයක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. කාරක සභා පිළිබඳ රැස්වීම්වලදී ගරු කථානායකතුමාටත් අපි මේ ගැන මතක් කළ යුතු වෙනවා. මොකද, එහෙම නැති වුණොත් වන්නේ අපි තවත් කාරක සභාවක් විතරක් රැස්වෙනවා; රැස්වෙලා තීරණ ගත්තාට ඒ තීරණ ක්‍රියාත්මක වන්නේ නැති තවත් කල් මරණ ක්‍රමවේදයක් බවට පත් වෙන එකයි. එහෙම කල් මරණ ක්‍රමවේදයක් බවට පත් වුණොත් අපට රටේ අනාගතය පිළිබඳව තීරණ ගන්න පුළුවන් ඉඩ කඩ ඇහිරෙනවාය කියන කාරණය මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අලුතින් ඇති වන ස්ථාවර නියෝග හරහා පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ කාරක සභාවක් ඉදිරිපත් කර තිබෙනවා. මේක ඉතාමත් හොඳයි. පසුපෙළ මන්ත්‍රීවරුන්ට තිබෙන ප්‍රශ්න, පසුපෙළ මන්ත්‍රීවරුන්ට තිබෙන අවශ්‍යතා වැඩි කරන්න, ඒ හැකියාවන් ඉදිරියට ගේන්න තිබෙන ඉඩකඩ වැඩි කරන්න විපක්ෂයේ පසුපෙළ මන්ත්‍රීවරුන්ටත්, ආණ්ඩු පක්ෂයේ පසුපෙළ මන්ත්‍රීවරුන්ටත් සියලු දෙනාටම හැකියාවක් ලැබෙන ආකාරයට යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒ කාරක සභාවේ සභාපතිවරයා හැටියට යෝජනා කර තිබෙන්නේ ඇමතිවරයෙක්. ඒ පිළිබඳව සලකා බලා පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ කාරක සභාවේ සභාපතිවරයා හැටියට පසුපෙළ මන්ත්‍රීවරයකුම පත් වෙනවා නම්, පසුපෙළ මන්ත්‍රීවරු හැටියට පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරු දෙගොල්ලන්ටම එකතු වෙලා අනාගතයේ පාර්ලිමේන්තුව ගැන මීට වඩා කථා කරන්න හැකියාවක් ලැබෙයි කියා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය ගැන කථා කළා. මට මතක විධියට 2014 අග භාගයේ තමයි මෙය පටන් ගත්තේ. ඊට පස්සේ ලංකාවේ දේශපාලන ව්‍යාපාර තුළ, දේශපාලනයේ නියැලී සිටින බහුජන සංවිධාන තුළ, සිවිල් සංවිධාන තුළ මේ චර්යා ධර්ම පද්ධතිය, පිරිසිදු දේශපාලනඥයන් බිහි කරන්නේ කොහොමද කියන එක පිළිබඳව සාකච්ඡාවක් ඇති වුණා. ඒ හරහා තමයි "මාර්තු 12 ව්‍යාපාරය" වැනි ව්‍යාපාර ඇති වුණේ. "මාර්තු 12 ව්‍යාපාරය" කෙලින්ම සම්බන්ධ වුණේ, අපි කථා කරන චර්යා ධර්ම සංග්‍රහය ක්‍රියාත්මක කරන දේශපාලන පරිසරයක් නිර්මාණය කරන්නේ කොහොමද, සමාජය තුළ එවැනි පරිසරයක් නිර්මාණය කර අනාගතයේ රටට අවශ්‍ය විනයගරුක දේශපාලනඥයන් බිහි කරන්නේ කොහොමද කියන කාරණයටයි. සිවිල් සංවිධාන, බහුජන සංවිධාන සියලු දෙනා එකතු වී "මාර්තු 12 ව්‍යාපාරය" ආරම්භ කළේ ඒ ගැන කථා කිරීම සඳහායි. ඒ හරහා අපට හැකියාවක් ලැබුණා, පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් විසිපහක, තිහක පමණ පිරිසක් එකතු කර ගෙන මේ ගැන සාකච්ඡා කරන්න; මේ ගැන හඬක් නඟන්න. මේ ගැන කොච්චර හඬ නැඟුවත්, පිරිසිදු විනයගරුක දේශපාලනඥයෙකුට ප්‍රාදේශීය සභාවක සිට පාර්ලිමේන්තුවට එන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මේ ඡන්ද ප්‍රතිඵල දැක්කාම අපට මතුවනවා. එම නිසා ඡන්දදායකයින්ගෙන් මම විශේෂයෙන් ඉල්ලා සිටින්නේ, මේ ගැන දැඩිව කල්පනා කළ යුතුය කියායි. අපි ඡන්දය පාවිච්චි කරන්නේ මෙහෙම නම්, මේ රටේ අනාගතය ගැන සිතා කොච්චර දේවල් කිව්වත්, ලෝකය යන විධිය, ලෝකය ආදර්ශයට අරගෙන ඉදිරියට යන දෙය ගැන අපි කොච්චර කථා කළත් ලැබෙන්නේ අපි නොසිතන වෙනත් කෙනෙක් නම් ප්‍රතිඵලය සාර්ථක නැහැ. උදාහරණයකට කියනවා නම් අපි දැක්කා, මහරගම ප්‍රදේශයේ දිනපු කණ්ඩායමට අපේ දිවුලපිටිය මන්ත්‍රීතුමාගේ ගමේ අයත් ඉන්නවා. එසේ නැත්නම් බඩල්ගම ප්‍රදේශයේ අය තමයි හිටියේ. ඒ කණ්ඩායමේ විවිධ පක්ෂවල අය හිටියා. නමුත් ඡන්දය දීලා. කවුරුත් දන්නේ නැහැ, ඒ එක් එක් කොට්ඨාසයේ මන්ත්‍රීවරු හැටියට කවුද පත් වුණේ කියා. කවුද මන්ත්‍රීවරයා කියා අදටත් දන්නේ නැහැ, මේ සමාජයීය ඛේදවාචකය ගැන අපි කල්පනා කළ යුතුයි. තනි පුද්ගල ප්‍රතිරූපයකටද මේ ලංකාවේ ජනතාව ඡන්දය දෙන්නේ, එසේ නැත්නම් තමන්ගේ ප්‍රදේශය ගැන හිතලා තමන්ගේ ප්‍රදේශය සංවර්ධනය කරන්න පුළුවන් දේශපාලන පක්ෂයක බිම් මට්ටමක ඉන්න නායකයෙකුටද කියන කාරණය අපි හිතන්න ඕනෑ. මේක තමයි චර්යා ධර්ම ඇතුළු මේ සියලු දේවල් හරහා අපි ගොඩ නැඟිය යුතු දේශපාලන නිර්ණායක වෙන්න ඕනෑ; දේශපාලන නායකත්වය වෙන්න ඕනෑ. එසේ නැති වුණොත් වෙන්නේ, මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන, තරුණයෝ බලාපොරොත්තු වෙන දේශපාලන ව්‍යාපාරයෙන් ඈතට ගිහින් පුද්ගල චරිතයක් විතරක් හැදිලා, ඒ වටා ගොඩ නැඟුණු ඕනෑම කෙනෙකුට -ස්ත්‍රී දූෂකයෙකුට, වංචා කාරයෙකුට, මිනීමරුවෙකුට, හොරෙකුට- ඡන්දය දෙන ක්‍රමවේදයක් හැදෙන එකයි. එය ඉතාමත්ම අවාසනාවන්ත සිද්ධියක් වෙනවා. එම නිසා රටේ බුද්ධිමත් ජනතාව මෙවර පාඩමක් ඉගෙන ගෙන මෙන්න මේ ක්‍රමවේදය වෙනස් කරන්න පුළුවන් කතිකාවතක් මේ රටේ ආරම්භ කළ යුතුයි කියා අපි විශ්වාස කරනවා. එසේ නැත්නම් ජරාම ජරා වූ දේශපාලන ක්‍රමවේදයකට මේ රට ඉස්සරහට යනවා. එයයි අපි මේ අත් දකිමින් ඉන්නේ. මේක ඉතාමත් දරුණු ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නයට මුහුණ දෙන සියලුම දේශපාලන පක්ෂ කල්පනා කළ යුතුයි, කොහොමද දක්ෂ නායකයන්ඉදිරියට එන ක්‍රමවේදයක් හදන්නේ කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම එක උදාහරණයක් ගන්නම්. ප්‍රංශයේ වර්තමාන අධ්‍යාපන අමාත්‍යවරිය මොරොක්කෝ ජාතික තරුණියක් හැටියට තමයි ප්‍රංශයේ අධ්‍යාපන ඇමතිවරිය හැටියට පත් වෙන්නේ. එතුමියගේ පියාණන් කම්කරුවෙක්. එහෙම ඉඳගෙන එතුමිය කුඩා කාලයේ ප්‍රංශයට ඇවිත් ඉගෙන ගෙන එතුමියගේ දක්ෂතාව නිසා ඉදිරියට එනවා. මෙවැනි තත්ත්වයක් මේ රටේ නිර්මාණය විය යුතුයි. එහෙම නැති වුණොත් වෙන්නේ මේ රටේ දක්ෂ තරුණ තරුණියන්ට කිසිම දවසක මේ ප්‍රාදේශීය සභා ක්‍රමවේදය තුළ, පළාත් සභා ක්‍රමවේදය තුළ, පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයක් දක්වා එන ක්‍රමවේදය නැති වෙනවා. පියාගේ, මවගේ උරුමයෙන් එන දේශපාලනඥයෝ තමයි තවමත් මේ රටේ ඉන්නේ. එසේ නැත්නම් චණ්ඩිකම්වලින් ඉදිරියට එන දේශපාලනඥයෝ, සල්ලි තිබෙන පවුලකින් එන දේශපාලනඥයෝ තමයි තවමත් ඉන්නේ. එසේ නොවෙයි විය යුත්තේ. රටක් දියුණු කරන්න නම් බලාපොරොත්තු විය යුත්තේ දක්ෂයෝ ඉදිරියට එන ක්‍රමවේදයක්. එයයි අද මේ අපි කථා කරන චර්යා ධර්ම සංග්‍රහයේ තිබෙන වටිනාකම. නමුත් මේ වටිනාකමට තැනක් ලැබේවිද කියන ප්‍රශ්නාර්ථය මේ රටේ තිබෙනවා. මා නැවත නැවතත් ඒ ගැන ප්‍රශ්න කරනවා. මා ප්‍රශ්න කරන්නේ රටේ ජනතාවගෙන්. හෘදය සක්ෂියක් තිබෙන රටේ ජනතාව නැත්නම් ඡන්දදායකයෝ තමන්ගේ හදවතට තට්ටු කරලා ප්‍රශ්න කර ගත යුත්තේ, අපි මේ හදන්නේ රටට ගැලපෙන දේශපාලනඥයන්ද, එසේ නැත්නම් පුද්ගල චරිත වටේ යන, මංකොල්ල කන හොරු රැළක්ද කියන

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

එකයි. මේක නම් උත්තරය මේ රට ඉදිරියට යන්නේ නැහැ. මේ රට ඉදිරියට යන්න නම් බිහිවිය යුත්තේ පරමාදර්ශී දේශපාලනයේ යෙදෙන චරිත. එවැනි චරිත නිර්මාණය කර ගන්නට දේශපාලන වටපිටාවක් සැකසිය යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය දවසක අපි කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාඥයින් පිරිසක් සමඟ කථා කළා, මේ රටට දේශපාලන විද්‍යා පීඨයක් අවශ්‍යයි කියා. ඒ දේශපාලන විද්‍යා පීඨය අවශ්‍ය වෙන්නේ මේ නිසායි. කාන්තා දේශපාලන නියෝජිත ප්‍රතිශතය වැඩි කරන්න, කාන්තා දේශපාලනඥවරියන් ඉදිරියට ගේන්න, තරුණ දේශපාලනඥයෝ ඉදිරියට ගේන්න දැන් අපේ ලොකු දැක්මක් තිබෙනවා.

එහෙම නම් එවැනි දේශපාලනඥයින්ට පුහුණු විය හැකි තැනක් මේ රටට අවශ්‍යයි. දැනට ජේ.ආර්. ජයවර්ධන කේන්ද්‍රය පාර්ලිමේන්තුව සමඟ එක්ව කටයුතු කරනවා. කලින් එක්සත් ජාතික පක්ෂය මේ ගැන විශේෂ ඇල්මකින් කටයුතු කළා. ගරු අගමැතිතුමාට මේ ගැන විශේෂ දැක්මක් තිබෙනවා. විශේෂයෙන් දේශපාලන විද්‍යාව, දේශපාලනය ගැන හදාරන පිරිසට අවශ්‍ය පහසුකම් සහිත තැනක් හදන්න එතුමාට ලොකු දැක්මක් තිබෙනවා. ඒත් එක්කම කොළඹ විශ්වවිද්‍යාලය සමඟ එකතු කරලා මේ ගැන කථා කරන, මේ ගැන කල්පනා කරන සුවිශේෂී දේශපාලනඥයින් පිරිසක් බිහි කිරීමට හැකියාව ලැබෙන තැනක් හැටියට දේශපාලන කේන්ද්‍රයක්, එහෙම නැත්නම් දේශපාලන පීඨයක් අපට ආරම්භ කරන්න පුළුවන් නම් ප්‍රාදේශීය මට්ටමේ සිට දේශපාලනඥයින් පුහුණු කරගෙන ඇවිත් අපි ප්‍රාර්ථනා කරන, අපි දකින පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් අපට බිහි කරන්න පුළුවන්. ඒක අපේ සිහිනයක්. ඒ සිහිනය සැබෑ කර ගන්න නම්, හෘදය සාක්ෂියක් ඇති දේශපාලනඥයින් සියලු දෙනා එකතු වෙලා මේ ගැන සාකච්ඡා කළ යුතු වෙනවා. එහෙම නොවුණොත් හැමදාම මේ ජරාජීර්ණ දේශපාලන ක්‍රමවේදය තුළ රැඳී සිටින්නයි අපට සිදු වෙන්නේ.

මේ ජරාජීර්ණ, බලලෝභී, තමන්ගේ පදවි තානාන්තර රැක ගන්න කාලකණ්ණි ක්‍රමවේදයේ ප්‍රතිඵලයක් හැටියට තමයි අද මේ බල අරගලය ඇති වෙලා තිබෙන්නේ. බලය වෙනත් විධියකට ලබා ගන්න උත්සාහ කරනවා. ප්‍රජාතන්තවාදී විධියට 2020 වසර දක්වා ලැබුණු ප්‍රතිඵලය වෙනස් කරලා වෙනත් විධියකට බලය ලබා ගන්න උත්සාහ කරනවා. මෙවැනි ක්‍රමවේදයක ආදීනව තමයි අපි මේ අත් විඳින්නේ. මේවා වෙනස් විය යුතුයි. මේවා වෙනස් වුණේ නැත්නම් අපේ අනාගත දූ දරුවන් මේ රටේ ජීවත් වෙන එකක් නැහැ. මොකද, ලෝකයත් එක්ක ඒ දූ දරුවන් හිතන විධිය වෙනස් වෙනවා. මේ system එක ඇතුළේ සිදු වෙන්නේ කොල්ලකාරී දේශපාලනඥයින් බිහි වීම නම් කවදාවත් මේ රට හැදෙන්නේ නැහැ. දේශපාලන ක්‍රමවේදය තුළ මෙවැනි දේවල් හිතන පතන, සමාජයට ගරු කරන පිරිසක් ඇති වුණේ නැත්නම් අපට අපේ රටට වග කියන දේශපාලනඥයින් බිහි කර ගන්න බැරි වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි මේ කථා කරන මාතෘකාව ඉතාම කාලෝචිත, අවශ්‍යම මාතෘකාවක්. නමුත් අවාසනාවට මේ ගැන වාද විවාද කරන්න සභා ගර්භයේ ඉන්නේත් හතර පස් දෙනායි. අපේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් නිදි. මේක තමයි ඇත්ත කථාව. එම නිසා මේ කාරණාව ගැන සාකච්ඡා කරන අද දිනයේවත් අපට මන්ත්‍රීවරු ටික අල්ලා ගන්න බැරි වෙලා තිබෙනවා. අපි මන්ත්‍රීවරු ගැනයි මේ කථා කරන්නේ. අපි චර්යා ධර්ම සංග්‍රහයක් ගැනයි කථා කරන්නේ. නමුත්, මේක තමයි යථාර්ථය. එම නිසා මාධ්‍යවේදී සහෘදයන්ගෙන් ඉල්ලා සිටින්නේ, අපි කථා කළ යුත්තේ මෙන්න මේ දේවල් ගැනයි. එහෙම නැතිව නීත්‍යානුකූලව තිබෙන ආණ්ඩුවක් කොහොමද පෙරළන්නේ කියන එක උදේ ඉඳන් රෑ වනතුරු කථා කරන එක නොවෙයි. අද තිබෙන එවැනි රූපවාහිනී නාලිකා නිසා තමයි මේ ජරාජීර්ණ දේශපාලන ක්‍රමවේදයම ඉදිරියට යන්නේ. මොකද, නීත්‍යානුකූලව පත් වුණු දේශපාලනඥයින්ට, විනය ගරුක දේශපාලනඥයින්ට මේ රටේ ඉඩක් නැති තරමට ජනමාධ්‍ය හැසිරෙන්නේ එම කාරණය නිසායි. එම නිසා ජනමාධ්‍ය ශිල්පීන්ගේ ස්වයං විනයක් ඇති විය යුතුයි කියලා අපි කල්පනා කරනවා. මේ රටේ තිබෙන තමන්ගේ නාලිකාවේ අයිතිකාරයාගේ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටින මජර ක්‍රමවේදය වැරැදියි. මේ ක්‍රමවේදයෙන් මිදිලා ප්‍රජාතන්ත්‍රවාදීව, නිදහස්ව, නිවහල්ව කල්පනා කරන මාධ්‍යවේදීන් පිරිසක් මේ රටේ බිහි විය යුතුයි. එහෙම නැතිව පයිප්ප බාස් කෙනෙකුගේ channel එකක, පයිප්ප බාස්ට අවශ්‍ය විධියට යන channel එකක, පයිප්ප බාස්ට අවශ්‍ය විධියට වැඩ කරන මාධ්‍යවේදීන් නොවෙයි අපට අවශ්‍ය වන්නේ. කෙළින්ම කිව්වොත් පයිප්ප බාස්ගේ channel එක. පයිප්ප බාස්ගේ channel එකේ උදේ ඉඳන් හවස් වනතුරු අපි දකින්නේ මොකක්ද? කොහොමද අගමැතිවරයා ඉවත් කරන්නේ? ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ පත් වුණු අගමැතිවරයා ඉවත් කරන්න කියලා උදේ ඉඳන් හවස් වනතුරු කථා කරනවා. මේ රටේ දේශපාලන න්‍යාය පත්‍රය සම්පූර්ණයෙන්ම නිර්මාණය කරන්නේ මේ පයිප්ප බාස්. මේ රට වෙනස් කරන්න මේ පයිප්ප බාස්ට හැකියාවක් තිබෙනවාද? මේ රටේ ජනතාව මීට වඩා බුද්ධිමත් විය යුතුයි. තමන්ගේ නිවසේ තිබෙන රූපවාහිනියෙන් මෙවැනි නාලිකා නරඹන්නේ නැති තැනට ගෙන යන වැඩ පිළිවෙළක් මේ රටට අවශ්‍යයි. එහෙම වුණොත් විතරයි මේ පයිප්ප බාස්ලාගේ channelsවල වැඩ කරන බත් බැළයෝ ටික තමන් කොතැනටද යා යුත්තේ කියලා නිවැරදි තීරණයක් ගත යුතු වෙන්නේ. එහෙම නැත්නම් මේ රටට ලැබෙන්නේ වැරදිම වැරදි ක්‍රමවේදයන්. එම නිසා මම බොහොම කරුණාවෙන්, බොහොම ආදර බරිතව සියලු ජනමාධ්‍යවේදීන්ගෙන් ඉල්ලා සිටිනවා, තමන්ගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා අහන්න තමන් කරන දේ හරිද කියලා. හරි දේ කරනවා නම් ඔබ සතුටු විය යුතුයි.

මේ රටේ එවැනි පරිසරයක් ඇති කරන්න පුළුවන් දේශපාලනඥයෝ පිරිසක් බිහි කරන්න නම්, ජනමාධ්‍යවල කාර්ය භාරය මීට වඩා වැඩිදියුණු විය යුතුයි කියලා මම යෝජනා කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ලබා දුන් කාලය සම්බන්ධයෙන් මා ඔබතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. අද දින සාකච්ඡාවට ගැනුණු ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව තුළත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය තුළත් ඉතාම වැදගත් කරුණු රාශියක් තිබෙනවා. අපි අලුතින් කල්පනා කරන කාරක සභා ගැන, ආංශික අධීක්ෂණ කාරක සභා ගැන සහ පාර්ලිමේන්තුවේ අනෙක් සියලුම කාර්යයන් ගැන මෙහි සඳහන් වෙනවා. මෙම චර්යා ධර්ම පද්ධතිය මෙම පොතට සීමා නොවී පිළිපදින චර්යා ධර්ම පද්ධතියක් වේවා! මෙම පාර්ලිමේන්තුව අපි කල්පනා කරන, අපේ ලෝකයේ පරමාදර්ශී චරිත හැටියට අපි දකින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් පිරි පාර්ලිමේන්තුවක් වේවා! කියන ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. ඊළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා.

[අ.භා. 3.34]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුව හමුවේ ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයත් ඉදිරිපත් කළ මේ අවස්ථාවේ වචන කිහිපයක් කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ඇතුළේ මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න, ඒ වාගේම පාර්ලිමේන්තු කටයුතු විධිමත්ව කළමනාකරණය කරන්න අපි පසුගිය කාලය පුරාම ස්ථාවර නියෝග භාවිතයට ගත්තා. එය යම් සංශෝධන සහිතව අද අලුතින් මෙම කාරක සභා වාර්තාවෙන් ඉදිරිපත් කළත්, ස්ථාවර නියෝග අනුව- කඩදාසිවල මොන මොන සංශෝධන ගෙනාවත් ඇති වැඩක් නැහැ.- පාර්ලිමේන්තුව ක්‍රියා කරලා තිබෙනවාද, ඒක මෙහෙයවන කථානායකතුමාගේ ඉඳලා, පාර්ලිමේන්තුවට නායකත්වය දෙන අගමැතිතුමාගේ ඉඳලා ස්ථාවර නියෝගවලට අනුකූලව පාර්ලිමේන්තුව ක්‍රමවත්ව ගෙන ගියාද කියන එක ගැන ආපසු හැරී බැලීම වැදගත්.

පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් අසා පිළිතුරක් ලබා ගැනීමේදී, එම පිළිතුර විද්වත් විධියට ලබා ගැනීම තුළ තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා සෑහීමකට පත් වෙන්නේ කියලා මම කියන්න කැමැතියි. අපි පසුගිය කාලයේ දැකපු දෙයක් තමයි, අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශයක් කරනකොට, ඒ සම්බන්ධව රීති ප්‍රශ්නයක් මතු කළාම, ගරු කථානායකතුමා එම රීති ප්‍රශ්නයට කන් දෙන්නේ නැහැ කියන එක. මේ, මම ප්‍රායෝගිකව අත්දැකපු දෙයක්. ගරු අගමැතිතුමා එම ප්‍රකාශය කරලා ඉවර වනතුරු ඉන්නවා. නමුත් එම ප්‍රකාශය තුළ මතු වෙන රීතිය පිළිබඳ කාරණයක් තමයි අපි මතු කරන්නේ. ඒ වාගේම ප්‍රශ්නයක් මතු කරනකොට, මේ පාර්ලිමේන්තුවේදී අග්‍රාමාත්‍යවරයා ඒකට ගැළපෙන උත්තරය නොවෙයි දෙන්නේ. වෙනත් කෙනෙකුට දෝෂාරෝපණයක් ඇති වෙන්න, පාර්ලිමේන්තුවට නොගැළපෙන උත්තරයක් දීලා ඇත්ත වශයෙන්ම ඒක මග හරින්න උත්සාහ කරනවා. ඒක, අපි අත්දුටු දෙයක්. එම ආදර්ශය තමයි සමහර ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් අරගන්නේ. ඒ නිසා මෙවැනි තත්ත්වයක් තුළ මෙම පාර්ලිමේන්තුවේ විනය පිරිහී ගියා. මේ තුළ විද්වත් සභාවක ස්වභාවය නැති වෙලා, මල්ලවපොර පිටියක ස්වභාවයට පත් වුණු අවස්ථා තිබුණා. අපි මහජනතාවගේ සල්ලි වියදම් කරනවා. පාර්ලිමේන්තුව රැස් කරන්න එක දවසකට ලක්ෂ 40ක් විතර වැය කරනවාය කියලා මම අසා තිබෙනවා. එහෙම මුදලක් වැය කළත්, මේ සභාව ඇතුළත විද්වත් සංවාදයක් ගෙන යන්න, ආචාරශීලී විධියට සභාව හසුරුවන්න, ඒ වාගේම අන්‍යයන්ගේ අදහසට කන් දෙන්න හැකියාවක් නැත්නම්, මේවා කොයි තරම් පොත්පත්වලට සීමා වුණත් ඇති වැඩක් නැහැ. මේක අලුත් එකක් නොවෙයි, අපට යම් සංශෝධන විතරයි මේක ඇතුළත තිබෙන්නේ. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ඇතුළත අපි දැකපු දෙය අනුව, ලෝකයේ පාර්ලිමේන්තුවලින් ලබපු අත්දැකීම අනුව ඒවායේ සභා දිහා බැලුවාම, මේකත් පාර්ලිමේන්තුවක්ද කියලා හිතෙනවා. ඒ නිසා ඇත්තවශයෙන්ම මෙම තත්ත්වය වෙනස් කරන්න නීතිරීතිවලින් බැහැ.

නායකත්වය විනයගරුකව පාර්ලිමේන්තුවට මඟ පෙන්වන තත්ත්වයක් හරිහැටි නිර්මාණය වුණේ නැත්නම්, ඒ මට්ටමට ශීලාචාර වුණේ නැත්නම් මේවා සියල්ලම හිස් කඩදාසි විතරක් වේවි. මා ඒ ගැන මීට වඩා කතා කරන්නේ නැහැ. පසුගිය කාලයේ, ස්ථාවර කාරක සභාවලට ඉදිරිපත් වුණු කරුණු සුළු සංශෝධනයන්ට යටත්ව සකස් කරලායි මෙම වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ. මෙම වාර්තාවට විරුද්ධ වන්න අපට පදනමක් නැහැ. මොකද, අපි කැමැතියි, පාර්ලිමේන්තුව රීතිවලට එකඟව, විනයගරුකව, ආචාරශීලීව, සංවාදාත්මකව ඉස්සරහට යනවා දකින්න. ඒ සඳහා අපේ කැමැත්තක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුව දිහා රට බලාගෙන ඉන්නවා. පාර්ලිමේන්තුවේ හැසිරීම දිහා රට බලාගෙන ඉන්නවා. පාර්ලිමේන්තුවේ විද්වත් සංවාද ගැන යමක් ඉගෙන ගැනීම සඳහා පාසල් ශිෂ්‍යයෝ මේ පාර්ලිමේන්තුවට එනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම විද්වත් සංවාදයක් නැති වුණාම පාර්ලිමේන්තුව කෙරෙහි තිබෙන විශ්වාසය නැති වෙලා යනවා.

අනෙක් කාරණය මේකයි. ආචාර ධර්ම ගැන කතා කරන කොට මේ රටේ ඡන්දය ගැන කතා කළා. කිව්වා, පුද්ගලයා දන්නේත් නැතිව සමහර අයට ඡන්දය දී තිබෙනවා කියලා. මේ විධියේ නොයෙක් කාරණා කතා කළා. ඇත්ත තමයි! දේශපාලන බල තුලනයේ වෙනසක් අවශ්‍යයි කියන එක ගැන මිනිසුන්ට තිබෙන විශ්වාසය මත පසුගිය මැතිවරණයේදී පිළිතුරක් දුන්නා, මේ ගෙන යන පාලනයට. එහි යම් වරදක් මිනිස්සු නිවැරදි කළා. මිනිස්සු පුද්ගලයන් දිහා බැලුවේ නැහැ. ඒ වෙනස වෙනුවෙන් සුදුසු ජාතික නායකත්වයක් මතු කරන්න ඕනෑ කියන එක ගැන කල්පනා කරලා, අවශේෂ කරුණු අමතක කරලා ක්‍රියා කළා. එයින් මේ වෙනස ඇති වෙලා තිබෙනවා. මේ ගැන යථාර්ථවාදීව බලනවා මිසක් මෙයට ගරහන්න ඕනෑ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම, සදාචාරසම්පන්න, විනයගරුක පාර්ලිමේන්තුවක් ආචාර ධර්මවලින් හදන්න බැහැ කියා අපි කියන්න කැමැතියි. ආචාර ධර්ම රකින්නේ නැත්නම් ආචාර ධර්මවලින් පාර්ලිමේන්තුව මෙහෙයවන්න පුළුවන්කමක් ඇති වන්නේ නැහැ. ඒකට බලපෑ සාධක මේ සමාජය ඇතුළේ තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද තිබෙන්නේ සම්පූර්ණයෙන්ම චර්යා ධර්ම විනාශ වූ, ආචාර ධර්ම විනාශ වූ සමාජයක්; සමාජ ක්‍රමයක්; ධනය අගය කරන සමාජයක්. ධනය තිබෙනවා නම්, සල්ලි තිබෙනවා නම් ඕනෑම විකෘති වැඩක් කරන්න පුළුවන් සමාජයක් අද නිර්මාණය වෙලා තිබෙනවා. ඒ, සමාජ ආර්ථික ප්‍රතිපත්තිය නිසායි. අද තිබෙන මේ තත්ත්වය වෙනස් කරන්න, පාලන තන්ත්‍රයේ යහපත් වෙනසකට රට පරිවර්තනය කරන්න ඕනෑ.

මේ පාර්ලිමේන්තුවේ සමහර අවස්ථාවල උසස් විවාද පැවැත්වෙනවා. ඒවා නොවෙයි මාධ්‍යවල පළ වන්නේ. ඒවා ජනමාධ්‍යවල පළ වන්නේ නැහැ. දැන් රට පුරාම මාධ්‍ය ජාලා කරන්නේ මොකක්ද? සමාජ සංස්කෘතිය විනාශ කරන සමහර දර්ශන, රූපරාමු තමයි අද ඇත්ත වශයෙන්ම සමාජගත වන්නේ. සමාජය ඇතුළේ චර්යා ධර්ම රැකෙන්නේ නැත්නම්, ආචාර ධර්ම පිරිහෙනවා නම්, සමාජ විකෘතියක් ඇති වනවා නම් ඒ විකෘතිය මේ පාර්ලිමේන්තුවේ පිළිබිඹු වේවි. ඒක ස්වභාවයක්. ඒකට වග කියන්න ඕනෑ ඒ සමාජ විකෘතියට ඉඩ සලසන අනෙකුත් සමාජ බලවේගයි. ඒ නිසා මම කියනවා, සමාජ ආදර්ශයක් දීමේ ලොකු වගකීමක් මේ වෙලාවේ අපට තිබෙන බව. සම්පූර්ණ සමාජයේ මේ පවතින චර්යා ධර්ම විරෝධී, ආචාර ධර්ම විරෝධී, සංස්කෘතික විරෝධී ක්‍රමවේදයන් පරාජය කරන්න පුළුවන් ආකාරයේ යම්කිසි පරිවර්තනයකට සමාජය ගෙනෙන්න අප කටයුතු කරන ප්‍රමාණයට මේ පාර්ලිමේන්තුවේ උසස් නියෝජනයන් ඇති වේවි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ සඳහා දෙපැත්තටම වගකීමක් තිබෙනවා; සමාජමය වගකීමක් තිබෙනවා. මේ උත්තරීතර පාර්ලිමේන්තුව විසින් සමාජයට ආදර්ශයක් දීමේ වගකීමකුත් තිබෙනවා. මේ දෙක අතර සම්බන්ධතාව ඇත්ත වශයෙන්ම මේ සමාජයටත්, ඒ වාගේම අපේ පාර්ලිමේන්තුවේ කටයුතුවලටත් ප්‍රබලව බලපාවි. ඒ ගැන කතා කරන්න මීට වඩා වෙලාව මම ගන්නේ නැහැ.

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

අපට ජාතික වගකීමක් තිබෙනවා. මුළුමහත් රට පුරා දැනටමත් දේශපාලන වශයෙන් තිබෙන අර්බුදකාරිත්වය දිහා බැලුවාම එක පැත්තකින් දැන් මේක දේශපාලන සූදුවක් බවට පත්වෙලා තිබෙනවා. උසස් සංවාදයක් වෙනුවෙන් හෝ රට ගැන හිතන, රටේ ආර්ථිකය ගැන හිතන, රටේ අනාගතය ගැන හිතන, ඒ සඳහා වූ බල මාරුවක් ගැන හිතන, ඒ සඳහා වූ මහ පෙන්වීමක් ගැන හිතන බලයකට නොවෙයි අද කවුරුත් කථා කරන්නේ. අද සංඛ්‍යාලේඛන එකතුවක් ගැනයි කථා කරන්නේ. කාටද වැඩියෙන් තිබෙන්නේ, කාටද අඩුවෙන් තිබෙන්නේ කියන කාරණායි අද සංවාදයක තිබෙන්නේ. ඒ නිසා එහෙම සංවාදයක් ඇතුළේ මම දකින්නේ නැහැ, මොන බල හුවමාරු ආවත් රටේ අනාගතයට සේවයක් ඇති වෙයි කියලා. රටේ ජනතාවට ඒකෙන් වාසියක් ඇතිවෙයි කියා අපට හිතන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා රට ඇතුළේ පීඩනය ඇති වෙන්න, ඇති වෙන්න; දුප්පත්කම ඇති වෙන්න, ඇති වෙන්න; සමාජ ව්‍යසනය ඇති වෙන්න, ඇති වෙන්න අනික් පැත්තෙන් මහජන විරෝධය මතුවීමත්, ඒ තුළ සමාජ විරෝධී ක්‍රියාවලට සමාජය පෙලඹවීමත් ස්වාභාවිකයි. ඒ නිසා අපි මේ වෙලාවේ මතු කළ යුතු කාරණය තමයි හැම ප්‍රශ්නයක් දෙසම නිවැරදිව, යථාර්ථවාදීව බැලිය යුතු බව. කළ යුත්තේ දෙපැත්තේ ඉඳගෙන ගහ මරා ගන්න එක, කොටා ගන්න එක නොවෙයි; සමාජයට අවශ්‍ය නිවැරදි උත්තර සපයන උත්තරීතර ආයතනයක් විධියට මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න අපි ක්‍රියා කිරීමයි. එය අප කාගේත් වගකීමක් බව ප්‍රකාශ කරමින් මට කෙටි වේලාවක් ලබාදීම ගැන ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

[අ.භා. 3.45]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය පිළිබඳ කරන සාකච්ඡාවේදී ඊට සම්බන්ධවීමට අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ - කලින් කථා කරපු අපේ මන්ත්‍රීවරු ඒ ගැන පැහැදිලි කළා,- මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයක් එහෙම නැත්නම් චර්යා ධර්ම පද්ධතියක් හඳුන්වා දිය යුතුයි කියන කාරණය සාකච්ඡා කළා. විශේෂයෙන්ම ඒ ගැන මැතිවරණ කාලවලදී අපට සාකච්ඡා කිරීමට සිද්ධ වුණේ මේ රටේ දේශපාලන සංස්කෘතිය තුළ 'මන්ත්‍රීවරයා' ගැන තිබෙන ජනතා හැඟීම හා ජනතා අදහස ඒ තරම් හොඳ අදහසක් නොවුණු නිසායි. අපි දන්නවා, මේ සමාජය තුළ, සමාජ කතිකා තුළ, මහජනයා තුළ, විශේෂයෙන්ම ජනමාධ්‍ය තුළ 'මන්ත්‍රීවරු' කියලා කියන්නේ දරදඬු, දූෂිත, එහෙම නැත්නම් යම් යම් අපරාධවලට සම්බන්ධ වුණු, තමන්ට ඕනෑම දෙයක් කරන්න පුළුවන් යැයි සිතන මානසික මට්ටමින් වැඩ කරන උදවිය කියන එකයි අපේ සමාජය ඉදිරියේ තිබෙන මතය. නමුත් මැතිවරණයක් ආවාම ජනතාව ඡන්දය දීලා පත් කරන්නෙත් ඒ මන්ත්‍රීවරුන්ම තමයි. ඒ මානසික මට්ටමේ සිටිනවාය කියා ජනතාව හිතන ඒ උදවියටම තමයි බහුතර ඡන්ද ලැබෙන්නෙත්. මැතිවරණ කාලවලදී අපි සාකච්ඡා කළ පරිදි එවැනි චර්යා ධර්ම පද්ධතියක් හඳුන්වා දීම හරහා යම් රීති පද්ධතියකට මන්ත්‍රීවරුන් එකහ කරවා ගැනීම හා ඔවුන්ගේ ක්‍රියාකලාපය ඉදිරියට ගෙන යන්න පුළුවන් යම් වැඩසටහනක්, යම් ක්‍රියාදාමයක් අද අපි ඉස්සරහට ගෙනැල්ලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා, මීට කලින් අපට එහෙම චර්යා ධර්ම පද්ධතියක් තිබුණේ නැහැ කියලා. මන්ත්‍රීවරු හැටියට අපි බොහෝ දුරට වැඩ කරගෙන ආවේ පාර්ලිමේන්තුව තුළ සම්ප්‍රදාය අනුවයි. අද ඒ සම්ප්‍රදායෙන් පමණක් සෑහීමකට පත් වෙන්නේ නැහැයි කියන එක මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලුදෙනාම පිළිගෙන තිබෙනවා. ඒ නිසා සම්ප්‍රදායට එහා ගිය යම් චර්යා ධර්ම සංග්‍රහයක් එහෙම නැත්නම් චර්යා ධර්ම පද්ධතියක් අවශ්‍යයි කියන මතය අද පාර්ලිමේන්තුව තුළින්ම ඇවිල්ලා, ඒක ගැන යම් ලියවිල්ලක් ඉදිරිපත් කරලා, අපට ඒ ගැන සාකච්ඡා කරන්න පුළුවන් තත්ත්වයට අපි මෙය ගෙනැල්ලා තිබෙනවා. අපට එහෙම දෙයක් අවශ්‍ය වුණේ ඇයි කියන කාරණය ගැන සාකච්ඡා කළොත්, පසුගිය කාලයේ තිබුණු දේශපාලන සංස්කෘතිය තුළ වූ ඒ පිරිහීම නිසාම තමයි අප විසින් චර්යා ධර්ම සංග්‍රහයක් හදා ගන්න ඕනෑ කියන අවශ්‍යතාව ඇති වුණේ කියලායි මම හිතන්නේ.

මොකද, පසුගිය කාලය පුරාම "මන්ත්‍රීවරයා" කියන පුද්ගලයාගේ පිරිහීම කොයි තරම් දුරට බලපෑවා ද කිව්වොත්, අන්තිමට අපි සියලු දෙනාම එකතු වෙලා අපි වෙනුවෙන්ම චර්යා ධර්ම පද්ධතියක් හදා ගන්න ඕනෑ කියන තැනට මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225ම අද තල්ලු වෙලා තිබෙනවා. අපි අද අලුතින් හිතන්න ඕනෑය කියන තැනට අද පැමිණිලා තිබෙනවා. අද අපි ඉන්න තැන හොඳ තැනක් නොවුණත්, අපි යන්න ඕනෑ කොතැනටද කියන එක සියලු දෙනාටම පිළිගන්න පුළුවන් විධියට සියලු දෙනාම ඒක ස්වයං විවේචනය කරමින් ඉදිරියට යන්න ඕනෑ කියන අදහසට අද අපි ඇවිල්ලා තිබෙනවා. ඒ අදහස මත අද මෙම ලියවිල්ල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ගැන ගරු කථානායකතුමාටත්, ඒ වාගේම මේ කමිටුවේ සිටි සියලුම මන්ත්‍රීවරුන්ටත් අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මම හිතනවා, මේ තුළ විශේෂ දේවල් තිබෙනවා කියලා. "පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය" තුළ VII වන කොටසේ "මන්ත්‍රීවරුන් විසින් පොදු දේපළ පාවිච්චි කිරීම හා පෙලඹවීම්" කියන කාරණය ගැන විග්‍රහයක් කරලා තිබෙනවා. එහි 23වන වගන්තියේ මෙසේ සඳහන් වනවා:

> "මන්ත්‍රීවරුන් විසින් යම් පොදු අරමුදල්, දේපළ හෝ පහසුකම් හුදෙක් මහජන බැඳියාවක් සම්බන්ධයෙන් පමණක් නීතියෙන් අවසර දී ඇති පරිදි පාවිච්චි කළ යුතු ය. එම පොදු අරමුදල්, දේපළ හෝ පහසුකම් ඒ සඳහා නීතියෙන් විශේෂිතව විධිවිධාන සලසා ඇත්නම් මිස පක්ෂ දේශපාලන කටයුතුවලට පාවිච්චි නොකළ යුතුය."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පමණක් නොවෙයි, අප සියලු දෙනාටම තිබෙන චෝදනාව තමයි, මහජන මුදල් -පොදු දේපළ- අනිසි ලෙස පාවිච්චි කිරීම සහ ඒවා අවභාවිත කිරීම කියන එක. අද මේ ඉදිරිපත් කරලා තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය තුළ, පොදු දේපළ මන්ත්‍රීවරුන් පාවිච්චි කළ යුත්තේ කොහොමද කියන එක ගැන යම් අර්ථ දැක්වීමක් කරලා තිබෙනවා. ඒ අර්ථ දැක්වීම පවා කරන්න සිද්ධ වුණේ, පසුගිය කාලය පුරාම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරුන්ට දූෂණ, වංචා සහ මහජන මුදල් අවභාවිත කිරීම යනාදී කරුණු ගැන චෝදනා රාශියක් එල්ල වුණු නිසායි. අද මේ ඉදිරිපත් කරපු ලියවිල්ල තුළ, මහජන මන්ත්‍රීවරුන් පොදු දේපළ පාවිච්චි කරන්න ඕනෑ කොහොමද, මහජන මුදල් පාවිච්චි කරන්න ඕනෑ කොහොමද කියන ආකාරය සම්බන්ධයෙන් යම් අදහසක් ඉදිරිපත් කරලා තිබෙනවා. මන්ත්‍රීවරයෙකුගේ චර්යාව, ඒ වාගේම මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික කටයුතු යනාදී සියලු දේවල් පිළිබඳ මේ ලියවිල්ල තුළ කරුණු ඉදිරිපත් වෙලා තිබෙනවා. අපි මෙය තව ඉස්සරහට ගෙන යන්න ඕනෑ. මන්ත්‍රීවරුන් හැටියට අපි දකින දෙයක් තිබෙනවා. මන්ත්‍රීවරයා කියන්නේ, මේ විධියට සිටිය යුතු කෙනෙක්; ඔහුගේ හැසිරීම, ඔහුගේ ක්‍රියාකලාපය මේ සමාජයේ සියලු කාරණාවලට බලපාන දෙයක් කියන එක අපි සියලු දෙනාම පිළිගන්නවා. ඉදිරියේදී මේ දේශපාලන සංස්කෘතිය තුළ, මේ සමාජය තුළ ඉන්න අනෙකුත් සියලු දෙනාටම ආදර්ශයක් වන හැටියට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඉන්න ඕනෑ කියන දේ අප සියලු දෙනාම පිළිගන්නා දෙයක්. ඒ සම්බන්ධයෙන්

අපි කවුරුවත් වෙනත් අදහස්වල නැහැ. අපි එවැනි ආදර්ශවත් පුද්ගලයන් වෙන්න ඕනෑ. මේ රට තුළ, මේ සමාජය තුළ අපි සියලු දෙනාටම -අපේ ඡන්ද දායකයන් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් අනෙකුත් අය වෙන්න පුළුවන්- ආදර්ශවත් නොවී ඉඳීමම තමයි අද මේ චර්යා ධර්ම සංග්‍රහයක් පවා අපට අද ඉදිරිපත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අපි අද හොඳ ආරම්භයක් ලබා දීලා තිබෙනවා. පාර්ලිමේන්තු සම්ප්‍රදාය හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වටිනාකම තවත් ඉස්සරහට ගෙන යන්න පුළුවන් ලියවිල්ලක් අද මේ සභාවට ඉදිරිපත් කිරීම ගැන අපි ස්තුතිවන්ත වෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාලයත් එක්ක අද අපි ස්ථාවර නියෝග නවීකරණය කරලා තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ තිබෙන ස්ථාවර නියෝග විතරක් නොවෙයි, මේ තිබෙන අලුත් තත්ත්වයන් එක්ක අපේ රට තුළ තිබෙන යම් යම් නීතිරීති, ආයතන සංග්‍රහය පවා ඉදිරියේදී නවීකරණය වෙන්න ඕනෑ. මොකද, තිබෙන හුඟක් දේවල් නවීන ලෝකයට, පවතින තත්ත්වයට ඔබින්නේ නැති බව අප දන්නවා. ඒවාත් එක්ක අද මේ සමාජය, මේ රට ඉස්සරහාට ගෙන යන්න බැහැ. ඉස්සරහාට ගෙන යන්න ඕනෑ නම්, අනිවාර්යයෙන්ම ඒවා අලුත් වෙන්න ඕනෑ; අලුත් අදහස් එන්න ඕනෑ; අලුත් නීති රීති එන්න ඕනෑ; අලුත් දේවල් එකතු කරන්න ඕනෑ.

උපදේශක කාරක සභා නැවත ක්‍රියාත්මක කිරීම අපි මේ කෙටුම්පතට එකතු කර තිබෙනවා. මම හිතන හැටියට ඒක ඉතාම හොඳ දෙයක්. මොකද, පාර්ලිමේන්තුව තුළ අපි වාද විවාද සහ අදහස් ඉදිරිපත් කිරීම පමණක් නොවෙයි සිදු කරන්නේ. උපදේශක කාරක සභා කියන්නේ, පාර්ලිමේන්තුව තුළ තිබුණු වැදගත්ම කොටසක්. විශේෂයෙන්ම අපේ එදිනෙදා කටයුතු, තිබෙන දේවල් ක්‍රියාත්මක කිරීම හා ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කිරීම සඳහා වූ පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක වුණු උපදේශක කාරක සභා නැවත පණ ගන්වා ක්‍රියාත්මක කිරීම මේ තුළට ඇතුළත් කිරීම අපි ඉතාම අගයන්න ඕනෑ දෙයක්. ඒ වාගේම ආංශික අධීක්ෂණ කාරක සභාත් එලෙසම පවත්වාගෙන යාමට ගත්ත ඒ තීන්දුවත් ඉතාම හොඳ දෙයක්. මොකද, පසුගිය කාලය තුළ ආංශික අධීක්ෂණ කාරක සභා තුළිනුත් යම් කාර්ය භාරයක්, -විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශාල කාර්ය භාරයක්- අපට කරන්න පුළුවන් වුණා. පාර්ලිමේන්තුව තුළ සිටින ගරු මන්ත්‍රීවරු 225ම එය නොදැක්කාට ඒවාට සහභාගි වුණු හා එම කාරක සභාවල සිටින මන්ත්‍රීවරු දැක්කා. විශේෂයෙන්ම යම් යම් ක්ෂේත්‍රවල කාලයක් තිස්සේ විසඳා ගන්න බැරිව තිබුණු ප්‍රශ්න අපට එම කාරක සභා තුළින් විසඳා ගන්න පුළුවන් වුණා. අලුත් අදහස් ඉදිරිපත් කරමින් යම් යම් ක්ෂේත්‍ර තුළ වෙනස්කම් කරන්න, තීන්දු තීරණ ගන්න පුළුවන් හැකියාව පවා අපට ලැබුණා. ආංශික අධීක්ෂණ කාරක සභාත් පවත්වාගෙන යමින්, නැවත උපදේශක කාරක සභා ක්‍රියාත්මක කිරීමත් අපේ පාර්ලිමේන්තු ක්‍රමය හා ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට ගත් උත්සාහයක්. ඒ තීන්දු ගැන ස්තුතිවන්ත වෙමින්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේටද ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "විවාදය දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

This Debate will be continued on a future date.

***ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.***
*இதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*The Debate stood adjourned accordingly.*

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය
## பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவை
## CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ චර්යා ධර්ම සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07වැනි අඟහරුවාදා පිළිගන්වන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ අවසන් කෙටුම්පත අනුමත කළ යුතුය"යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "විවාදය දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

This Debate will also be continued on a future date.

***ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.***
*இதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*The Debate stood adjourned accordingly.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The Adjournment Motion is to be moved by the Hon. Dinesh Gunawardena. Before that, will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්න.

## ශ්‍රී ලංකාව තුළ උද්ගත වී ඇති දේශපාලන අර්බුදය
## இலங்கையில் எழுந்துள்ள அரசியல் நெருக்கடி
## POLITICAL CRISIS ARISEN IN SRI LANKA

[අ.භා. 3.56]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "අද දින වන විට ශ්‍රී ලංකාවේ උද්ගත වී ඇති දැවැන්ත දේශපාලන අර්බුදය නිසාවෙන්, රට අරාජික තත්ත්වයට පත්ව ඇති බැවින් ඒ හා සම්බන්ධිත මෙම ගරු සභාවේ විවාදයක් අද දින ලබා දෙමින්, ජාතික වැදගත්කමකින් යුත් මෙම අර්බුදයට සුවිශේෂ අවධානය යොමු කරවීමට අවස්ථාව ඉල්ලා සිටිමු."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු දෙක හමාරකට පසුව පෙබරවාරි මාසයේ 10වන දින පළාත් පාලන ඡන්දය රට පුරාම පැවැත්වුණා. රටේ හැම දෙනාටම ඡන්දය දීමේ අවස්ථාව උදා වුණා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හා සම්බන්ධ දේශපාලන පක්ෂ එකමුතුවෙන් විශාලතම ජයග්‍රහණයක් උදා කර ගත්තා. රජයට එරෙහිව ජනතා තීන්දුව ප්‍රකාශ වුණා. ඒ පිළිබඳව මා විශේෂයෙන් අවධානය ගෙනෙන්න කැමැතියි. එය බෙදී යන්නේ මෙසේය. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ලබා ගත් ඡන්ද සංඛ්‍යාව 4,941,952යි; ආසන ප්‍රමාණය 3,369යි. එක්සත් ජාතික පක්ෂය ලබා ගත් ඡන්ද සංඛ්‍යාව 3,612,259 -[බාධා කිරීම්] ඔව්, 36 ලක්ෂ -[බාධා කිරීම්] ඒක තමයි. බොහොම සතුටුයි, 36 ලක්ෂය කියලා කියා ගන්න. පොඩ්ඩක් ඉන්න. දැන් වෙලා තිබෙන දේ ඉවසීමෙන් අහගන්න. ඔබතුමන්ලා ලබා ගත් ආසන සංඛ්‍යාව 2,385යි. -[බාධා කිරීමක්] ඔව්. වැටුණා. එක්සත් ජනතා නිදහස් සන්ධානය නොහොත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලබා ගත් ඡන්ද සංඛ්‍යාව 989,821යි; ආසන සංඛ්‍යාව 674යි. ජනතා විමුක්ති පෙරමුණ ලබාගත් ඡන්ද සංඛ්‍යාව 693,875යි; ආසන සංඛ්‍යාව 431යි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලබාගත් ඡන්ද සංඛ්‍යාව 1,481,656යි; ආසන සංඛ්‍යාව 358යි.

දෙමළ ජාතික සන්ධානය -ITAK- ලබා ගත් ඡන්ද සංඛ්‍යාව 339,675යි; ආසන සංඛ්‍යාව 407යි. ඒ අනුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සියයට 44.65ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන ඇති අතර, එක්සත් ජාතික පක්ෂය ලබා ගෙන ඇති ඡන්ද ප්‍රතිශතය සියයට 32යි. එක්සත් ජාතික පක්ෂය ඉතිහාසයේ කවදාවත් මෙවැනි අන්ත පරාජයකට පත් වෙලා නැහැ. ඒ දේශපාලන තීන්දුව, මුළු රටම ප්‍රකාශ කළ තීන්දුව අනුව පළාත් පාලන ආයතන විශාල සංඛ්‍යාවක -239ක- ජයග්‍රහණය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට හිමි වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයට හිමි වී තිබෙන්නේ, පළාත් පාලන ආයතන 41ක බලය පමණයි. දැන් දේශපාලන අර්බුදයක් මතු වෙලා, ජාතික අර්බුදයක් මතු වී තිබෙනවා. මේ සමඟම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ආර්ථික වැඩ පිළිවෙළ අසාර්ථක වී තිබෙනවා; රාජ්‍ය පාලනය අසාර්ථක වී තිබෙනවා. ඒ වාගේම යහ පාලනය නමින් සිදු කළ මහ බැංකු Bond නිකුතුවෙන් ඇති වී තිබෙන මහා මූල්‍ය අර්බුදය හා වංචාව මුළු රටම ඉදිරියේ හෙළිදරව් වී හමාරයි. මේ හේතුසාධක මත අවුරුදු තුනක් ආණ්ඩු කරපු මේ ආණ්ඩුව ජනතාව විසින් අන්ත පරාජයකට පත්කොට, ප්‍රතික්ෂේප කර තිබෙනවා.

ජනතාව තීන්දුවක් දීලා තිබෙද්දී ආණ්ඩුව බලයේ එල්ලී සිටීමට තවත් උත්සාහ දරනවා. මේ ප්‍රශ්නය නිසා ඉදිරියේදී ඇතිවන්නේ දේශපාලන, ජනමත ගැටුමක්. එය ඉදිරියේ ආණ්ඩුවට පසු බහින්න සිදු වෙනවාමයි. ඔබ කෙරෙහි විශ්වාසයක් නැහැ. ඔබ කෙරෙහි විදේශ ආයෝජකයන්ගේ විශ්වාසයක් නැහැ. ඔබ කෙරෙහි කොටස් වෙළෙඳ පොළේ විශ්වාසයක් නැහැ. කඩා වැටෙන ආණ්ඩුවක් බවට පත්ව තිබෙන ඔබ කෙරෙහි විශ්වාසයක් නැති නිසා ලංකාවේ ධනේශ්වර ව්‍යාපාරයේ සිට සුළු ධන ව්‍යාපාර දක්වා අලුතෙන් ආයෝජන නොකර බලා සිටිනවා. මේක තමයි ඉදිරියේදී අපි මුහුණ දෙන දේශපාලන, ආර්ථික අර්බුදය. ඔබේ විසඳුම් රට පිළිගන්නේ නැහැ. ඔබේ විසඳුම් රට ප්‍රතික්ෂේප කර තිබෙනවා. සංඛ්‍යාත්මකව, සත්‍යයේ තොරතුරු මත ඔබ අසාර්ථකයි. ඔබ විසින් ප්‍රකාශ කළ මිත්‍යා තොරතුරු මතත් ඔබ අසාර්ථකයි. ඉතින් එවැනි ආණ්ඩුවකට ප්‍රජාතන්ත්‍රවාදීව රටක් ගෙන යාමට බැරි නිසා තමයි අපි මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් මේ මහා ජයග්‍රහණය ලබා ගත්තේ. ඒ නිසා පාර්ලිමේන්තුවේ තිබෙන වැරදි නියෝජනය නිවැරදි කරලා, මහජන මතයට සවන් දී මහා මැතිවරණයක් පවත්වලා, නිවැරදි මහජන මතයට අපේ රටේ පාලන තන්ත්‍රය නියෝජනය කිරීමේ අවස්ථාව ලබා දෙන්න. ඊට එරෙහිව දරදඬු වී කටයුතු කිරීමෙන් දේශපාලනික වශයෙන් ඔබට තාවකාලික තෘප්තියක් ලබන්න පුළුවන්. නමුත් එයින් අපේ රටේ සෑම ආර්ථික අංශයක්ම, රාජ්‍ය ක්ෂේත්‍රය, අපේ රටේ සියලු ජනතාව බරපතළ අර්බුදයකට මුහුණ දෙන තත්ත්වයක් ඇති වනවා. එක්සත් ජාතික පක්ෂය හා එක්සත් ජාතික පක්ෂයේ මිත්‍ර අමාත්‍යවරු මේ අවුරුදු තුන තුළ ගමන් කළ මාවත අසාර්ථක බව පෙන්වා, රටට එරෙහිව ගත් ක්‍රියා මාර්ග ජනතාව ප්‍රතික්ෂේප කර තිබෙනවා.

තමුන්නාන්සේලාට කියන්න පුළුවන්, මේක පළාත් පාලන මැතිවරණයක් කියලා. ගරු අග්‍රාමාත්‍යතුමා කියනවා, මේක පළාත් පාලන මැතිවරණයක් කියලා. එහෙම නම් පළාත් පාලන මට්ටමෙන් ඡන්දය පවත්වන්න ඉඩ තියන්න තිබුණා නේ. රාජ්‍ය නායකයෝ ඒකට සම්බන්ධ වුණේ මොකටද? ජනාධිපතිතුමා

ඡන්ද ව්‍යාපාරයට ගියා; අගමැතිතුමා ඡන්ද ව්‍යාපාරයට ගියා; මුළු ඇමති මණ්ඩලයම ගියා. ඒ ඉදිරිපත් කළ අභියෝගයට අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රධාන මන්ත්‍රී කණ්ඩායම මුහුණ දීලා, ඔබතුමන්ලා ජාතික වශයෙන් අන්ත පරාජයකට පත් කරලා තිබෙනවා. ඉතින් මේ රජය අපේ රටේ ඇති කර තිබෙන විසඳුමක් නැති අර්බුදය -දේශපාලන ප්‍රශ්නය- වැඩි නොකොට ඉවත් විය යුතුයි. ඒ නිසා තමයි අපි ප්‍රකාශ කළේ, එක්සත් ජාතික පක්ෂයට තවදුරටත් ආණ්ඩු කරන්න බලයක් නැහැ කියලා. ඒ සන්ධානය දැන් කැඩිලා ඉවරයි. දැන් සන්ධානයක් නැති බව ප්‍රකාශ කර තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව ජාතික ආණ්ඩුවකට දුන් වරම ඉවරයි.

දැන් අලුත් ආණ්ඩුවක් පිහිටුවන බව එක්සත් ජාතික පක්ෂයේ අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශ කරනවා. හොඳයි. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් පිහිටුවනවා කියන්නේ, අලුත් ආණ්ඩුවක්. ඒකට ජනාධිපතිවරයාට අවසර දෙන්න වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මිස වෙන විධියකට නොවෙයි කියන එක අපි ඉතාම වග කීමෙන් බරපතළව ප්‍රකාශ කරනවා.

දැන් මේ කිසිම ඇමතිවරයකු අවලංගු වූ ආණ්ඩුවේ අමාත්‍ය ධුර දරන්නේ නැහැ. අලුත් ආණ්ඩුවක් පිහිටුවන තුරු ඒ කිසිම ක්‍රියාවක් වලංගු වන්නේ නැහැ. සම්පූර්ණ රාජ්‍ය යන්ත්‍රණයම අද අඩ පණ වී බලා සිටිනවා. ඔබතුමන්ලාට රටට ඔක්සිජන් දෙන්නත් බැහැ. ඔබතුමන්ලාට ඔක්සිජන් දෙන්න රටටත් බැහැ. ඒ නිසා දැන් තිබෙන්නේ "ආයුබෝවන්" කියා ගෞරවයෙන් ගෙදර යැමයි. [බාධා කිරීම්] මේ ප්‍රශ්නයට අලුතින් විසඳුමක් සෙවීමට රටට අවස්ථාව දෙන්න. මේ, රටේ කිසිම ප්‍රශ්නයකට විසඳුමක් සොයා ගන්න බැරි වුණු ආණ්ඩුවක්. අලුත් විසඳුමක් ගෙනෙන තීන්දුවක් ප්‍රකාශ කරන්න රටේ ජනතාවට වරම දෙන්න.

[අ.භා. 4.04]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමන් විසින් ගෙන එන ලද මේ යෝජනාව මා ස්ථිර කරනු ලබනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා දීර්ඝ කාලයක් ප්‍රමාද කරලා තටමලා තටමලා ඉතාම අමාරුවෙන් තමයි පළාත් පාලන මැතිවරණය මේ රටේ මහ ජනතාවට දිනා දෙන්න පුළුවන් වුණේ කියලා ඔබතුමාත් දන්නවා ඇති. පැරදුණත් පාලන බලය අල්ලා ගන්න පුළුවන් වන විධියට තාක්ෂණ ක්‍රමවේද යොදලා, මැතිවරණ ක්‍රමයේ අසාමාන්‍ය වෙනස්කම් කරලා තමයි තමුන්නාන්සේලා මැතිවරණ ක්‍රමයත් හදා ගත්තේ. මේ ඔක්කෝම කරලා තමුන්නාන්සේලා මැතිවරණය පැවැත්වුවා. නමුත්, මැතිවරණ කොමිසම තවම තටමනවා, මැතිවරණ ප්‍රතිඵල අවසාන වශයෙන් නිකුත් කරන්න විධියක් නැතිව. මා හිතන හැටියට ස්වාධීන මැතිවරණ කොමිසම ඔවුන් කරපු පළමුවැනි මැතිවරණයෙන්ම කොමිසමේ කලිසම ගලවා ගෙන ඉවරයි. ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මහ ජනයාට දීපු විශ්වාසය, කියපු පුරාජේරු කථා සියල්ලම කොමිසමේ සභාපතිවරයා විසින් නැත්තටම නැති භංග කර ගෙන ඉවරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩ බැරි ආණ්ඩුව වාගේම වැඩ බැරි කොමිසමක් බවට අද ඒ කොමිසමත් පත් වෙලා ඉවරයි. තමුන්නාන්සේලා මේ පළාත් පාලන මැතිවරණයට ගියේ, මේක ගමේ පාලම, බෝක්කුව, පාර පිළිබඳව තීරණය කරන මැතිවරණය හා ගමේ නායකයා කවුද කියලා තීරණය කරන මැතිවරණය කියලා, මේ මැතිවරණයට තිබෙන අර්ථය ප්‍රාදේශීයකරණය කරමින්.

තමුන්නාන්සේලාගේ විශ්වාසවන්ත රක්ත මිත්‍රයා, ජනතා විමුක්ති පෙරමුණේ නායකයා කියනවා මම අහගෙනයි, "මහරගම බයිසිකලය කොහොමද දිනුවේ, ඒ බයිසිකලයෙන් ඡන්දය ඉල්ලූ ලැයිස්තුවේ වැඩි දෙනෙක් ඉන්නේ කුලියාපිටියේ, අපේක්ෂකයා කවුද කියලාවත් දන්නේ නැතිව පොහොට්ටුවට කතිරය ගැහුවේ කොහොමද" කියලා. මේ රටේ තිබුණේ පළාත් පාලන මැතිවරණයක් වුණාට, මේක ජන මත විචාරණයක් හැටියට සලකා ඡන්දය පාවිච්චි කරන්නයි අපි මුල සිටම මේ රටේ මහ ජනතාව පෙලඹෙව්වේ කියන එක ඒ අයට අපි කියන්න ඕනෑ. ජනාධිපතිවරයා කිව්වා, අගමැතිතුමාගේ පාර්ශ්වයෙන් කිව්වා, ගමේ පාර, බෝක්කුව ඇතුළුව ගම හදන්න ප්‍රාදේශීය සභාවට සල්ලි ටික ලැබෙන්නේ බලය තිබෙන අයට ඡන්දය දුන්නොත් පමණයි කියලා. නමුත්, මිනිස්සු ඡන්දය දුන්නේ ගමේ පාලම, බෝක්කුව, ලයිට් කණුව දිහා බලා නොවෙයි. රටත්, ජාතියත් පසුගිය අවුරුදු තුන ඇතුළේ ඇද ගෙන ගිය විනාශකාරී මාර්ගය දිහා බලා, ඒ මාර්ගයෙන් මේ රට එළියට ගන්න ඕනෑ නිසායි මේ මැතිවරණයේදී සියයට 80කට ආසන්න පිරිසක් ඡන්ද පොළට ගිහිල්ලා ඡන්දය දුන්නේ. එපමණක් නොවෙයි. බිහි කරලා ඉතා කෙටි කාලයක් ඇතුළත තරග වැදුණු මේ දේශ මාමක බලවේගයන්ගේ එකතුව -ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ- ජයග්‍රහණය කරවන්න මේ රටේ පොදු ජනතාව තීරණය කළා. ඒ මැතිවරණ ප්‍රතිඵලයට අනුව එක්සත් ජාතික පක්ෂය ලබා ගෙන තිබෙන ඡන්ද ගණන් කරලා පාර්ලිමේන්තු මැතිවරණයකට මාරු කරලා බලන්න. මේ මැතිවරණය පාර්ලිමේන්තු මැතිවරණයක් හැටියට සලකා ගත්තොත් එක්සත් ජාතික පක්ෂයට ලැබුණේ ආසන 67යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පැත්තෙන් අපට තිබෙන අමාරුම මැතිවරණයටයි අපි මුහුණ දුන්නේ. තමුන්නාන්සේලා පළාත් සභා මැතිවරණ කල් දැම්මා.

තමුන්නාන්සේලා දන්නවා, පළාත් සභා මැතිවරණ දිනන එක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ඉතාම පහසුයි කියා. එම නිසා තමුන්නාන්සේලා ගෙනාවා, අලුත් මැතිවරණ ක්‍රමයක්. අපි ගෙනාපු මැතිවරණ ක්‍රමය ව්‍යාකූල තත්ත්වයකට පෙරළුවා. එහෙම කරලා "ආ! මේ පිට්ටනියේ පුළුවන් නම් තරග වැදිලා බලමු" කියන අභියෝගයත් එක්කයි තමුන්නාන්සේලා මේ මැතිවරණයට ආවේ. මේක අමාරුම පිට්ටනියක්. මැතිවරණයට අපේක්ෂකත්වය නොලැබෙන විශාල පිරිසක් අමනාප වනවා; ස්වාධීන ලැයිස්තු එනවා; ඥාතිකම, කුලය, මිත්‍රකම වාගේ එක එක කාරණා නිසා ඡන්ද වෙනස් වනවා; ජාතික දේශපාලන අරමුණුවලට වඩා ප්‍රාථමික දේශපාලන අරමුණු උඩට එනවා. මේ මැතිවරණය තමයි, අපට මුහුණ දෙන්න තිබුණු අවාසිදායකම මැතිවරණය. හැබැයි, මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවට අපි හිස නමා ආචාර කරනවා, මේ මැතිවරණය ජාතික මැතිවරණයක් හැටියට අරගෙන, මේ ජාතික මැතිවරණයේදී තමන්ගේ ජාතික යුතුකම ඉටු කරන්න ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණට ඉහළම ජයග්‍රහණයක් ගෙනැල්ලා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ, අපට මුහුණ දෙන්න තිබුණු අමාරුම මැතිවරණය. මේ මැතිවරණය අමාරු නිසා තමුන්නාන්සේලා මුලින්ම අපට අභියෝගය භාර දුන්නා, "ආ! එන්න, ක්‍රීඩා කරලා පෙන්වන්න" කියලා. නමුත්, ඒ මැතිවරණය මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ නාමයට විශිෂ්ට ජයග්‍රහණයක්. ඒ තුළින් එතුමා ගැන තිබෙන විශ්වාසය අලුත් වුණා.

මේ ආණ්ඩුව අවුරුදු තුනක් ගෙන ගිය තමුන්නාන්සේලා මොකක්ද කළේ? බන්ධනාගාර බස් රියයි, පොලීසියයි, උසාවියයි, රාජපක්ෂලයි, අපියි නැත්නම් පසුගිය අවුරුදු තුනට රූපවාහිනී නාලිකාවලට, පත්තරවලට ප්‍රවෘත්ති නැහැ. තමුන්නාන්සේලා ඔච්චරයි කල් ආපු දවසේ ඉඳලා. අද එක් කෙනෙක් ගෙනියනවා බන්ධනාගාර බස් එකේ, හෙට තව කෙනෙක් ගෙනියනවා, එක්කෙනෙක් ඇප පිට එළියට එනවා, තව හාමුදුරු නමක් අලි

[ගරු විමල් වීරවංශ මහතා]

පැටියෙක් හින්දා හිරේ දානවා, තව මොකක් හෝ කියලා රණ විරුවෙක් හිරේ දානවා. බන්ධනාගාර බස් එකයි, බන්ධනාගාරයයි, අධිකරණයයි, පොලිසියයි, FCID එකයි, CID එකයි නොතිබුණා නම් පසුගිය අවුරුදු තුනට තමුන්නාන්සේලා කරලා තිබෙන කොංගෙඩියක් නැහැ. මේ රටේ ජාතික මනස හඳුනන්නේ නැති පාලනයක් තමුන්නාන්සේලා අරගෙන ආවේ. තමුන්නාන්සේලාගේ අගමැතිවරයා මේ රටේ ජාතික මනස හඳුනන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ අගමැතිවරයා එංගලන්තය ගැන කථා කරන්නේ.

පසුගිය දවස්වල බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයෙන් ඉවත් වෙනවාද, නැද්ද කියන එක තීරණය කිරීම සඳහා එහි ජනමත විචාරණයක් තිබුණා. එම ජනමත විචාරණයේ ප්‍රතිඵල අනුව ඩේවිඩ් කැමරන් අගමැතිවරයා, "මේක ජනමතවිචාරණයක්, මගේ පට්ටම ගැන තීරණය කරන ඡන්දයක් නොවෙයි" කියලා තනතුරින් ඉවත්ව නොගිහින් හිටියේ නැහැ, තනතුරෙන් ඉල්ලා අස් වුණා. තමන් දරපු මතය ජනමත විචාරණයේදී ප්‍රතික්ෂේප වුණු නිසා ඔහු ආණ්ඩු බලය අතහැරියා. එංගලන්තය ගැන, වෙස්මිනිස්ටර් සම්ප්‍රදාය ගැන බොරුවට ඉංග්‍රීසියෙන් කථා කළාට වැඩක් නැහැ, ඒ සම්ප්‍රදායේ තිබෙන යහපත් දේ ආරක්ෂා කර ගන්නට බැඳෙන්නේ නැත්නම්.

තමුන්නාන්සේලා දන්නවා, 2015 ජනවාරි මාසයේ 08 වෙනිදා හිටපු අගමැතිවරයාව වෙනස් කළේ කොහොමද? 2015 ජනවාරි 08 ලැබුණු ජන වරම ජනාධිපතිවරණ ජන වරමක්. මහ මැතිවරණ ජන වරමක් නොවෙයි. ජනාධිපතිවරණ ජන වරම පාවිච්චි කළා, හිටපු දි.මු. ජයරත්න අගමැතිවරයා ඉවත් කරලා ඒ වන විට හතළිස් ගණනක සුළු පිරිසක් සිටි එක්සත් ජාතික පක්ෂය තමන්ගේ අගමැති කෙනෙක් ගෙනෙන්න. වෙනත් ජන වරමක් පාවිච්චි කළා, බල පෙරළියට. අද මේ පළාත් පාලන මැතිවරණයෙන් ජාතියක් විධියට තීන්දුව දීලා තිබෙනවා. ඒ තීන්දුව සැලකිල්ලට ගන්න තමුන්නාන්සේලාට ඥානයක් නැද්ද? දැන් මේ ආණ්ඩුව මළ කුණක් වෙලා ඉවරයි.

තමුන්නාන්සේලා මේක තව දුරටත් තියාගෙන ඉන්න ගියොත් තව අවුරුද්දක් විතර යන විට ඕජස් ගලන, සැරව ගලන, පිළිකුල් සහගත මළ කුණක් විධියට තමයි මේක ඉවත් කර දමන්න වෙන්නේ.

මේ ආණ්ඩුව තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් ඉන්නවා. එතුමන්ලා මේ ආණ්ඩුව ඇතුළේ ලැගලා පසුගිය අවුරුදු තුනේ ගත කළ ජීවිතයට අදාළ ප්‍රතිඵල එතුමන්ලාට ලැබිලා තිබෙනවා. බොහොම අමාරුවෙන් රාජ්‍ය බලය පාවිච්චි කරලා, දන්න කියන සෙල්ලම් ඔක්කොම දාලා, යූඑන්පී විරෝධයකුත් තමන්ට ආරෝපණය කරගෙන තමයි එතුමන්ලා කටයුතු කළේ. ජනාධිපතිවරයා කිව්වා නේ, පසුගිය අවුරුදු තුන තුළ යූඑන්පී එක මේ රටේ ආර්ථිකය කාබාසිනියා කළා කියලා. අපි නොවෙයි නේ කිව්වේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ කැබිනට් එකේ ප්‍රධානියා කිව්වේ, යූඑන්පී එක මේ රටේ ආර්ථිකය කාබාසිනියා කළා කියලා. ඒ විධියට යූඑන්පී විරෝධී කථා පවත්වමින්, ඒ ඔක්කොම කරලාත් ගන්න පුළුවන් වුණේ ලක්ෂ 14ක පමණ ඡන්ද ප්‍රමාණයක්. ඒ ඔක්කොම කරලාත් ගත්තේ ලක්ෂ 13කට මදක් වැඩි ඡන්ද ප්‍රමාණයක්. එතකොට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අයිතිවාසිකම් කියන්නට පුළුවන්ද? මම ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් නොවෙයි. නමුත් ඒ ප්‍රශ්නය අපි නියෝජනය කරන කඳවුරට අදාළ ප්‍රශ්නයක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පොළොන්නරුවත් පරාදයි. එක්සත් ජාතික පක්ෂය විපක්ෂයේ සිටිනකොට දිනපු ප්‍රදේශත් මේ පාර පරාදයි. එම නිසා මේ හැම දෙයකින්ම පෙන්වන්නේ මොකක්ද?

තමුන්නාන්සේලාගේ මරු ක්‍රමයනේ තිබෙන්නේ. පළමුවෙනියා වෙච්ච මිනිහාට වඩා ලොකුයි ලු දෙවෙනියායි, තුන්වෙනියායි, හතරවෙනියායි ගත්ත ඡන්ද ටික. උදාහරණයක් හැටියට මම ඉස්කොලේ පන්තියේ පළමුවෙනියා වෙනවා ලකුණු වැඩියෙන් අරගෙන. දෙවෙනියාට ලකුණු ගත්ත කෙනාගේ සහ තුන්වෙනියාට ලකුණු ගත්ත කෙනාගේ ලකුණු එකතු කරලා කියනවා, එයාට වඩා ලකුණු වැඩියි කියලා. මේ වාගේ ප්‍රාථමික තර්ක දාලා පරාජයේ හෙලුව වහ ගන්න හදන්න එපා. තමුන්නාන්සේලා දන්නවා පරාජයේ ඇත්ත හේතුව මොකක්ද කියලා. මේ ගෙනාවේ තිස්වෙනි පරාජය. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමනි, අග්‍රාමාත්‍යතුමනි, තමුන්නාන්සේලාට ඔය තනතුරුවල ඉන්න අයිතියක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අතේ තියාගෙන ඉන්න මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට දැන් කිසිම හේතුවක් නැහැ. පක්ෂයේ ඡන්ද ප්‍රමාණය ලක්ෂ 13ට බස්සපු නායකයෙකුට එම පක්ෂය අතේ තියාගෙන ඉන්න කිසිම හේතුවක් නැහැ. අග්‍රාමාත්‍යවරයා පිළිබඳව එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් - අපි දන්නවා, හිත යටින් නම් වෙනත් ප්‍රාර්ථනාවක් තිබෙන්නේ. එතුමා කොයි වෙලාවේ ඉවත් වෙලා යයිද කියලා තමයි තමුන්නාන්සේලා හිත හිතා ඉන්නේ. හැබැයි ඇතුළු වෙන කොටම කුට්ටියක් හම්බ වුණා, ඉන් පසුව හිත ලොක් වුණා. ලොකු ගාණක් හම්බ වුණා. බැඳුම්කර සල්ලි එහේ මෙහේ ගියා. ඡන්දයේ දීත් ගියා; ඡන්දයෙන් පස්සෙත් ගියා. අපේ දිලිප් වෙදආරච්චි රාජ්‍ය ඇමතිතුමා උඩු රැවුලත් පෙන්වාගෙන හීනි හිනාවක් දානවා. සමහර අයට pocket money ලොකු මිටියක් හම්බ වුණා. ඒ නිසා සල්ලිවලින් හිතේ තිබෙන ආවේගය යට වුණා. "ඉවසපාන් පපුව" කියලා යන්තම් සල්ලිත් එක්ක මේක බැලන්ස් කර ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ප්‍රශ්නයක් නැහැ තමුන්නාන්සේලාට හොඳ නම් අගමැතිවරයාව තියා ගන්න. ඒක අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි මේ ආණ්ඩුවට මෙහෙම යන්න කිසිම අයිතියක් නැහැ. ජනතාව මේ ආණ්ඩුව ප්‍රතික්ෂේප කරලා ඉවරයි. ජනතාව ප්‍රතික්ෂේප කළ ආණ්ඩුවකට, ජන බලයක් නැති ආණ්ඩුවකට, ජන වරමක් නැති ආණ්ඩුවකට මේ රට ගැන තීරණ ගන්නට අයිතියක් නැහැ. තමුන්නාන්සේලා ඉන්න හැම තත්පරයකම රුපියල කඩාගෙන වැටෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද රුපියල කඩාගෙන වැටෙනවා. දැන් ඇමෙරිකානු ඩොලරය රුපියල් 158යි. එය තවදුරටත් රුපියල් 180 දක්වා ඉහළ යනවා. කොටස් වෙළෙඳ පොළ කඩාගෙන වැටෙනවා. ආයෝජකයන් එන එක නතර වෙනවා. තමුන්නාන්සේලා ඩීසල්, පෙට්‍රල් මිල ඉහළ දමන්න යනවා. බදු ආදායම වැඩි කරගන්න කියලා බදු පෝරියල් එක පටවනවා. පාර්ලිමේන්තුවේ අනුමැතිය නැතිව දැන් ණය ගන්නත් අලුත් ක්‍රමයක් පාවිච්චි කරන්න බලනවා. අග්‍රාමාත්‍යවරයාට හිතෙන හිතෙන තැනින් ණය ගන්න පුළුවන් වන විධියේ පනතකුත් මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙනවා. මේ ඔක්කෝම කරලා ඉවර වුණාට පස්සේ රටක්

ඉතුරු වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා කාලා ඉවර කළාට පස්සේ මේ රට බේරාගන්න පුළුවන් තත්ත්වයකට එන්නේ නැහැ. ඒ නිසා අපි ඉතා ඕනෑකමින් කියනවා, පවු නොදී, තව දුරටත් වාචාලකම් දොඩවන්නේ නැතුව, දෙකයි තුනයි එකතු කළාම එකට වඩා ලොකුයි කියන මෝඩ, අමන, තර්ක දමන්නේ නැතිව, අඩු ගණනේ ඇඳිවත හෝ රැකගෙන ගෙදර යන්න ඕනෑය කියලා හිතනවා නම්, මේ රටේ මහජන මතය පිළිගෙන, මහජන මතයට ඇහුම් කන් දීලා, මහජන මතයට යටත් වෙලා තමුන්නාන්සේලාට බැහැලා යන්න පුළුවන්. එහෙම නැතුව තව දුරටත් ඉන්න හදනවා කියන්නේ,- [බාධා කිරීමක්] ඇයි, දත් දොස්තර මහත්තයෝ? ඇයි, නැව් මහත්තයෝ? අනේ! යනවා "නැවෝ" යන්න. නැව් හතයි. මේ කම්බ හොරු ටික "හොරු, හොරු" කියලා කෑ ගහනවා. රාජිත සේනාරත්න මහත්තයෝ! ඔය කම්බ හොරු ටික "හොරු, හොරු" කියලා කෑ ගහලා අවුරුදු තුනේ නාටකයක් කළා. දැන් ඒ නාටකය ඉවරයි. කම්බ හොරුන්ට මහ ජනයා තීන්දුව දුන්නා. මහ බැංකුව හොරා කාපු හොරුන්ට මහ ජනයා තීන්දුව දුන්නා. රට විකුණාගෙන කන එවුන්ට මහ ජනයා තීන්දුව දුන්නා. ඒ නිසා තවත් මෙතැන වාචාලකම් දොඩවන්න එපා. නැට්ටේ හිටං ගොම, නැට්ටේ හිටං ගොම. යන්න, යන තැනකට පාර කපාගන්න. දැන් යන තැනකට පාර කපාගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
දැන් යන තැනකට පාර කපාගන්න. දෙයියෝ බුදුන් අදහනවා නම්, අදහන්න පටන් ගන්න. ලජ්ජා නැද්ද? ලජ්ජා නැද්ද රාජිත මහත්තයෝ. දත් ගලවලා නැව් ගත්ත නැව්පතියා. මෙහෙම නැව්පතියෝ. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය වාචාලකම්වලට මේ රටේ ජනමතය යටත් කරන්න බැහැ. මේ මව් පොළොව තමුන්නාන්සේලාව ප්‍රතික්ෂේප කරලා ඉවරයි. තවත් රටට වද දෙන්න එපා. මේ රටට තවත් වද දෙන්න එපා. තවත් මේ රටේ ආර්ථිකය කන්න එපා. මේ රට තවත් විනාශ කරන්න එපා. ඒ නිසා මහජන මතයට ඇහුම් කන් දීලා කරුණාකරලා බැහැලා යන්න. පව් නොදී යන්න, පීචං නොවී යන්න, අකුළාගෙන යන්න. එහෙම නැත්නම් වෙන්නේ, කුදලලා යවන්නයි. එහෙම නැත්නම් වෙන්නේ, හැඳි ගෑවෙන විධියට යවන්නයි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න ඇමතිතුමා. [බාධා කිරීම්]

[අ.භා. 4.16]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය අද උදේ මහ ලොකුවට කිව්වා, දැන් ජාතික ආණ්ඩුව නැහැයි කියලා. දැන් ජාතික ආණ්ඩුව නැද්ද? "ලංකාදීප" පත්තරේ ලිපියක් තිබෙනවා. මේ අය ඒ පත්තර කැල්ලත් අරගෙන ඇවිල්ලා. මහින්ද අමරවීර මැතිතුමා විසින් කළ ප්‍රකාශයක් කියලා ලිපියක් "ලංකාදීප" පත්තරේ තිබෙනවා. මහින්ද අමරවීර මැතිතුමා දැන් නිවේදනයක් නිකුත් කරලා කියනවා, "ඒක අමූලික බොරුවක්" කියලා. "අමූලික බොරුවක්, ඒ විධියේ කිසිම ප්‍රකාශයක් මම කළේ නැහැ" කියලා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කෝ, ඒ ප්‍රකාශය?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මේ තිබෙන්නේ. මගේ ළඟ තිබෙනවා. මට ආපු "මැසේජ්" එකක තිබෙනවා. [බාධා කිරීමක්] ඔහොම ඉන්න, ඔහොම ඉන්න. "අලුත් අගමැතිවරයෙක් පත් කරන්න කියලා මම ලියුම් ලිව්වේ නැහැ. පත්තරේ තිබෙන කථාව බොරු. මහින්ද අමරවීර 'සියත' ට කියයි."

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
Point of Order එකක් නොවෙයි. මම මේක **සභාගත*** කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේක සභාගත කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් කිසි ලේඛනයක් ගැන කියනවා නම් කරුණාකර ඒක සභාගත කරන්න ඕනෑ. ෆෝන් එක දිහා බලාගෙන; චිත්‍රපටයක් දිහා බලාගෙන බොරු කියන්න එපා. මේ අප්පයි, පුතායි දෙන්නම ඔහොමයි. කට ඇරියොත් පච කෙළින්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා තාක්ෂණය දන්නේ නැහැ. නව තාක්ෂණය ගැන දන්නේ නැහැ. පරණ කොළ කෑලි ගැන විතරයි දන්නේ. මොකද, මෙතුමා GCE O/L විභාගය fail.

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ඒකයි වුණේ. GCE O/L විභාගය fail. පුළුවන් නම් තමුන්නාන්සේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතිකය පෙන්වන්න. මෙතුමා තිස්ස මහා විද්‍යාලයට ගියාට විභාගය pass වුණේ නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැබිනට් ප්‍රකාශක ගරු රාජිත සේනාරත්න මැතිසඳ කියනවා, මම GCE O/L විභාගය fail කියලා. එතුමා ඒක ඔප්පු කළොත් මම හෙට මේ පාර්ලිමේන්තු මන්ත්‍රීධුරයෙන් අයින් වෙනවා. පුළුවන් නම් ඔප්පු කරන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
A/L කළේ නැත්තේ ඇයි? [බාධා කිරීම්] A/L කළේ නැත්තේ ඇයි? [බාධා කිරීම්] O/L විෂයයන් 6ක් පාස්. O/L විෂයයන් 6ක් පාස් වුණාම ඕනෑ කෙනෙක් පාස්. විෂයයන් හයයි ඕනෑ.[බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
විෂයයන් හයයි ඕනෑ, O/L පාස් වෙන්න. [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, එකම කැරැල්ලට සහභාගිවෙලා, ඔබතුමන්ලා ඉගෙන ගන්නකොට, උපාධිධාරීන් වනකොට එතුමා කොහේද? එතුමා ඕනෑ නම් O/L විෂයයන් හයක් පාස් වෙන්න ඇති. A/L කරන්න බැරි වුණේ ඇයි? එතුමාට තාක්ෂණය තේරෙන්නේ නැහැ. මා එය **සභාගත*** කරනවා.

තව කාරණා තිබෙනවා. මෙන්න තිබෙනවා, "අද දෙරණ" ප්‍රවෘත්ති. මෙහි තිබෙනවා, ආණ්ඩු පක්ෂයේ ඉන්න සියලුම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු වෙනත් කිසිම පක්ෂයකට සහයෝගය දෙන්නේ නැහැයි කියලා. [බාධා කිරීම්] දැන් තමුන්නාන්සේලාගේ "ගේම" ඉවරයි නේ. [බාධා කිරීම්] "ගේම" ඉවරයි. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීම්] බේරුවල එක ඡන්දයයි. මතක තබා ගන්න. [බාධා කිරීම්] මේ බලන්න. මෙවරත් මහින්ද රාජපක්ෂට ඡන්ද කීයද තිබෙන්නේ? මේවා සභා. මේ සභාවලින් දිනපු ප්‍රතිඵලය විතරයි. නමුත් ප්‍රතිශතය ගත්තාම කීයද? පොහොට්ටුවට ලැබී තිබෙන ඡන්ද ප්‍රතිශතය සියයට 44.65යි. එතකොට මහින්ද රාජපක්ෂ ඉතුරු ටික ගන්නේ කොහෙන්ද? ලබන සැරේ ජනාධිපතිවරණ - [බාධා කිරීම්] කීයද? සියයට 44.65යි. ආසන කීයද? ආසන -කොට්ඨාස- 3,369යි. එක්සත් ජාතික පක්ෂයේත්, ජනාධිපතිතුමාගේ කණ්ඩායමේත් - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජනතා නිදහස් සන්ධානය - ඡන්ද සංඛ්‍යාව එකතු කළාම ප්‍රතිශතය සියයට 46.01යි. [බාධා කිරීම්] අපට ආසන - කොට්ඨාස - 3,417ක් තිබෙනවා.

2010 දී මහින්ද රාජපක්ෂ ගත්ත ඡන්ද සංඛ්‍යාව කීයද? 2010 දී සියයට 57.88ක ඡන්ද ප්‍රතිශතයක් ගත්තා. එදා ලබා ගත් සියයට 57.88 ප්‍රතිශතය 2015 වනකොට කීයක්ද අඩු වුණේ? ඒ ප්‍රමාණය සියයට 47.58 දක්වා අඩු වුණා. පරදින අවස්ථාවේ තිබුණේ, සියයට 47.58ක ප්‍රතිශතයක්. 2018 ලබා ගත් ඡන්ද ප්‍රතිශතය කීයද? සියයට 44.65යි. එන්න-එන්නම අඩු වෙනවා; එන්න-එන්නම වැටෙනවා. [බාධා කිරීම්] ජනාධිපතිවරණය දිනන හැටි කියන්න. [බාධා කිරීම්] මහින්ද රාජපක්ෂයට විරුද්ධ ඡන්ද සංඛ්‍යාව කීයද කියලා බලන්න. 2010 දී සියයට 40.15යි; 2015 දී සියයට 51.28යි; 2018 දී සියයට 55.35යි. [බාධා කිරීම්] මෙන්න තිබෙනවා, ප්‍රමාණය; මහින්ද විරෝධය වැඩිවෙනවා; මහින්ද ඡන්ද අඩුවෙනවා. [බාධා කිරීම්] ඔය "වූන්" එක දමාගෙන ඉන්නකෝ. [බාධා කිරීම්] තව "වූන්" එක දමාගෙන ඉන්නවා. මේ ගොල්ලෝ මහ ලොකුවට කියනවා, "දිනුවා"ය කියලා. දිනුවේ මොනවාද? ඡන්ද නොවෙයි, සභා දිනුවේ. ඡන්ද ප්‍රතිශතය ගත්තාම දිනලා නැහැ. මේ ආණ්ඩුවේ නරකම කාලය මෙයයි. [බාධා කිරීම්]

ඕනෑම ආණ්ඩුවක් පත්වෙලා අවුරුදු 3කට පස්සේ තමයි තමන්ගේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්නේ. 2005 දී මහින්ද රාජපක්ෂ මහත්මයා දිනුවාම එතුමා 2005 දී වැඩ පටන් ගත්තේ නැහැ නේ. ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ 2008, 2009 වනකොටයි. [බාධා කිරීම්] ඔය කෑ ගහන කට්ටිය එදා හතර මායිමක සිටියේ නැහැ. තමුන්නාන්සේලාත් සිටියේ නැහැ; දන්නේත් නැහැ. තමුන්නාන්සේලා ගම් සභාවේ සිටියේ. තමුන්නාන්සේලා ඒ කාලයේ සිටියේ ගම් සභාවේ; පළාත් සභාවේ. තමුන්නාන්සේලා කොහේද සිටියේ? ඒ ආණ්ඩුවේ හිටියේ අපි. මතක තියා ගන්න. එදා යුද්ධය පැවති වෙලාවේදී ඒ ආණ්ඩුව ආරක්ෂා කරන්න මෙතැන කථා කළේ තමුන්නාන්සේලා නොවෙයි, අපි. මතක තියා ගන්න. ඒ වෙලාවේ මේ අයියලා කොහේද හිටියේ? මේ අයියලා හිටියා, ගම් සභාවල; ප්‍රාදේශීය සභාවල. මේගොල්ලන් ඒ කාලයේ පාර්ලිමේන්තුවේ වැසිකිළියටවත් ගිහිල්ලා නැහැ. [සෝෂා කිරීම්] තව අවුරුදු දෙකක් ඉතුරුවෙලා තිබෙනවා. අපිට ජනතාව හොඳ පාඩමක් උගන්වලා තිබෙනවා. [සෝෂා කිරීම්] ඒ කාරණය අපි පිළිගන්නවා. නමුත් ආණ්ඩුව එහෙම පරාද කරලා නැහැ. [සෝෂා කිරීම්] පැහැදිලිව එය මතක තියා ගන්න. එදා -ජනවාරි මාසයේ 08 වැනිදා- අපේ බලවේගය ගත්ත ඡන්ද ප්‍රමාණයට වඩා වැඩි ඡන්ද ප්‍රමාණයක් අපි අද අරගෙන තිබෙනවා. අපි වැඩි ඡන්ද ප්‍රතිශතයක් අරගෙන තිබෙනවා. අපේ ඡන්ද ප්‍රතිශතය සියයට 51 ඉඳලා සියයට 55 පන්නලා තිබෙන බව මතක තියා ගන්න. මේ ප්‍රතිශතයත් එක්ක තමයි අපි ඊළඟට එන ජනාධිපතිවරණයට යන්නේ.

---

***ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.**
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය "වූන්" එක එතකොට කොහොමද වෙන්නේ කියලා අපි බලා ගනිමු. දැන් තමයි කට්ටියගේ නඩු හබ අවසන්වෙලා එළියට එන්නේ. මේගොල්ලන් රජ ගෙදර නොව හිර ගෙදර යන කාලය තමයි දැන් උදාවෙලා තිබෙන්නේ. ඊළඟ මැතිවරණය එනකොට දැන් මෙතැන ඉන්න කී දෙනෙකු සිටීවිද කියන එකයි අපිට ගණන් හදා ගන්න තිබෙන්නේ. අන්න එදාට "වූන්" එකද, "මෝඩ වූන්" එකද කියලා ඔබතුමන්ලාට තේරේවි. මේ කාරණා මතක තියා ගන්න. හරිද? [සෝෂා කිරීම්] ගිය සැරේ ආණ්ඩුවට එක්කහු වෙලා, ආණ්ඩුවේ බලය පාවිච්චි කළා. මේ රටේ ධනය විශාල වශයෙන් මංකොල්ල කාපු අය; මිනී මරපු අය. තාජුඩීන්ගේ මරණයට අදාළ වාර්තා ඔක්කොම දැන් සකස් කරලා අවසානයි. දැන් නඩු දාන්න තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාට විනාඩි පහක් මම ලබා දෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ලසන්ත වික්‍රමතුංගගේ මරණයට අදාළ නඩුව, එක්නැලිගොඩව අතුරුදහන් කරපු සිද්ධියට අදාළ නඩුව - ඔක්කොම- හෙට දවස වනකොට එනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවාත් එක්ක තමයි ඉදිරි මැතිවරණවල ඡන්ද ප්‍රතිඵල නිකුත් වෙන්නේ කියන කාරණය මතක තියා ගන්න. මම ආණ්ඩුවට කියන්නේ ඉක්මන් කරලා, වෙනදා වාගේ මන්දගාමී නැතිව මේ වැඩ කටයුතු කරන්න කියලායි. එතකොට අපිට බලා ගන්න පුළුවන්, ඡන්ද ප්‍රතිඵල කොහොමද කියලා. යාළු මිත්‍රකම් අනුව එක් කෙනෙකුවත් බේරා ගන්නේ නැතිව මේ වැඩ කටයුත්ත කරන්න.

තමුන්නාන්සේලා අද උදේ වරුවේ "වූන්" වුණා. අද උදේ වරුවේ වූන් වුණා, එක්සත් ජනතා නිදහස් සන්ධානය එළියට ඇවිල්ලා, ආණ්ඩුව කැඩිලා ඔක්කොම සිදු වෙයි කියලා. අනේ! දවල් බත් කාලා ඉවර වනකොට ඒ "වූන්" එක ඉවරයි. [සෝෂා කිරීම්] දැන් තව "වූන්" එකක් තිබෙනවා. හරිද? හොරකම් ගැන කථා කරනවා. තමන්ගේ ආයතනයේ සල්ලි අරගෙන ගිහිල්ලා, තමන්ගේ අක්කාගේ දුවගේ මඟුල් කාපු ඇමතිවරු ලංකා ඉතිහාසයේ කවදාවත් ඉඳලා තිබෙනවාද? [සෝෂා කිරීම්] මේ වාගේ හිඟන ඇමතිවරු ලංකා ඉතිහාසයේ ඉඳලා තිබෙනවාද? ආණ්ඩුවේ සල්ලිවලින් අක්කාගේ දුවගේ මඟුල් කෑව ඇමතිවරු ලංකා ඉතිහාසයේ ඉඳලා තිබෙනවාද? [සෝෂා කිරීම්] එදා සජිත් ප්‍රේමදාස ඇමතිතුමා එතුමාට අභියෝග කළා. බොරු නම් කියන්න. කට ඇරියාද? නැහැනේ. කට ඇරියේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නම කියන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එදා නම කියලා කිව්වේ. [සෝෂා කිරීම්] "විමල් වීරවංශ". මෙතුමාගේ නම කියලා කිව්වේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
හැන්සාඩ් වාර්තාවේ මේ පිළිබඳව සඳහන්ව තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සම්පූර්ණ අසත්‍යයක් රාජිත සේනාරත්න ඇමතිවරයා කරන්නේ. මම අභියෝග කරනවා, පුළුවන් නම් හෙට ඒක ඔප්පු කරලා පෙන්වන්න කියලා. එහෙම ඔප්පු කරලා පෙන්වුවොත් මම මන්ත්‍රී ධුරයෙන් ඉවත් වෙනවා. පුළුවන් නම් හෙට ඔප්පු කරලා පෙන්වන්න. තමුන්නාන්සේලා අවුරුදු තුනක් පව කෙළියා. [සෝෂා කිරීම්] පුළුවන් නම් හෙට ඔප්පු කරලා පෙන්වන්න; පුළුවන් නම් හෙට ඔප්පු කරලා පෙන්වන්න. [සෝෂා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාද වුණු දවසේ නිවාස හා ඉදිකිරීම් ඇමති සජිත් ප්‍රේමදාස මහත්මයා ඊට අදාළ සියලු ලිපි ලේඛන සභාගත කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මෙතුමාගේ හිටපු NHDA එකේ සභාපති ජයන්ත සමරවීර මෙතැන හිටියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, මොකක්ද රීති ප්‍රශ්නය?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් රකින්නයි තමුන්නාන්සේ ඉන්නේ. මෙතුමා ඉතාමත් අසත්‍ය චෝදනාවන් තමයි කරන්නේ. ඔය එකක් ඔප්පු

[ගරු විමල් වීරවංශ මහතා]

කරලා පෙන්වන්න. ඔය කියන ඥාතියෙකුගේ wedding එකකට සල්ලි වියදම් කළා කියලා හෙට ඔප්පු කරලා පෙන්වන්න. හෙට ඔප්පු කරලා පෙන්වන්න. හෙට ඔප්පු කරලා පෙන්වන්න. [බාධා කිරීමක්] හෙට ඔප්පු කරලා පෙන්වන්න. [බාධා කිරීමක්]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හැන්සාඩ් වැඩක් නැහැ. ඔප්පු කරලා පෙන්වන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, හෙට ඔප්පු කරන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
සජිත් ප්‍රේමදාස මැතිතුමා ඒක කියනකොට NHDA එකේ හිටපු සභාපති ජයන්ත සමරවීර කට පියාගෙන හිටියා. මෙතුමා ලිපි ලේඛන ඉදිරිපත් කරනකොට ජයන්ත සමරවීර කට පියාගෙන මෙතැන හිටියා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔප්පු කරලා පෙන්වන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එදා ඔප්පු කරලා පෙන්නුවා. NHDA එකේ හිටපු සභාපති අතන හිටියා. නැහැයි කියලා කිව්වේ නැහැ. NHDA එකේ හිටපු සභාපති මෙතැන හිටියා. එතුමා කියනකොට තමුන්නාන්සේ එදා පැනලා ගිහිල්ලා. ජයන්ත සමරවීර හිටපු සභාපති කට පියාගෙන හිටියා. මෙතුමා ඉදිරිපත් කළා, ලේඛනයෙන් ලේඛනයට. සල්ලි කීයද? විසිතුන් ලක්ෂ ගණනක්. මට තවම මතකයි. මුදල් අරගෙන මඟුල් කෑවා. අක්කාගේ දුවගේ මඟුල කෑවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔප්පු කරන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔප්පු කළා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔප්පු කරන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔප්පු කළා. ඒක හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. හැන්සාඩ් වාර්තාව කියවන්න.[ඝෝෂා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයේ හැන්සාඩ් වාර්තාව අරගෙන කියවන්න. ඒකට NHDA එකේ හිටපු සභාපති වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත සමරවීර මහත්මයා උත්තර දුන්නාද කියලා හැන්සාඩ් වාර්තාව අරගෙන බලාගන්න. මෙතුමාට වඩා එතුමා දන්නවා. මෙන්න මේ වාගේ අයියලා තමයි අද ඇවිල්ලා ශෝභන දාන්නේ. මේ වාගේ හිඟන වැඩ කරපු ඇමතිලා තමයි අද ඇවිල්ලා ආණ්ඩු පෙරළන්න හදන්නේ. මේ මොකටද? තමන්ගේ නඩු ටික බේරා ගන්න. ඉක්මනට ආණ්ඩුව අරගෙන- [ඝෝෂා කිරීම්] පසු පෙළ මන්ත්‍රීවරු කෑ ගහන්න එපා. තමුන්නාන්සේලාට නොවෙයි නඩු තිබෙන්නේ, මේ මිනිස්සුන්ට. තමුන්නාන්සේලාගේ ඒවා පස්සේ කියන්නම්. මේ ගොල්ලන් මේවා කාල ඉවර වෙලා දැන් ඒවායේ නඩු එනවා. ඊට ඉස්සෙල්ලා කොහොම හරි හදන්නේ දේශප්‍රේමයේ නාමයෙන් ආණ්ඩුව වට්ටගන්න.

හැම හොරාම අන්තිමට එල්ලෙන සටන් පාඨය තමයි දේශප්‍රේමය. ඒක මතක තියා ගන්න. ඒක නිසා තමයි අයින්ස්ටයින් කිව්වේ, "දේශප්‍රේමය වනාහි රෝගයකි. ඒක නිකම් රෝගයක් නොවෙයි. මුළු ඇඟ පුරා දුවන රෝගයක්. ඒවායේ බිබිලි දානවා මුළු ඇඟ පුරාම." කියලා. අයින්ස්ටයින් කිව්වේ මෙන්න මේ අයියලාට. ඒක මතක තියා ගන්න. ඔය හැම හොරාම අන්තිමට එල්ලෙන්නේ දේශප්‍රේමයේ. ඒක මතක තියා ගන්න. මම වමේ මිනිස්සු දැකලා තිබෙනවා. වාමාංශික මිනිසුන්ගේ වැරැදිත් දැකලා තිබෙනවා. වාමාංශික ව්‍යාපාරයේ ඉන්න මේ වාගේ හොරු මම දැකලා නැහැ. මේ වාගේ හොරා කාපු එවුන් නොවෙයි එදා වමේ ව්‍යාපාරයේ හිටියේ. මම ඇන්.එම්. පෙරේරා එක්ක හිටියා. කොල්වින් ආර්. ද සිල්වා එක්ක හිටියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු කථානායකතුමා දැන් මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. LUCKY JAYAWARDANA left the Chair, and THE HON. SPEAKER took the Chair.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
වමේ ව්‍යාපාරය ගෙනාපු පිලිප් ගුණවර්ධන මැතිතුමා මෙතැන නැති වුණත් එතුමාගේ පුතාලා මෙතැන ඉන්නවා. පිලිප්ලාගේ ඉඳලා ඒ වාමාංශික ව්‍යාපාරයේ එක ගුණයක් තිබුණා. ඒ මිනිසුන්ට තිබුණේ කැපවීම සහ අවංකභාවයයි. අනෙක් ඒවා ගැන අපට ප්‍රශ්න තිබුණේ නැහැ. ප්‍රතිපත්ති ප්‍රශ්න විතරයි අපට තිබුණේ. නමුත් මෙතැන තිබෙන්නේ ඒවා නොවෙයි. හොරාකෑම. මෙන්න මේකයි මෙතැන තිබෙන වෙනස. මේ වාගේ වමේ නායකයෝ ලංකාවේ කොහේවත් හිටියේ නැහැ. ඒක මතක තියා ගන්න. මෙතුමා කවදා හෝ දවසක මහින්ද රාජපක්ෂත් ඉවර කරනවා. ඒකත් මතක තියා ගන්න. මහින්ද රාජපක්ෂවත් ඉවර කරනවා. හරිද? ඒකයි මම තමුන්නාන්සේලාට කියන්නේ.

මෙතැන කිසිම ප්‍රශ්නයක් නැහැ. ගමේ ඡන්දයක් පැරදුණා කියලා මේ ගොල්ලන් කියනවා, "ආණ්ඩුවට අස් වෙන්න." කියලා. මේක පුදුම කථාවක් නේ. ගමේ ඡන්දයට ආණ්ඩුව අස්වෙන්නේ කොහේද? ලෝකයේ කොයි රටේද ආණ්ඩුවක් වෙනස් වෙන්නේ ගමේ ඡන්දයට? ගමේ ඡන්දයට ආණ්ඩුව අස්වෙන්න කියලා කියන මේ වාගේ මෝඩ, තකතීරු අයියලා ඉන්න එකම රට ලංකාව තමයි. මේ වාගේ මෝඩ, තකතීරුවෝ පාර්ලිමේන්තුවට යවලා තිබෙන එකම රට ලංකාව. වෙන කිසිම රටක් නැහැ. ඉන්දියාවේ මෝදි තමන්ගේම ප්‍රාන්තය වුණු ගුජරාටය නුලෙනුයි දිනුවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
තව විනාඩි පහක කාලයක් ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. [බාධා කිරීමක්]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
බලමු කාගේ කටේද දමන්නේ කියලා. තමුසෙලාගේ කටේ- [බාධා කිරීම්] තමුන්නාන්සේලා ජංගිය ගහගෙන යනකොට අපි බලමු කෝ, මොකද වෙන්නේ කියලා. [බාධා කිරීම්] තමුන්නාන්සේත් පණ්ඩිතකම් කථා කර කර ඉන්න කෝ. තමුන්නාන්සේට මොකද වෙන්නේ කියලා- [බාධා කිරීම්]

ගරු කථානායකතුමනි, ජනවාරි 08 වැනිදා අපි මේ රටේ යහ පාලනය ඇති කරන්නට බෙල්ල දීලා කැප වෙලා ආවා. අපි ඒ ගමන නවත්වන්නේ නැහැ. අපේ සියලු මිත්‍ර බලවේගත් එක්ක ඇවිල්ලා, අපේ වැරදි අඩු පාඩු හදාගෙන අපි ඒ ගමන යනවා. ඒ ගමන අපි ජයග්‍රහණය කර ගන්නවා. ඒ ගමන ජයග්‍රහණය කරලයි අපි එන මහ මැතිවරණවලට, ජනාධිපතිවරණවලට මුහුණ දෙන්නේ. ඒක මතක තියා ගන්න. [බාධා කිරීම්] කලබල වෙන්න එපා. අපට අවුරුදු දෙකක් කාලය තිබෙනවා. අපි මේ අවුරුද්ද මේ සියලු ප්‍රතිඵල අනෙක් පැත්තට හරවන අවුරුද්ද බව මතක තියා ගන්න. අපට ඒකට ආත්ම ශක්තිය තිබෙනවා. ඒ ආත්ම ශක්තිය යටතේ, මේ නායකයින් දෙදෙනා යටතේ අපි ඒ ගමන යනවා. මේ රටේ ජනතාවට අපි පොරොන්දු වෙනවා, ජනවාරි 08 වැනිදා අපට ලබා දුන්නු ඒ ජනවරමත් එක්ක, අපි ජනතාවට ලබා දුන් පොරොන්දු ඒකාන්ත වශයෙන්ම මේ රටේ ක්‍රියාත්මක කරනවායි කියන එක. බොහොම ස්තුතියි.[බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මා පළමුවෙන්ම ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානයට යොමු කරන්න කැමැතියි, මේ විවාදය ගරුත්වයෙන් වාගේම විනයානුකූලව කරගෙන යන්නය කියන එක. [බාධා කිරීම්] අවස්ථාව දෙන්නම්. පොඩ්ඩක් ඉන්න. මේක පහදා දීලා අවස්ථාව දෙන්නම්. චර්යා ධර්ම පද්ධතියක් ගැන සාකච්ඡා කරපු අද දවසේ ආදර්ශවත්ව හැසිරෙමු.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්වරයා වන මහින්ද අමරවීර මැතිතුමා 2018.02.13වැනිදා නිකුත් කරපු නිවේදනය.

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, ජනාධිපති ලේකම් කාර්යාලය, කොළඹ.

අතිගරු ජනාධිපතිතුමනි,

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍ය ධුරය සහ පාලන බලය ලබා ගැනීම.

පසුගිය මහ මැතිවරණයෙන් පසුව එක්සත් ජාතික පක්ෂය හා එක්සත් ජනතා නිදහස් සන්ධානය සම්මුතිවාදී රජයකට එකඟ වූයේ වර්ෂ දෙකක් සඳහාය."

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
It is not a point of Order. ඔය කරුණ ගැන දැනට - [බාධා කිරීම්]

Hon. Leader of the Opposition, please.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මේකේ අවසානයේ කියනවා, "එම නිසා එක්සත් ජාතික පක්ෂය ලද ඡන්ද සංඛ්‍යාව මත ගරු අග්‍රාමාත්‍යතුමා එම තනතුරේ තව දුරටත්..."

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
It is not a point of Order. මේ කරුණ ගැන නියෝජ්‍ය කථානායක, ගරු තිලංග සුමතිපාල මැතිතුමා පහදා දෙනවා ඇති. He is going to explain. He is on the way. මේ කරුණ ගැන උදේ කථා කළා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මට මේක කියලා ඉවර කරන්න දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
උදේ මේ ගැන කථා කළා. ඔය කරුණ ගැන ගරු නියෝජ්‍ය කථානායකතුමා පහදා දෙනවා. It is not a point of Order.

Hon. Leader of the Opposition, you may speak now.

[4.36p.m.]

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)
Thank you, Mr. Speaker.

I thought I would say a few words on this debate. The people have delivered a verdict and, in a democracy, the people's verdict must be respected. The Hon. Member who moved the Motion and the Hon. Member who seconded the Motion have referred to various matters. I think, Sir, I will primarily do a brief analysis of the result of the Local Authorities Election held on 10th of February.

The Sri Lanka Podujana Peramuna polled 44.69 per cent of the votes cast at that election. The United National Party polled 32.61 per cent. The United People's Freedom Alliance polled 8.90 per cent. The Sri Lanka Freedom Party polled 4.48 per cent. If one was to add the percentage of the votes polled by the United National Party, the United People's Freedom Alliance and the Sri Lanka Freedom Party, those three parties put together polled 45.99 per cent, almost 46 per cent. The Sri Lanka Podujana Peramuna polled 44.69 per cent, that is almost 2 per cent less than the other three parties put together.

The People's Liberation Front - JVP - polled 6.26 per cent and the Illankai Tamil Arasu Kachchi polled 3.06 per cent. If one was to add the percentage of votes polled by those two parties together with the percentage of votes polled by the United National Party, the United People's Freedom Alliance and the Sri Lanka Freedom Party, the total would be 55.31 per cent. So, in other words, parties opposed to the Sri Lanka Podujana Peramuna have polled 55.31 per cent and the Sri Lanka Podujana Peramuna has polled only 44.69 per cent. This is indisputable. [*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please, do not disturb him. Everybody has the right to speak.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)
Former President Mahinda Rajapaksa at the Presidential Election held in 2015 polled 47.58 per cent. The votes he polled at the Presidential Election in January, 2015 were more than the votes he polled now. There have been three elections in recent times; the Presidential Election in 2015, the Parliamentary Election in 2015 and the Local Authorities Election held this month. In none of these elections has former President Mahinda Rajapaksa been able to obtain more than 50 per cent.

His vote has always been below 50 per cent at the Presidential Election, at the Parliamentary Election and at the Local Authority Election. So, there is nothing to get excited about: elections are held; parties win; parties lose. The Local Authority Elections have been held and you have won. One does not dispute that fact, but the fact of the matter is that you have polled only 44.69 per cent as opposed to 55.31 per cent cast against you. So, what is there to get excited about? Nothing at all. Parliament is not constituted on the basis of votes cast at the Local Authority Elections. Parliament is constituted, -the President is elected, on the basis of votes cast at the Presidential Election - at a Parliamentary Election held for that purpose in keeping with the Constitution and the laws of this country. The Constitution and the laws of this country cannot be subverted by your claiming benefits under the Local Authority Elections to your advantage in the way you please.

I want to make a few comments, Mr. Speaker, if you permit me in regard to the nature of the propaganda that was carried on at this election. I do not want to do something controversial. But, I must refer to the fact that I was quite alarmed when, quite early in the campaign, former President Mahinda Rajapaksa, in the course of an election rally, said that sometimes this election would result in Tamil Eelam blooming after the election is over. The reason he gave was that there was a new Constitution being framed which might result in that happening. Sir, ever since the Thirteenth Amendment was enacted in 1987 - 1988, there had been continued efforts on the part of different Presidents and different Governments to improve the Thirteenth Amendment in such a manner as to bring about a political resolution acceptable to all the citizens in this country. During President Premadasa's time, there was the Mangala Moonesinghe Parliamentary Select Committee Proposals which made recommendations which went far beyond the Thirteenth Amendment. During President Chandrika Bandaranaike Kumaratunga's time, there were the 2000 Constitutional Proposals brought to Parliament by no less a person than Prof. G.L. Peiris which went far beyond the Thirteenth Amendment and contained various new features. That proposed Constitution had been brought as a Bill to Parliament.

Thereafter President Mahinda Rajapaksa assumed office. If he will recall his speech that he made at the initial meeting, the inaugural meeting of the All Party Representatives Committee (APRC) and the Experts Committee, he talked of maximum possible devolution. He appointed an Experts Committee that came up with the reports. There was the Prof. Tissa Vitharana Committee which came up with their own report which took the Constitutional proposals much beyond the Thirteenth Amendment and that was the position. After the assumption of office of this Parliament, this

Parliament was evolved into a Constitutional Assembly to frame a new Constitution. As per a Resolution adopted unanimously in this Parliament with all the Joint Opposition Members being supportive of that Resolution, - none of you opposed it - there was a Steering Committee appointed. You participated in the proceedings of the Steering Committee. None of you opposed it. None of you talked of Eelam in this Parliament. None of you talked of Eelam at the Steering Committee. You accepted it; you went along with the process. Suddenly, Mr. Mahinda Rajapaksa says, "There Eelam is likely to bloom after the Local Authority Elections if the people are not careful."

I have information, Sir, that this message was propagated amongst the innocent Sinhala people in this country. They were told, "This is a referendum for an Eelam. If you vote for the Government or if you vote for the UNP, it will result in an Eelam being created. So, do not vote for them. Vote for the 'Lotus Bud' ". I am told, Sir, that particularly this propaganda was very virulently carried out in all the temples, in all the villages in the Sinhala South. This, I think, is unfortunate, Sir. I want to put on record that my Party at this Election, in our manifesto, talked of a political solution within the framework of an undivided, indivisible, single country.

There was no campaign carried on, anywhere, in the North and East which talked of division of the country. We only talked of a solution that is acceptable to our people, that is reasonable, with substantial power-sharing within the framework of a united, undivided, indivisible single country. That was the propaganda we carried out in all our areas and when we did that, how dare President Rajapaksa say that Eelam could bloom after the election. This is not merely deception of the people in the South, innocent Sinhala people in the South, but it is the deception of everyone including himself.

I would like to put this on record because I want everybody in this country to know that it was a malicious, vicious, fallacious, false propaganda on the part of President Mahinda Rajapaksa and the Sri Lanka Podujana Peramuna and if you proceed with this agenda, I want to tell you, Eelam will bloom, not on account of us, but on account of your "Lotus Bud". Your "Lotus Bud" will bloom into an Eelam. That is what will happen. Therefore, please resist your temptation to achieve cheap political gain by carrying on such false propaganda.

Thank you, Sir.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු තිලංග සුමතිපාල මැතිතුමා. ඔබතුමාගේ පැහැදිලි කිරීම කරන්න.

**ගරු තිලංග සුමතිපාල මහතා (නියෝජ්‍ය කථානායකතුමා)**
(மாண்புமிகு திலங்க சுமதிபால - பிரதிச் சபாநாயகர்)
(The Hon. Thilanga Sumathipala -Deputy Speaker)
ගරු කථානායකතුමනි, අද උදෑසන මම පාර්ලිමේන්තුවේ නොසිටි අවස්ථාවේ මාගේ නම සඳහන් කර තිබුණු නිසායි මේ පැහැදිලි කිරීම සිදුකරන්නේ.

ඊයේ රාත්‍රියේ නිකුත් කරන ලද නිවේදනයක් සම්බන්ධයෙන් ජනමාධ්‍යය මගෙන් ඇසුවා. ඒ ප්‍රකාශනය සත්‍යයක්. ජාතික රජයේ හවුල්කාර පක්ෂයක් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය ජාතික රජයක් සෑදීමට සහාය වුණා. එයින් ඉවත් වෙන්න ජනාධිපතිතුමාගෙන් අපි අවසරයක් පැතුවා. අපේ පක්ෂයේ සභාපති හැටියට එතුමාගෙන් අපි එවැනි අවසරයක් ඉල්ලුවේ, පක්ෂයක් හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයත් දේශපාලන වශයෙන් දරන මත අනුවයි. ජනාධිපතිතුමා අපට කියා සිටියේ, මෙම පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් 03 වැනි දින ප්‍රකාශ කළ ජාතික රජයෙන්, එක්සත් ජනතා නිදහස් සන්ධානය ඉවත් වුණොත් ඒත් සමඟ මේ රජයේ ස්ථාවරභාවයටත්, රටේ ස්ථාවරභාවයටත් යම් කිසි විධියේ බලපෑමක් ඇති විය හැකි බවත්, එම නිසා එයට නීතිමය උපදෙස් ලබා ගත යුතු බවයි. ඒ නිසා එතුමා නීතිපතිතුමා එක්ක සාකච්ඡා කරලා, එවැනි අවස්ථාවක් ඇති වුණොත් ක්‍රියාත්මක කළ යුතු ආකාරය ගැන සඳහනක් කරන ලෙස ඉල්ලා සිටියා. ඒ වෙලාවේ නීතිපතිතුමාගේ උපදෙස වූයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන ප්‍රතිපාදන මත මෙවැනි අවස්ථාවක් ගැන පැහැදිලි කිරීමක් කිරීමට අපහසු බවත්; ජාතික රජයක් පවත්වලා, එය ජාතික රජයක් නොවන අවස්ථාවකට පැමිණියොත් ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් නීතිපතිතුමාට කළ නොහැකි බවත් ය. ඒ නිසා නීතිපතිතුමා ගරු ජනාධිපතිතුමාට ප්‍රකාශ කර තිබෙනවා, "මේ පිළිබඳව සුප්‍රිම් උසාවියෙන් මත විමසුමක් ලබා ගැනීමේ හැකියාව තිබෙන්නේ අතිගරු ජනාධිපතිතුමාට පමණයි; ඒ අනුව මේ ගැන ජනාධිපතිතුමා සුප්‍රිම් උසාවිය දැනුවත් කරන්න" කියා. එයයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයේත් ඊයේ රාත්‍රියේ පැවැති තත්ත්වය වුණේ.

රජය පැත්තේ සිටින එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන් අද දහවල් කැඳවලා මේ පිළිබඳව නැවතත් සාකච්ඡා කළා. ඒ අනුව, සුප්‍රිම් උසාවියෙන් මේ ගැන ජනාධිපතිතුමා දැනුවත් කරන තෙක් රටේත්, රජයේත් ස්ථාවරභාවය පවත්වා ගෙන යන්නත්, දින කිහිපයක් යනතුරු රජයේ වර්තමාන තත්ත්වය පවත්වා ගෙන යන්නත් ජනාධිපතිතුමා ඉල්ලීමක් කර තිබුණා.

ගරු කථානායකතුමනි, ඒ අනුව ඊයේ රාත්‍රියේ කළ ප්‍රකාශයේ සත්‍යතාවත්, අද වන කොට ඒ සාකච්ඡාව ඉදිරියට ගිය බවත්, මගේ නමින් නිකුත් කළ SMS පණිවුඩයත් මම සනාථ කරනවා. ඒ වාගේම, අද සාකච්ඡාවෙන් පසු එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැති ඇමතිවරුන් කිසිවෙක් පාර්ලිමේන්තුව නියෝජනය කළේ නැහැ. ඊකට හේතුව වුණේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාර්ලිමේන්තුවේ රජයේ පාර්ශ්වයත් එක්ක ඉන්න සියලුම මන්ත්‍රීවරුන්ට එක කණ්ඩායමක් හැටියට කටයුතු කරමින් ඉදිරියට යන ලෙසට උපදෙස් ලබා දීමයි. මේ ගැන මට කියන්න තිබෙන්නේ එපමණයි.

ගරු කථානායකතුමනි, ඔබතුමා පසුගිය සතිය පුරාම රටේ දේශපාලනයේත්, ඒ වාගේම පාර්ලිමේන්තු කටයුතුවලත් ස්ථාවරභාවය පවත්වා ගෙන යාමට දරපු උත්සාහය ගැන මම දන්නවා. ඒ නිසා මේ ගැන මීට වඩා සඳහන් කරන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මැතිතුමා. ඔබතුමාට විනාඩි හතක් තිබෙනවා.

[අ.භා. 4.52]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. මැතිවරණය ගැන වචන කිහිපයක් කථා කරන්නට ලැබීම ගැන සතුටු වනවා.

අපි කවුරුත් දන්නවා, මේ මැතිවරණය එකවර මුළු රටේම පැවැත්වුණු පළාත් පාලන මැතිවරණයක් බව. සමහර දේශපාලන පක්ෂ විසින් මෙය ජනමත විචාරණයක් බවට එහෙමත් නැත්නම් ආණ්ඩුවට විරෝධය පාන මැතිවරණයක් බවට පත් කර ගත්තා. මෙය පළාත් පාලන මැතිවරණයක් නම් මේ පළාත් පාලන මැතිවරණයේ පරාජය භාර ගන්න අපි සූදානම්. බහුතරයක් පළාත් පාලන ආයතන පොහොට්ටුව ලකුණ යටතේ ජයග්‍රහණය කර තිබෙනවා. හැබැයි, මේක ජනමත විචාරණයක් නම් ජනමත විචාරණයක ජයග්‍රහණය සඳහා සියයට 50ක් ඉක්මවූ ඡන්ද ප්‍රතිඵලයක් අවශ්‍යයි කියන එක හොඳට මතක තියා ගන්න. එහෙම නම් මේක ජනමත විචාරණයක් කියලා කියන අයට මා කියන්න කැමැතියි, ඒ අයට අත් වෙලා තිබෙන්නේ පරාජයක් බව. මොකද, සියයට හතළිස් ගණනක් අරගෙන ජනමත විචාරණයක් ජයග්‍රහණය කරන්න බැහැ. අපි පළාත් පාලන මැතිවරණයේ පරාජය භාර ගන්නවා. මේක ජනමත විචාරණයක් විධියට සලකා කටයුතු කරපු අයට අපි කියනවා, ජනමත විචාරණයේ පරාජය භාර ගන්නය කියන කාරණය. මේකයි ඇත්ත.

මේ පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ මේ රටේ ආණ්ඩුව පෙරළන්න සමහරුන් සූදානම් වෙනවා. මේකේ හොඳම විහිළුව තමයි ඊයේ පෙරේදා ජනාධිපතිතුමා කට්ටියට "ඉජු, ඉජු" කියලා "ආණ්ඩුව හදන්න එන්න" කිව්වා. කට්ටිය නැට්ට වනාගෙන ආවා, ඉක්මනට ආණ්ඩුව හදා ගන්න. මොකද, මේගොල්ලන්ට ඕනෑකම තිබෙන්නේ ආණ්ඩුවක් හදලා තමන්ගේ files ටික අයින් කර ගන්නයි. හැබැයි, ඒ නැට්ට වනාගෙන ආපු අයට අද නැට්ට පස්ස පැත්තේ ගහ ගන්න වෙලා තිබෙනවා. ජනාධිපතිතුමා මේගොල්ලන්ව හොඳට කඩේ ඇරියා. ජනාධිපතිතුමාත් බැලුවා මේගොල්ලන් මොනවාටද එන්නේ කියලා. අනේ! කට්ටියක් බොහොම උනන්දුවෙන් හිටියා ආණ්ඩුවක් හදන්න. අද මේගොල්ලන් හත් පොළේ ගාගෙන ඉන්නවා. ඇමතිකම් ගන්න බලාගෙන හිටපු අයට ආණ්ඩුත් නැහැ, මොනවත් නැහැ. සමහරු නම් කිව්වා, ඇමතිකම් ගන්නේ නැහැ, විපක්ෂයේ ඉඳගෙන ස්වාධීනව ආණ්ඩුවට උදව් කරනවායි කියලා. ඒ කෙසේ වෙතත් "ජනාධිපතිතුමා දුන්නු ලණුව නම් කෑවා" කියන කථාව අපට පොහොට්ටු පක්ෂයේ අයට කියන්න වෙනවා.

මේ ගොල්ලන්ගේ ඉලක්කය මොකක්ද කියලා අපට පැහැදිලියි. දේශපාලනිකව නම් මේ ගොල්ලන්ට ආණ්ඩුවට එන්න අවශ්‍යතාවක් නැහැ. මේක දේශපාලනය ගැන දන්නා ඕනෑම කෙනෙකුට තේරෙනවා. මොකද, තව අවුරුදු එකහමාරකින්, දෙකකින් ජනාධිපතිවරණය එනවා. එහෙම නම් මේ පළාත් පාලන ආයතන ජයග්‍රහණයත් එක්ක ඒ ගොල්ලන් දේශපාලනිකව ඉස්සරහට යනවා මිසක්, ආණ්ඩුවකට එකතු වෙන්න වුවමනාවක් නැහැ. හැබැයි, අපට පැහැදිලිවම පේනවා මේ ගොල්ලන්ට ආණ්ඩුවකට එකතුවීමේ අවශ්‍යතාව තිබෙන්නේ දේශපාලනිකව නොවෙයි කියලා. තමන් වටා විශාල නඩු ගොනු ප්‍රමාණයක් තිබෙනවා; ගොනු වෙච්ච වැරැදි තිබෙනවා; ක්‍රියාත්මක වෙන නඩු තිබෙනවා. ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා එක්ක එකතු වෙලා ආණ්ඩුවක් හදලා මේවා ටික හංගා ගන්න මේ මැතිවරණ ප්‍රතිඵලය උපායක් විධියට භාවිතා කරන්න මේ අය උත්සාහ කළා. මේකයි ඇත්ත. මේකයි ජනතාව තේරුම් ගන්න ඕනෑ. දැන් මීට ඉස්සෙල්ලා කථා කරපු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා, "මට විරුද්ධව කිසිම චෝදනාවක් නැහැ; පුළුවන් නම් ඔප්පු කරන්න." කියලා. ගරු කථානායකතුමනි, බරපතළ වංචා, දූෂණ පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව දැන් මා ළඟ තිබෙනවා. ඇහෙන පෙනෙන මානයේ ඉන්නවා නම් විමල් වීරවංශ මහත්මයාට මේ සභාවට එන්න කියලා මම කියනවා. මෙන්න තිබෙනවා බඩු. එතුමා දැන් රාජිත සේනාරත්න ඇමතිතුමාට කිව්වා, "පුළුවන් නම් ඔප්පු කරන්න." කියලා. ඔප්පු කරන්න මෙන්න මා ළඟ සාක්ෂි තිබෙනවා. ගරු කථානායකතුමනි, බරපතළ වංචා, දූෂණ පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවේ මෙසේ සඳහන් වෙනවා:

> "ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ තිබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු කඩසාප්පු සහ මහල් නිවාස 2012 දේපළ කළමනාකරණ චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව ලබාදීම සහ එකී අමාත්‍යාංශය යටතේ තිබූ ආයතනවල සේවය කරන ලද නිලධාරින් වෙත නීත්‍යානුකූල ක්‍රමවේදයෙන් බැහැරව පොලිස් නිලධාරින්ගේ ආරක්ෂාව ලබාදීම සම්බන්ධ පෙත්සම-"

ගරු කථානායකතුමනි, මේකේ වගඋත්තරකරුවන් විධියට අංක එකට ඉන්නේ හිටපු අමාත්‍ය විමල් වීරවංශ මැතිතුමායි. විමල් වීරවංශ මහත්මයාට විරුද්ධව අනාවරණය වූ වැරැද්ද මෙන්න මෙසේ සඳහන්ව තිබෙනවා:

> "2010 මැයි මස සිට 2015.01.09 දින දක්වා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ විෂය භාර අමාත්‍යවරයා ලෙස සිටිමින් අමාත්‍යාංශය යටතේ තිබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු කඩසාප්පු වන මාලිගාවත්ත නිවාස යෝජනා ක්‍රමයේ E1/G1 - අනූෂා නිරෝෂනී නානායක්කාර, දෙහිවල මහල් නිවාස යෝජනා ක්‍රමයේ C2 - හේවාවසම් මදුරාච්චි පද්මිණී, C3 - ඊශ්රාවරී ගුණවතී; C4 - වාදාරච්චිගේ ලලිත් පුෂ්පකුමාර, ඩයස් පෙදෙස, F/G/13 - ලියනආරච්චි ඉන්ද්‍රානි,......."

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමාට තවත් විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මේ කඩසාප්පු අවභාවිත කිරීම නිසා රුපියල් එක්කෝටි තිස්හයලක්ෂ අසූපන්දහසක අලාභයක් රජයට සිදුව තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ වාර්තාවේ එක තැනෙක තිබෙනවා, "ලක්ෂ 70ක් වටිනා කඩ සාප්පුවක් ලක්ෂ 5කට ආසන්න මුදලකට දීලා තිබෙනවා." කියලා. මේකට හේතුව විධියට දක්වා තිබෙන්නේ, "වඳ කළ නොහැකි කෘමීන් විශේෂයක් ඉන්න නිසා අඩුවට දුන්නා." කියලායි. වඳ කළ නොහැකි කෘමීන් විශේෂයක් ඉන්නවා කියලා ලක්ෂ 70ක කඩේ ලක්ෂ 5කට දීලා තිබෙනවා. කෘමියෙක් ඉඳලා ලක්ෂ 5කට දුන්නා නම්, කැරපොත්තෙක්, මීයෙක් හිටියා නම් මේ කඩසාප්පු ලක්ෂයකට, දෙකකට ගන්න තිබුණා. ඒ වාගේ කම්බ හොරු තමයි මේ ජයග්‍රහණයත් එක්ක උඩ පැන පැන දැන් තප්පුලන්නේ. වෙන මුකුත් නොවෙයි. මේ ජයග්‍රහණය භාවිත කරන්න හදනවා මේ බරපතළ ලිපි ගොනු -අපේ ගරු ඇමතිතුමා දැන් මෙතැන ඉන්නවා. ඇමතිතුමා මේවාට සාක්ෂි. නැත්නම් "නැහැ" කියයි- හංගා ගන්නයි. ගරු කථානායකතුමනි, බරපතළ වංචා, දූෂණ පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවයි මම මේ කියන්නේ. මඩ ගහන්න බොරුවක් කියනවා නොවෙයි. මේ ලිපි ගොනු යට ගස්ස ගන්න තමයි මේ ජයග්‍රහණය භාවිතා කරන්න හදන්නේ. ඊළඟ මැතිවරණයට අවුරුදු එකහමාරක්, දෙකක් තිබියදී අපේ අඩු පාඩුකම් හදා ගන්න ජනතාව අපට රතු එළියක් දී තිබෙනවා. ජනතාව අපට දුන්න වරමක් විධියටයි අපි ඒක සලකන්නේ. මොකද, අපට හැදෙන්න කල් තිබෙනවා. අපට හැදෙන්න ඕනෑ තරම් කල් තිබෙනවා. අපෙන් අඩු පාඩු සිද්ධ වුණා. මොකද, ජනතාව ඉල්ලුවේ යහ පාලනය නොවෙයි. ජනතාව ඉල්ලුවේ කන්න බොන්නයි. අපි දුන්නේ යහ පාලනයයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව තව විනාඩියකින් අවසන් කරන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න.

ජනතාව අපෙන් ඉල්ලපු දේ නොවෙයි අපි ඔවුන්ට දුන්නේ. රතුපස්වල ජනතාව ගිහිල්ලා තමන්ට වෙඩි තියපු පොහොට්ටුවේ අයට පසුගිය මැතිවරණයේදී ඡන්දය දුන්නා. අපි ජනතාවට ඉල්ලපු දේ දුන්නේ නැහැ. එම නිසා අපි දැන් සූදානම් ඉදිරි අවුරුදු දෙකේදී ජනතාව ඉල්ලන දේ දෙන්න. ඊළඟ මැතිවරණයට තවත් අවුරුදු දෙකක් තිබියදී අපේ අඩු පාඩුකම් හඳාගන්න ජනතාව අපට දීපු වරමට අපි ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ හරහා අපට 2019 අග තිබෙන ජනාධිපතිවරණයට යන්න අවශ්‍ය පාර කපා ගන්න පුළුවන්. මේ මැතිවරණ ප්‍රතිඵලය ජනාධිපතිවරණයකට පරිවර්තනය කෙරුවොත් ජයග්‍රහණය තිබෙන්නේ පොහොට්ටුවට නොවෙයි, අනෙක් පැත්තෙන් ඉල්ලන අපේක්ෂකයාටයි. එහෙම නම් ඒ අපේක්ෂකයා සූදානම් කරලා අපි සූදානම් ඒ මැතිවරණ ජයග්‍රහණය කරා යන්න. එම නිසා රටේ ජනතාව අපට හොඳ අවස්ථාවක් දීලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ අවස්ථාව තමයි අපි පසුගිය කාලයේ කරපු වැරැදි තේරුම් අරගෙන, ගිය මාර්ගය අවබෝධ කරගෙන හරි මාර්ගයට යන්න කියන එක. අපි දැක්කා සම්පන්දන් මැතිතුමා කියනවා, "මේ මැතිවරණය භාවිතා කළේ කොහොමද?" කියලා. ජාතිවාදය වැපුරුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට අවසාන වශයෙන් විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

මේ අය ජාතිවාදය වැපුරුවා. එසේ කරමින් ගම් ගානේ ගිහිල්ලා තමයි මේ අය ඡන්දය ගත්තේ. එහෙම නැතිව ගමේ පාලම, බෝක්කුව හදනවා කියලා නොවෙයි ඡන්දය ගත්තේ. අපි සම්පන්දන් මැතිතුමාට ගරු කරනවා.

එතුමා කිව්වා, "ඒකීය රටක් තුළ කටයුතු කරන්න සූදානම්" කියලා. ඒක කියද්දී, කියද්දී, දිගින් දිගටම-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීතුමා දැන් අවසාන කරන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ජාතිවාදය වැපුරු අයට අපි කියනවා, 2020 ජනාධිපතිවරණයේදී මුළු රටේම අය ඒකට උත්තරය දෙයි කියලා. ඔබතුමාට බොහොම ස්තුතියි ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

[අ.භා. 5.00]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්ද මන්ත්‍රීතුමාත් සභාවේ නැහැ. එතුමාගේ කාලයත් තිබෙනවා, අවශ්‍ය වුණොත් ගන්නම්.

ගරු කථානායකතුමනි, අද්‍යතන ශ්‍රී ලංකාවේ උද්ගතවී ඇති දැවැන්ත දේශපාලන අර්බුදය නිසා රට අරාජික තත්ත්වයකට පත්ව ඇති බැවින් ඒ පිළිබඳව විවාදයක් පවත්වන්නට ඕනෑ කියලා තමයි ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විවාදයක් ඉල්ලුවේ. ඒ කියන්නේ මේ මොහොතේ රටේ තිබෙන අරාජික තත්ත්වය පිළිබඳව. අද රටේ දැවැන්ත දේශපාලන අර්බුදයක් තිබෙනවා. මේ අර්බුදය පිළිබඳව අද අපේ පාර්ලිමේන්තුවේ විවාදයක් පැවැත්විය යුතුයි කියලා තමයි මේ හදිසි විවාදය පවත්වන්න තීරණය කළේ.

මේ විවාදය තුළ විවිධ අර්ථකථන වෙමින් තිබෙන බව අපි දැක්කා. එක් පාර්ශ්වයක් උත්සාහ කරමින් තිබෙනවා, මේ මැතිවරණය ජනමත විචාරණයක් ලෙස අර්ථකථනය කරන්න. ගරු කථානායකතුමනි, ජනමත විචාරණයකින් පැහැදිලි වෙන්නේ කරුණු දෙකයි. මෙම මැතිවරණය ජනමත විචාරණයක් යැයි ප්‍රකාශ කරන්නට උත්සාහ කළ කඳවුර දෙස බැලුවොත්, ඒ කඳවුර ජනමත විචාරණයේදී "ෆේල්" වී තිබෙනවා. ගරු කථානායකතුමනි, ජනමත විචාරණයකදී

"ඔව්"ද, "නැහැ" ද කියලා තමයි අහන්නේ; "හා" ද, "බෑ" ද කියලා තමයි අහන්නේ. එතැන කඳවුරු දෙකයි තිබෙන්නේ. එම නිසා මෙය ජනමත විචාරණයක් ලෙස කවුරු හෝ අර්ථකථනය කරන්නට හදනවා නම්, මේ මැතිවරණය ජනමත විචාරණයක් යැයි කියන කණ්ඩායම පරාජයට පත් වී තිබෙනවා. එම නිසා අපි කිසිසේත්ම මෙම මැතිවරණය ජනමත විචාරණයක් ලෙස සලකන්නේ නැහැ. මෙම මැතිවරණය ජනමත විචාරණයක් ලෙස සැලකීමම තමයි ආණ්ඩුවට වාසිසහගත තත්ත්වයක් නිර්මාණය කරන්නේ. ඒ නිසා ඔවුන්ට අර්ථකථනය කරන්නට පුළුවන්කම තිබෙනවා, ජනමත විචාරණයක් නම් ආණ්ඩු පාර්ශ්වය නියෝජනය කරන කණ්ඩායම් දෙක එකතුවුණාට පසුව ඡන්ද ප්‍රමාණය වැඩි නිසා ඔවුන් ජයග්‍රහණය කොට තිබෙන බව.

මේ මැතිවරණය ජනමත විචාරණයක් නොවෙයි. මේ මැතිවරණයට එක් එක් දේශපාලන ධාරා තමතමන්ගේ දේශපාලන මත එක්ක ඉදිරිපත් වුණා. එක් දේශපාලන ධාරාවක් ආණ්ඩුව පවත්වා ගෙන යෑම වෙනුවෙන් -මේ බලය දෙන්න ඕනෑ ආණ්ඩුවටමයි, ආණ්ඩුව තමයි රට පාලනය කරන්නේ. රට පාලනය කරනවා වාගේම ගම පාලනය කරන්නත්, රට හදන්නත්- බලය ඉල්ලුවා. ඒක එක දේශපාලන ධාරාවක්.

තව දේශපාලන ධාරාවක් කියනවා, මේ ආණ්ඩුව අනුගමනය කළ ක්‍රියාමාර්ග කිසිසේත්ම සාධනීය නැහැ, වැරදියි. අපි කරපු දේවල් තමයි හරි. එම නිසා නැවත අපට පාලනය දෙන්න කියලා. ඒ වාගේම අපිත් දේශපාලන ව්‍යාපාරයක් හැටියට මේ මැතිවරණයට ඉදිරිපත් වුණා." ඔබතුමන්ලා අවුරුදු හැත්තෑවක් රට පාලනය කර තිබෙනවා. ආණ්ඩුව තිබෙද්දීත් පළාත් පාලන ආයතන පාලනය කර තිබෙනවා. මේ පළාත් පාලන ආයතන දීර්ඝ කාලයක් ඔබතුමන්ලායි පාලනය කළේ. නමුත් ඔබතුමන්ලා අසමත්. ඒ නිසා අපට බලය දෙන්න" කියන ආරාධනය අපි කළා.

[ගරු අනුර දිසානායක මහතා]

දෙමළ ජාතික සන්ධානය උතුරේ දේශපාලනය කේන්ද්‍ර කරගෙන දේශපාලන ධාරාවක් හැටියට කටයුතු කළා කියලා මම හිතනවා. මෙම මැතිවරණයේ ප්‍රතිඵල පෙන්නුම් කර තිබෙන්නේ, එක් එක් දේශපාලන වුවමනා අනුව පෙළ ගැසුණු දේශපාලන ධාරාවලට. ඒ නිසා මේ මැතිවරණය කොටස් දෙකකට බෙදීම වැරදියි. ආණ්ඩුව පැත්තෙනුත් උත්සාහ කර තිබෙනවා, මේ ප්‍රතිඵලය කොටස් දෙකකට බෙදන්න. අනෙක් පාර්ශ්වයත් උත්සහ කර තිබෙනවා, මේ ප්‍රතිඵලය කොටස් දෙකකට බෙදන්න. මේ ප්‍රතිඵලය කොටස් දෙකකට බෙදා මේ සංඛ්‍යා විග්‍රහ කිරීම වැරදියි.

විශේෂයෙන්ම පළාත් පාලන මැතිවරණවල ඉතිහාසය ගෙන බැලුවොත්, පළාත් පාලන මැතිවරණ ජයග්‍රහණය කරන්න වැඩි විභවයක්, වැඩි ඉඩක්, වැඩි අවස්ථාවක් තිබෙන්නේ, ආණ්ඩුවට. එසේ වැඩි අවස්ථාවක් තිබෙන්නේ වෙන කිසිවක් නිසා නොවෙයි, තමන්ට තිබෙන ආණ්ඩු බලය පළාත් පාලන මැතිවරණ ජයග්‍රහණය කරන්න හිතකර තත්ත්වයක් නිර්මණය කරන නිසා. හැබැයි, ඒ වාසිසහගත දේශපාලන තත්ත්වය හා සංසන්දනය කර බලනවිට, ආණ්ඩු පාර්ශ්වය නියෝජනය කරන කණ්ඩායම් විශාල පසු බැසීමකට භාජන වී තිබෙනවා. විශේෂයෙන් මෑත ඉතිහාසයේ මැතිවරණ කිහිපයක් හා සංසන්දනය කර බැලුවොත්, ආණ්ඩුවේ ප්‍රධාන පාර්ශ්වයක් වූ එක්සත් ජාතික පක්ෂය තනි පක්ෂයක් ලෙස ඉතාම බරපතළම කඩා වැටීමකට ලක් වී තිබෙනවා. එය කිසිසේත්ම සැඟවිය යුතු කරුණක් නොවෙයි. ඒ වාගේම තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. එම පක්ෂය දීර්ඝ ඉතිහාසයක් තිබෙන පක්ෂයක්. එම පක්ෂය අද ජනාධිපති ධුරය හොබවනවා. ඒ පක්ෂයේ යම් කොටසක් ආණ්ඩුව නියෝජනය කරමින් තිබුණා. ඒ කොටසත්, ජනාධිපති ධුරයත් අතේ තියාගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙම මැතිවරණ ව්‍යාපාරයට අවතීර්ණ වුණා. හැබැයි, මොකක්ද සිදු වී තිබෙන්නේ? ඒ මැතිවරණ ව්‍යාපාරය තුළදී කිව්වා වාගේම, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඩාලි පාරේ නොවෙයි, වෙන තැනක තිබෙන බව මෙම මැතිවරණ ප්‍රතිඵලයෙන් ඔප්පු කර තිබෙනවා. ඒවා අපි පිළිගත යුතු කරුණු.

දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපේ පැත්තෙන් බැලුවොත්, අපි අපේක්ෂා කළ ප්‍රතිඵලයක් තිබුණා. අපි අපේක්ෂා කරන ලද ඒ ප්‍රතිඵලය අපට අත්පත් වී නැහැ. නමුත් මෑත කාලයේ -2006න් පසු - ලබාගන්නා ලද වැඩිම ඡන්ද ප්‍රතිශතය සහ වැඩිම ඡන්ද ප්‍රමාණය අපි ලබාගෙන තිබෙනවා. නමුත් එය අපි අපේක්ෂා කරන ලද ප්‍රතිඵලය නොවෙයි.

උතුරු පළාතේ මැතිවරණ ප්‍රතිඵල දිහා බැලුවාම අපට පෙනෙන්නේ මොකක්ද? විශේෂයෙන්ම දෙමළ ජාතික සන්ධානය යම් උත්සාහයක් දරමින් තිබුණා යම් දේශපාලන ප්‍රතිසංස්කරණ යෝජනාවක් සඳහා. ඒ යෝජනාවට එරෙහිව යම් කඳවුරක් උතුරේ ගොඩනැඟෙමින් තිබුණා. දැන් මේ මැතිවරණ ප්‍රතිඵලවලින් අපට යම් ප්‍රමාණයකට පැහැදිලි කරමින් තිබෙනවා, ඒ කඳවුරත් යම් ප්‍රමාණයකට ශක්තිමත් වෙමින් තිබෙන බව. එම නිසා මේ මැතිවරණයෙන් උතුරේ ඇති වී තිබෙන දේශපාලන ප්‍රතිඵලය දිහාත් අපේ රටේ ජනතාව බැලිය යුතුව තිබෙනවා. අන්ත ජාතිවාදී කණ්ඩායම් අතට උතුරේ දේශපාලන මතය ගලාගෙන යෑමේ අනතුරක් මෙම මැතිවරණ ප්‍රතිඵලවලින් පෙන්නුම් කරමින් තිබෙනවා. එම නිසා මේ මැතිවරණ ප්‍රතිඵල හැම දේශපාලන ව්‍යාපාරයකටම තමන්ගේ භූමිකාව, තමන්ගේ කාර්ය භාරය දෙස නැවත හැරී බලන්න බල කරන මැතිවරණ ප්‍රතිඵලයක්. අපි හැමදෙනාම ඒක පිළිගන්න ඕනෑ. තමන්ගේ දේශපාලන භූමිකාව සහ තමන්ගේ දේශපාලන ක්‍රියාමාර්ග පිළිබඳව නැවත හැරී බලන්න මේ ප්‍රතිඵලයෙන් අපි හැමදෙනාටම බල කරමින් තිබෙනවා.

මෙම මැතිවරණයෙන් පසුව රටේ අරාජික තත්ත්වයක් නිර්මාණය වුණේ කුමක් නිසාද? එය කිසිසේත්ම මැතිවරණ ප්‍රතිඵලයට සම්බන්ධ කාරණයක් නොවෙයි කියා මා විශ්වාස කරනවා. මැතිවරණයේ සංඛ්‍යා, දත්ත මත නොවෙයි ඒ ප්‍රශ්නය පැන නැඟුණේ. මේ රටේ දේශපාලන ගැටුමක් තිබුණා. මැතිවරණ ව්‍යාපාරය තුළත් ඒ දේශපාලන ගැටුම අපි දැක්කා. ඒ දේශපාලන ගැටුමේ ප්‍රතිඵලයක් විධියට තමයි ආණ්ඩුව ඉතා නිශ්චිත ලෙස කණ්ඩායම් දෙකක් ලෙස මැතිවරණ ව්‍යාපාරයේ නිරත වුණේ. මැතිවරණ ව්‍යාපාරයේදී කණ්ඩායම් දෙකක් ලෙස තමයි ඔවුන් කටයුතු කළේ. ඒ ගැටුම කොයි තරම් තීව්‍ර වුණාද කියනවා නම්, මැතිවරණයෙන් පසුව එකට ඉඳීමට බැරි තත්ත්වයක් නිර්මාණය වුණා. ඇයි එහෙම වුණේ? මැතිවරණ ව්‍යාපාරය ඇතුළේ කණ්ඩායම් දෙකක් ලෙස බෙදීම දක්වා වූ දේශපාලන තත්ත්වයක් වර්ධනය වන්නේ මොකක් නිසාද? ඒ අන් කවරක්වත් නිසා නොවෙයි, ගරු කථානායකතුමනි.

2015 ජනවාරි 08වැනි දා මේ රටේ ජනතාව විශාල ජන වරමක් දුන්නා, මේ ජනාධිපතිවරයාට සහ අග්‍රාමාත්‍යවරයාට. ඒ වෙලාවේදී කවුරු හෝ මෙන්න මෙහෙම හිතන්න ඇති. මා හිතනවා එහෙම හිතන්න ඇති කියලා. ජනාධිපතිවරයාගේ පැත්තෙන් කල්පනා කළා, එය එතුමාට ලැබුණු අනභිභවනීය බලයක් කියලා. එම නිසා එතුමාට බලය ලබාදුන් මුල් අවුරුදු පහ තුළ ජනාධිපති ධුරය අහෝසි කරනවා වෙනුවට, නැවත වතාවක් එම පුටුවේ වාඩි වෙන්න පුළුවන්ද කියන දේශපාලන සිතියම එළන්න එතුමා පටන් ගත්තා. ඒකයි ඇත්ත.

අගමැති රනිල් වික්‍රමසිංහ මහත්මයාත් ඒ වාගේමයි හිතුවේ. එතුමා විධායක ජනාධිපති ධුරය යටතේ අගමැති ධුරය දරා තිබුණාට, විධායක ජනාධිපති ධුරය යටතේ අමාත්‍ය ධුර දරා තිබුණාට, එතුමාගේ මුළු දේශපාලන ඉතිහාසයේම විධායක පුටුවේ වාඩි වෙන්න බැරි වෙලා තිබෙනවා. හැබැයි, ජනවාරි මාසයේ 8වැනි දා ප්‍රතිඵලයෙන් පසු, මේ විධායක පුටුවේ වාඩි වෙන්න එතුමා නැවතත් සැලසුම් හැදුවා. ඒකයි ඇත්ත. හැබැයි, 2015 ජනවාරි මාසයේ 08වැනි දා දුන්නේ කවර ආකාරයේ ප්‍රතිඵලයක්ද? ඒක මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ හාස්කමක් හෝ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ දැවැන්ත ප්‍රතිරූපයකට ලැබුණු ප්‍රතිඵලයක් නොවෙයි. පැවති පාලනයට එරෙහිව වර්ධනය වෙමින් තිබුණු විරෝධය විසින් තමයි එම ප්‍රතිඵලය නිර්මාණය වුණේ. නමුත් එය තේරුම් ගන්න ඒ දෙදෙනාම අසමත් වුණා. ඒ ප්‍රතිඵලය පිටුපස තිබුණු සැබෑ ජන වරම, ඒ ප්‍රතිඵලය පිටුපස තිබුණු ජනතාවගේ සැබෑ වුවමනාව ඒ දෙදෙනාම අමතක කළා. එම නිසා පසු ගිය අවුරුදු තුනේම දෙදෙනාට හොරෙන් හොර ගල් අහුලමින් කටයුතු කළා. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කල්පනා කරනවා, ඊළඟට එම පුටුවේ වාඩි වෙන්න. රනිල් වික්‍රමසිංහ මහත්මයා කල්පනා කරනවා, ඊළඟ ජනාධිපතිවරණයේදී ජනාධිපති පුටුවේ වාඩි වෙන්න. එළැඹෙන ජනාධිපතිවරණයකදී පුටුවේ වාඩිවීම සඳහා කරන දේශපාලන දාදු කෙළියක් එම අවුරුදු තුන ඇතුළත මේ දෙදෙනාම ගෙන ගියා. එහෙම කටයුතු කිරීම නිසා මොකක්ද වුණේ? ගරු කථානායකතුමනි, එසේ කටයුතු කිරීම නිසා තමයි ජනවාරි මාසයේ 08වැනි දා ලැබුණු ජන වරම මේ ඡන්දයේදී ප්‍රතික්ෂේප වුණේ. ඔවුන් ඒ ජන වරමට පිටුපස හැරෙව්වා. ඒකයි සිද්ධ වුණේ. ඒකෙන් මොකක්ද වුණේ? තමන්ට ප්‍රතිපාක්ෂික කඳවුරේ කණ්ඩායම් තමන්ට දිනා ගැනීම වෙනුවෙන් කටයුතු කළා. වංචාවලට, දූෂණවලට එරෙහිව කටයුතු කරන ආයතන අඩපණ කළා.

ගරු කථානායකතුමනි, වංචා දූෂණ සහ නාස්තිය පිළිබඳ විශාල සාකච්ඡාවක් මේ රටේ තිබුණා. ලලිත් වීරතුංග සහ අනූෂ පැල්පිටට විරුද්ධව දමපු නඩුව තමයි මේ ආණ්ඩුවෙන් දමපු පළමුවැනි නඩුව. විභාග කරලා අවසන් කළ පළමුවැනි නඩුව

ඒකයි. එම නිසා ඒ නඩුවේ තීන්දුව රටට අතිශය වැදගත් වුණා. ඒ මොකක් නිසාද? දූෂිතයන් පිළිබඳව ගොඩනඟා තිබෙන මතය, ජනතාවගේ මූල්‍ය අවභාවිත පිළිබඳව රටේ ගොඩනඟා තිබෙන මතය සැබෑවක්ද, නැද්ද යන්න තහවුරු කිරීමේ නඩුවක් බවට එම නඩුව පත් වුණා.

ඒ නඩුව අතිශය වැදගත් නඩුවක් වුණා. හැබැයි, මොකක්ද වුණේ? මම අහන්න කැමැතියි, අඩුම තරමින් ඒ නඩුව වෙනුවෙන් පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් ගෙන්වලා ඔවුන්ට ප්‍රශංසා කළේ ආණ්ඩුවේ මොන ඇමතිවරයාද කියලා. ඒ නඩුව ගොනු කිරීම වෙනුවෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය-FCID- එකේ මොන නිලධාරියාටද තමුන්නාන්සේලා සහතිකයක් ප්‍රදානය කළේ? නැහැ, තමුන්නාන්සේලාට ඒවා ඕනෑ නැහැ. තමුන්නාන්සේලා කටයුතු කළේ බේරා ගන්නයි. ඒකයි ඇත්ත. ඒ නිසා තමයි ලලිත් වීරතුංග සහ අනුෂ පැල්පිට සිරගත වූ වහාම මහින්ද රාජපක්ෂ මහත්මයා ඇතුළු කණ්ඩායමක් ගිහිල්ලා රනිල් වික්‍රමසිංහ මහත්මයා මුණ ගැසුණේ. මා දැක්කා, මහින්ද රාජපක්ෂ මහත්මයා කිව්වා "ඒ නඩු තීන්දුව ගැන අගමැතිවරයා පුදුම වුණා"යි කියලා. පුදුම වෙන්න දෙයක් නොවෙයි. "පුදුම වුණා" කියන්නේ මොකක්ද? තමන් අපේක්ෂා නොකරන ලද තීන්දුවක් ලැබුණා. අගමැතිවරයා ඉන්නේ එතැන.

ඊළඟට මොකක්ද වුණේ? ඊළඟට අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළා. High Court එකට ගිහිල්ලා ඇප ඉල්ලුවා. "මේක වංචාවක්, මේකට දඬුවම් ලබා දිය යුතු"යි කියලා එදා අධිකරණයේදී තර්ක කළ තුසිත මුදලිගේ කියන ජ්‍යෙෂ්ඨ නීතිඥතුමා ඇප ඉල්ලන දවසේ අධිකරණයට ගියේ නැත්තේ ඇයි? ඇයි, ගියේ නැත්තේ? තමුන්නාන්සේලාගෙන් orders ආවා. ඇප ඉල්ලනවාට විරුද්ධ වෙන්න එපා කියලා නියෝග ආවා. ඇප ඉල්ලන එකට විරුද්ධ වෙන්න එපා නම් මොකක්ද කරන්න ඕනෑ? එම නීතිඥවරයා ගිය සතියේ ගිහිල්ලා ඒ අය හිරේ දමන්න කියලා තර්ක කරලා, මේ සතියේ ඇඳුම් ඇඳගෙන අධිකරණයට ගිහිල්ලා කියන්න වෙනවා, ඇප දෙනවාට විරුද්ධ නැහැ කියලා. ඒ නිසා කණිෂ්ඨ නීතිඥවරයෙක් අධිකරණයට යැව්වා. මොකක් වෙනුවෙන්ද? තමුන්නාන්සේලා මේ අයව ආරක්ෂා කර ගන්න උත්සාහ කළා. ඒ අන් කවරක් සඳහාවත් නොවෙයි, තමුන්නාන්සේලාගේ දේශපාලන දාදුකෙළිය නිසා. ඇයි? පුටුවේ වාඩිවෙන්න. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට යළි එම පුටුවේ වාඩිවෙන්න, රනිල් වික්‍රමසිංහ මහත්මයාට ජීවිතයටම වාඩිවෙන්න බැරි වුණු පුටුවේ වාඩිවෙන්න. මෙහෙමයි සැලසුම් හැදුවේ. ඒ සැලසුමට අනුව මොකක්ද කළේ? වංචාවට දූෂණයට එරෙහිව කටයුතු කරන ආයතන අඩපණ කළා; අධෛර්යට පත් කළා. සමහර නිලධාරින් භීතියට පත්වෙලා තිබෙනවා. මේකයි ඇත්ත කථාව. නීතිපති දෙපාර්තමේන්තුවේ සමහර නිලධාරින් ඇහුවා "ඇමතිවරු දූෂිතයන් රකිනවා නම්, අපි නීතිපති දෙපාර්තමේන්තුවෙන් ගිහිල්ලා නඩු මෙහෙය වන්නේ කොහොමද?" කියලා. ආණ්ඩුව දූෂිතයන් රකිනවා නම්, අපි නඩු මෙහෙයවන්නේ කොහොමද කියලා ඇහුවා. තමුන්නාන්සේලා සමස්ත ක්‍රියාදාමය දියත් කළේ වංචනිකයන් ආරක්ෂා කරන්නයි. තමුන්නාන්සේලා වංචනිකයන්ට දඬුවම් ලබාදෙයි කියලා, ඒ පිළිබඳව ජනතාව තුළ මහත් බලාපොරොත්තුවක් තිබුණා. ඒ බලාපොරොත්තුව මුළුමනින්ම ප්‍රතික්ෂේප කළා. තමුන්නාන්සේලා ඒ වෙනුවට ඊට ප්‍රතිපක්ෂව කටයුතු කළා. වංචනිකයන්, දූෂිතයන් රකින පාලනයක් බවට තමුන්නාන්සේලා පාලනය පත් වුණා. ඒ සංඥව තමයි මේ මැතිවරණයෙන් ලබා දී තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් ලබා දීම සඳහා ලැබුණු ජනවරමින් තිබුණු සදාචාරයට හානි කර ගත්තා. තමුන්නාන්සේලා ප්‍රබල වංචා දූෂිතයන්ගේ හවුල්කරුවන් බවට පත් වුණා.

ගරු කථානායකතුමනි, වංචා, දූෂණ මැඩපැවැත්වීම සඳහා එන ලද පාලනයක් මහා විශාල වංචා දූෂණවල හවුල්කරුවන් බවට පත් වුණාම තවදුරටත් වංචනිකයන්ට සහ දූෂිතයන්ට දඬුවම් දෙන්න ඔවුන්ට සදාචාරාත්මක අයිතියක් නැති වුණා. ජනතාවගේ බලාපොරොත්තුවලට හාත්පසින්ම වෙනස් පාලනයක් තමුන්නාන්සේලා දියත් කරමින් තිබුණා. එහි ප්‍රතිඵල තමයි මේ මැතිවරණයෙන් පෙන්නුම් කර තිබෙන්නේ.

වංචා දූෂණ පිළිබඳව විතරක් නොවෙයි, ඝාතන, අපරාධ පිළිබඳවත් කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, සමහර අපරාධ වළක්වන්න බැරි විධියටම, සමහර අපරාධ සඳහා දේශපාලන මැදිහත්වීම් තිබුණාට ක්‍රියා මාර්ග අරගෙන තිබුණේ සමහර හමුදා නිලධාරිනුයි. ඒක වළක්වන්න බැහැ. මොකද, දේශපාලනඥයෝ අරගෙන ගිහිල්ලා වෙඩි තියන්නේ නැහැ. හැබැයි, ඒ සමහර අය පිළිබඳව ක්‍රියාත්මක වන විට ඒවා අඩපණ කළා. ගරු කථානායකතුමනි, මම අදත් අහනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය මාරු කළේ ඇයි කියලා. මේ ආණ්ඩුව ඒක තවමත් මේ පාර්ලිමේන්තුවට කියලා නැහැ. එතුමිය මාරු කළේ ඇයි? ආණ්ඩුවට එන ලද මුදල් රුපියල් කෝටි 1140ක් ඇවන්ට්ගාර්ඩ් සමාගමට හැරෙව්වා කියලා ගෝඨාභය රාජපක්ෂටත්, හිටපු නාවික හමුදාපතිවරු තිදෙනාටත් විරුද්ධව ප්‍රධාන නඩුවක් දැම්මා. මොකක්ද වුණේ? පසුවදා අයින් කළා. ගරු කථානායකතුමනි, මේගොල්ලෝ හිටියේ කොතැනද? මේගොල්ලෝ හිටියේ මොකක් වෙනුවෙන්ද? තම තමන්ට හිතවාදී කණ්ඩායම් ප්‍රතිපක්ෂයෙන් හදා ගන්න උත්සාහ කළා. ඒ නිසා අග්‍රාමාත්‍යවරයාත් යම් කණ්ඩායම් ආරක්ෂා කළා; මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාත් යම් කණ්ඩායම් ආරක්ෂා කළා. ආරක්ෂා කළේ නැහැයි කියලා ඒ දෙදෙනාම මෙතැනට ඇවිල්ලා අභියෝග කළොත් ආරක්ෂා කළ විධිය, රැක ගත් විධිය නම් ගම් එක්ක කියන්න මා ලැහැස්තියි. එහෙම රැක ගත්තා විතරක් නොවෙයි, නැවත වංචා, දූෂණවල යෙදුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මුල් කාලය ඉවරයි. ඔබතුමන්ලාට තව විනාඩි 10ක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හොඳයි. ඒ වාගේම ඝාතන පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම ගැන මහජනතාව තුළ බලාපොරොත්තුවක් තිබුණා. නමුත් එක ඝාතකයකුවත් තමුන්නාන්සේලාට අල්ලන්න බැරි වුණා. අල්ලන්න බැරි වුණේ පරීක්ෂණ ආයතන අඩපණ නිසා නොවෙයි.

පරීක්ෂණ ආයතන ශක්තිමත්ව තිබුණා. හැබැයි, ඒ පරීක්ෂණ ආයතනවලට බාධා කරන ආණ්ඩුවක් තිබුණා. ඒකයි හේතුව.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. හර්ෂ ද සිල්වා ඇමැතිවරයා විපක්ෂයේ සිටින විට පසු ගිය ආර්ථික ක්‍රමවේදය පිළිබඳ විවේචනය කළා මට මතකයි. සමාජ ආර්ථික වෙළෙඳ පොළක් ගැන කථා කළා. හැබැයි, තමුන්නාන්සේලා දියත් කළේ ඒ ආර්ථිකය නොවෙයි. තමුන්නාන්සේලාට කඩිමුඩියේ, හදිසියේ මහා බලයක් ලැබුණු ලෙස කල්පනා කරලා සියල්ල වෙනස් කරන්න පටන් ගත්තා. ගොවි ජනතාවගේ ජීවිත විශාල ලෙස විනාශයට පත් වෙමින් තිබුණා. ඔවුන්ගේ පොහොර සහනාධාරය කප්පාදු කළා. ගම්මිරිස් වගාව පිළිබඳව ප්‍රශ්නයක් එනකොට ආණ්ඩුව ඒ ගැන අවධානය යොමු කළේ නැහැ. අමාත්‍යවරයා යම්

[ගරු අනුර දිසානායක මහතා]

උත්සාහයක් දැරුවා කියලා මම දන්නවා. හැබැයි, ඒ උත්සාහයට මුදල් අමාත්‍යාංශය සල්ලි දුන්නේ නැහැ. ඒක නේ වුණේ. තමුන්නාන්සේ ගම්මිරිස් ගොවීන්ට කිව්වා, රුපියල් 950 ගණනේ -[බාධා කිරීමක්] මට නියමිත කාලය සීමිත නිසා අවස්ථාව දෙන්න බැහැ. එම නිසා මොකද කළේ? සාමාන්‍ය පතුලේ ජනතාවගේ වුවමනාවන් තමුන්නාන්සේලා නියෝජනය කළේ නැහැ. තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගේ ඔළු පුරවාගෙන තිබුණු මනස්ගාත ලිබරල් අදහස් මේ රටේ ප්‍රකට කරන්න පටන් ගත්තා.

ගරු කථානායකතුමනි, අපි දැන් පසු ගිය අය වැය ලේඛනය ගැන බලමු. අපේ රටේ තට්ටු තුනට අඩු නිවාස මිලදී ගැනීමට විදේශිකයන්ට බාධාවක් තිබුණා. හැබැයි, තමුන්නාන්සේලාගේ අය වැය ලේඛනයේ කියනවා, තට්ටු තුනට අඩු නිවාසත් සුද්දන්ට ගන්න පුළුවන් කියලා. තමුන්නාන්සේලා රට පාලනය කළේ කවුරු වෙනුවෙන්ද?

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. අපේ රටේ ඉඩම් නීති ශක්තිමත්. ඉඩම් නීතිවල ශක්තිමත් බව නිසා තමයි අද අපේ රටේ ගම්වල මිනිසුන් සතුව තවමත් ඉඩම් තිබෙන්නේ. අපේ රටේ සක්‍රිය ඉඩම් වෙළඳ පොළක් නැහැ. ඒක හොඳයි. එම නිසා තමයි අපි අනුරාධපුරයේ ගෙදරකට ගියොත්, ඒ ගෙදර විශාල දේපොළ නැති වුණාට ඔවුන්ට කුඹුරක් තිබෙන්නේ. ඒ මේ ඉඩම් නීති නිසා. හැබැයි, තමුන්නාන්සේලා මේ අය වැය ලේඛනයෙන් යෝජනා කරනවා, ඉඩම් නීති සංශෝධනය කරන්න; කුඹුරු පනත සංශෝධනය කරන්න. ඒ විතරක් නොවෙයි. අපේ රටේ නාවික සේවා සැපයීමේ ක්ෂේත්‍රයට විදේශිකයන්ගේ පැමිණීමට බාධා ඇති කරලා තිබුණා. විදේශිකයෙක් එනවා නම් සමාගමේ ඔහුගේ කොටස් පංගුව සියයට 40ට වඩා වැඩි වෙන්න බැහැ කියලා තිබුණා. හැබැයි, තමුන්නාන්සේලා පසුගිය අය වැය ලේඛනයෙන් යෝජනා කරනවා, විදේශ සමාගම්වලට අපේ නාවික සේවා ක්ෂේත්‍ර සපයන්න සූදානම් කියලා. අපේ රටේ දේශීය කර්මාන්තකරුවා ආරක්ෂා කර ගැනීමේ දී, අපේ තාක්ෂණය දුබලයි, අපේ නිෂ්පාදනය පොඩියි. එම නිසා අපේ රටේ නිපදවන භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය වැඩියි. ඒ නිසා අපේ රටේ කර්මාන්තකරුවා ආරක්ෂා කර ගැනීමට නම්, අනිවාර්යෙන්ම විවිධ බදු හරහා පමණයි අපේ රටේ කර්මාන්තකරුවා ආරක්ෂා කර ගැනීමට පුළුවන් වන්නේ. හැබැයි, තමුන්නාන්සේලා අය වැයෙන් යෝජනා කරනවා, ඉදිරි වසර තුන ඇතුළත භාණ්ඩ 1,500ක තීරු බදු නොවන බදු සියල්ල ඉවත් කරනවා කියලා. ඒ කියන්නේ මොකක්ද? අපේ කර්මාන්ත කඩා වට්ටන්න සැලසුමක් හැදුවා. තමුන්නාන්සේලා මුළු ආර්ථික ප්‍රතිපත්තියම වෙනස් කළා. එදා විපක්ෂයේ ඉන්නකොට කියපු කථාව නොවෙයි ක්‍රියාත්මක කළේ. ඊට ප්‍රතිපක්ෂ ලෙස ඔළුවේ තැන්පත් කර ගන්නා ලද, ලෝකයේත් අසාර්ථක ක්‍රමවේදයක් තමයි තමුන්නාන්සේලා ක්‍රියාත්මක කළේ. 2008 වර්ෂයේ ඇමෙරිකා එක්සත් ජනපදයේ නිවාස වෙළෙඳ පොළෙන් පටන් ගත් අර්බුදය මූල්‍ය වෙළඳ පොළ දක්වා වර්ධනය වන විට එවකට සිටි ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් බුෂ් මොකක්ද කිව්වේ? එතුමා කිව්වා, "ඉතිහාසයේ මුහුණ දී තිබෙන දැවැන්ත අර්බුදය, නිවාස වෙළඳ පොළෙන් පටන් ගන්නා ලද අර්බුදය ඩොමිනෝ ආකාරයෙන් පැතිරිලා යනවා, දසලක්ෂ ගණනකට රැකියා අහිමි වෙලා තමයි මේක නතර වෙන්නේ" කියලා. හැබැයි, තමුන්නාන්සේලාත් ඒ ගමනම යන්න පටන් ගත්තා. එංගලන්තයේ මහ බැංකු අධිපතිවරයා කිව්වා, 1929 වසරෙන් පසුව එංගලන්ත රාජ්‍යය, ඇය මුහුණ දී තිබෙන දරුණුතම අගාධයට මුහුණ දී තිබෙනවා කියලා. සෞඛ්‍ය රක්ෂණය කපන්න වෙනවා, අධ්‍යාපන පහසුකම් කපන්න සිදු වෙනවා, ඇයගේ ඉතිහාසයේ දැවැන්තම ආර්ථික අර්බුදය නිර්මාණය වෙලා තිබෙනවා, කියලා කිව්වා. ලෝකය පුරා අසාර්ථක වෙමින් තිබුණු ආර්ථික ගමනම තමුන්නාන්සේලා දියත් කරමින් තිබුණා. ඒකෙන් මොකක්ද වෙන්නේ? ගොවි ජනතාවගේ වුවමනාවන්, සාමාන්‍ය ජනතාවගේ වුවමනාවන්, කර්මාන්ත කරුවන්ගේ වුවමනාවන්, තරුණයන්ගේ වුවමනාවන් සියල්ල අත්හරිමින්, බලයෙන් හිස උදුම්මාගත්, කිසි කෙනෙකුට ඇහුම් කන් නොදෙන කණ්ඩායමක් හැටියට තමුන්නාන්සේලා කටයුතු කළා. ඒ කණ්ඩායමට නිසි පාඩම මේ මැතිවරණයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා මේ සංඛ්‍යා ලේඛනවල හැංගෙන්න බැහැ. මේක තමයි සමාජ මතය. මේක තමයි මැතිවරණ ප්‍රතිඵලය. හැබැයි, මැතිවරණ ප්‍රතිඵලයෙන් පසුව මොකක්ද වුණේ? මැතිවරණ ප්‍රතිඵලයෙන් පසුව පළාත් පාලන ආයතනවල ආණ්ඩු හදා ගනියි; තිබෙන ආණ්ඩුව යයි. ඒක වෙනම දෙයක්. හැබැයි, සිද්ධ වුණේ මොකක්ද? මැතිවරණ ප්‍රතිඵලයෙන් පසුවත් මෙම පරාජයේ වගකීම එකිනෙකා පිට පටවා අනෙකා නිදහස් වීමේ උපක්‍රමයකට ගියා.

රනිල් වික්‍රමසිංහ මහත්මයා සහ මෛත්‍රීපාල සිරිසේන මහත්මයා අතර නම් ඊළඟ ජනාධිපති පුටුවේ තරගය තිබුණේ, මැතිවරණ ප්‍රතිඵල ඇතුළේත් උත්සාහ කළේ අන් කවරක්වත් නොවෙයි, එක් අයෙක් පරයා අනෙක් කෙනා නැවත පුටුවේ වාඩි වෙන්නයි. මේකටයි සැලසුම හැදුවේ. ඒ නිසා තමයි එක් අයෙක් පිට මුළු දෝෂාරෝපණයම පටවා තමන් සුද්ධවන්තයෙක් බවට පත් වෙන්න උත්සාහ කරන්නේ. එම නිසා තමයි තව කෙනෙක්, අනෙකා පිට මුළු විවේචනයම පටවා තමන් හරි කෙනෙක් බවට පත් වෙන්න උත්සාහ කරන්නේ. එම උත්සාහය පිටු පස තිබෙන්නේත් නැවත ජනාධිපති පුටුවේ වාඩිවීමේ සිහිනයයි. එම නිසා මේ පළාත් පාලන මැතිවරණයෙන් පසුව ආණ්ඩුවක් නොමැති තත්ත්වයක් නිර්මාණය වුණා. රුපියල කඩා වැටෙන්න පටන් ගත්තා. කොටස් වෙළෙඳ පොළ කඩා වැටෙන්න පටන් ගත්තා. ඒ වාගේම ගිවිසුම් අත්සන් කර නැති, සාකච්ඡා මට්ටමේ තිබුණු විදේශ ආයෝජන පැත්තකට ගලාගෙන යන්න පටන් ගත්තා. ආණ්ඩුවේ යම් අරාජිකත්වයක් නිර්මාණය වෙන්න පටන් ගත්තා. මේ අරාජිකත්වය නිර්මාණය කළේ මැතිවරණ ප්‍රතිඵලය විසින් නොවෙයි.

තමුන්නාන්සේලා 2015 ජනවාරි මාසයේ 08 වැනි දා සිට දියත් කරන ලද දේශපාලන "ගේම්" එක, මැතිවරණයෙන් පසුවත් ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. එකිනෙකා මත වරද පටවමින් එක් අයෙකු යට කර, නැවත තමන්ගේ කොඩිය ඔසවා ගැනීමේ තරගය තිබුණා. එම තරගය තමයි මේ අරාජිකත්වය නිර්මාණය කළේ, දින 10ක් පමණ.

අද ආණ්ඩුවක් තිබෙනවාද? මොන ඇමතිවරයාද, වගකීමෙන් කටයුතු කරන්නේ? මොන නිලධාරියාද, ඇමතිවරයෙකුගේ නියෝගයක් පිළිගන්නේ? අද වනවිට මේ බල පොරය මුළු රටම අරාජිකත්වයට ගෙනැවිත් තිබෙනවා. ඒ නිසා අපි තමුන්නාන්සේලාට කියන්නේ මෙයයි. මේ බල පොරයෙන් මිදෙන්න තමුන්නාන්සේලා සූදානම් නැත්නම්, මේ අරාජිකත්වය හැම දාමත් තිබේවි. මේක තිබෙනවා. ඒ නිසා දැන් තේරුම් ගන්න. රනිල් වික්‍රමසිංහ මහත්මයා ආයෙත් සිහින මවන්න එපා, ජනාධිපති පුටුවේ වාඩිවෙන්න. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් ආයෙත් සිහින මවන්න එපා, ජනාධිපති පුටුවේ වාඩිවෙන්න. එහෙම බැහැ, හරිද? 2015 ජනවාරි මාසයේ 08 වැනි දා එකතු වුණු බලවේග ආයෙත් කවදාවත් එකට එකතු වෙන්නේ නැහැ. මතක තබා ගන්න. ආයෙත් කවදාවත් එකට එකතු වෙන්නේ නැහැ. එය ජනවාරි මාසයේ 08 වැනි දාට පමණයි. හරිද? "මෙහෙම ගියාට පසුව එයි, මෙහෙ ගියාට පසුව සහාය දෙයි, පසුව එකතු වෙයි" කියලා හිතන්න එපා. එහෙම වෙන්නේ නැහැ. මතක තබා ගන්න. මේ ජනාධිපති පුටුව ඉදිරියෙන් තබා ගෙන මේ දෙදෙනා කරන බල සූදුව මේක විනාශයට පත් කරලා තිබෙනවා. ඒ නිසා මේ බල සූදුව නතර කරන්න ඕනෑ.

2015 ජනවාරි මාසයේ 08 වැනි දාට ආපසු යන්න. ජනවාරි මාසයේ 08 වැනි දා පැවැති වුවමනාව මොකක්ද? ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම හා විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම තමයි ජනවාරි මාසයේ 08 වැනි දා පැවැති වුවමනාව වුණේ. හැබැයි, තමුන්නාන්සේලා ජනවාරි මාසයේ 08 වැනි දා පැවැති වුවමනාව වෙනුවෙන් කටයුතු කරනවා වෙනුවට ඊට පටහැනිව තමයි කටයුතු කරමින් තිබෙන්නේ. එසේ පටහැනිව කටයුතු කිරීම තමයි මෙවැනි විනාශකාරී තැනකට, විනාශකාරී බලවේගයන්ට යළි අපේ රටේ දොරටු විවෘත කරමින් තිබෙන්නේ. ඒ නිසා ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි තමුන්නාන්සේලාට එක දෙයයි කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අපි එක දෙයයි කියන්නේ. මේ ජනතාවගේ අභිලාෂ, වුවමනා මත තමුන්නාන්සේලා පෙළ ගැහෙන්නේ නැත්නම්, මේ ඔළු මාරුව කර ගන්න පුළුවන්. එහෙන් ඔළු ගන්න පුළුවන්; මෙහෙන් ඔළු ගන්න පුළුවන්. මම මීට කලිනුත් මේ ගරු සභාවේදී මේ ගැන කියලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ නිකම් කුණු මාළු වාගේ විකිණෙන අය ගොඩාක් ඉන්නවා. නිකම් කඳන්. එහෙම නේද? සමහර විට බුරුත කඳන් වාගේ තමයි ශරීර කඳන්. කොස් කඳන්, බුරුත කඳන්, පාර්ලිමේන්තු මන්ත්‍රී කඳන්. කොට විකිණෙනවා වාගේ, ලී විකිණෙනවා වාගේ වර්ග අඩි ගණනට විකිණෙන, ඝන අඩි ගණනට විකිණෙන කණ්ඩායමක් ඉන්නවා. මේ කණ්ඩායම්වලින් ඕනෑ තරම් වට අඩි ප්‍රමාණයට විකිණෙන කණ්ඩායම් ඉන්නවා. ගහ පැරණිද, ගහ අලුත්ද කියලා බලන්නේ නේද? ගහ පැරණි නම් අරටුව හොඳයි. දැන් නම් ගොඩාක් අයගේ අරටු දිරලා. ඔහොම තිබෙනවා. හැබැයි, එහෙම වැඩක් නැහැ. මේ විකිණෙන කඳන් තබා ගෙන ආණ්ඩුවක් ස්ථාවර කර ගන්න බැහැ. ආණ්ඩුවක් ස්ථාවර කරගත හැකි වන්නේ ජනවාරි මාසයේ 08 වැනි දා ජනතාව දෙන ලද එකඟතාවන්ට අනුව තමුන්නාන්සේලා කටයුතු කරන්න සමත් වුණොත් විතරයි. එසේ සමත් නොවන තාක්කල්, මේක අරාජිකත්වයෙන්. ජනතාවගෙන් ප්‍රතික්ෂේප වී ඔළු විතරක් එකතු කරගෙන ආණ්ඩුවක් පවත්වාගෙන යන්න පුළුවන් කියලා කවුරුහරි කල්පනා කරනවා නම්, ඒක ඉතිහාසයට අයිතියි. ඇයි? අද ජනතාව වෙනදාට වඩා සක්‍රියයි. වෙනදාට වඩා ඔවුන්ට අවබෝධයක් තිබෙනවා. ඔවුන් දේශපාලනය නිරීක්ෂණය කරලා ගනු ලබන තීරණ වැරදි වෙන්න -නිවැරදි නොවෙන්න- පුළුවන්. හැබැයි, ජනතාව දේශපාලනය පිළිබඳව නිරීක්ෂණයක ඉන්නවා. ඒකයි තේරුම් ගත යුත්තේ. එම නිරීක්ෂණයෙන් එන තීන්දු හොඳද, නරකද කියන එක වෙනම දෙයක්. හැබැයි, ජනතාව තුළ අන් කවරදාටත් වඩා වැඩියෙන් අපේ රටේ දේශපාලනය පිළිබඳව කියවීමක් තිබෙනවා. ඔවුන් නිරීක්ෂණයකින් ඉන්නවා. ඒ ගැන තමුන්නාන්සේලා හොඳට මතක තබා ගන්න.

තමුන්නාන්සේලා ඇඳුම් මාරු කරනවා තමයි. තමුන්නාන්සේලා හිතනවා ඇඳුම් මාරු කර ගන්නේ, දොරගුළු ලා ගත් කාමරයක් තුළ කියලා. හැබැයි, තමුන්නාන්සේලා ඇඳුම් මාරු කර ගන්නේ වීදුරු කාමරයක ඉඳන්. මතක තබා ගන්න. තමුන්නාන්සේලා වීදුරු කාමරයක ඉඳන් තමයි මෙතෙක් කල් ඇඳුම් මාරු කර ගත්තේ කියන එක කල්පනා කරලා බලන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හොඳමයි, ගරු කථානායකතුමනි. දැන් සමහර අය හිතනවා, යටි ගේම්වලින්, යටි දේවල්වලින් මේවා වෙනස් කර ගන්න පුළුවන් කියලා. වෙනස් කර ගන්න බැහැ. ඒ නිසා ගරු කථානායකතුමනි, 2015 ජනවාරි මාසයේ 08 වැනි දා ලබා දුන් ජනවරම, මොන ආකාරයෙන් පිහිටා කටයුතු කරන්න සූදානම්ද කියන පණිවුඩය තමයි මේ පණිවුඩයෙන් දීලා තිබෙන්නේ. ඔළු ගෙඩි මාරු කරමින් කට්ටියක් එළියට ඇවිල්ලා, තව කට්ටියක් එකතු වෙලා, ඊට ප්‍රතිපක්ෂව තව කට්ටියක් අරගෙන කරන ඔළු ගෙඩි සෙල්ලම්වලින් ඒක හරි යන්නේ නැහැ. එය තමන්ගේ බල පොරය සඳහා පමණයි. මේකයි තිබෙන්නේ. දැන් එය මුළුමනින්ම අමතක කරපු - මම නම් දන්නේ නැහැ, නැවත ප්‍රතිසංස්කරණය කර ගන්න පුළුවන්ද කියලා. හැබැයි, අපි එක සහතිකයක් දෙනවා. එම ජනවරම වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ පෙනී සිටිනවා. ඒ සඳහා අවශ්‍ය වෙන ඕනෑම ක්‍රියාමාර්ගයකට මේ රටේ ජනතාවත් එක්ක පෙළ ගැහෙන්න ජනතා විමුක්ති පෙරමුණ සූදානම්, ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු නවින් දිසානායක ඇමතිතුමා.

[අ.භා. 5.24]

**ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் )
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, මෙවැනි අවස්ථාවක -නොයෙක් අදහස් හා මත තිබෙන වේලාවක- ජනවරම කියන්නේ මොකක්ද කියන එක ඉතාම වැදගත් කියා අපි විශේෂයෙන්ම සඳහන් කරන්න අවශ්‍යයි. එම නිසා දේශපාලනය කරලා තිබෙන පුද්ගලයෙක් වශයෙන්, දේශපාලනය දැනුත් කරන පුද්ගලයෙක් වශයෙන් සහ අනාගතයේත් දේශපාලනය කරන පුද්ගලයෙක් වශයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජයග්‍රහණය ගැන මම එම පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මාගේ සතුට ප්‍රකාශ කරනවා. ඒ මක් නිසාද කියා මා කියන්නම්. මා තරුණයකු හැටියට දේශපාලනය කරන කොට මගේ දිවංගත පියාණන් හා ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා අලුත් දේශපාලන ව්‍යාපාරයක් පටන් ගත්තා. එය "රාජාලියා" ලකුණ දරන "ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ" කියා හැඳින්වූ පක්ෂයයි. එතුමන්ලා මාස 18ක් මහන්සි වුණා; වැඩ කළා. එතුමන්ලා පැය 24න් පැය 18ක් ම දේශපාලනයයි කළේ. ප්‍රේමදාස මහතා කියන දැවැන්තයා එක්කයි සටන් කළේ. මාස 18ක් මැතිවරණවලට ලෑස්ති වෙලා අන්තිමට ඡන්ද ලක්ෂ 10යි හම්බ වුණේ. නමුත් තමුන්නාන්සේලා ඉතාම සුළු කාලයකින් "ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ" නමින් දේශපාලන ව්‍යාපාරයක් අලුතින් පටන් ගෙන ලබපු මේ ඡන්ද ප්‍රතිශතය ඉතාම ප්‍රශංසනීයයි කියා මම සිතනවා. ඒ වාගේම තමුන්නාන්සේලා සිතන්න එපා එය බහුතරයයි කියා. මා ඒකත් කියන්න ඕනෑ. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න කෝ. මට කතා කරන්න ඉඩ දෙන්න කෝ. සියයට 44.65 කියන්නේ සියයට 50 නොවෙයි. හිටපු ජනාධිපතිතුමා වන මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ චරිතයට, බාගවේලාවට එතුමාගේ ආකර්ෂණ බලයට ඒ ඡන්ද ටික ලැබෙන්න ඇති. අපගේ අඩු පාඩු නිසාත් ජනතාව ප්‍රතිචාර දක්වා

[ගරු නවින් දිසානායක මහතා]

තිබෙනවා. ඒ සියලු දේ ම මේ ප්‍රතිඵලය ඇතුළේ තිබෙනවා. මෙය තමුන්නාන්සේලා ලබපු විශාල ජයග්‍රහණයක් හැටියට හිතන්න එපා. මේ විධියටම අනෙක් පැත්තට ගහන්නත් පුළුවන්. ඒ මක් නිසාද කියා මා කියන්නම්. අපගේ එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද ප්‍රතිශතය 32.63යි; එක්සත් ජනතා නිදහස් සන්ධානය, සියයට 8.94යි; ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, සියයට 4.44යි; JVP එක, සියයට 6.27යි; ITAK එක, සියයට 3.07යි; මේ ඔක්කෝම ගෙන බැලුවාම, සියයට 55ක ඡන්ද ඔබතුමන්ලාට වැටිලා නැහැ. ඔහොම සතුටු වන කොට කරුණාකර ඒකත් පොඩ්ඩක් ඔළුවේ තියාගන්න.

විශේෂයෙන්ම නුවරඑළිය ජනතාවට මාගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. එම නගර සභාවේ කොට්ඨාස 13 ම අපි - එක්සත් ජාතික පක්ෂය - ජයග්‍රහණය කළා. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය සභා - විශේෂයෙන්ම සිංහල කොට්ඨාස - බහුතරයක් අපි ජයග්‍රහණය කළා. එතැනදීත් ඡන්දය විශ්ලේෂණය කරන කොට මා දැකපු දෙයක් තිබෙනවා. නුවරඑළියේ කඳපොළ හා සමර්හිල් ප්‍රදේශ ගැන ඔබතුමාත් දන්නවා, ගරු සී.බී රත්නායක මන්ත්‍රීතුමනි. එය, මාගේ දිවංගත පියාණන්ට ඉතාම කිට්ටු, මමත් අතිශයින්ම වැඩ කර තිබෙන කොට්ඨාසයක්. අපි එයට ඉතාම දක්ෂ තරුණයකු ඉදිරිපත් කළා. නමුත් ඔහු ඡන්ද 50කින් පැරදුණා, තමුන්නාන්සේලාට. ඒ වාගේ ධාරාවන් ගොඩක් තිබෙන මැතිවරණයක් හැටියට මෙවර මැතිවරණය හඳුන්වන්න පුළුවන්.

කරුණාකර මේ කාරණයත් මතක තබා ගන්න. ඇමෙරිකාවේ තිබෙනවා, - අනෙක් රටවලත් තිබෙනවා - midterm elections. ඒවා තමයි ආණ්ඩුව මනින මැතිවරණ. බොහෝ අවස්ථාවල midterm election එකේ ජය විපක්ෂයට යනවා; ඇමෙරිකාවේත් එහෙමයි. නමුත් හිටපු ජනාධිපතිවරයා ආයෙත් ජනාධිපතිවරණය ජයග්‍රහණය කරනවා. මේ වාගේ දේවලුත් වෙනවා. තමුන්නාන්සේලාගේ ජන වරම අපට තිබෙන මේ ජන වරම අහෝසි කරන ජන වරමක් හැටියට කරුණාකර මොහොතකටවත් හිතන්න එපා. එහෙම හිතන එක වැරැදියි; සදාචාරසම්පන්න නැහැ. ඔබතුමන්ලා ජයග්‍රහණයක් ලබාගත්තා; පළමුවන පාර්ශ්වය බවට පත් වුණා.

ඩොනල්ඩ් ට්‍රම්ප් මැතිතුමා ඉදිරිපත් වූ ජනාධිපතිවරණය ගැන නොයෙකුත් සමාජ විශ්ලේෂණයන් කර තිබුණා; opinion polls කර තිබුණා. එතුමා පැහැදිලිවම පරාජය වන බව තමයි ප්‍රකාශ කළේ. නමුත් ජනතාව දුන් තීන්දුව මොකක්ද? ජනතාවගේ කැමැත්ත තිබුණේ හිලරි ක්ලින්ටන් පරාජය කරලා ඩොනල්ඩ් ට්‍රම්ප් ජයග්‍රහණය කරවීමයි. ඔබතුමන්ලාත් එහෙමයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමා, ඔබතුමාට තවත් විනාඩි 3ක කාලයක් තිබෙනවා.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

ඔබතුමන්ලා සිතුවේ ජනාධිපතිවරණයෙන් රාජපක්ෂ මහතා අනිවාර්යයෙන්ම ජයග්‍රහණය කරනවා කියලායි. නමුත් අන්තිමට මොකක්ද වුණේ? ජනතාව තුළ තිබෙන හැඟීම්, ජනතාවගේ සිතුම් පැතුම් හරියටම මනින්න අපට අමාරුයි. නමුත් එකක් කියන්න පුළුවන්. අපේ මේ ඡන්ද බහුතරය පැහැදිලිව තමුන්නාන්සේලාට ලබා ගන්න බැරි වෙලා තිබෙනවා. ඉතින්, රටේ බහුතරයක් ඉන්නේ තමුන්නාන්සේලාත් එක්කයි කියා තමුන්නාන්සේලා කියන එක සදාචාරසම්පන්න නැහැ. ඒක වැරැදියි. නොයෙකුත් කාරණා නිසා, නොයෙකුත් හේතු නිසා තමුන්නාන්සේලාට මේ ඡන්ද ප්‍රමාණය ලැබී තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම කියන්න අවශ්‍යයි, අප නීතිය අනුව ක්‍රියා කරනවා කියා. අපි හිතනවා අපගේ අගමැතිතුමාට බහුතරයක් තිබෙනවා කියා. අදත් එහෙමයි. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(2) ව්‍යවස්ථාව යටතේ එතුමා අයින් කරන්න පුළුවන් වන්නේ, එතුමා එතුමාගේ කැමැත්තෙන් ඉල්ලා අස් වුණොත් හෝ එතුමාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය අහෝසි වුණොත් පමණයි. පැහැදිලිවම එතුමා බහුතරයක් තිබෙන අගමැති හැටියට ජනාධිපතිතුමා එතුමාව පත් කර තිබෙනවා.

බහුතරය නැහැ කියලා ඔබතුමන්ලා පෙන්වනතුරු එතුමා අගමැති. මේක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ. ඊයේ රෑ අපට ආරංචියක් ආවා, කැබිනට් මණ්ඩලය අහෝසි කරනවා කියලා ගැසට් එකක් ගහනවා කියලා. එහෙම ව්‍යවස්ථාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නැහැ. අද මම ඒක check කළා. එහෙම දෙයක් නැහැ. පැහැදිලිවම අපි හිතනවා, මේ ආණ්ඩුව ඉදිරියට ගෙන යන්න අපට සදාචාරය තිබෙනවා; ජන වරම තිබෙනවා; අපි ඒක කරනවා. අපගේ තිබෙන ගැටලු - ප්‍රශ්න- අපි විසඳනවා. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය දැවැන්ත ප්‍රතිසංස්කරණයකට ලක් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. අපි ඒක අනිවාර්යයෙන්ම කරනවා. අපි එහෙම කළේ නැත්නම් දේශපාලන වශයෙන් අපට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. අපේ අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා, මේ පරාජය විශිෂ්ට පරාජයක් කියලා. නමුත් 2010 අපි සියයට 29ට බැස්ස පක්ෂයක්. ඊට පසුව අපි පක්ෂය දවසින් දවස වැඩි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමා වේලාව අවසානයි. ඔබතුමාගේ කථාව දැන් අවසාන කරන්න.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

අපි හිතනවා, අපේ එක්සත් ජාතික පක්ෂයට තිබෙන ඡන්ද ප්‍රමාණය සියයට 35ක 40ක ඡන්ද ප්‍රතිශතයක් කියා. නොයෙකුත් කාරණා නිසා එක්සත් ජාතික පාක්ෂිකයන් අපේ පක්ෂයට මේ අවස්ථාවේ ඡන්ද ප්‍රතිශතය ලබා දුන්නේ නැත්තේ අපේම අඩු පාඩුකම් නිසා. අපි මේවා හදා ගන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මෙවැනි අවස්ථාවක. අපි ඉදිරියට යන ආණ්ඩුවක්. අපි කිසි දේකට බය නැහැ. අපි විශ්වාස කරනවා, බහුතරය අපට තිබෙනවා කියලා. අපි මේ සතියේම අපගේ බහුතරය තමුන්නාන්සේලාට ඔප්පු කරන්න ක්‍රියා කරනවා කියන එක මා පැහැදිලිව ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.31]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, ගරු නවින් දිසානායක ඇමතිතුමාගේ කථාව අනුව අපේ කොට්ඨාසවලින් කවුරුවත් දිනලා නැහැ. ඇයි?

ඒ දිනපු අයට වැඩිය  අනික් අයට ඡන්ද තියෙනවා. ඕක නම් තර්කය, ඡන්දයක් වුණාම ඒ ඡන්දයේදී දිනන අය ඊළඟට දිනන්න බැරිවුණු අනික් අයගේ ඡන්ද එකතු කරලා දිනපු එක්කෙනා පරාදයි කියනවා. ඔය ගණිත ක්‍රමය,- [බාධා කිරීමක්] නවීන් දිසානායක ඇමතිතුමනි, මට විනාඩි 8යි තිබෙන්නේ. - [*Interruption.*]  Help me out. I have to finish my speech. ඉතින් මම කියන්නේ ඔබතුමාගේ ගණිත ක්‍රමයයි, රාජිත සේනාරත්න ඇමතිතුමාගේ ගණිත ක්‍රමයයි ටිකක් එක වාගෙයි. මේක බලන්නේ ඉස්සරහ පැත්තේ ඉඳලා නොවෙයි, පස්ස පැත්තේ ඉඳලා. [බාධා කිරීම්] ඒකයි තමුන්නාන්සේලාගේ ක්‍රමය.

ඊළඟට මම කැමතියි, - [බාධා කිරීමක්] නැහැ, නැහැ, ඉස්සර කථා එපා. රාජිත සේනාරත්න ඇමතිතුමනි, තමුන්නාන්සේ පැත්තෙන් පැත්තට පැන පැන ගිහිල්ලා තිබෙන්නේ. [බාධා කිරීම්] තමුන්නාන්සේ ලෝකේ වටේ ගිහිල්ලා තිබෙනවා. තමුන්නාන්සේ ට්‍රම්ප්ගෙන් පටන්ගෙන ඉවර වෙන්නේ කෘසොප්ගෙන්. ඒකයි තමුන්නාන්සේගේ දේශපාලන ඉතිහාසය. අපේ එහෙම ඉතිහාසයක් නැහැ. [බාධා කිරීම්] අපි පැනපු ඉතිහාසයක් නැහැ. [බාධා කිරීමක්] අපි පැනපු ඉතිහාසයක් නැහැ. නින්දිතයි. [බාධා කිරීම්] අපි දෙන්නා ගැන කථා කර ගන්නේ නැතුව ප්‍රශ්නය ගැන කථා කරමු.  දැන් මේ ගොල්ල කියනවා, හොරකම් අල්ලන්න බැරුව ආණ්ඩුව ටිකක් ඔතැනිව සිටි නිසා තමයි මහජනයා ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දුන්නේ කියලා. හොරකම් අල්ලන්නට ඔතැනිවීම නිසා ප්‍රයෝජනයක් වූ හොරුන්යැයි නම් කරපු අය, ඒ අය දිනලා. [බාධා කිරීම්] ඒ අය දිනලා. අර හොරකම අල්ලන්නට ඔතැනි වූ අය, උන් පැරදිලා.[බාධා කිරීම්] මේක තවත් න්‍යායක්. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න මන්ත්‍රීතුමා. Do not disturb.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඊළඟට, මම එන්න කැමැතියි, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාවට. එතුමා කියනවා, "අනේ! මේ අස්ථාවරභාවය. අහෝ! මෙය අවසන් කරන්න; මේ ආණ්ඩුව අස්ථාවරභාවයෙන් මිදෙන්න; දෙගොල්ල එකතු වෙන්න." කියා. අනේ! ඒක තමයි කියන්නේ. අපි නම් කියන්නේ ඒක නොවෙයි. අහෝ! මේ ආණ්ඩුව වැටෙන්න; මේ ආණ්ඩුව කැඩෙන්න; රට ස්ථාවර කරන්න; රට ස්ථාවර කරන්න ඕනෑ නම් මේ ආණ්ඩුව කැඩෙන්න ඕනෑ. මේ ඡන්ද ප්‍රතිඵලයෙන් මේ ආණ්ඩුවට අපි කියන්නේ කරුණාකරලා පාර්ලිමේන්තුව විසුරුවා හරින්න. අපි එකතුවෙලා තුනෙන් දෙකක යෝජනාවක් සම්මත කරලා  මහ මැතිවරණයකට යමු. පුළුවන් නම් භාරකාර ආණ්ඩුවක් යටතේ. ඕනෑ නම් ඔයගොල්ලන්ගේම ආණ්ඩුව යටතේ වුණත් මහ මැතිවරණයකට යමු. ඒකයි අපේ ඉල්ලීම. ඒකයි අපි යෝජනා කරන්නේ. මම දන්නේ නැහැ, මේ ආණ්ඩුව සමාදාන කරන්න තියෙන රුදාව මොකක්ද කියලා.

අපට මේ ආණ්ඩුව කිව්වා, "අපේ එක මන්ත්‍රීවරයෙක් සිරිසේන මහත්තයාගේ ආණ්ඩුවට 'ජැක්' එක ගහන්න ගියා" කියලා. අනේ! නැහැ.  We wanted to divide the enemy and isolate the worst enemy -මේ අපේ සතුරා හැටියට හඳුනන මේ කඳවුර බෙදන්නත්, ඒ අතර පරම හතුරා තනිකරන්නත්- අන්න ඒ න්‍යාය අනුව තමයි අපි සිරිසේන මහත්තයාට කිව්වේ, "UNP නොවන ආණ්ඩුවක් ඔබතුමා පිහිටුවනවා නම්, අපේ සහයෝගය දෙන්න ලැහැස්තියි." කියලා. ඒක අපි අදත් කියනවා.

තිලංග සුමතිපාල මහත්තයා රාජිත සේනාරත්න ඇමතිතුමාට කට උත්තර නැති වෙන්න කිව්වා. ඇවිල්ලා කටේ උලලත් ගියා. එහෙම නේද? අපේ නියෝජ්‍ය කථානායක තිලංග සුමතිපාල මැතිතුමා අවංකව, ඍජුව යථා තත්ත්වය ප්‍රකාශ කිරීම ගැන අපි සතුටු වනවා. ඒ එක්කම අපි කියන්නට ඕනෑ, ඒ තත්ත්වයට මුහුණ දෙන්න බැරිව ගලේ පහරපු බළල්ලු වාගේ මේක වහ ගන්න හදන දැඟලිල්ල අපට ඉතාම පැහැදිලියි කියා. ඒ වුණාට කමක් නැහැ. දැන් ඉතින් පරාජය වෙලා, පොට්ට වෙලා ඉන්න තත්ත්වය තුළ මොකක් හෝ කරන්න ඕනෑ. දත් කූරු විකන්නවත් ඕනෑ.  අද ඒක තමයි තමුන්නාන්සේලා කරමින් ඉන්නේ.

ගරු කථානායකතුමනි, "ජනවරම" කියන එකට තිබෙන්නේ එක අර්ථයයි. ඒ තමයි "mandate". ජනවරමක් නැති ආණ්ඩුවක් තිබෙන්න පුළුවන්ද? මේ ජනවරම 2015 වර්ෂයේ දී ලැබුණේ. 2015 වර්ෂයේදී ලැබුණු ජනවරම නැවත පරීක්ෂණයට ලක් වුණේ, 2018 වසරේදී. ඒ පරීක්ෂණයේදී ජනවරමට මොකද වුණේ? ජනවරම හැලුණා. දැන් ඒ හැලුණු ජනවරම ඉදිරියේ මේ ආණ්ඩුවට පවතින්න තිබෙන පදනම කුමක්ද? ඒකයි අප අහන්නේ. අපට කමක් නැහැ පවතින්න පුළුවන් නම්, පුළුවන් හැටියට try කරලා බලන්න. නමුත්, මේ රටේ මේ සා විශාල ජනබලයක් විරුද්ධව සිටිද්දී මේ ආණ්ඩුව පවත්වාගෙන යන්න උත්සාහ කළොත් මේ රටත් අස්ථාවරයි කියලා මතක තියා ගන්න. මේ ආණ්ඩුවට ඒ අනතුර අපි මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ඊළඟ කරුණට එන්න මම කැමැතියි. පළාත් පාලන ආයතනවල වැඩ කරවා ගන්න නම්,"අපට ඡන්දය දෙන්න." කියලා කිව්වා. අපි කවුරුත් දන්නවා ආණ්ඩු බලය තිබෙන අය පළාත් පාලන ඡන්දත් දිනනවා කියලා. ඒ කොහොමද? ආණ්ඩුවත් එක්ක හිටියොත් තමයි අපට අපේ පළාතේ වැඩ කර ගන්න පුළුවන් කියලා, එහෙම හිතා ඡන්දය දෙන්න ජනතාව පොලඹවා ගන්න කොච්චර කැස කැවුවාද? ආණ්ඩු බලය තිබෙද්දිත් පළාත් පාලන ඡන්දයක මේ විධියට නිර්භීතව ඡන්දය දුන්නු ජනතාවට අපේ ප්‍රණාමය අපි පළ කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මාත් එක්ක මගේ නෝනා තරහා වෙලා යනවා. දික්කසාද නඩුවට ගියාම මම කියනවා, "අපේ නෝනා මාත් එක්ක හිටියේ නැති කාලයත් මාත් එක්ක හිටියා වාගේ සලකන්න." කියලා. ඉතින් මේක නේ මේ වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත වේලාව අවසන්වී ගෙන එනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ පක්ෂයට දුන්නු ඡන්ද; ආණ්ඩුවට විරුද්ධව දුන්නු ඡන්ද ආණ්ඩුවට දුන්නු ඡන්ද හැටියට සලකන්න ලු. මේ කියන්නේ, නෝනා පිට ගිය කාලයත් මාත් එක්ක හිටපු කාලය හැටියට සලකන්න කියලායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේක ජාතික විශ්වාසභංගයකින් ඉල්ලා අස්වෙලා -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

මීළඟට, ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට කථාව කරන්න ඉඩ දෙන්න. Order, please! මේ ගරු සභාවේ කාටත් කථා කිරීමේ අයිතිය තිබෙනවා.

[අ.භා. 5.39]

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
ගරු කථානායකතුමනි, පැවැති පළාත් පාලන මැතිවරණයේදී ජනතාව පණිවුඩ දෙකක් දීලා තිබෙනවා. එක පණිවුඩයක් දීලා තිබෙන්නේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට; අනෙක, මේ රජයට. මහින්ද රාජපක්ෂ මැතිතුමාට ජනතාව දීපු පණිවුඩය තමයි, "ඔබ තවමත් එදා මෙන්ම ප්‍රතික්ෂේපයි" කියන එක. [බාධා කිරීම්] ඇයි ඒ? [බාධා කිරීම්] කොහොමද, ඒ පණිවුඩය දීලා තිබෙන්නේ? එදා ජනාධිපතිවරණයේදී එතුමා ලබාගත් ඡන්ද ප්‍රතිශතය 47.6යි. හැබැයි, මෙම පළාත් පාලන මැතිවරණයේදී එතුමාගේ පක්ෂය ලබාගත් ඡන්ද ප්‍රතිශතය 44.6යි. සියයට තුනක් අඩු වෙලා. ඒ කියන්නේ, "ඔබ තවමත් එදා මෙන්ම ප්‍රතික්ෂේපයි" කියන එක. එතුමා එදා ජනාධිපතිවරණයේදී 47.6ක ඡන්ද ප්‍රතිශතයක් අරගෙන, මේ මැතිවරණයේදී සියයට 44.6ක් ගත්තා. සියයට 3ක් අඩුයි. ඒක තමයි ඒ පණිවුඩය. හැබැයි, එලෙසම පණිවුඩයක් දීලා තිබෙනවා, අපටත්. ඒ මොකක්ද? 2015 ජනවාරි 08වැනි දා අපි ජනතාවට පොරොන්දු වුණා, "දූෂිතයන්ට දඬුවම් දෙනවා, හොරුන්ට දඬුවම් දෙනවා" කියලා. අන්න ඒක අපට කරන්න බැරි වුණා. [බාධා කිරීම්] ජනතාව අපට පණිවුඩය දීලා තිබෙන්නේ ඒ කටයුතු ඉක්මන් කරන්න කියලා. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, කථා කිරීමේ අයිතිය නැති කරන්න එපා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඒ කටයුතු ඉක්මන් කරන්න කියන පණිවුඩය අපට දීලා තිබෙනවා. අද "ලංකාදීප" online edition එකේ සඳහන්ව තිබෙනවා, "අල්ලස් කොමිසමෙන් විමල්ට නඩු පවරයි" කියලා. කෝටි 71ක් කොහොමද හම්බ කර ගත්තේ කියලා හොයා ගන්න බැරිව, මෙන්න නඩු පවරලා. මෙන්න මේවා සම්බන්ධයෙන් කටයුතු කරන්න තමයි ජනතාව ඉල්ලන්නේ. අපට ජනතාව දීපු පණිවුඩය තමයි, "ඔයගොල්ලෝ අපට දුන්නු පළමුවැනි පොරොන්දුව ඉෂ්ට කරලා නැහැ. මෙන්න මේක ඉෂ්ට කරන්න" කියා ජනතාව අපට මේ දීපු පණිවුඩය, අපි ඉක්මනින් ඉෂ්ට කරනවා. ඒක නිසා ඊළඟ රැස්වීම් සතියේ මේ පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් වනවා, අලුත් උසාවි තුන පිහිටුවන්න. ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් වෙලා උසාවි තුන පිහිටෙව්වාට පස්සේ මේ කටයුතු ඉක්මන් වනවා. මේ කටයුතු කරන්න කියලා තමයි ජනතාව ඉල්ලන්නේ. මේ, ජනතාව බලාපොරොත්තු වන දේවල්.

මම පසුගිය දිනක "හිරු" නාලිකාවේ වැඩසටහනකට සහභාගි වුණා. ඒකට ඇවිල්ලා සිටිය ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරයා කිව්වා මට මතකයි, "මේක ජනමත විචාරණයක් බවට පත් කර ගන්නවා" කියලා. මම කිව්වා, "බොහොම හොඳයි. ජනමත විචාරණයක් බවට පත් කර ගන්න. සියයට 50කට වැඩිය ඡන්ද ගන්න. එතකොට අපට පුළුවන් ජනතාව කොයි පැත්තේද ඉන්නේ කියලා දැන ගන්න" කියලා. දැන් මොකද වෙලා තිබෙන්නේ? ජනමත විචාරණයක් බවට පත් කර ගත්තොත් දෙපැත්තක් තිබෙනවා. කට්ටියක් කියනවා, "ඔව්" කියලා. අනෙක් කට්ටිය කියනවා, "නැහැ" කියලා. ඒ ජනමත විචාරණයේ ඡන්ද ප්‍රතිශතය 47.3යි. සියයට 50යි එක ඡන්දයක් ගත්තද? මේක තේරුම් ගන්න බැරි නම්,- [බාධා කිරීම්] මොකද මේ කෑ ගහන්නේ? [බාධා කිරීම්] කොයි රටේද, කොයි ලෝකයේද, පළාත් පාලන මැතිවරණයක් පැරදිලා ආණ්ඩු වෙනස් වනවා කියලා තිබෙන්නේ? කොයි ලෝකයේද, එහෙම තිබෙන්නේ? දැන් කියනවා, ආණ්ඩුවට යන්න ලු. මේගොල්ලෝ ව්‍යවස්ථාව දන්නේත් නැහැ. ආණ්ඩුවට යන්න කියනවා නම්, අගමැතිතුමා ඉවත් වන්න ඕනෑ නම් ව්‍යවස්ථානුකූලව ක්‍රියා කරන්න තිබුණා නේ. අගමැතිතුමා අයින් කරන්න ක්‍රම තුනයි තිබෙන්නේ. ඒ තමයි, අගමැතිතුමා ඉල්ලා අස් වෙන්න ඕනෑ; එහෙම නැත්නම්, පාර්ලිමේන්තුවට විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න ඕනෑ; එහෙමත් නැත්නම්, අය වැය පරදින්න ඕනෑ. මේ ක්‍රම තුනෙන් තමයි අගමැතිතුමා හෝ ආණ්ඩුව වෙනස් වෙන්නේ. ඇයි විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නේ නැත්තේ? අද ගෙනෙන්න තිබුණා නේ. අද ගෙනැල්ලා පරාජය කරන්න තිබුණා නේ. ආණ්ඩුව ඉවත් වන්න ඕනෑ කියනවා. හැබැයි, විශ්වාස භංගය ගෙනෙන්නේ නැහැ. විශ්වාස භංගය ගෙනෙන්නේ නැහැ; භයයි. ඒක ගැන කථා කරන්නේ නැහැ. දැන් ගොළුවෝ වාගේ ඉන්නවා. ඔය කෑ ගහන අය කෑ ගහලා කියන්න එපායැ, "අපි විශ්වාස භංගයක් ගෙනෙනවා. හෙට අනිද්දා ගෙනෙනවා" කියලා. කෝ? ඒක කරන්න බැහැ.

අද එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු ජනාධිපතිතුමාත් එක්ක තීන්දුව දුන්නා. දැන් ඊට පස්සේ කරන්න දෙයක් නැහැ. වෙන මුකුත් නොවෙයි, මේ රට අස්ථාවර කරන්න යන්නේ. අපි දන්නවා, මෙතුමන්ලා කවදාකවත් ආණ්ඩුව ගන්න හදන්නේ නැහැ. මෙතුමන්ලාට ආණ්ඩුව ගන්න බැහැ; අරගෙන කරන්නත් බැහැ. අපි කෙරුවාට එතුමන්ලාට ඒක කරන්න බැහැ. ඒගොල්ලෝ ඒක දන්නවා. ඒක නිසා මේ ආණ්ඩුව ගන්නේ නැහැ. ඒ ගොල්ලෝ බලාපොරොත්තු වනවා, 2020දී ආණ්ඩු බලය ගන්න. 2020දී මොකද වෙන්නේ කියලා අපි බලමු. මේ ප්‍රතිඵලය මීට වඩා වැඩි වෙන්නේ කොහොමද කියලා අපි බලමු. එදා ජනාධිපතිවරණයේදී අපත් සමඟ සිටි ලක්ෂ 62 අදත් අපත් සමඟ ඉන්නවා. ඡන්ද ටික එකතු කරලා බලන්න. ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර මන්ත්‍රීතුමා කිව්වේ මොකක්ද? "මේ රට ස්ථාවර කරන්න. ආණ්ඩුව ස්ථාවර කර ගන්න" කියලායි. අපි ආණ්ඩුව ස්ථාවර කරමින් යනවා. 2015දී අපට ලක්ෂ 62ක් ඡන්දය දීලා තිබෙනවා. මෙතුමන්ලාට විරුද්ධව මෙවරත් ලක්ෂ 62ක් ඡන්දය දීලා තිබෙනවා. මේ පළාත් පාලන ආයතන 340න් හෙට අනිද්දා වෙද්දි ඔබතුමන්ලාට පිහිටුවන්න පුළුවන් කීයද කියලා බලන්න. ඔබතුමන්ලාට තනියෙන් පිහිටුවන්න පුළුවන් වන්නේ, 150කටත් අඩු ප්‍රමාණයක්. අපි දෙගොල්ලෝ එකතු වෙලා ඊට වැඩි ප්‍රමාණයක් පිහිටුවනවා. එතකොට ඔබතුමන්ලාට තේරෙයි මේ රටේ ජනතාව දුන් පණිවුඩය මොකක්ද කියලා. මාර්තු මාසය

වෙද්දි පළාත් පාලන ආයතන 200කට ආසන්න ප්‍රමාණයක් අපි අනිවාර්යයෙන්ම පිහිටුවනවා. [බාධා කිරීම්] එහෙම වුණාම, "ජන බලයට මොකක්ද වෙලා තිබෙන්නේ?" කියයි. ඊට පස්සේ කියයි, "මේ ඡන්ද ක්‍රමය වැරදියි" කියා. මේ ඡන්ද ක්‍රමයට පාර්ලිමේන්තුවේ සියල්ලම එකතු වෙලා ඡන්දය දුන්නා. ඡන්දය දීලා, මේ මැතිවරණ ක්‍රමය අනුමත කර ගත්තා. දැන් කියනවා, "ඡන්ද ක්‍රමය වැරදියි" කියලා. මේක හොඳට මතක තබා ගන්න. ජනතාව අපට යම්කිසි සංඥාවක් දීලා තිබෙනවා. ඒ තමයි, "මේ ආණ්ඩුව හරියට හදාගෙන යන්න. මේ ආණ්ඩුව හරියට හදාගෙන ගියොත් 2020 ජනාධිපතිවරණයේදී අපි ඔබලාගේ ජනාධිපතිවරයෙක් පත් කරනවා" කියලා අපට සංඥාවක් දීලා තිබෙනවා.

මේ මැතිවරණයේදී මෙහෙම වුණු එක හොඳයි. මොකද, එවිට අපට අපේ වැරදි හදා ගන්න පුළුවන්; වැරදි හදාගෙන ඉදිරියට යන්න පුළුවන්. ජනතාව මේවා ගැන හොඳට දන්නවා. 2015 ජනවාරි 08 වන දා සහ අගෝස්තු 17 වන දා පැවැති මැතිවරණ දෙකම අපි දිනුවා. හැබැයි, අපි කවදාවත් කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පින්තූරය තිබෙන බෝඩ් ගැලෙව්වේ නැහැ; දැනට පාර්ලිමේන්තු මන්ත්‍රීකමක් නැති බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ පින්තූරය තිබෙන බෝඩ් ගැලෙව්වේ නැහැ. නමුත් මේ මැතිවරණය දිනුවා කියලා, අන්න දැන් නුවරඑළියේ අපේ දෙමළ ජනතාවට ගහනවා; කලවානේ ජනතාවට ගහනවා. අපේ ආසනවල බෝඩ් කඩනවා, මේ සුළු ජයග්‍රහණය නිසා. පළාත් පාලන ආයතනයක් ජයග්‍රහණය කරලා, අපි අර සංවර්ධන කටයුතු වෙනුවෙන් ගහලා තිබෙන බෝඩ් ටික කඩනවා; ගිනි තියනවා. නුවරඑළියේ දෙමළ මිනිසුන්ට ගහනවා; ජනතාවට ගහනවා. මේ, පොඩි මැතිවරණයක් ජයග්‍රහණය කළා කියලා. මහ මැතිවරණයක් ජයග්‍රහණය කළොත් කොහොම වෙයිද? මේ පණිවුඩය ජනතාව දැන ගන්න ඕනෑ. අපි මැතිවරණ දෙකක් ජයග්‍රහණය කරලා, මේ රටේ යම් කිසි දේශපාලන සංස්කෘතියක් ඇති කළා. දැන් ඒ දේශපාලන සංස්කෘතිය නැති කරන්න හදනවා. ජනතාව මේවා හොඳට හිතේ තියාගෙන ඉන්නවා. ජනතාව ඒ අවස්ථාව ලබා දෙයි. ජනතාව හොඳ අවස්ථාවක් ලබා දුන්නා, මේ මැතිවරණයේ ප්‍රතිඵල තුළින්.

2020 ජනාධිපතිවරණයේදී අනිවාර්යයෙන්ම එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ මේ රජයේ අපේක්ෂකයා ජයග්‍රහණය කරවීමේ ප්‍රතිඵලයක් තමයි මේ ලැබී තිබෙන්නේ. ඒ නිසා ජනතාව අපට හොඳ අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. ඒ අවස්ථාවෙන් අපි ප්‍රයෝජන ගන්න ඕනෑ. ඒ නිසා අපි ජනතාවට දීපු පොරොන්දු ඉෂ්ට කරන්න ඕනෑ. පළමුවන පොරොන්දුව තමයි දූෂිතයින්ට දඬුවම් කිරීම. මේ මන්ත්‍රීතුමාගේ නඩුව කල් ගිහිල්ලා තිබෙන්නේ, මැයි මාසයට. එහෙම වෙන්නේ මොකද? අපට අවශ්‍යයි, මේ නඩු ටික අවුරුද්දක් ඇතුළත අවසන් කරන්න. අවුරුද්දක් ඇතුළත අවසන් කළාම, ජනතාව බලාපොරොත්තු වූ දේ අපි ලබා දුන්නා වෙනවා. අපි ඒක අනිවාර්යයෙන්ම කරනවා. ඒ වාගේම අපි අපේ රටේ ජනතාවට ලබා දුන් ප්‍රතිලාභ විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා පිළිබඳව ජනතාවට සන්නිවේදනය වීමේදී යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය ගැනත් අපි බලන්න ඕනෑ. අපි ගරු අග්‍රාමාත්‍යතුමා සමඟත්, අතිගරු ජනාධිපතිතුමා සමඟත් සාකච්ඡා කරලා, ඒ සන්නිවේදනය-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වෙලාව අවසන් වෙමින් පවතිනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
හොඳට මතක තබා ගන්න, මේ මැතිවරණයෙන් ලබා දුන්නේ, ඔබ තවමත් එදා මෙන්ම ප්‍රතික්ෂේපයි කියන පණිවුඩය බව. ඒ වාගේම අනිවාර්යයෙන්ම මතක තබා ගන්න, ඊළඟ ජනාධිපතිවරණය ජයග්‍රහණය කරන්නේ අපේ රජයේ මූලිකත්වයෙන් බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

මීළඟට, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.47]

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, මෙවර මැතිවරණයේදී නොයෙක් බාධක මධ්‍යයේ, මැතිවරණ අල්ලස් මධ්‍යයේ පොහොට්ටුවට ඡන්දය දීපු සියලුදෙනාට අපි ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද අපි දැක්කා, අපේ ගම්වල ජනතාවට නොදීපු දෙයක් නැති බව. - දිලිප් වෙදආරච්චි මැතිතුමාත් මේ අවස්ථාවේදී ගරු සභා ගැබේ ඉන්නවා. - ඒ ජනතාවට නොදීපු දෙයක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරයා වංගෙඩියක් දුන්නාම, ඒක බලාගෙන ඉඳලා එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරයා මෝල් ගහක් ගිහිල්ලා දුන්නා. ඒක ආරංචි වුණාට පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනාට පහුවදාට මෙට්ටයක් ගිහිල්ලා දෙනවා. ඒක ආරංචි වුණාම එක්සත් ජාතික පක්ෂයේ කෙනාට කොට්ටයක් ගිහිල්ලා දෙනවා. අන්තිමට ඊට පහුවදා උදේ ඇවිල්ලා කියනවා, "නැන්දේ, දැන් ඩෙංගු තිබෙනවා, මෙන්න නෙට් එකක්" කියලා. ඉතින් මේක තමයි ලංකා දේශපාලන ඉතිහාසයේ මැතිවරණ නීති රීති වැඩිපුරම උල්ලංඝනය කළ මැතිවරණය; මැතිවරණ නීති අමු අමුවේ උල්ලංඝනය කළ මැතිවරණය. හැබැයි, බහුතරයක් ජනතාව ඔප්පු කළා, බඩු බෙදලා, සල්ලි දීලා ඡන්ද ගන්න බැහැයි කියන එක.

ගරු කථානායකතුමනි, මට දැන් මේ ආණ්ඩු පක්ෂය - විපක්ෂය මොකක්ද කියලා හොයා ගන්න බැරුවයි ඉන්නේ. මොකද, දැන් මේ කොනෙන් පටන් ගත්තාම, දෙමළ ජාතික සන්ධානයෙන් පටන් ගත්තාම, මේ සියලු දෙනාගේම ඡන්ද ටිකයි, ස්වාධීන කණ්ඩායමේ ඡන්ද ටිකයි, අහම්බෙන් එහෙන් මෙහෙන් ආපු, reject වුණු ඡන්ද ටිකයි සියල්ලම එකතු කරලා කියනවා, "මෙන්න අපේ කණ්ඩායම මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කණ්ඩායමට වඩා ඡන්ද ගත්තා" කියලා. හරි, ඔබතුමන්ලාගේ තර්කය ඒක. දැන් බලනකොට මෙතැන ඉඳලා මේ වටේම ඉන්නේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු. එහෙම ඉඳලා කියනවා, "ඔන්න අපි සියල්ලෝම එකතු වෙලා මහින්දට වඩා, පොහොට්ටුවට වඩා ඡන්ද ගත්තා" කියලා. මෙයින් අනෙක් පැත්තෙන් පෙන්වන්නේ මොකක්ද? අද වනකොට ඔබතුමන්ලාට බැරි වෙලා තිබෙනවා, ඔබට විරුද්ධව ජනමතය පාවිච්චි වුණේ ඇයි කියන එක තේරුම් ගන්න. රාජිත සේනාරත්න ඇමතිතුමා අපට චෝදනා කරනවා, අපි ආණ්ඩුවක් ගන්න ලැහැස්ති වුණා කියලා. නැහැ. මේ ජැක් ගහන -මුක්කු ගහන- ආණ්ඩුවලට සම්බන්ධ වෙන්න අපි ලැහැස්ති නැහැ. අපි ඒ ගැන පළමුවන දවසේම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළා. හැබැයි මේ ජනමතය, ආණ්ඩු

[ගරු නාමල් රාජපක්ෂ මහතා]

පෙරළන ජනමතයක් නොවෙයි කියලා ඔබ කියනවා. මතක තබා ගන්න, ජනතාවගෙන් සියයට 80ක් ඡන්දය පාවිච්චි කළා. සියයට 80ක්! ගරු කථානායකතුමනි, ඉතිහාසයේ කවදාවත් ප්‍රාදේශීය සභා මැතිවරණයකදී සියයට 80ක් ඡන්ද භාවිත වෙලා නැහැ. ඉතිහාසයේ පළමු වතාවට ප්‍රාදේශීය සභා මැතිවරණයකදී ආණ්ඩුවට විරුද්ධව ජනතාව ඡන්දය පාවිච්චි කළා.

එහිදී විපක්ෂය ජයග්‍රහණය කළා. එහෙම නම්, මේ සභා ගර්භයේ සිටින තමුන්නාන්සේලා ඇතුළු සියලුම ආසන සංවිධායකවරුන්ගේ ඡන්ද ටික ගණන් කරලා මහින්දට වඩා අපේ ඡන්ද වැඩියි කියලා හිත හදා ගන්න පුළුවන් කාරණයක් නොවෙයි, මේ ජන මතය. ඔබතුමන්ලා දැන්වත් මේ රටේ ජනතාවට තිබෙන ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරයි කියලා අපි විශ්වාස කළා. හැබැයි, මොකක්ද වුණේ? මැතිවරණ ප්‍රතිඵලය ඇවිල්ලා පැය 24ක් යන්න කලින් එක්සත් ජාතික පක්ෂය කිව්වා, අපි දැන් අපේ නායකයා මාරු කරන්න ඕනෑය කියලා. අපට ප්‍රශ්නයක් නැහැ, ඔබතුමන්ලා නායකයාත් එක්ක ඕනෑ සෙල්ලමක් කර ගන්න. හැබැයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයාවත් වාඩි කරවා ගෙන එක්සත් ජාතික පක්ෂයේ නායකයාට කියනවා, "ඔබතුමා දැන් එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයෙන් අයින් වෙන්න" කියලා. අනික් පැත්තෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා වාඩි වෙලා කියනවා, "එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය වෙනස් වන්න ඕනෑ"ය කියලා. එක්සත් ජාතික පක්ෂයේ අය කියනවා, "සියයට 13ක්, 15ක් ඡන්ද ගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා වන ඔබතුමා කොහොමද කියන්නේ අපේ නායකයා අයින් කරන්න" කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක් තිබෙනවා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
හොඳයි, ගරු කථානායකතුමනි.

මේ ජන මතය කියන දේ ඔබතුමන්ලාට දැනුණා නම්, මේක පක්ෂයක් ඇතුළත බල අරගළයක් බවට පරිවර්තනය කර ගත්තේ ඇයි? මැතිවරණ කාල සීමාව තුළ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්තයා මොකක්ද කිව්වේ? "96දෙනා එන්න, මගේ දොරකඩ හිටගන්න, මා ආණ්ඩුව හදනවා" කිව්වා. ඔන්න අපි කිව්වා, "අපට තනතුරු -ධානාන්තර- එපා" කියලා. විපක්ෂයක් කවදාවත් ආණ්ඩුවකට මෙහෙම කියනවාද? තනතුරු -ධානාන්තර- මොකුත් එපා, ඔබතුමන්ලා ආණ්ඩුවක් පිහිටුවනවා නම්, රට ගැන හිතා අපි අවශ්‍ය වෙලාවට සහයෝගය දෙනවා කියන යෝජනාව අපි ඉදිරිපත් කළා. හැබැයි, අපි ඒ ආණ්ඩුවට ජැක් ගහන්න ගියේ නැහැ. අපි කිව්වා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් හදන්න කියලා. මොකද, කරු ජයසූරිය මහත්තයා අගමැති කරනවාද, එක්සත් ජාතික පක්ෂයෙන් වෙන කෙනෙකු අගමැති කරනවාද කියන එක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයාගේ කාර්යයක් නොවෙයි. අපි කිව්වා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කෙනෙකු අගමැති කරන්න, අපි කොන්දේසි විරහිතව විපක්ෂයට වෙලා උදව් කරන්නම් කියලා. හැබැයි, ඒකෙන් කියන්නේ නැහැ, අපි ආණ්ඩුවට ගිහිල්ලා මුක්කු ගහනවා කියලා. හැබැයි, අද වනකොට දවස් 10ක් ගත වෙලාත් මේ රටේ ආණ්ඩුව කරන්නේ කවුද කියන එක පිළිබඳව තීන්දුවක් ගන්න බැරිව ආණ්ඩුව දෙපැත්තට වෙලා ඉන්නවා.

දැන් බලන්න, තිලංග සුමතිපාල මහත්තයා ඊයේ රෑ එකක් කියනවා. ඒක එනවා, SMS එකකින්. අද උදේ පාන්දර මහින්ද අමරවීර ඇමතිතුමා තව එකක් කියනවා. අනික් පැත්තෙන් එක්සත් ජාතික පක්ෂයෙන් තව එකක් කියනවා. මා දැක්කා, රාජිත ඇමතිතුමා මාධ්‍ය සාකච්ඡාවකට ගිහිල්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් නාම යෝජනා දීපු කෙනෙකුට පොහොට්ටුවෙන් නාම යෝජනා දුන්නා කියලා කෑ ගහනවා. මාධ්‍යවේදියා කියනවා, "නැහැ, එම පුද්ගලයා පොහොට්ටුවේ නොවෙයි, බුලත් කොළයේ" කියලා. ගරු කථානායකතුමනි, මේ දෙගොල්ලන්, තුන්ගොල්ලන් දෙපැත්තකට තුන්පැත්තකට ඇද ගත්තාම මේ රට කොහේද යන්නේ?

විපක්ෂ නායකවරයා කියනවා, පොහොට්ටුව ජාතිවාදය ඇවිස්සුවා කියලා. පොහොට්ටුව ජාතිවාදයක් ඇවිස්සුවේ නැහැ. ජාතිවාදය ඇවිස්සුවේ දෙමළ ජාතික සන්ධානය. දෙමළ ජාතික සන්ධානය තමයි යාපනයට ගිහිල්ලා කිව්වේ ව්‍යවස්ථාවේ තිබෙනවාට වඩා එහාට ගිහිල්ලා අපි බලය බෙදා ගන්නවා කියලා. ඒක federal කිව්වා. ඒකට ආණ්ඩුව එකඟ වුණාය කියලා කිව්වේ කවුද? අපි නොවෙයි, ගරු කථානායකතුමනි. ඒක කිව්වේ සුමන්තිරන් මන්ත්‍රීතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අවසන් කරන්න.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ඒක කිව්වේ සුමන්තිරන් මන්ත්‍රීතුමා. ඒකට පිළිතුරක් දෙන්න අපට වග කීමක් තිබෙනවා. අපි ඒකට පිළිතුරක් දුන්නා. හැබැයි, ඒකට පිළිතුර දීම ජාතිවාදය ඇවිස්සීම නොවෙයි, ගරු කථානායකතුමනි. අපි ආණ්ඩුවට යෝජනා කරන්නේ මේකයි. ජැක් ගහමින්, මුක්කු ගහමින් තව දුරටත් ඔබතුමන්ලාට ඔය ආණ්ඩුව කර ගෙන යන්න බැහැ. අවුරුදු 10ක් රුපියල් 350ට පොහොර දීපු මහින්ද රාජපක්ෂ මහත්තයා හිරේ දමපු නැති හින්දා තමයි ගොවියා ඔබතුමන්ලාට ඡන්දය නොදුන්නේ කියලා ඔබතුමන්ලා හිතනවා නම්, අවුරුදු 30ක යුද්ධයක් අවසන් කරපු මහින්ද රාජපක්ෂ මහත්තයාගේ පවුලේ අය හිරේ දමපු නැති හින්දා තමයි ජනතාව ඔබතුමන්ලාට ඡන්දය නොදුන්නේ කියලා ඔබතුමන්ලා හිතනවා නම්, ඔබතුමන්ලාට වැරදිලා. ජන මතය තේරුම් ගන්න. ඔච්චර අපට අභියෝග කරන්න දෙයක් නැහැ. ගරු කථානායකතුමනි, සංඛ්‍යා ලේඛන අනුව අපට ජන මතය වැඩි නම්, පාර්ලිමේන්තුව විසුරුවා මහ මැතිවරණයකට ගිහිල්ලා බලමු, ජන මතය කොහේද තිබෙන්නේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක් තිබෙනවා.

[අ.භා. 5.53]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තූතියි, ගරු කථානායකතුමනි.

අද අපේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කළා, වර්තමානයේ දැවැන්ත දේශපාලන අර්බුදයක් තිබෙනවා කියලා. ගරු කථානායකතුමනි, මේ දැවැන්ත අර්බුදය ඇති වුණේ කොහොමද? පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵලයත් එක්ක ඒකාබද්ධ විපක්ෂයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කණ්ඩායම බහුතර ඡන්ද ප්‍රමාණයක් ගත්තාම මේ ගොල්ලන් ඒක නිර්වචනය කළා, දැන් ඔවුන්ට ආණ්ඩු බලය ලබා ගන්න පුළුවන් කියලා. ඒ ආණ්ඩු බලය ලබා ගැනීමේ ක්‍රියා පරිපාටිය උඩ තමයි මේ අර්බුදය නිර්මාණය කළේ. 2015දී ජන මතය ලැබුණු ආණ්ඩුවක් පාර්ලිමේන්තුව තුළ ඔළු ගෙඩි මාරු කරලා වෙනස් කරන්න පුළුවන්ද කියලා උත්සාහයක් කළා. පාර්ලිමේන්තුව තුළ ඔළු ගෙඩි මාරු කරලා මන්ත්‍රීවරුන්ට මුදල් දීලා එහෙම නැත්නම්, වෙනත් යම් යම් දේවල් ලබා දීලා තමන්ගේ පැත්තට මන්ත්‍රීවරු ටික හරවා ගෙන බලය අල්ලන්න පුළුවන්ද කියන යම් අදහසක් මත සතියක කාලයක් ගෙව්වා. ඒ නිසා තමයි ගරු කථානායකතුමනි, මේ දේශපාලන අර්බුදය නිර්මාණය කළේ. මේ අර්බුදය නිර්මාණය කළේ අපි නොවෙයි. මේ දැවැන්ත අර්බුදය නිර්මාණය කළ අයම තමයි අද මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. එහෙම නැත්නම් මේ යෝජනාව ගේන්න ඕනෑ නැහැ. පළාත් පාලන ඡන්දය තිබ්බා; ප්‍රතිඵල ආවා. ඒ ප්‍රතිඵලය අපි සියලුදෙනාම පිළිගන්නවා. ඒ තුළින් පාර්ලිමේන්තුවේ සංයුතිය වෙනස් වෙලා නැහැ; පාර්ලිමේන්තුවට දීපු ජන මතය වෙනස් වෙලා නැහැ. මේ පාර්ලිමේන්තුව අවුරුදු පහක් දුවනවා. ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අනුමැතිය තිබෙනවා. එම නිසා පාර්ලිමේන්තුවේ කාලය අවසාන වෙලා නැති නිසා කිසිම අර්බුදයක් නැහැ. අර්බුදය නිර්මාණය කළේ කවුද? අර්බුදය නිර්මාණය කළේ තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා කෙටි මාර්ගයකින් බලය ලබාගන්නට ගියා. තමුන්නාන්සේලා පසුගිය කාලයේ හොරා කාපු සල්ලි දීලා, සන්තෝසම් දීලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ව බිලි බා ගන්නට බැලුවා. ඒ තුළ තමයි මේ අර්බුදය නිර්මාණය වුණේ.

ගරු කථානායකතුමනි, අනෙක් කාරණය තමයි මැතිවරණය. මට කලින් කථා කළ මන්ත්‍රීතුමා මැතිවරණය ගැන කථා කරමින් කිව්වා, "බඩු බෙදුවා" කියලා. ගරු කථානායකතුමනි, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ මැතිවරණ ව්‍යාපාරය පටන් ගත්තේ කොහොමද? මැතිවරණ ව්‍යාපාරය පටන් ගත්තේම එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු සමෘද්ධි නිලධාරින්ට, ග්‍රාම නිලධාරිවරුන්ට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් සියලුම බඩු භාණ්ඩ බෙදලායි.

ඒ විතරක් නොවෙයි, ඔක්කොම සමෘද්ධි නිලධාරින් ඡන්ද වැඩවලට යනවා. ග්‍රාම නිලධාරිවරුන් ඡන්ද වැඩවලට ගියා. එදා ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ යටතේ තමයි සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව තිබුණේ. ඒ දෙපාර්තමේන්තුවේ හිටපු මිනිසුන්වත් ඡන්ද වැඩවලට යෙදෙව්වා. එහෙමයි එදා ඡන්ද ව්‍යාපාරය කළේ. අද එහෙම කළේ නැහැ. අද අපි සමෘද්ධි නිලධාරින් ඡන්ද වැඩවලට දැම්මේ නැහැ; ග්‍රාම නිලධාරින් ඡන්ද වැඩවලට දැම්මේ නැහැ; බඩු බෙදන්නට ගියේ නැහැ. හැම ගෙදරකටම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා බඩු බෙදලා තමයි එදා ඡන්ද ව්‍යාපාරය පටන් ගත්තේ. අද එහෙම එකක් නැහැ. ලංකාවේ තිබුණු මැතිවරණවලින් අවම ප්‍රචණ්ඩත්වයක් තිබුණු මැතිවරණය හැටියට පසුගිය දා පැවති මැතිවරණය වාර්තාවෙලා තිබෙනවා. පසුගිය සෑම මැතිවරණයකටම වඩා මෙවර මැතිවරණයේ දූෂණ, මැරකම් අඩු වෙලා තිබුණා.

ගරු කථානායකතුමනි, ඊළඟට ජනමතවිචාරණය ගැන කථා කළා. ඒගොල්ලන් පසුගිය කාලයේ මැතිවරණ පැවැත්වුවේ කොහොමද? ගරු කථානායකතුමනි, ඌව පළාත් සභා මැතිවරණය එක දවසක පැවැත්වුවා. බස්නාහිර පළාත් සභා මැතිවරණය තව දවසක පැවැත්වුවා. දකුණු පළාත් සභා මැතිවරණය තව දවසක පැවැත්වුවා. මධ්‍යම පළාත් සභා මැතිවරණය තව දවසක පැවැත්වුවා. එහෙමයි මේගොල්ලන් මැතිවරණ පැවැත්වුවේ. අඩුම තරමින් අද ජනමතවිචාරණය කියලා කියන්නට හෝ මුළු රටේම එක දවසක මැතිවරණය තියන්නට අපට පුළුවන්කම ලැබුණා. අපි එකම දවසේ මැතිවරණය තිබ්බ නිසා තමයි අඩුම තරමින් ජනමතවිචාරණයක් ගැන හෝ කථා කරන්නට මෙතුමන්ලාට හැකියාව ලැබුණේ. එහෙම නැතිව එදා මෙහෙම මැතිවරණ තිබුණේ නැහැ. එදා මැතිවරණ තිබ්බේ කඩ - කඩ සලාක ක්‍රමයට. රටේ එක එක තැන්වල එක එක දවසට මැතිවරණ තිබ්බේ. අපිට පුළුවන් වුණා මැතිවරණය එක දවසක තියන්නට.

ගරු කථානායකතුමනි, අද අපි ජනමතය ගැන කථා කරනවා. මේ ඡන්ද ක්‍රමය තුළ මේ රටේ බහුතර ජනතාවගේ ඡන්ද ප්‍රතිශතය මේගොල්ලන්ට හම්බ වෙලා තිබෙනවා කියලා අද මේගොල්ලන් කියනවා නම්, මේ රටේ ජනතාවගෙන් මේ මැතිවරණයට ඡන්දය පාවිච්චි කළේ සියයට 65 - 70 අතර ප්‍රමාණයක් බව අපි කියන්නට ඕනෑ, ගරු කථානායකතුමනි. ඒ විතරක් නොවෙයි, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ගත්තාට වඩා ඡන්ද ප්‍රමාණයක් අනෙකුත් දේශපාලන පක්ෂවල ඡන්ද ඔක්කෝම එකතු කළාම තිබෙනවා. එහෙම නම් අපි ජන මතය කියලා ගන්නවා නම්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට විරුද්ධව තිබෙන ජනමතය තවම අඩු වෙලා නැහැ. තවම ඒ ජන මතය සියයට 55කට ආසන්න ප්‍රමාණයකට තිබෙනවා. ගරු කථානායකතුමනි, එම නිසා මේ මැතිවරණ ප්‍රතිඵල තුළින් අපට යම් පණිවුඩයක් ලබා දෙනවා. ඒ පණිවුඩය තමයි, යහ පාලන ආණ්ඩුව තුළ අපි ලබා දීපු පොරොන්දු මතක් කර දීම.

ගරු කථානායකතුමනි, එක මන්ත්‍රීවරයෙක් ඇහුවා ඒගොල්ලන්ව හිරේ දැම්මේ නැහැ, ඒගොල්ලන්ව ඇල්ලුවේ නැහැ, ඒගොල්ලන්ට දඬුවම් දුන්නේ නැහැ, ඒ හින්දාද අපට ඡන්දය නොදුන්නේ කියලා. හරියට හරි. ඒකත් එක කාරණයක් තමයි. විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා අපේ කාලයේ අපි පෙන්වුවේ බන්ධනාගාරයයි, උසාවියයි, හිර ගෙදරයි විතරයි කියා. ඒක ඇත්ත. අගමැතිතුමාට පින් සිද්ධ වෙන්න තමයි එතුමා අර පාස්පෝට් නඩුවෙන් බේරුණේ. එහෙම නැත්නම් එතුමා අද වන විට මීගමුව හෝ මහර බන්ධනාගාරයේ ඉන්න ඕනෑ. ඒ අය අද ඇවිල්ලා මේ විධියට කථා කිරීම ගැන ඇත්තටම ලජ්ජා වෙන්න ඕනෑ. මොකද, ආණ්ඩුවක් හැටියට පසුගිය කාලයේ වංචා, දූෂණවලට දඬුවම් දෙන්න වාගේම ජනතාවගේ යම් යම් බලාපොරොත්තු ඉෂ්ට කර ගන්නට බැරි වීම තුළ ජනතාව අපට යම් සංඥාවක් ලබා දීලා තිබෙනවා; යම් අනතුරු හැඟවීමක් ලබා දීලා තිබෙනවා.

ඒ අනතුරු ඇඟවීම ආශීර්වාදයක් හැටියට අපි ලබා ගන්න ඕනෑ. ඒ නිසා 2015 ජනවාරි 08 වන දා ජනමතයට අනුව අපි නැවත පටන් ගන්න ඕනෑ. ඒ ක්‍රියාදාමය නැවත ඉදිරියට ගෙන යන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේ මැතිවරණය තුළ මේ රටේ ජාතිවාදී, පැසිස්ට්වාදී බලවේගවලට විරුද්ධව කඳවුරු දෙකක් තිබෙනවා. ඒ එක කඳවුරක් තමයි මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පැසිස්ට්වාදී, ජාතිවාදී ක්‍රියාදාමයට විරුද්ධ කඳවුර. අනික් කඳවුර තමයි ජාතිවාදී කඳවුරට විරුද්ධ-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට නියමිත වේලාව අවසානයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
විනාඩියකින් මගේ කථාව අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

මේ මැතිවරණය පටන් ගත්ත දවසේ සිටම මේ රටේ ජාතිවාදය, ආගම්වාදය අවුස්සන්න පුළුවන්ද කියලා බැලුවා. එදා අපි ඒක පරාජය කළා. මේ ලබා දුන්නු තීන්දුව ආශීර්වාදයක් හැටියට අරගෙන, මේ රටේ ජාතිවාදයට, ආගම්වාදයට විරුද්ධව එක්සත්භාවයෙන් අපේ ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යා යුතුයි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක් තිබෙනවා.

[අ.භා. 6.00]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, ඇමෙරිකාවේ සිටි සුප්‍රකට ජනාධිපතිවරයකු වන ඒබ්‍රහම් ලින්කන් වරක් මෙසේ පැවසුවා:

> "You can fool some of the people all the time, and all the people some of the time, but you cannot fool all the people all the time."

පසුගිය ජනාධිපතිවරණයේදීත්, පාර්ලිමේන්තු මැතිවරණයේදීත් ජනතාවට බොරු කියමින් ජන වරමක් ලබාගෙන, ඒ ජන වරම රැක ගැනීම උදෙසා වසර තුනක් තිස්සේ අඛණ්ඩව ජනතාවට බොරු කීම නිසා ජනතාවගේ පපු කැනැත්තේ එකතු වුණු කේන්තිය, කලකිරීම දෝරේ ගලා යෑමක් -පිටාර ගැලීමක්- විධියටයි මේ පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵලය අපි දකින්නේ.

ගරු කථානායකතුමනි, මේ තමයි ශ්‍රී ලංකා ඉතිහාසයේ පුංචි ඡන්දයකින් ආණ්ඩුවක් පරාජය වුණු පළමුවන අවස්ථාව. ආණ්ඩුවක් පළාත් සභා මැතිවරණ පැරදිලා තිබෙනවා, ජනාධිපතිවරණ පැරදිලා තිබෙනවා, පාර්ලිමේන්තු මැතිවරණ පැරදිලා තිබෙනවා. ඒත් ඉතිහාසයේ කවදාකවත් ආණ්ඩුවක් පුංචි ඡන්දයක් පැරදිලා නැහැ. ආණ්ඩුවකට ජයග්‍රහණය නියත එකම මැතිවරණය විධියටයි ඉතිහාසය පුරාම පුංචි ඡන්දය සැලකුවේ. ඒ නිසා තමයි විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක අනුර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රශ්න කළේ, "මේ පුංචි ඡන්දයකින් මොකටද ආණ්ඩුවක් පෙරළෙන්නේ? එහෙම නම් ඡන්දයක්, ඡන්දයක් ගානේ ආණ්ඩුව පෙරළන්න සිදු වෙයි නේ" කියලා. අපි එතුමාගෙන් පෙරළා ප්‍රශ්න කරනවා, "ඉතිහාසයේ පුංචි ඡන්දයකින් ආණ්ඩුවක් පැරදුණේ කවදාද?" කියලා. ආණ්ඩුවක් අනිවාර්යයෙන් ජය ගත යුතු ඡන්දයත් පරදිනවා නම්, අනික් ඡන්ද ගැන කවර කථාද?

ගරු කථානායකතුමනි, පැරණි සිංහල කියමනක් තිබෙනවා, "යකඩ මල්ලට ගුල්ලෝ ගහලා නම්, වී මල්ල නොබලාම විසි කරන්න"යි කියලා. ආණ්ඩුවේ යකඩ මල්ල තමයි මේ පුංචි ඡන්දය. ඒ යකඩ මල්ලටයි පෙබරවාරි 10 වන දා ගුල්ලෝ ගැහුවේ. එහෙම නම් පළාත් සභා මැතිවරණ ගැන, පාර්ලිමේන්තු මැතිවරණ ගැන, ජනාධිපතිවරණ ගැන කවර කථාද? ඒ වී මල්ලට නම් ගුල්ලෝ ගහනවා ගහනවාමයි.

ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයෙන් මේ සභාවේ මතු වුණු තර්ක ටිකට පිළිතුරු දීම සඳහා මගේ විනාඩි 8 පාවිච්චි කළ යුතුයි.

මූලික වශයෙන් තර්කයක් මතු වුණා, ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා ඡන්ද ලක්ෂ 58ක් ගත්තාය, එය සියයට 48ක ඡන්ද ප්‍රමාණයක් වුණා කියලා. ගරු කථානායකතුමනි, ඒක හරියට මේ වාගෙයි. නිවාසාන්තර මළල ක්‍රීඩා උළෙලක පළමුවන දවසේ මා දුර පනිනවා, මීටර් 5ක්. ඊළඟ දවසේ උස පනිනවා, මීටරයක්. ලෝකයේ උස පැනීමේ වාර්තාව තිබෙන්නේ මීටර් 2.45යි. දුර පැනීමේ වාර්තාව තිබෙනවා, මීටර් 8.9ක්. දුර පැනීමයි, උස පැනීමයි සංසන්දනය කරන්න බැහැ. දුර පනින තරම් උස පනින්න බැහැ. ඒ වාගේම ලංකා ඉතිහාසයේ වැඩිම ප්‍රතිශතයක් ඡන්දය පාවිච්චි කරන, වැඩිම ප්‍රමාණයක් ඡන්ද ගන්න ජනාධිපතිවරණයයි, අඩුම ප්‍රතිශතයක් ඡන්දය පාවිච්චි කරන පළාත් පාලන මැතිවරණයයි කිසිසේත්ම සංසන්දනය කරන්න බැහැ. ඒක හරියට උස පැනීමයි, දුර පැනීමයි සංසන්දනය කරනවා වාගෙයි. හැබැයි, මේ කාරණය මතක තබා ගන්න. 2011 පුංචි ඡන්දයේදී එක්සත් ජාතික පක්ෂය විපක්ෂයේ ඉඳලා ලබාගත් ඡන්ද ප්‍රතිශතය සියයට 32.7යි. මෙදා පාර ලබාගෙන තිබෙන්නේ සියයට 33.6යි. ආණ්ඩුවේ පසුබෑම නේද මේ ජයග්‍රහණයක් කියලා කියන්නේ? රාජ්‍ය බලය තමන්ගේ අතේ තබාගෙන වැඩි කර ගන්න පුළුවන්වෙලා තිබෙන්නේ දශම 9ක ඡන්ද ප්‍රතිශතයක්. ජනාධිපතිතුමා සියයට 13ක ඡන්ද ප්‍රතිශතයක් ගනිද්දී, අගමැතිතුමා සියයට 33ක ඡන්ද ප්‍රතිශතයක් ගනිද්දී, විපක්ෂ නායකතුමා සියයට 4ක ඡන්ද ප්‍රතිශතයක් ගනිද්දී, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සියයට 6ක ඡන්ද ප්‍රතිශතයක් ගනිද්දී, රාජ්‍ය බලය කිසිත් නැති, ජනාධිපතිතුමාගේ පක්ෂයේත් නොවන, අගමැතිතුමාගේ පක්ෂයේත් නොවන, අඩුම ගානේ විපක්ෂ නායකතුමාගේ පක්ෂයේත් නොවන, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකගේ පක්ෂයේත් නොවන, මන්ත්‍රී ධුරයක්වත් නැහැයි කියා හැමදෙනාම කියපු, ජී.එල්. ගේ පොහොට්ටුව පක්ෂය -ඒ දවස්වල එහෙම නේ කිව්වේ- සියයට 46ක ඡන්ද ප්‍රතිශතයක් ගැනීම ආශ්චර්යයක් නොවෙයිද, විශ්වකර්ම වැඩක් නොවෙයිද, ඉතිහාසය යළි ලිවීමක් නොවෙයිද කියන ප්‍රශ්නය අපට අහන්න වෙනවා.

ගරු කථානායකතුමනි, දැන් මේ ගරු සභාවේ තර්ක කරනවා, "මොනවා කිව්වත් මහින්ද රාජපක්ෂ මහත්තයාට තිබුණේ සියයට 46යි නේ. එතුමාට සියයට 54ක් විරුද්ධයි නේ" කියලා. අපි ඒකත් පිළිගනිමු කෝ. මහින්ද රාජපක්ෂ මැතිතුමාට සියයට 54ක් විරුද්ධ නම්, ජනාධිපතිතුමාට ලැබුණේ සියයට 13ක් නිසා එතුමාට සියයට 87ක් විරුද්ධයි. අගමැතිතුමාට ලැබුණේ සියයට 33ක් නිසා එතුමාට සියයට 67ක් විරුද්ධයි. විපක්ෂ නායකතුමාට ලැබුණේ සියයට 4ක් නිසා එතුමාට සියයට 96ක් විරුද්ධයි. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට ලැබුණේ සියයට 6ක් නිසා එතුමාට සියයට 94ක් විරුද්ධයි. එහෙම බලද්දී මේ රටේ අඩුම විරෝධය තිබෙන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාටයි කියන එක ඉතාම පැහැදිලිව ජනතාව ප්‍රකාශ කරලා තිබෙනවා.

අපට පුංචි ප්‍රශ්නයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. එදා ජනාධිපතිවරණයේදී මේ පක්ෂ සියල්ල එකට එකතුවෙලායි ලක්ෂ 62ක ඡන්ද ගත්තේ. ඒ නිසා "හංස පූට්ටුව" හරි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට නියමිත වෙලාවෙන් තව විනාඩි තුනක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මේ ඡන්දයේදී එක්සත් ජාතික පක්ෂය අපට එරෙහිව මැතිවරණ ව්‍යාපාරය කළා විතරක් නොවෙයි, ජනාධිපතිතුමාට එරෙහිවත්, ජනතා විමුක්ති පෙරමුණට එරෙහිවත් මැතිවරණ ව්‍යාපාරය කළා. අපට ඒවා මතකයි නේ. ජනාධිපතිතුමාට "පික් පොකට්කාරයා", "නයා" කියලා කිව්වා. අපි එහෙම කිව්වේ නැහැ නේ, දෙවියනේ! ඒ විධියට එකිනෙකාට එරෙහිව තරගකාරිව ගත් ඡන්ද එකතු කරලා, "අපේ ගොඩ ලොකුයි - ඔබේ ගොඩ පොඩියි" කියන න්‍යාය අපට නම් තේරෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අපෙන් අහන තවත් ප්‍රශ්නයක් තිබෙනවා. හොරු ඇල්ලුවේ නැති නිසා ජනතාව කෝපය ප්‍රකාශ කළා කියලා අපේ ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමා කිව්වා. හොරු ඇල්ලුවේ නැති එකට එජාපයත් එක්ක තරහයි නම්, හොරුත් එක්ක කොහොම තරහා වෙලා ඉන්න ඕනෑද? හොරු අල්ලපු නැති එක වැරැදියි කියපු ජනතා විමුක්ති පෙරමුණ ජන වරමක් ඉල්ලුවා. ජනවාරි මාසයේ 08 වැනිදා ජන වරම වෙනුවෙන් ඔවුන් පෙනී හිටියා. ඒ අයට සියයට 6යි; හොරු අල්ලපු නැති අයට සියයට 33යි; හොරුයි කියපු අපට සියයට 46යි! මොන ලෝකයේද ගරු කථානායකතුමනි, හොරු අල්ලපු නැති කේන්තිය පෙන්වන්න හොරාට ඡන්දය දෙන්නේ? ඒ නිසා මෙවැනි අතාර්කික විහිළු සහගත දේවල් මෙවැනි ගරු සභාවක ප්‍රකාශ කිරීමෙන් මේ ගරු සභාව හෑල්ලුවනවා කියන එකයි අපට ප්‍රකාශ කරන්න වෙන්නේ.

ඊළඟට තවත් තර්කයක් ගෙනාවා, "ජනමත විචාරණයක් වුණා නම් මේක පරාදයි නේ. ලැබුණේ සියයට 46යිනේ" කියලා. අපි මොකක්ද කිව්වේ? "මේ මැතිවරණය ජනමත විචාරණයක් සේ සලකන්න" කියලා තමයි අපි ජනතාවට කිව්වේ. ඒ ගැන අපට මෙහෙම කියන්න පුළුවන්. අපි කිව්වේ, කවුරු හෝ කෙනෙකු ත්‍රී වීලරයේ නැඟලා යනවා නම්, කාර් එකේ නැග්ගා කියලා හිතාගෙන මේ ගමන යන්න කියලායි. කාර් එකේ නැඟලා යන කොට දැනෙන දෙයයි, කාර් එක කියලා හිතාගෙන ත්‍රී වීලර් එකේ යනකොට දැනෙන දෙයයි දෙකක්. "මෙය ජනමත විචාරණයක් සේ සලකන්න" කියලා අපි ජනතාවට කියපු නිසා තමයි සාමාන්‍යයෙන් සියයට 55ක් ඡන්දය දෙන පුංචි ඡන්දය සියයට 80ක් දක්වා වර්ධනය වුණේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලැබී ඇති වේලාව අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
එහෙම කිව්වේ නැත්නම්, මේ පුංචි ඡන්දය කානු, බෝක්කු ඡන්දයක් කියලා ජනතාව ඡන්දය දෙන්න එන්නේ නැහැ. තව කියන්න දේවල් නම් බොහොමයි. නමුත් මේ කාරණය කියලා මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමනි, මේ විවාදය ඓතිහාසිකයි. මේ විවාදයෙන් ඉතා වැදගත් දෙයක් මතු වුණා. විපක්ෂ නායකතුමා ජනාධිපතිතුමායි, අගමැතිතුමායි එකට වැඩ කිරීමේ අවශ්‍යතාව ගැන හිතලා "අනේ! එහෙම කරන්න" කියලා ඉල්ලීම් කළා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, "ජනාධිපතිතුමායි, අගමැතිතුමායි, ජනාධිපති සිහිනයක් නිසා රණ්ඩු කරනවා. එහෙම කරන එක වැරැදියි. ඒක නිසායි මේ ප්‍රතිඵලය අත් වුණේ" කියලා. විපක්ෂ නායකතුමාත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් සිටින්නේ ආණ්ඩුව රැක ගැනීමේ ව්‍යාපෘතියේය කියලා එතුමන්ලාගේ කථා හරහා ඔප්පු කළා. ගරු කථානායකතුමනි, එතුමන්ලාගේ ඡන්දත් තමන්ගේ ගොඩට දමාගෙන එක්සත් ජාතික පක්ෂය කථා කරපු දේ නිවැරැදි නිසා විපක්ෂ නායකකම අපේ කණ්ඩායම් නායක මහින්ද රාජපක්ෂ මැතිතුමාට ලබා දිය යුතුයි කියන කාරණය යෝජනා කරමින් මම නිහඬ වනවා.

සියලු දෙනාටම තෙරුවන් සරණයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Dr.) Jayampathy Wickramaratne. You have seven minutes.

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
Sir, I will not speak today.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්දිම ගමගේ මැතිතුමා. You have seven minutes.

[අ.භා. 6.08]

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ස්තුතියි, ගරු කථානායකතුමනි.

අද අපේ ගම්මන්පිල මන්ත්‍රීතුමා කථා කරලා කිව්වා, "පුංචි ඡන්දය පැරදුණා" කියලා. පුංචි ඡන්දය ගැන තමුන්නාන්සේ කථා කළාට, ඉතිහාසයේ කවදාවත් පැරදුණේ නැති විධියට විධායක ජනාධිපතිවරයෙක් -මහින්ද රාජපක්ෂ මහත්තයා- අවුරුදු දෙකකට කලින් ගෙදර ඇරියේ මේ යහ පාලන ආණ්ඩුව කියලා මතක තියා ගන්න. ඒ කාරණය මතක් කරන ගමන්ම තමුන්නාන්සේට මේ කාරණයත් කියලා දෙන්න ඕනෑ. පුංචි ඡන්දය ගැන කථා කළ තමුන්නාන්සේලා එදා කරපු දේවල් අපි දැක්කා. තමුන්නාන්සේලා බොරු කියලා, කසිප්පු බෙදලා, ගංජා බෙදලා, කන්න දීලා, බොන්න දීලා, -ඔක්කොම කරලා- අපි දීපු නිදහස අවභාවිත කරලා, ඡන්ද ටිකක් අරගෙන උඩ පනින්න ලෑස්ති වෙන්න එපා.

එතුමා කියපු විධියට නිවාසාන්තර ක්‍රීඩා තරගය ගැන මමත් කියන්නම්.

තමුන්නාන්සේලා මේ පුංචි ඡන්දය දිනලා මොකක්ද කිව්වේ? ආණ්ඩුව පෙරළන්න කථා කළා. ගරු කථානායකතුමනි, මේක හරියට ක්‍රීඩකයෙක් පාසලක ක්‍රීඩා තරගයක් දිනලා "නිවාසාන්තර ක්‍රීඩා තරගයේ පදක්කම මට එපා. මට සමස්ත ලංකා පදක්කමක් ඕනෑ" කියලා කියනවා වාගේ වැඩක්. අන්න ඒ වාගේ විහිළුවක් තමයි මේ ඒකාබද්ධ විපක්ෂයේ අය කළේ. ඒකාබද්ධ විපක්ෂයේ අය හිතුවා, මේ ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් ප්‍රාදේශීය සභා කිහිපයක බලය ගත්තාම මේ ආණ්ඩුව පෙරළන්න පුළුවන් කියලා. ආණ්ඩුවට මොකද වුණේ? ආණ්ඩුව පෙරළන්න පුළුවන් කියලා කිව්වා. දැන් කියනවා, අපි එහෙම කිව්වේ නැහැ කියලා. අපි දැක්කා, ගාමිණී ලොකුගේ මැතිතුමා, ඒ වාගේම දිනේෂ් ගුණවර්ධන මැතිතුමා උඩ පැන පැන කථා කරනවා. මයික් එකක්

[ගරු චන්දිම ගමගේ මහතා]

පේන්න බැහැ. උඩ පැන පැන මයික්වලට කිව්වා, "අපි 113 හදනවා. අපි ආණ්ඩුව පවත්වනවා" කියලා. ඔවුන් අද මේ සභාවේත් නැහැ. අද පරාජයට පත් වෙලා, නඟුට ගුද මාර්ගයේ ගහ ගත්තු සුනඛයන් වාගේ අද කට්ටියම මහ හැරලා ඉන්නවා. මේක තමයි අද පොහොට්ටුව වෙනුවෙන් කටයුතු කරන ඒකාබද්ධ විපක්ෂයේ තත්ත්වය.

ගරු කථානායකතුමනි, අද මේ අර්ථ කථනය කිරීම සහ ගණනය කිරීම ගැන කථා කරනවා. අර්ථකථනය කිරීම කොහොම වෙතත් අද අපි කියන්නේ, එදා අපිත් එක්ක හිටපු ඔක්කෝම එකතු වුණාම මහින්ද මහත්තයාට විරුද්ධව සියයට 55ක් තිබෙනවාය කියන කාරණයයි. ඒ වාගේම අපි කියන්නේ, අපිත් එක්ක එදා හිටපු කට්ටියගේ පක්ෂවල එකතුව ගත්තාම, රාජපක්ෂ මහත්තයාගේ සියයට 47 සියයට 44 දක්වා අඩු වෙලා තිබෙනවාය කියන කාරණයයි. අද කවුරු මොනවා කිව්වත්; ඒකාබද්ධ විපක්ෂයේ අය මොනවා කිව්වත්, එදා යහපාලන ආණ්ඩුව පිහිටුවන්න අපිත් එක්ක හිටපු පක්ෂත් එක්ක එකතු වුණාම අපි තමුන්නාන්සේලාට වැඩිය ඉදිරියෙන් සිටින බව පැහැදිලිව කියන්නට ඕනෑ.

මේ කාරණයත් විශේෂයෙන් මතක් කරලා දෙන්නට ඕනෑ. මේ තරගය ප්‍රාදේශීය මට්ටමේ මැතිවරණයක් වුණාට, ප්‍රාදේශීය අපේක්ෂකයෝ කවුරුවත් පෝස්ටර් ගැහුවේ නැහැ. ගැහුවේ, මහින්ද මහත්මයාගේ පෝස්ටරය පමණයි. මහින්ද මහත්තයා තමයි මේ පළාත් පාලන මැතිවරණයේ දී පළාත් පාලන ආයතන 341හිම අපේක්ෂකයා බවට පත් වුණේ. හැබැයි, එම අපේක්ෂකයා එදා සමස්ත ලංකා තරගවලට ඉදිරිපත් වෙච්ච අපේක්ෂකයෙක්; ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙච්ච අපේක්ෂකයෙක්. කනගාටුවෙන් හරි කියන්නට ඕනෑ, එතුමා ගම් මට්ටමේ ප්‍රාදේශීය සභා මැතිවරණයකටත් ඉදිරිපත් වුණාය කියන කාරණය. ඒ ප්‍රාදේශීය සභා මැතිවරණයට එදා හිටපු ජනාධිපතිවරයාගේ මුහුණ පෙන්නලා තමයි මේ ඡන්ද ටික හරි එකතු කර ගත්තේ. හැබැයි, ප්‍රතිඵලය මොකක්ද? රාජපක්ෂ මහත්මයාගේ මුහුණ පෙන්නුවාට ගමේ මැතිවරණ දිනලා තිබෙන්නේ කවුද? කසිප්පුකාරයෝ; ගංජාකාරයෝ; ස්ත්‍රී දූෂකයෝ; හොරු; වංචාකාරයෝ තමයි මේ ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් දිනලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ගරු කථානායකතුමනි, ඒකාබද්ධ විපක්ෂයේ උදවියට මේ කාරණය පැහැදිලිව කියන්නට ඕනෑ. ගම කන, ගම විනාශ කරන, ගමේ කාන්තාවන්ට ජීවත් වෙන්න බැරි පසුබිමක් නිර්මාණය කරන මන්ත්‍රීවරුන් ටිකක් තමයි අද මේ ප්‍රාදේශීය සභා මැතිවරණයේ දී පොහොට්ටුවෙන් පත් වෙලා තිබෙන්නේ. ගමේ-ගොඩේ කථාවක් තිබෙනවා, "නංගි පෙන්නලා අක්කා දුන්නා වාගේ" කියලා. පොහොට්ටුව පක්ෂයේ අය නංගි පෙන්නලා අක්කා නොවෙයි, නංගි පෙන්නලා ආච්චි තමයි දීලා තිබෙන්නේ. නංගි පෙන්නලා ආච්චිව දීපු මැතිවරණයක් කියලා අපි තමුන්නාන්සේලාට මතක් කරලා දෙනවා.

මේ වෙන කොට විවිධ මතිමතාන්තර ගොඩනැඟිලා තිබුණත්, අද ඒකාබද්ධ විපක්ෂයේ උදවියට, පොහොට්ටුවේ උදවියට බැරි වුණා මන්ත්‍රීවරුන් 113ක් පෙන්වන්න. මන්ත්‍රීවරුන් 113ක් තියා අඩුම ගණනේ මන්ත්‍රීවරුන් 25ක්වත් පෙන්වන්න බැරි වුණා. කලින් ඉදිරිපත් කරපු යෝජනාවට අත්සන් කරලා තිබෙන්නේ මන්ත්‍රීවරුන් 20යි. ඒ මන්ත්‍රීවරුන් 20 තියාගෙන තමයි පසු ගිය ටිකේ මාධ්‍ය ඉස්සරහට ගිහිල්ලා ප්‍රකාශ කළේ. මේ ඒකාබද්ධ විපක්ෂයේ උදවිය එදා ආණ්ඩු පක්ෂයේ සිටිද්දී ගුටි කාපු මාධ්‍යකාරයෝ තමයි මේක වැඩිපුරම පෙන්වන්නේ. උඩ පැන පැන පෙන්නුවා, අපට මන්ත්‍රීවරුන් 113ක් පෙන්වන්න පුළුවන් කියලා. අද මන්ත්‍රීවරුන් 113 නොවෙයි, මම ඉස්සෙල්ලා කිව්වා වාගේ අද පස්සා පැත්ත බිම ඇන ගන්නා තත්ත්වයක් ඒකාබද්ධ විපක්ෂයට උද්ගත වෙලා තිබෙනවා.

එදා පළාත් පාලන මැතිවරණය දිනලා, ඒ ජයග්‍රහණය අනුව කටයුතු කරන්නේ නැතිව ආණ්ඩුව පෙරළන්න හැදුවා. පළාත් පාලන මැතිවරණයෙන් පෙබරවාරි 11වැනි දා යම් කිසි ජයග්‍රහණයක් ලැබුවා වෙන්නට ඇති. හැබැයි, ආණ්ඩු පෙරළන්න ගිහිල්ලා ඒකාබද්ධ විපක්ෂය, එහෙම නැත්නම් පොහොට්ටුව පක්ෂය අද නන්නත්තාර වෙලා, පරාජය වෙලා තිබෙනවා කියන එක හොඳට මතක තබා ගන්න. මේ මැතිවරණයේ දී ආණ්ඩුවක් විධියට, එක්සත් ජාතික පක්ෂය විධියට අපි අඩු මන්ත්‍රී ධුර ප්‍රමාණයක් ගත්තා තමයි. හැබැයි, මේකත් හොඳට මතක තියා ගන්න. මේ පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ ඇති වෙච්ච තත්ත්වය තුළ ආණ්ඩු පෙරළන්න ගත්තු උත්සාහය නිසා අද එක්සත් ජාතික පක්ෂය ඇතුළු අපේ යහ පාලන ආණ්ඩුව විශිෂ්ට ජයග්‍රහණයක් ලබා තිබෙනවා.

ඔවුන්ට අවශ්‍යතාව තිබුණා අගමැතිවරයා පන්නන්න; ඇමතිවරු පන්නන්න. ඒ වාගේම අවශ්‍යතාවක් තිබුණා, ඇමතිවරුන් මාරු කරන්න; එහෙම නැත්නම් ඔළුගෙඩි මාරුවක් කරන්න. හෙට අනිද්දා වනකොට ඔළුගෙඩි මාරුව සිද්ධ වේවි. ඒ ඔළුගෙඩි මාරුව සිද්ධ වුණාට පස්සේ අද පාර්ලිමේන්තුවේ ඉඳගෙන කෑගහන, හිරේ ඉන්න ඕනෑ අයට හිරේට යන්න වෙනවායි කියන එකත් මතක තියා ගන්න. හොරකම් කරලා මෙච්චර කල් වැල්වටාරම් ගහපු, රවුම් ගහපු, වංගු ගහපු, හැංගිලා හිටපු ඔක්කෝටම මේ ඇති කරන වෙනසින් පසුව අනිවාර්යයෙන්ම හිරේ යන්න වෙනවායි කියන එක තේරුම් ගන්න ඕනෑ; මතක තියා ගන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
හොඳයි, ගරු කථානායකතුමනි. ඒ නිසා ඒකාබද්ධ විපක්ෂයේ අය ඔළුව බේරාගෙන ඉන්නේ නැතිව කරකවන්න ගිහිල්ලා, නැති සංදර්ශන මවන්න ගිහිල්ලා නුදුරු අනාගතයේ දී ඉතා ඉක්මනින්ම තමන් වළ පල්ලට යන ක්‍රියාදාමය ආරම්භ කරගෙන තිබෙනවාය කියන එකත් මතක් කරමින් මා නිහඬ වෙනවා, බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.15]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු කථානායකතුමනි, පළාත් පාලන මැතිවරණයත් එක්ක රටේ ඇති වෙලා තිබෙන දේශපාලන අර්බුදය සහ ආර්ථික අර්බුදය පිළිබඳවයි අපේ පැත්තෙන් මෙම යෝජනාව ඉදිරිපත් කළේ. ඇත්ත වශයෙන්ම ආණ්ඩු පක්ෂය මේ පරාජය භාර ගන්නේ නැත්තේ ඇයි කියන එක මම අහන්න කැමැතියි. ආණ්ඩුව පරාජය භාර ගන්න නිහතමානී වෙන්න ඕනෑ. පරාජය භාර ගත්තොත් විතරයි ඒ පරාජයට හේතු හොයන්න පුළුවන් වෙන්නේ. ගරු කථානායකතුමනි, දැන් කියනවා," ඔක්කෝම එකතු කළාම සංඛ්‍යා ලේඛන අනුව අපට තමයි වැඩියෙන් ඡන්ද තිබෙන්නේ. ඊළඟ ජනාධිපතිවරණයේ දීත් අපි තමයි ජයග්‍රහණය කරන්නේ" කියලා. දැන් මේක තමයි මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන විග්‍රහය. මේකෙන් පෙනෙනවා, මේ මැතිවරණ ප්‍රතිඵල ගැන ආණ්ඩුවට කිසිම තක්සේරුවක් නැහැයි කියන එක. තක්සේරුවක් තිබුණා නම් මේ වන විට රට හමුවේ ස්වයං විවේචනයක් කරන්න ඕනෑ, "මේ, මේ හේතු නිසා අපි පැරදුණා" කියලා. ඒ නිසා කවදාවත් මේ අයට නිවැරදි වෙන්න බැහැ කියන එක මම කියන්න කැමැතියි. මොකද, යථාර්ථමය විධියට ප්‍රශ්නයක් දෙස බලන්නේ නැතිව වෙනත් විග්‍රහවලින් උත්තර දෙන්න ගියාම හරි උත්තරය එන්නේ නැහැ.

දැන් සමහර අය කියනවා, "අපි තමයි ආණ්ඩුව කරන්නේ. ඔයගොල්ලන්ට ආණ්ඩුව ආවත් ගෙන යන්න බැහැ" කියලා. මෙහෙම කථා කරන අය තමන්ගේ කොට්ඨාසය තුළත් පරාදයි. ඡන්දයෙන් පස්සේ ජනතාව හමු වෙන්න ඒ කොට්ඨාසය තුළ ඇවිද්දා නම්, පැරදුණු හේතුව මොකක්ද කියලා හොයා ගන්න පුළුවන්.

2015 ජනවාරි 08වැනිදා වුණු සමාජ වෙනසේ දී ආණ්ඩුව දීපු ප්‍රතිඥා එකක්වත් ඉස්සරහට ගෙන යන්න ආණ්ඩුවට බැරි වුණා. ඒ නිසා මේ වටා හිටපු සියලු සමාජ බලවේග ආණ්ඩුව අත්හැරියා. ඒක එක පැත්තක්. ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. ආණ්ඩුව ගෙන ගිය ඒ ආර්ථික ප්‍රතිපත්තිය නිසා රට වෙලා ගත්ත දිළිඳු බවයි, පීඩනයයි තුළ මිනිස්සු දැක්කා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා පරාජය වීමේ හේතුව උඩ තමයි තමන් මේ තත්ත්වයට මුහුණ දෙන්නේ කියන එක. ඒක තමයි ඇත්ත. ඒ නිසා ඇති වුණු එම තත්ත්වය වෙනස් කිරීම සඳහා වුණු පෙළ ගැසීමේ ප්‍රතිඵලයක් තමයි මේ මැතිවරණ ප්‍රතිඵලය. දැන් මේකත් එක්ක මොකක්ද වෙලා තිබෙන්නේ? මේ මැතිවරණ ප්‍රතිඵලත් එක්ක බරපතළ දේශපාලන අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. සමහරුන් දැන් සංඛ්‍යා ලේඛන හොයනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියනවා, "අපේ ආණ්ඩුවක් අපි හදනවා. අපට ටිකක් වැඩියෙන් තිබෙනවා" කියලා. ඒකාබද්ධ විපක්ෂයටත් ආරාධනා කරනවා, "තනි ආණ්ඩුවක් හදන්න අපේ ළඟ කෙළින් හිට ගන්න" කියලා. එක්සත් ජාතික පක්ෂය කියනවා, "අපට ආණ්ඩුවක් හදන්න පුළුවන්, අපේ ගොඩ වැඩියි" කියලා. දැන් මේ අර්බුදයට උත්තරයක් නැහැ. ඒ නිසා මේ ඇති වුණු දේශපාලන අර්බුදය අද සමාජ, ආර්ථික අර්බුදයකට හේතු වී තිබෙනවා. සියලු ක්ෂේත්‍ර කඩා වැටෙමින් තිබෙනවා. විදේශ ආයෝජකයන්ගේ විශ්වාසය නැති වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, කොටස් වෙළෙඳ පොළ බිඳ වැටී තිබෙනවා. ඒ ගැන අපි කවුරුත් දැන් කථා කළා. මහා ආර්ථික පරිහානියක් සිදු වෙලා තිබෙනවා. මේ කට්ටිය මේ සූදුව කෙළීවි.

මේකේ ප්‍රතිඵලය මේ සමාජයේ දුප්පත් මිනිස්සු මතයි පැටවෙන්නේ. ඒ නිසා මිනිසුන්ට දරා ගන්න බැරි ආර්ථික පීඩනයකට ඉදිරියේදී මේ රට පත් වෙනවා. ඒ නිසා තමයි ඒකාබද්ධ විපක්ෂයේ අපි සමාජය ගැන හිතලා, මේ රට ගැන හිතලා කිව්වේ, "හරි, අපි සහයෝගය දෙන්නම් තනතුරු භාර නොගෙන. මේ රට ගැන හිතලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් හදාගෙන යන්න ක්‍රියා කරන්නය" කියලා. නමුත්, මේ වෙනකල් උත්තරයක් තිබෙනවාද? අපි මොනවා කථා කළත්, නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය ඉස්සරහට ගෙන යන්න අද එක්සත් ජාතික පක්ෂය ගෙන යන ක්‍රියා මාර්ග ආපස්සට හරවන්න බැරි තැනට රට තල්ලු වෙලා ඉවරයි කියන කාරණය මම කියනවා. ඒක පිටිපස්සේ ඉන්න බටහිර බලවේග ලෙහෙසියෙන් මේක බිඳින්න ඉඩ දෙන්නේ නැහැ; වැටෙන්න ඉඩ දෙන්නේ නැහැ. කාගේ අභිලාෂයන් තිබුණත් අවසාන විග්‍රහය තමයි, මේක පූට්ටු කර ගෙන අරගෙන යනවාය කියන කාරණය. මොකද, ඒකේ වැඩි වාසිය තිබෙන්නේ මේ රටේ ඉන්න මූල්‍ය ධනපති පන්තියට සහ විජාතික ධනපති පන්තියට. අපේ සම්පත් සූරාකන්න උත්සාහ කරන බටහිර ධනපති පන්තියේ අවශ්‍යතාව මේ ආණ්ඩුවෙන් ඉටුවෙන්න නම්, මේ ආණ්ඩුවේ බහුතර බලයක් ඇති ඒ සන්ධානය තවදුරටත් රැකෙන්න ඕනෑ. ඒ නිසා අපට හිතෙන ආකාරයට මෙය වෙනස් කරන්න බැරි වෙයි. එහෙම කරනවා නම්, ඒක ලොකු විප්ලවීය වැඩක්. පසුගිය කාලයේ ගෙන ගිය, මුළු ලෝකයම ප්‍රතික්ෂේප කළ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියේත් මේක පරාජයක් කියා මම කියන්න කැමැතියි. තවදුරටත් මේක ඉස්සරහට ගෙන යන්න බැහැ කියන එක අද රට හමුවේ ඔප්පු වෙලා තිබෙනවා. දැන් මොකක්ද මේකේ ප්‍රතිඵලය? අර මැදපෙරදිග රටවල ඉන්න මහාරාජාවරුන්ටත් වැඩිය ධන කුවේරයෝ මේ රටේ බිහි වෙලා. මහාරාජාවරු වාගේ මහා සම්පත් ඒක රාශී කරගත්ත මූල්‍ය ධනපති පන්තියක් බිහිවෙලා තිබෙනවා. ඒ ධනපති පන්තිය බිහි කරන්න තමයි අපේ මහ බැංකු මං කොල්ලය කළේ. ඒ මහ බැංකු මං කොල්ලයෙන් ගත්ත ධනය මේ රටේ ධනපති ක්‍රමයේ සීමිත කොටසක් ශක්තිමත් කරන්න ගත්ත උත්සාහයක එක්තරා ප්‍රතිඵලයක්.

මේ ආකාරයට කටයුතු කරන ආණ්ඩුවක් ලෙහෙසියෙන් බිඳ දමන්න බටහිර බලවේගවල ක්‍රියාකාරිත්වය ඉස්මතු වෙලා ඒවි කියා මම හිතන්නේ නැහැ; ඒක එහෙම වෙන්නේ නැහැ. ඒ නිසා රට හමුවේ ප්‍රධාන අභියෝගයක් තිබෙනවා. මේ මතු වෙන දේශපාලන අර්බුදය අද බරපතළ ආර්ථික අර්බුදයකට යොමු කරලා තිබෙනවා. මේ ආර්ථික අර්බුදය නිසා මහා සමාජ ප්‍රශ්න වැලකට රට යොමු වෙමින් තිබෙනවා. ඒක නිසා තවදුරටත් රටට දරාගන්න බැරි පීඩනයක්, දරාගන්න බැරි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, වේලාව අවසන් වේ ගෙන එනවා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

හොඳයි, ගරු කථානායකතුමනි.

රටට දරාගන්න බැරි පීඩාකාරී තත්ත්වයක් ඇතිවෙන නිසාම තමයි මේ ජයග්‍රහණය ආරක්ෂා කර ගන්න කියන්නේ. "ඔව්, අපි ඒක බලාගන්නම්. දැන් නඩු ටික එනවා. හිරගෙදරට දක්කනවා". අන්න! මේ ප්‍රශ්නයට උත්තර හොයන හැටි. බලය දිනාගන්න ක්‍රියා කරන හැටි එහෙමයි. ඒ නිසා මෙහි අනෙක් අන්තය සමහරවිට සමාජ පීඩනයත්, මර්දනයත් මේ රට හමුවේ වෙළාගනී. එයින් රට මුදා ගන්න ඒකාබද්ධ විපක්ෂය කළ හැකි හැම කටයුත්තක්ම ඉටු කරන බව ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම මම කොමියුනිස්ට් පක්ෂයේ කෙනෙක් හැටියට, ජනතාව පැත්තෙන් සිදුවන එවැනි අනතුරකදී ඒක ආරක්ෂා කරන්න අපි කටයුතු

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

කරනවාය කියන එක මේ අවස්ථාවේ ප්‍රකාශ කරමින්, ධනපති පන්තියත් එක්ක එකගෙයි කන ජාතික ධනපති පන්තියේ හවුල් ආණ්ඩුවේ අර්බුදය මේ සමාජය පිට පටවන්නේ නැතිව, ප්‍රබුද්ධ දේශපාලන තීරණයක් ගන්නය කියා ඉල්ලා සිටිමින් මම නිහඬ වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.23ට, 2018 පෙබරවාරි මස 20 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 6.23 மணிக்கு பாராளுமன்றம், 2018 பெப்ருவரி 20, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 6.23 p.m. until 1.00 p.m. on Tuesday, 20th February, 2018.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.